# නගර සභා ආඥාපනත

1988

# පෙරවදන

නගර සහ ආඥාපනත (255 අධිකාරිය) මෙතෙක් සිංහලෙන් පළ වී නොතිබීම බලවත් අඩුපාඩුවක් විය.

නාගරික පළාත් පාලන ආයතනවල කාර්ය සාධනය වර්ධනය කිරීමට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සහ ගරු අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මැතිතුමා දියත් කර ඇති වැඩ සටහන යටතේ එම අඩුපාඩුව සපුරාලමින් නගර සභා ආඥාපනත 1987 අප්‍රේල් 16 දා දක්වා කර ඇති සංශෝධන අන්තර්ගත කරමින් ප්‍රථම වතාවට සිංහල භාෂාවෙන් මුද්‍රණය කිරීමට හැකි වීම නාගරික පළාත් පාලන ආයතනවලට සම්බන්ධ සැමටත් සතුටට කරුණක් වනු ඇත.

නුදෙක් පහසුවෙන් එම නීතිය හැදෑරීමට උපකාරී වනු වස් ප්‍රකාශයට පත් කරන මෙය ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ලෙස නොසැලකිය යුතු ය.

මෙම නගර සභා ආඥාපනත සිංහලෙන් පළ කිරීමට උපකාරී වූ නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, එන්. ජේ. අබේසේකර මහතාටත්, විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක එස්. ජී. එච්. සී. වංශරත්න මහතාට හා පියසිරි සමරසූරිය මහතාටත් අපගේ කෘතඥතාවය පිරිනමමු.

ආර්. පාස්කරලිංගම්,
ලේකම්,
පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
"සෙත් සිරිපාය",
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

## 255 වන අධිකාරිය

# නගර සභා ආඥාපනත

**ශ්‍රී ලංකාවේ පළාත් පාලන කාර්යයන් සඳහා නගර සභා පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වූ ආඥාපනතකි.**

1939 අංක 61,
1940 අංක 14,
1942 අංක 3,
1942 අංක 16,
1942 අංක 51,
1943 අංක 5,
1943 අංක 37,
1944 අංක 36,
1945 අංක 37,
1946 අංක 31,
1946 අංක 37,
1946 අංක 53,
1946 අංක 57,
දරණ ආඥාපනත්

1950 අංක 9,
1951 අංක 12,
1951 අංක 39,
1952 අංක 8,
1952 අංක 25,
1953 අංක 38,
1955 අංක 22,
1957 අංක 2,
1958 අංක 14,
1959 අංක 7,
1961 අංක 01,
1961 අංක 09,
1961 අංක 39,
1967 අංක 02,
1968 අංක 42,
1969 අංක 04,
1971 අංක 48,
දරන පනත්.

ජාතික රාජ්‍ය සභාවේ
1975 අංක 4,
1977 අංක 18,
1977 අංක 24,
දරන පනත්.

1979 අංක 13,
1979 අංක 42,
1979 අංක 57,
1981 අංක 10
1981 අංක 16,
1983 අංක 5,
1983 අංක 13,
1983 අංක 48,
1984 අංක 48,
1985 අංක 20,
1986 අංක 39,
1987 අංක 18
දරන පනත්.

[1940 ජනවාරි මස 1 වන දින]

**1.** **මේ ආඥාපනත නගර සභා ආඥාපනත යනුවෙන් හඳුන්වනු** ලුහුඬු නාමය.

## I වන කොටස

### නගර සභා සංස්ථාපනය කිරීම

### නගර සභා සංස්ථාපනය කරනු ලබන ප්‍රදේශ

නගර ප්‍රකාශයට පත් කිරීමේ සහ ඒවායේ පරිපාලන සීමා නියම කිරීමේ බලය.
[1971 අංක 48 § 30]

2 (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රදේශයේ සංවර්ධනය හෝ එහි ඇති පහසුකම් අනුව නාගරික ස්වභාවයක් දරන යම් ප්‍රදේශයක් මේ ආඥාපනතේ කාර්යයන් සඳහා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අතර එසේ ප්‍රකාශයට පත් කරන ලද නගරයේ පරිපාලන සීමා නියම කරනු ලැබිය හැකි ය. තවද, එසේ ප්‍රකාශයට පත් කරන ලද නගරය සඳහා මේ ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබිය යුතු නගර සභාවට අමාත්‍යවරයා විසින් ඒ නියමය ම මගින් හෝ යම් තදනන්තර නියමයක් මගින් නමක් සහ අභිධානයක් වෙන් කොට දිය හැකි ය.

(2) යම් ප්‍රදේශ දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකිනෙකට යාබදව පිහිටා නොතිබිය හැකි වුව ද, ඒ ප්‍රදේශ දෙක හෝ ඊට වැඩි ප්‍රදේශ ගණන ඒකාබද්ධ ව ඇති ලෙස සලකා ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කළ හැකි ය. තව ද එබඳු යම් ප්‍රකාශයක් කරන ලද්දේ යම් ප්‍රදේශ සම්බන්ධයෙන් ද ඒ ප්‍රදේශ ඒ අනුව මේ ආඥාපනතේ සියලු කාර්යයන් සඳහා තනි නගරයක් ලෙස ඒකාබද්ධව සංස්ථාපනය වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

එක් එක් නගරය සඳහා නගර සභා වක් සංස්ථාපනය කළයුතු බව.

3. 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සෑම නාගරික ප්‍රදේශයක් සඳහා ම මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව නගර සභාවක් සංස්ථාපනය කළ යුතු ය.

නගර සභාවල කර්තව්‍යය.

4. එක් එක් නගරය සඳහා සංස්ථාපිත නගර සභාව, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් වෙනත් යම් අධිකාරියකට වෙන් කොට දෙන ලද හෝ සතු කරන ලද බලතලවලට යටත් ව, නගරයේ මහ ජන සෞඛ්‍යය, මහ ජන උපයෝගී සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ සියලු කරුණු නගරයේ සීමා තුළ විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම හා සාමාන්‍යයෙන් ජනතාවගේ සුඛ විහරණය, පහසුකම් හා සුභ සාධනය සහ නගරයේ සැප විහරණ ක්‍රම ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම භාර කරනු ලැබූ පළාත් පාලන ආයතනය විය යුතු ය.

නගර සභාවල සංයුතිය.
[1977 අංක 24 § 116.]

5. (1) එක් එක් නගර සභාව සභාපතිවරයාගෙන් ද උප සභාපතිවරයාගෙන් ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් සංඛ්‍යාවකින් යුක්ත වන අනෙකුත් සභිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.



(2) සභික සංඛ්‍යාව නිර්ණය කිරීමේ දී නගරයේ භූමි ප්‍රමාණය ද ජනගහණය ද පිළිබඳ ව අමාත්‍යවරයා සැලකිලිමත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු ය.

### නගර සභාවල ඡන්ද විමසීම සහ ධුර කාලය ආරම්භ වීම ආදිය

[1977 අංක 24 § 117.]
සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ ප්‍රථම මහා ඡන්ද විමසීම.]

*7. මේ ආඥාපනත යටතේ යම් නගරයක් සඳහා නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබිය යුතු අවස්ථාවක, සභාවේ ප්‍රථම සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා, තත් කාලයෙහි තත් කාර්යයට අදාළ වන ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව, මහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය.

නගර සභා සංස්ථාපනය කිරීමට ප්‍රාරම්භක වූ වැඩ පිළිවෙළ.

8. මේ ආඥාපනත යටතේ යම් නගර සභාවක් සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් යම් ප්‍රාරම්භක වැඩ පිළිවෙලක කාර්යයන් සඳහා, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් හෝ නියමයන් මගින්, අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි සියලු විධාන නිකුත් කිරීම හෝ ඔහු විසින් එකී නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ එහි සඳහන් කරනු ලැබිය හැකි ප්‍රමාණයට මේ ආඥාපනතේ විධිවිධාන කිසිවක් මඳ වශයෙන් වෙනස් කිරීම හෝ පරිපූරණය කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, එකී සෑම නියමයක් ම එය මේ ආඥාපනතෙහි ඇතුළත් වී තිබිණි නම් බලාත්මක විය හැකි ලෙස ම එකී කාර්යයන් සම්බන්ධයෙන් බලාත්මක විය යුතුය.

නගර සභාවල ධුර කාලය ආරම්භ වීම සහ ඒ සභා සංස්ථාපනය වීමේ දිනය.

9. මේ ආඥාපනත යටතේ යම් නගරයක් සඳහා සංස්ථාපනය කරනු ලබන නගර සභාවක ධුර කාලය, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, නියම කරනු ලැබිය හැකි දිනයක සිට ආරම්භ විය යුතු ය. ඒ දිනය සභාව සංස්ථාපනය කරන ලද දිනය ලෙස මේ ආඥාපනතේ සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය. තවද 5 වන වගන්තිය යටතේ නියමිත සම්පූර්ණ සභික සංඛ්‍යාව යථා පරිදි තෝරා පත් කරගෙන නොමැති වුවත්, සභාව ඒ දිනයේ දී යථා පරිදි සංස්ථාපනය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

ප්‍රථම සහ එක් එක් තදනන්තර මහා ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගනු ලබන සභිකයන්ගේ ධුර කාලය.

10. (1) මහා ඡන්ද විමසීමක දී තෝරා පත් කරගනු ලබන එක් එක් සභිකයාගේ ධුර කාලය—

(අ) ප්‍රථම මහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ විට, අමාත්‍යවරයා විසින් 9 වන වගන්තිය යටතේ නියම කරනු ලබන දින දී; සහ

* 6 වන වගන්තිය 1977 අංක 24 දරණ පනත මගින් ඉවත් කරන ලදී

(ආ) ප්‍රථම මහා ඡන්ද විමසීමෙන් පසුව පැවැත්වෙන මහා ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වූ විට, ඡන්ද විමසීම පැවැත්වූ දිනයට පසුව එළැඹෙන ඊළඟ ජනවාරි මස පළමුවන දින දී හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දිනයක දී.

[1961 අංක 39 § 2.] [1967 අංක 2 § 2.] [1986 අංක 39 § 65 (ආ)]

ආරම්භ විය යුතු අතර, (ධුර කාලය ආරම්භ වූ වර්ෂය ද ඇතුළුව) එසේ ආරම්භ වීමෙන් පසුව ඒ සභිකයාගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුකොටගෙන ඔහුගේ ධුරය කලින් හිස් කරනු ලැබුවේ නම් මිස, ඒ ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට, මාස හතළිස් අටක කාලයක් සඳහා ඒ සභිකයා ධුරය දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

[1986 අංක 39 § 65 (ආ)]

(අ) ධුර කාලය අවසන් වන දිනය වෙනුවට ඒ වර්ෂයේ හෝ වර්ෂයට පෙරාතුවම වූ වර්ෂයේ ඒ ධුර කාලය අවසන් වන මාසයට පෙරාතුව වූ යම් මාසයක දිනයක් ආදේශ කිරීම නියම කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් ධුර කාලය කෙටි කළ හැකිය: තවද

[1986 අංක 39 § 65 (ආ)]

(ආ) (1) වන උපවගන්තිය යටතේ ධුර කාලය අවසන් වන දිනය වෙනුවට හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරනු ලබන දිනය වෙනුවට, ඒ වර්ෂයේ හෝ එසේ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නියම කරන ලද වර්ෂයට ඉක්බිතිවම වූ යම් වර්ෂයක ධුර කාලය අවසන් වන දිනයට පසුව වූ යම් මාසයක දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය දීර්ඝ කළ හැකි අතර, ඉන් පසුව අවසාන නියමයේ නිශ්චිතව සඳහන් ධුර කාලය අවසාන වන දිනය වෙනුවට පසුව වූ යම් දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය කලින් කල දීර්ඝ කළ හැකි ය:

එසේ වුව ද, ඒ ධුර කාලය දීර්ඝ කරන කාල සීමාව හෝ ඒ ධුර කාලය කලින් කල දීර්ඝ කරන කාලසීමාවල එකතුව මාස දොළහකට වැඩි නොවිය යුතු ය.

**11.** නගර සභාවක සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ ප්‍රථම මහා ඡන්ද විමසීමේ දී හෝ යම් තදනන්තර මහා ඡන්ද විමසීමක දී තෝරා පත් කරගනු ලැබූ සභිකයන්ගේ ධුර කාලය10 වන වගන්තිය යටතේ අවසන් වීමට නියමිත අවස්ථාවක, ඒ සභිකයන් වෙනුවට අලුත් සභිකයන් තෝරා පත් කරගැනීමේ කාර්යයන් සඳහා මහා ඡන්ද විමසීමක්, තත් කාලයේ දී තත් කාර්යය සඳහා අදාළ වන ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව පැවැත්විය යුතු ය.





ධුරය ප්‍රතික්ෂේප කිරීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම.

**12.** (1) නගර සභාවක සභිකයකු ලෙස තෝරා පත් කරගනු ලැබූ යම් තැනැත්තකු විසින් යම් හේතුවක් නිසා එහි සභිකයකු විශයෙන් සේවය නොකිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී ඔහු විසින්—

(අ) ඔහුව තෝරා පත් කරගනු ලැබීමෙන් පසුව පැවැත්වීමට නියමිත සභාවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කොට ඇති දිනයට පෙර යම් වේලාවක, සභාව සංස්ථාපනය කරනු ලැබූ නගරය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයාට ස්වකීය ධුරය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ලිඛිත නිවේදන යැවීම් කිරීමෙන්, හෝ

(ආ) එකී ප්‍රථම රැස්වීමෙන් පසු යම් වේලාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීම ගැන කෙලින් ම හෝ සභාපතිවරයාගේ මාර්ගයෙන් ඡන්ද විමසීම් නිලධරයාට ලිඛිත නිවේදනයක් කිරීමෙන්

ධුරය අත්හැරිය හැකි ය.

(2) පිට පිටම සභාවේ සාමාන්‍ය රැස්වීම් තුනකට වැඩි රැස්වීම් සංඛ්‍යාවකට සභාවේ අවසරයක් නොමැතිව නොපැමිණෙන නගර සභාවේ යම් සභිකයකු විසින් එනයින්ම ස්වකීය ධුරය අත්හැරිය යුතු ය.

(3) නගර සභාවක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබූ යම් තැනැත්තකු විසින් ස්වකීය ධුරය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඔහු ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මිය ගියහොත් හෝ (2) වන උපවගන්තිය යටතේ ධුරය හිස් කළහොත් හෝ වෙන යම් ආකාරයකින් එකී ධුරයෙහි අනියම් පුරප්පාඩුවක් ඇති වුවහොත් ඒ ධුරය පිරවීම සම්බන්ධයෙන් තත් කාලයෙහි අදාළ වන ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව, ඒ ධුරය පිරවිය යුතු අතර එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ඒ සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ඊළඟට පැවැත්වෙන ඡන්ද විමසීම තෙක් ධුරය දැරිය යුතු ය. [1977 අංක 24 § 119.]

### නගර සීමා සහ සභික සංඛ්‍යාව ආදිය වෙනස් කිරීම

[1977 අංක 24 § 121.]

නගරයේ සීමා සහ සභික සංඛ්‍යාව වෙනස් කිරීමට සහ සභාව විසුරුවා හැර ඒ වෙනුවට වෙනත් සභාවක් ප්‍රතියෝජනය කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**14.** *ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් යම් වේලාවක—

(අ) යම් නගරයක නගර සීමා වෙනස් කළ හැකි ය;

(ආ) යම් නගර සභාවක් සඳහා නියම කරනු ලැබ ඇති සභික සංඛ්‍යාව වෙනස් කළ හැකි ය;

* 13 වන වගන්තිය ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරණ පනත මගින් ඉවත් කරන ලදී.

[1977 අංක 24 § 122.]

(ඇ) පවත්නා යම් නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූයේ යම් නගරයක් සඳහා ද ඒ නගරයේ සීමාවල කරන ලද යම් වෙනස් කිරීමක් අනුව, මෙසේ කිරීම යෝග්‍ය යැයි ඔහුට පෙනී ගියහොත්, එකී පවත්නා නගර සභාව විසුරුවා හැර එම නගර සභාව වෙනුවට සංස්ථාපනය කළ යුතු අලුත් නගර සභාවක් ප්‍රතියෝජනය කළ යුතු යැයි විධාන කළ හැකි ය;

(ඈ) යම් නගර සභාවක්, ඒ වෙනුවට වෙනත් යම් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේ කාර්යය සඳහා, විසුරුවා හැරිය හැකි ය.

අලුත් නගර සභාව පවත්නා නගර සභාවේ අනු ප්‍රාප්තිකයා වන බව.

*16. විසුරුවා හරින ලද යම් නගර සභාවක් වෙනුවට 14 වන වගන්තිය යටතේ යම් අලුත් නගර සභාවක් සංස්ථාපනය කරන ලද අවස්ථාවක—

(අ) විසුරුවා හරින ලද නගර සභාවක සංස්ථාපනය කරනු ලැබූ නගරය හෝ නගරයේ යම් කොටසක්, අලුත් නගර සභාව සංස්ථාපනය කරන ලද නගරයේ පරිපාලන සීමාවන් තුළට ඇතුළත් වන ප්‍රමාණයට, එකී නගරයට හෝ නගරයේ ඒ කොටසට සම්බන්ධ සියළු කාර්යයන් සඳහා අලුත් නගර සභාව, එය සංස්ථාපනය කරන ලද දිනයේ සිට විසුරුවා හරින ලද නගර සභාවේ අනුප්‍රාප්තිකයා විය යුතු ය;

(ආ) අලුත් සභාවේ පරිපාලන සීමා ඇතුළත පිහිටියා වූ සහ එකී විසුරුවා හරින ලද සභාවට අයත් වූ සියලු දේපළ ද, එකී විසුරුවා හරින ලද සභාවේ සියලු අයිතිවාසිකම්, බලතල, යුතුකම්, ණය, වගකීම් සහ බැඳීම් අලුත් සභාවේ පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයකට සම්බන්ධ වන ප්‍රමාණයකට, ඒවා ද අලුත් සභාව සංස්ථාපනය කරනු ලැබූ දිනයේ සිට අලුත් සභාවට පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) යම් ප්‍රඥප්තියක හෝ එය යටතේ කරන ලද යම් නියමයක, සාදන ලද යම් රීතියක, නියෝගයක හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ එය අනුව ලියා අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද ලේඛනයක හෝ සාධන පත්‍රයක, එකී විසුරුවා හරින ලද සභාව ගැන කර ඇති සියලු සඳහන් කිරීම්, එකී විසුරුවා හරින ලද සභාවේ පරිපාලන සීමා ඇතුළත පිහිටියා වූ ද අලුත් සභාවේ පරිපාලන සීමා තුළට ඇතුළත් කළ යුතු වූද යම් ප්‍රදේශයක කාර්යයන් සඳහා අලුත් සභාව ගැන කරන ලද සඳහන් කිරීම් ලෙස තේරුම් ගත යුතු ය;

* 15 වන වගන්තිය ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් ඉවත් කරන ලදී.





(ඈ) යම් පළාත් පාලන ආයතනයක් හෝ පළාත් පාලන ආයතන ගැන 236 වන වගන්තියේ සිට 245 වන වගන්තිය දක්වා වූ වගන්තිවල කරනු ලැබ ඇති සියලු සඳහන් කිරීම්, විසුරුවා හරින ලද සභාව ගැන කරන ලද සඳහන් කිරීම වූ විටක පවතින ආකාරයෙන්, ඒ වගන්තිවල සියලු විධිවිධාන අලුත් සභාව සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## සභා රැස්වීම් සහ සභා රැස්වීම් කටයුතු

සභාපතිවරයා සහ උප සභාපතිවරයා. [1977 අංක 24 § 125.]

*19. (1) සභිකයන් විය යුතු වූ ද තත්කාලයේ අදාළ ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගනු ලැබුවාවූ ද සභාපතිවරයෙකු හා උප සභාපතිවරයකු ඒක් එක් නගර සභාව සඳහා විය යුතු ය.

(2) නගර සභාවක සභාපතිවරයා හෝ උප සභාපතිවරයා එම ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් මිස, සභාවේ ධුර කාල සීමාව තුළ ධුරය දැරිය යුතු ය. සභාපතිවරයකු හෝ උපසභාපතිවරයකු ස්වකීය ධුරය හිස් කළ කවර අවස්ථාවක වුව ද ඔහු සභිකයකු ව සිටීම ද ඒ සමග ම අවසන් වන්නේ ය.

(3) නගර සභාවක සභාපතිවරයා, 170අ වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර සභාව විසින් කළ යුතු යැයි හෝ ඉටු කළ යුතු යැයි මේ ආඥා පනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් විධානය කර ඇති හෝ බලය පැවරී ඇති සියලු විධායක ක්‍රියා සහ වගකීම්, පද සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ චේතනාවෙන් පෙනී යන්නේ නම් මිස, සභාපතිවරයා විසින් කළ හැකි ය, නැතහොත් ඉටු කළ හැකි ය.

(4) මේ ආඥාපනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් සභාපතිවරයා වෙත පිරිනැමී ඇති, නියම වී ඇති හෝ පැවරී ඇති බලතල, කටයුතු හෝ කාර්ය අතුරින් කිසිවක් සභාපතිවරයා විසින්, උප සභාපතිවරයාට හෝ ලේකම්ට හෝ සභාවේ යම් නිලධරයකුට හෝ ලිඛිත නියමයක් මගින් පවරා දිය හැකි ය.

(5) සභාපතිවරයාගේ නියමයක් මගින් තමා වෙත පවරා දෙනු ලැබූ යම් බලයක්, කාර්යයක්, කටයුත්තක් හෝ උපසභාපතිවරයා විසින් හෝ ලේකම් විසින් හෝ වෙන යම් නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සභාපතිවරයාගේ විධාන යට හා පාලනයට යටත් ව විය යුතු අතර, එකී නියමයෙහි දැක්වෙන යම් කොන්දේසිවලට සහ සීමා කිරීම්වලට යටත් විය යුතු ද එහි දැක්වෙන කාර්යයට හෝ කාර්යයන්ට සීමා විය යුතු ද වන්නේ

* 17 වන සහ 18 වන වගන්ති ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනත මගින් ඉවත් කරන ලදී.

ය. තව ද එයින් යම් පවරාදීමක් සභාපතිවරයාගේ නියමයක් මගින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කවර අවස්ථාවක දී වුව ද කළ හැකි ය.

(6) සභාපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ දිනයෙන් ආරම්භ ව නව සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලබන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ හෝ රෝගාතුර වීම නිසා නැතහොත් වෙන යම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා සභාපතිවරයා පැමිණ නොසිටින කාල සීමාව තුළ උපසභාපතිවරයා විසින්, සභාපතිවරයා ක්‍රියාත්මක කරන හෝ ඉටු කරනා බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

(7) නගර සභාවක සභාපතිවරයාගේ ධුරය හිස් වූ සවර අවස්ථාවක වුව ද ඒ පුරප්පාඩුව ඇති වූ බව දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයාට සභාවේ ලේකම් විසින් ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එම දැනුම් දීම ලැබුණු විට, ඒ පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් තත් කාලයෙහි අදාළ ලිඛිත නීතියේ විධිවිධාන වලට අනුකූල ව එම පුරප්පාඩුව පිරවීමට ඡන්ද විමසීම් නිලධරයා ක්‍රියා කර ගෙන යා යුතු ය.

සභාපතිවරයා සහ උප සභාපතිවරයා සාමදාන විනිශ්චය කරුවන් සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරුන් වියයුතු බව.

*23. එක් එක් නගරයක නගර සභාවේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා, ස්වකීය ධුර කාලය තුළ එකී නගරය පිහිටි දිස්ත්‍රික්කය තුළ ඒ දිස්ත්‍රික්කය සඳහා නිල බලයෙන් පත් වන සාමදාන විනිශ්චයකාරවරයකු සහ නිල නොලත් මහේස්ත්‍රාත්වරයකු විය යුතු ය.

රැස්වීම්වල මූලාසන දැරීම.

24. නගර සභාවක සභාපතිවරයා සභාවේ සියලු රැස්වීම්වල මූලාසන දැරිය යුතුය. සභාපතිවරයා පැමිණ නොසිටි විටක උපසභාපතිවරයා මූලාසන දැරිය යුතු අතර, උපසභාපතිවරයා පැමිණ නොසිටි විටක, පැමිණ සිටින සභිකයන් විසින්, ඒ රැස්වීමේ දී මූලාසන දැරිය යුතු සභාපති ලෙස තෝරා පත් කරනු ලැබිය හැකි සභිකයකු මූලාසන දැරිය යුතු ය.

සභාවේ රැස්වීම, ඒවා කැඳවිය හැක්කේ කෙලෙස ද, කවදා ද යනාවග.

25. (1) කටයුතු කිරීම සඳහා සභාව විසින් නියම කරනු ලැබිය හැකි සෑම මසක ම යම් දිනක හෝ දිනවල හෝ නගර සභාවේ සාමාන්‍ය රැස්වීම පැවැත්විය යුතු ය.

(2) සභාපති වරයා විසින් රැස්වීමක් කැඳවීම යෝග්‍ය යැයි ඔහු සිතන සෑම විටක ම එසේ කරනු ලැබිය හැකි අතර, සභාවේ යම් සභිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් ලියවිල්ලකින්, ඒ ලියවිල්ලේ සඳහන් යම් කාර්යයක් සඳහා විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ඉල්ලා සිටින ලද කවර විටක වුව ද ඒ කාර්යය සඳහා නොපමාව

* 20 වන, 21 වන සහ 22 වන වගන්ති ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරණ පනත මගින් ඉවත් කරන ලදි.



විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය. එබඳු යම් විශේෂ රැස්වීමක් සඳහා නියම කරන ලද දිනයට දින දෙකකට කලින් දැන්වීමක් සභාවේ එක් එක් සභිකයාට දිය යුතු ය. නැතහොත් සභිකයාගේ වාසස්ථානයෙහි තැබිය යුතු ය.

සභාවේ බලතල බහුතරය වෙත පැවරීම. ගණ පූරණය.

26. (1) නගර සභාවක යම් රැස්වීමක ගණ පූරණය විය යුත්තේ එම රැස්වීම් දිනයෙහි දී සභික ධුරය දරන සභාවේ සභිකයන් අතුරින් තුනෙන් එකකි.

(2) නගර සභාවක සභිකයන් විසින් තීරණය කිරීමට මේ ආඥා පනතින් හෝ වෙන යම් ලිඛිත නීතියකින් හෝ බලය පැවරී ඇති සියලු කාරණා හෝ ප්‍රශ්න යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමකට පැමිණ සිටිමින් ඡන්දය දෙන සභිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. [1977 අංක 24 § 127.]

(3) යම් රැස්වීමකට පැමිණ සිටින සභිකයන්ගේ ඡන්දය යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් එක හා සමාන ව බෙදී ගිය අවස්ථාවක දී එම රැස්වීමේ මූලාසන දරන සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට හෝ වෙනත් සභිකයාට, සභිකයකු වශයෙන් හිමි තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය. 1977 අංක 24 § 127.]

ලේකම්පත්කිරීම, ඔහුගේ බලතල සහ කාර්ය.

27. (1) සෑම සභාවක් විසින් ම, සභාවේ ලේකම් වශයෙන් කට යුතු කිරීම සඳහා සුදුසු හා නිසි තැනැත්තකු පත් කළ යුතු ය.

(2) නගර සභාවේ ලේකම් සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුතු අතර මේ ආඥාපනතින් හෝ 193 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලින් හෝ තත් කාලයෙහි බල පවත්නා වෙන යම් ලිඛිත නීතියක් හෝ තමා වෙත පිරිනැමී ඇති හෝ නියම වී ඇති බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය. [1977 අංක 24 §128.]

(3) මරණය නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ධුරයෙන් පහ කරනු ලැබීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා සභාපති ධුරය හා උපසභාපති ධුරය යන ධුර දෙක ම හිස් වුවහොත්, උපසභාපති ධුරය හිස්වීමත් නව සභාපතිවරයකු තෝරා පත් කර ගැනීමත් අතර කාලසීමාව තුළ, (2) වන උපවගන්තියේ සඳහන් බලතලවලට අත් රේඛාව, සභාවේ ලේකම්, කොමසාරිස්වරයාගේ අනුමතයට යටත් ව සහ 193 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට හා කොන්දේසිවලට යටත් ව, සභාව වෙනුවෙන් වියදම් දැරීමට ද පොදු අරමුදලින් ගෙවීම් කිරීමට ද සභාපතිවරයාගේ බලතල, කටයුතු හා කාර්ය අතුරින් කොමසාරිස් වරයා විසින් නියම කරනු ලබන හෝ ඉහත කී පරිදි රීතිවලින් නියම කරනු ලබන බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හා ඉටු කිරීමට ද බලය ඇත්තේ ය. [1977 අංක24 §128.]

සභාවේ රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තා, පොත්වල සටහන් කිරීම.

28. නගර සභාවේ සියලු ක්‍රියා, නියම සහ රැස්වීම් කටයුතු, ඒ කාර්යය සඳහා තබාගත යුතු පොත්වල සටහන් කළ යුතු අතර, තත් කාලයේ සභාපතිවරයා විසින් ඒවා අත්සන් කළ යුතු ය. තවද, එවිට ඒ සියලු ක්‍රියා, නියම සහ රැස්වීම් කටයුතු මුල් ක්‍රියා, නියම සහ රැස්වීම් කටයුතු ලෙස සැලකිය යුතු සහ පිළිගත යුතු අතර, එකී පිටපතක් හෝ ඉන් ලබාගත් උද්ධෘතයක්, එය සැබෑ පිටපතක් යැයි හෝ උද්ධෘතයක් යැයි සභාවේ සභාපතිවරයා හෝ ලේකම් විසින් අත්සන් කර සහතික කරනු ලැබ තිබේ යැයි හැඟෙනහොත්, යම් අධිකරණයක දී සාක්ෂි වශයෙන් ඒවා ආවේශ විය යුතු ය.

කාරක සභා.

29. (1) නගර සභාවක් විසින්, සභාවේ බලතල, කාර්ය හෝ වගකීම් හෝ සභාවේ සැලකිල්ලට භාජනව ඇති යම් කරුණක් සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සභාවේ සභිකයන්ගෙන් ම සමන්විත වූ හෝ අඩක් සභාවේ සභිකයන්ගෙන් ද අඩක් නගරයේ සෙසු වැසියන්ගෙන් ද සමන්විත වූ කාරක සභා කලින් කල පත් කරනු ලැබිය හැකි අතර, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි උපදෙස් වලට සහ කොන්දේසිවලට යටත්ව, යම් ණයක් ලබා ගැනීමට හෝ යම් වරිපනම් ගාස්තුවක් පැනවීමට හෝ යම් බද්දක් අය කිරීමට හෝ බලය හැර, සභාවේ බලතල කිසිවක් හෝ කාර්ය කිසිවක් සභාව විසින් එකී කාරක සභාවට කලින් කල පවරනු ලැබිය හැකි ය.

(2) යම් නගර සභාවකට සෙසු යම් නගර සභාවක් හෝ යම් මහා නගර සභාවක් සමග හවුල් සම්බන්ධතාවක් ඇති යම් කරුණක කාර්යය සඳහා ඒකාබද්ධ කාරක සභාවක් සංස්ථාපනය කිරීම සඳහාත් එකී ඒකාබද්ධ කාරක සභාවට සභාවේ සභිකයන් පත් කිරීම සඳහාත්, යම් ණයක් ලබා ගැනීමට, යම් වරිපනම් ගාස්තුවක් අය කිරීමට හෝ බද්දක් පැනවීමට ඇති බලය හැර, ස්වකීය බලතල වලින් හෝ කාර්යවලින් හෝ කිසිවක් එකී ඒකාබද්ධ කාරක සභාවට පැවරීම සඳහාත් එම නගර සභාව විසින් එකී සෙසු නගර සභාවේ හෝ එකී මහ නගර සභාවේ අන්‍යෝන්‍ය එකගත්වය ඇතිව, විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

සභික ධුර හිස්වීම නිසා හෝ සභිකයන්ගේ නොපැමිණීම නිසා හෝ සභාවේ ක්‍රියා බල රහිත නොවිය යුතු බව.

30. ගණපූරණය සම්බන්ධ 26 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ ආඥාපනත හෝ සෙසු යම් ලිඛිත නීතියක් හෝ යටතේ කරන ලද හෝ තීරණය කරන ලද කිසිවක්, එය කරන ලද හෝ තීරණය කරන ලද වේලාවේදී, 5 වන වගන්තිය යටතේ එකී සභාව සඳහා නියමිත සම්පූර්ණ සභික සංඛ්‍යාව තෝරී පත් නොවී තිබීමේ හෝ යම් සභිකයකු සභාවට පැමිණ නොසිටීමේ හෝ සභික සංඛ්‍යාවෙහි යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ හේතුව නිසා ම බල රහිත නොවිය යුතු අතර බල රහිත වී ඇති ලෙස නොසැලකිය යුතු ය.



## II වන කොටස

### නගර සභාවල තත්ත්වය, බලතල සහ කාර්ය

නගර සභා සංස්ථා විය යුතු බව.

31. සෑම නගර සභාවක් ම අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සභාව සංස්ථාපනය කළ නියමය මගින් හෝ ඒ නියමය මඳ ලෙස වෙනස් කරමින් කරන ලද යම් තදනන්තර නියමයක් මගින් ඒ සභාවට වෙන් කොට දී තිබිය හැකි නාමයෙන් ඒ සභාව විසින් හෝ ඒ සභාවට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

### සාමාන්‍ය බලතල සහ කාර්ය

නගර සභාව වෙත සතු කරනු ලබන ඉඩම්.

32. එක් එක් නගරයක සීමාවන් ඇතුළත පිහිටා තිබිය හැකි වූ ද, නගර සභාවට හෝ නගර සභාව අනුප්‍රාප්තිකයා වන යම් පළාත් පාලන ආයතනයකට, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ හෝ අග්‍රාණ්ඩුකාරවරයාගේ අනුමතය ඇතිව, 33 වන වගන්තියේ විස්තර කර ඇති ආකාරයෙන් භාරදිය හැකි හෝ භාර දෙනු ලැබ තිබිය හැකි වූ ද පහත සඳහන් වර්ගවල සියලු නිශ්චල දේපළ එකී එක් එක් නගරයක නගර සභාව වෙත සතු කළ යුතු ය:—

(අ) මුඩු බිම් සහ එළිමහන් ස්ථාන;

(ආ) කලු ගල්, කබුක් ගල් සහ බොරලු වලවල්;

(ඇ) පොදු තටාක සහ ළිංවල්;

(ඈ) පොදු වැව්, පොකුණු සහ ඇලවල්;

(ඉ) ගොඩනැගිලි සහිත හෝ රහිත රජයේ ඉඩම්.

ඒ ඉඩම් සතු කිරීම, පරිපාලනය කිරීම ආදී කටයුතුවල ක්‍රමය.

33. (1) 32 වන වගන්තියේ සඳහන් යම් නිශ්චල දේපළක් භාර දීමට බලය පවරන ලද තැනැත්තා හෝ තැනැත්තන් විසින් සහ නගර සභාවේ හෝ සභාව අනුප්‍රාප්තිකයා වන යම් පළාත් පාලන ආයතනයක සභාපතිවරයා විසින් අත්සන් කරන ලද පැවරුම් නියමයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, එකී දේපළ සහ එකී දේපළෙහි අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාව අවස්ථාවෝචිත පරිදි නගර සභාව වෙත හෝ පළාත් පාලන ආයතනය වෙත සතු කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතුවාක් මෙන් ම සියලු කල්හි ප්‍රමාණවත් ව තුබූ ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ හෝ 32 වන වගන්තියේ සඳහන් කිසිමකින්—

(i) එබඳු යම් නිශ්චල දේපළකට රජයට ඇති යම් අයිතිවාසිකමකට හෝ හිමිකමකට හෝ පොදු කාර්යයන් සඳහා එකී දේපළ යම් විටක යළි ලබා ගැනීමට හෝ බැහැර කිරීමට රජයට ඇති අයිතිවාසිකමට හෝ බලපෑමක් හෝ හානියක් සිදුවන්නේ යැයි; හෝ

(ii) රජය වෙනුවෙන් ඉඩම් පවරනු ලබන්නේ යම් යුද්ධ හමුදා බලධරයකු වෙත ද ඒ යුද්ධ හමුදා බලධරයාට එබඳු යම් දේපළකට තිබෙන හෝ තිබිය හැකි යම් අයිතිවාසිකමකට, හිමිකමකට හෝ සම්බන්ධතාවකට බලපෑමක් හෝ හානියක් සිදුවන්නේ යැයි ; හෝ

(iii) එකී දේපළට අදාළ ඉහත කී පැවරුම් නියමයේ, සහතිකයේ හෝ වෙනත් ලේඛනයේ සඳහන් කර තිබිය හැකි නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව හැර අන්‍යාකාරයකින් එබඳු යම් දේපළක් බැහැර කිරීමට සභාවට බලය ඇවරෙන්නේ යැයි ; හෝ

(iv) එබඳු යම් නිශ්චල දේපළක්, යම් විටක සභාව විසින් රජයට ආපසු භාර දීම වැළකෙන්නේ යැයි හෝ

නොසැලකිය යුතු ය.

(2) නගර සභාවක් වෙත සතු කරනු ලැබ ඇති සියලු නිශ්චල දේපළ පරිපාලනය කළ යුතු අතර, ඉන් ලැබෙන ආදායම මේ ආඥාපනතේ කාර්යයන් සඳහා යෙදවීම සහ ප්‍රයෝජනයට ගැනීම කළ යුතු ය.

සභාව වෙත සතු කරනු ලබන වෙනත් දේපළ.

34. පහත සඳහන් පංතිවලට අයත් දේපළ ද මේ ආඥාපනතේ කාර්යයන් සඳහා එක් එක් නගර සභාව වෙත සතු කරනු ලැබිය යුතු ය :—

(අ) සභාව විසින් හෝ සභාව අනුප්‍රාප්තිකයා වන වෙනත් යම් පළාත් පාලන ආයතනයක් විසින් අත්කරගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් සභාව වෙත හෝ සභාව අනුප්‍රාප්තිකයා වන වෙනත් යම් පළාත් පාලන ආයතනයක් වෙත පවරන ලද සියලු පොදු උද්‍යාන, වතු සහ එළිමහන් සථාන සහ ඒවායෙ ඇති සියලු ඉදිකිරීම් සහ ව්‍යුහ සහ එකී උපකරණ සභාව වෙත හෝ සභාව අනුප්‍රාප්තිකයා වන යම් පළාත් පාලන ආයතනයක් වෙත එබඳු යම් දේපළක් පවරනු ලැබුයේ යම් භාරයකින් ද එකී භාරයේ නියමයන්ට ද, එසේ නැතහොත් යම් සාධන පත්‍රයක් මගින් නම්, සාධන පත්‍රයේ කොන්දේසිවලට ද සෑම විටම යටත් වේ ;

(ආ) (වෙන යම් ප්‍රඥප්තියක් යටතේ වෙනත් යම් අධිකාරියක් වෙත සතු කර තිබිය හැකි හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විශේෂයෙන් නිදහස් කරනු ලැබ ඇති හෝ පාරවල්, වීථි, ඇලවල් සහ පාලම් හැර) සියලු පොදු පාරවල්, වීථි, ඇලවල් සහ පාලම් ද, ඒවායේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ඉඩම් ද, ඒවායේ සියලු පදික වේදිකා, ගල් හෝ සෙසු ද්‍රව්‍ය ද, එමෙන් ම ඒ සඳහා සපයන ලද සියලු ඉදිකිරීම්, ද්‍රව්‍ය, ආම්පන්න සහ සෙසු දේ ;

(ඇ) මහජනයාගේ යහපත හෝ පහසුව උදෙසා මෙම ආඥාපනත යටතේ ගොඩනගනු ලැබිය හැකි, ඉදි කරනු ලැබිය හැකි හෝ සපයනු ලැබිය හැකි වූ හෝ යම් ඉවත් කරන ලද ප්‍රඥප්තියක් යටතේ ගොඩනගනු ලැබ, ඉදි කරනු ලැබ හෝ සපයනු ලැබ තිබිය හැකි වූ හෝ සභාව වෙත හෝ සභාව අනුප්‍රාප්තිකයා වන වෙනත් යම් පළාත් පාලන ආයතනයක් වෙත අන්‍යාකාරයකින් පවරනු ලැබිය හැකි හෝ පවරනු ලැබ තිබිය හැකි සියලුම පොදු වෙළඳ පළවල් සහ සියලුම කර්මාන්ත, ඉදිකිරීම් හෝ ව්‍යුහයන් සහ ඒවා සඳහා සපයා ඇති සියලු භූමි භාග, වෙන් කළ බිම්, අනුබද්ධ දේවල්, ද්‍රව්‍ය, ලී බඩු සහ උපකරණ ඉහත කී පරිදි වූ යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විටම යටත් ව ;

(ඈ) සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් සභාවේ හෝ සභාව අනුප්‍රාප්තිකයා වන වෙනත් යම් පළාත් පාලන ආයතනයක ප්‍රාදේශිය අරමුදලින් වැය කර ගොඩනගන ලද හෝ සපයන ලද හෝ සභාවට අන්‍යාකාරයකින් පවරනු ලැබිය හැකි වෙනත් සියලු පොදු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමි භාග, ඒවායේ අනුබද්ධ දේවල්, ද්‍රව්‍ය, ලී බඩු සහ උපකරණ, ඉහත කී පරිදි යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විටම යටත් ව ;

(ඉ) සභාව සමග වූ ගිවිසුමකින් අන්‍යාකාරයකින් හැසිරවිය යුතු තාක් හෝ පෞද්ගලික දේපළ විය යුතු ලෙස හෝ පෞද්ගලික අයිතිවාසිකම්වලට යටත් විය යුතු ලෙස අන්‍යාකාරයකින් පෙනෙන තාක් හෝ හැර සභාව වෙත පවරා ඇති පාරවල්වල, වීථිවල හෝ පොදු ස්ථානවල හෝ ඒවා අසල හෝ ඒවාට අයත්ව ඇති සියලු ලාම්පුවල, ලාම්පු කොකුවල, ලාම්පු කණුවල, සොරොව්වල, වේලිවල, නළවල, කණුවල, දම්වැල්වල, ජම්බාර කණුවල පිලිවල, සහ එවැනි වෙනත් ඉදිකිරීම්වල සහ දේවල්වල සහ ඒවාට අයත් වූ සියලු ද්‍රව්‍යවල, ලී බඩුවල සහ දේවල්වල අයිතිය.

ස්මාරක පිහිටුවීම සහ පාලනය කිරීම.
[1975 අංක 4 § 7.]

34අ. යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අමාත්‍යවරයා විසින් දෙන ලද පූර්ව අනුමතය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් ජනරජයට අයිති යම් ඉඩමක හෝ යම් පළාත් පාලන ආයතනයක් සතු කර ඇති හෝ පළාත් පාලන ආයතනයකට අයිති යම් ඉඩමක ස්මාරකයක් පිහිටුවීම නොකළ යුතු ය.

[1975 4 අංක § 9.]

මේ වගන්තියේ "ස්මාරකය" යන්නට ජීවත් වන හෝ මිය ගිය යම් තැනැත්තකු සිහි කිරීම පිණිස පිහිටුවනු ලබන යම් ස්මාරකයක්, කුළුණක්, කණුවක් හෝ යම් ඉදිකිරීමක් ඇතුළත් වන නමුදු යම් සුසාන භූමියක හෝ මිනී පිටියක පිහිටුවනු ලබන යම් ඉදිකිරීමක්, සොහොන් කොතක් හෝ කුරුසියක් ඊට ඇතුළත් නොවේ.

ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නම් කිරීම.
[1975 අංක 4 § 58]

**34ආ.** අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස යම් නගර සභාවක් විසින් යම් ප්‍රසිද්ධ උද්‍යානයක්, ක්‍රීඩා පිටියක්, පුස්තකාලයක්, කියවීම් ශාලාවක්, ක්‍රීඩාංගනයක්, ඔරලෝසු කණුවක්, පාලමක් හෝ නාන ලිඳක් නම් කිරීම නීත්‍යනුකූල නොවන්නේ ය.

සාමාන්‍ය කාර්ය.

**35.** එක් එක් නගරයේ නගර සභාවට ඒ නගරයේ පරිපාලන සීමා ඇතුළත පහත දැක්වෙන කාර්ය පැවරේ:—

(අ) සභාව වෙත සතුව ඇති හෝ එහි කළමනාකාරිත්වය යටතට පත්ව ඇති සියලු පොදු මංමාවත් සහ එළිමහන් භූමි නඩත්තු කිරීම සහ ශුද්ධ පවිත්‍ර කිරීම;

(ආ) සියලු පෞද්ගලික වීථි නිසි සේ නඩත්තු කරන ලෙස, ශුද්ධ පවිත්‍ර කරන ලෙස හා අලුත්වැඩියා කරන ලෙස බල කිරීම;

(ඇ) වීථි සැලසුම් කොට පළල් කිරීමෙනුත්, එළිමහන් භූමි වෙන් කිරීමෙනුත් පොදු වැඩ දියුණු කිරීම් සැලසීමෙනුත් නගරයේ වර්ධනය සහ දියුණුව සැලැස්වීම හා එය අධීක්ෂණය කිරීම;

(ඈ) සියලු කරදර නතර කිරීම;

(ඉ) පවත්වාගෙන යෑමට මේ ආඥාපනත යටතේ සභාවට බලය ලැබී ඇත්තා වූ ද මහජනයාගේ සුභ සිද්ධිය, සැප විහරණය සහ පහසුව සඳහා අවශ්‍ය වූ ද යම් පොදු උපයෝගි සේවාවක් (සභාවේ සම්පත්වල ප්‍රමාණය අනුව) පිහිටුවා පවත්වාගෙන යෑම;

(ඊ) පොදුවේ මහජන සෞඛ්‍යය, සුභ සාධනය සහ සැප විහරණය ද නගරයේ දියුණුව, සනීපාරක්ෂාව සහ පහසුකම් ද ප්‍රවර්ධනය කිරීම.

සාමාන්‍ය බලතල.

**36.** මේ ආඥාපනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා නගර සභාවකට, (එයට විශේෂයෙන් පවරා ඇති වෙනත් යම් බලතලවලට හානියක් නොමැති ව) පහත සඳහන් සවයුතු කිරීමේ බලතල තිබිය යුත්තේ ය:—

[1984 අංක 10 § 2]

**(අ)** අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ කලින් කල එබඳු යම් නිලධරයකු හෝ සේවකයකු අස් කිරීම සහ යම් නිලධරයකුට හෝ සේවකයකුට, සභාවට සුදුසු යැයි පෙනී ගිය හැකි වැටුපක්, දීමනා හෝ පාරිශ්‍රමිකයක් වෙන් කිරීම:





**එසේ වුව ද, ඉහත කී විධිවිධාන, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයකු වන හෝ සාමාජිකයකු වන්නේ යැයි සලකනු ලබන ඒ සභාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට සහ එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.**

(ආ) මාතෘදාරකාභිවෘද්ධි සේවාවන් සඳහාත්, සභාව විසින් පිහිටුවනු ලැබ ඇති යම් සූතිකා සේවයක කාර්යයන් සඳහා වින්නඹු මාතාවන් පුහුණු කිරීම සඳහාත්, නිවාස යෝජනා ක්‍රම සඳහාත්, පුණ්‍ය කටයුතු හෝ වර්ෂාවෙන්, ජල ගැලීම් වලින්, ගිනිගැනීම්වලින්, භූමි කම්පාවලින්, දුර්භික්ෂ වලින් හෝ වසංගත රෝගවලින් සිදු වන ආපදාවලට සහනය සැලසීමේ ක්‍රම සඳහාත් ප්‍රාදේශීය අරමුදලින් යම් කොටසක් වැය කිරීම;

(ඇ) වෙන යම් අධිකාරියක් සහ සභාවේ විවිධ කාර්යයන් සඳහා යම් නිලධරයකු හෝ සේවකයකු පත් කිරීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සඳහා ඒ අධිකාරිය සමග යම් ගිවිසුමකට එළඹීම;

(ඈ) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් බද්දට ගැනීම හෝ මිලට ගැනීම;

(ඉ) (i) සභාවට අයිති හෝ 32 වන වගන්තියේ හෝ 34 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නොවන අන්‍යාකාරයකින් එය වෙත සතු කර ඇති යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ සභාවට පවරා දුන් හෝ එය වෙත සතු කළ සාධන පත්‍රයෙන්, එය විකිණීම, හුවමාරු කිරීම, කුලියට දීම හෝ බදු දීම තහනම් කළහොත් හැර එකී සාධන පත්‍රයේ නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව එකී ඉඩම හෝ ගොඩනැගිල්ල විකිණීම, හුවමාරු කිරීම, කුලියට දීම හෝ බදු දීම;

(ii) 32 වන වගන්තියේ හෝ 34 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එය වෙත සතු කොට ඇති සහ තත් කාලයෙහි යම් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය නොකරන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ අමාත්‍යවරයාගේ පූර්ව අනුමතයට යටත්ව සහ එකී ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් 33 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද හෝ දෙන ලද පැවරුම් නියමයේ, සන්නිකයේ හෝ සටහනේ හෝ තක්සේරුකරු විසින් ලියා අත්සන් කරන ලද අන්තිම තැමනි පත්‍රයේ,

ඔප්පුවේ හෝ නෑගි කිරීමේ හෝ භාරය පැවරීමේ සාධන පත්‍රයේ සඳහන් කරනු ලැබිය හැකි නියමයන්ට සහ කොන්දේසිවලට සෑම විටම යටත්ව, කුලියට දීම හෝ බදු දීම ;

(ඊ) කරනු ලැබිය යුතු යම් වැඩක් හෝ සලසනු ලැබිය යුතු සේවයක් හෝ සපයනු ලැබිය යුතු භාණ්ඩ හෝ ද්‍රව්‍ය සඳහා යම් තැනැත්තකු සමග මේ ආඥාපනතේ ප්‍රකාශිත විධිවිධානවලට යටත්ව, යම් ගිවිසුමකට එළඹීම ;

(උ) කරදර අනාවරණය කර ගැනීම සහ නතර කිරීම සඳහාත්, මේ ආඥාපනත හෝ එ යටතේ කරන ලද අතුරු ව්‍යවස්ථා හෝ රීති උල්ලංඝනය කිරීම් අනාවරණය කර ගැනීම, ඒවා වැළැක්වීම සහ නතර කිරීම සඳහාත්, ඉඩම්වල හෝ ගොඩනැගිලිවල අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් හෝ පැහැර හරිනු ලැබ ඇති හෝ පැහැර හරිනු ලැබ ඇතැයි හෝ සැලකිය හැකි වූ ද මේ ආඥාපනත යටතේ කළ යුතු වූ ද ක්‍රියා ඉටු කිරීම සඳහාත් අවශ්‍ය විය හැකි පරිදි, තත් කාර්යය සඳහා බලය පවරා ඇති සභාවේ නිලධරයන් සහ ඔවුන් කැටුව යන සේවකයන් සහ කම්කරුවන් ඒ ඉඩම්වලට හෝ ගොඩනැගිලිවලට ඇතුළු වී පරීක්ෂණ පැවැත්වීම ;

(ඌ) සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකු විසින්, මේ ආඥාපනතේ කාර්ය යන් කිසිවක් සඳහා සභාපතිවරයා විසින් අවශ්‍ය ලෙස සලකනු ලැබිය හැකි සියලු පරීක්ෂණ පවත්වනු ලැබීම සහ එකී සියලු පරීක්ෂණවල කාර්යයන් සඳහා දිවුරවීම සහ සාක්ෂිකරුවන් කැඳවීම ;

[1987 අංක 18 §2]　(ඍ) (i) නගරයේ ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, ක්‍රීඩාභූමි, නේවාසිකාගාර, ගුරු නිල නිවාස, ක්‍රීඩා උපකරණ සහ පුස්තකාල පහසුකම් වැනි අධ්‍යාපන පහසුකම් සැපයීම සඳහා වූ වැඩ සටහනක් පිළියෙල කර උචිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ii) නගරයේ පාසැල් විවෘත කිරීම, වසා දැමීම, ඒක බද්ධ කිරීම, නම් කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් උචිත බලධරයාට නිර්දේශ කිරීම ;

(ඎ) නගරය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක සීමා ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවන ලද සංවර්ධන සභාව විසින් නගර සභාව වෙත පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම ; නවද ඒ සංවර්ධන සභාව විසින් නගර සභාව වෙත භාර කරන ලද යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩක් ක්‍රියාවේ යෙදීම ;



(එ) සභාවේ හෝ මහජනයාගේ හෝ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා තම යුතුකම් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කරන අවස්ථාවල දී සභාවේ සභිකයන් හෝ නිලධරයන් හෝ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා පැවරීමට අවශ්‍ය ලෙස පෙනී යිය හැකි යම් නඩු කටයුත්තක් පැවරීම හෝ විත්ති වාචක ඉදිරිපත් කිරීම අවශ්‍ය ලෙස පෙනී යිය හැකි නඩු යුත්තක දී විත්ති වාචක ඉදිරිපත් කිරීම ;

(එඑ) 209අ වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් පිළියෙළ කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව, ඒ කමිටුව විසින් කරනු ලබන නිර්දේශයක් මත දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන යම් නිවාස ස්ථානයක පදිංචිකරුවන්ට ඒ ගෙවීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබීම ;　[1981 අංක 61 §13.]

(එඑඑ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව—　[1986 අංක 39 §66.]

(i) මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙලින් යම් මහා නගර සභාවක් විසින් හෝ නගර සභාවක් විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන, අවස්ථාවෝචිත පරිදි පොදු සේවාවන් හෝ මහජන උපකාරී සේවාවන් සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍රෝපකරණ, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය සහ බඩු නිෂ්පාදනය සහ සැපයීම සඳහා වාණිජ සහ කර්මාන්ත ව්‍යවසායවල නිරත වීම ; සහ

(ii) ඒ යන්ත්‍රෝපකරණ, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු, සභාව විසින් තීරණය කොට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන මිල ගණන්වලට වෙනත් යම් මහා නගර සභාවකට හෝ නගර සභාවකට හෝ මහජනයාට විකිණීමට.

(ඒ) සාමාන්‍යයෙන් සභාවේ බලතල සහ කාර්ය එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කිරීම.

වාණිජ හා කාර්මික ව්‍යවසාය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.
[1983 අංක 13 § 4.]

**36අ.** (1) අමාත්‍යවරයා විසින් 36 වන වගන්තියේ (එඑඑ) ඡේදය යටතේ යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක්—

(අ) ඒ ව්‍යවසායේ ආර්ථික ජීව්‍යතාවය ;

(ආ) ඒ ව්‍යවසාය ක්‍රියාත්මක වීමෙන් යම් නගර සභාවකට හා මහජනයාට අත් විය හැකි ප්‍රතිලාභ ;

(ඇ) ඒ ව්‍යවසායේ නියුක්ත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සලකා බැලීමෙන් පසු අනුමත කරනු ලැබිය හැකි ය.

(2) 158 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පාර්ලිමේන්තුව විසින් නගර සභාවකට වෙන් කරන ලද කිසි ම මුදල් ප්‍රමාණයක් හා 158 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නගර සභාවකට වෙන් කරන ලද කිසි ම ප්‍රදානයක් යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක් පිහිටුවීමේ හෝ නඩත්තු කිරීමේ කාර්ය සඳහා ඒ සභාව විසින් ප්‍රයෝජනයට නොගත යුතුය.

(3) නොමනා ලෙස පාලනය කිරීමේ හේතුවෙන් යම් නගර සභාවක යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක් නොකඩවා ක්‍රියාත්මක කිරීම ඒ සභාවේ යහපතට හානිකර විය හැකි බව හෝ සභාවට මූල්‍ය පාඩුවක් වීමට ඉඩ ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් සභාවේ අදහස් විමසීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඒ ව්‍යවසාය ක්‍රියාත්මක කිරීම අවසන් කොට ව්‍යවසායයේ සියලු දේපළ, ලේඛන හා වත්කම් තම භාරයට ගෙන ඒ නියමය බලාත්මක කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීමට සභාවට විධාන කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් කලින් කල යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක නියුක්ත වී සිටින යම් නගර සභාවකට එකී ව්‍යාපාරය පවත්වා ගෙන යාම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් කලින් කල ඔහු විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක, ව්‍යවසායයේ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සැපයීමට සභාවට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මැණුම් සඳහා බිලය පැවරීමට ඇති බලය.

37. (1) යම් ප්‍රාදේශීය පොදු කාර්යයක් සඳහා යම් පෞද්ගලික ඉඩම්, ගොඩනැගිලි හෝ ස්ථාන පරීක්ෂා කිරීම හෝ මැනීම අවශ්‍ය යැයි යම් නගර සභාවක සභාපතිවරයාට පෙනී යන කවර විටක වුව ද, එකී මැණීම සඳහා සභාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට සභාපතිවරයා විසින් විධානය කරනු ලැබීම නීත්‍යනුකූල වන අතර එවිට එකී නිලධරයා හෝ සේවකයා සහ ඔහුගේ කම්කරුවන් එකී ස්ථානයට ඇතුළු වී එහි දී පහත සඳහන් ක්‍රියා අතුරෙන් කිසිවක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) එකී ඉඩම මැණීම සහ ලෙවල් ගැනීම;

(ආ) යටි පස කැණීම හෝ හෑරීම;

(ඇ) එකී පොදු කාර්යය සඳහා සුදුසු වන සේ ඉඩම සකස් කර ගෙන තිබේ දැයි නිසැකව දැන ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම;

(ඈ) අත් කරගැනීමට නියමිත යම් ඉඩමක මායිම් හෝ වීථි රේඛා හෝ කිරීමට යෝජිත යම් කර්මාන්තයක රේඛා දැක්වීම;



(ඉ) පවත්නා ගොඩනැගිලිවල, ගස්වල, කණුවල, බිත්තිවල, වැට වල්වල හෝ සවි කරන ලද සෙසු ද්‍රව්‍යවල ස්ථාවර සලකුණු යෙදීමෙන් හෝ අවස්ථාවෝචිත පරිදි අලුත් සලකුණු සවි කිරීමෙන් හෝ අගල් කැපීමෙන් එකී ලෙවල්, මායිම් හෝ රේඛා ලකුණු කිරීම;

(ඊ) අන්‍යාකාරයකින් මිණුමක් පරිසමාප්ත කිරීමට හෝ ලෙවල් ගැනීමට හෝ මායිම් හෝ රේඛා ලකුණු කිරීමට නොහැකි අවස්ථාවක දී එබඳු වැඩකට මග අහුරන යම් බාධාවක් ප්‍රහීන කිරීම සහ ඉවත් කිරීම;

එසේ වුව ද, කරන ලද යම් අලාභයක් සඳහා සම්පූර්ණ වන්දිය ගෙවිය යුතු ය;

එසේ ම තව දුරටත්, පදිංචිකරුගේ ලිඛිත අනුමතය හෝ එකී අනුමතය නොදුනහොත් සභාපතිවරයාගේ අවසරය ඇතිව හැර කිසි ම නැවැත්තැනු යම් ගොඩනැගිල්ලකට හෝ වාසස්ථානයකට සම්බන්ධ යම් තොටු කළ ස්ථානයකට ඇතුළු නොවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ යම් ඉඩමක සවි කර ඇති සෑම ලකුණක් ම සභාවේ දේපළක් ලෙස සලකනු ලැබිය යුතු ය.

38. රුපියල් දස දහසක් ඉක්මවන වියදමක් යන මේ ආඥා පනතේ කාර්ය කිසිවක් සඳහා වූ යම් ගිවිසුමක් ලියවිල්ලක් බවට පත් කළ යුතුවාක් මෙන් ම එය සභාපතිවරයා විසින් අත්සන් කළ යුතු ය. තවද පහත දක්වන කරුණු එහි සඳහන් විය යුතු ය:— ගිවිසුම. [1984 අංක 48 § 3.]

(අ) කළ යුතු වැඩය, ඉටු කළ යුතු සේවය හෝ භාර දිය යුතු බඩු;

(ආ) පාවිච්චි කළ යුතු ද්‍රව්‍ය;

(ඇ) එකී වැඩය, සේවය, බඩු හෝ ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මිල;

(ඈ) වැඩය හෝ සේවය ඉටු කළ යුත්තේ හෝ බඩු හෝ ද්‍රව්‍ය සැපයිය යුත්තේ කුමන කාල සීමාවක් හෝ කාල සීමා ඇතුළත ද යන වග;

(ඉ) ගිවිසුම කඩ කළ විටක පැනවිය යුතු දණ්ඩනය.

39. (1) සභාපතිවරයා විසින් සභාවේ අනුමතය නොලබා රුපියල් දසදහසක් ඉක්මවන වියදමක් සිදු වන යම් වැඩක් හෝ රුපියල් දසදහසක් ඉක්මවන වියදමක් සිදු වන යම් වැඩක් හෝ වීමක් මුදල් වර්ෂයේ අවසානයත් අතර කාලයට වැඩි කාල සීමාවක් පවතින යම් ගිවිසුමකට ඇතුළු වීම හෝ සභාව වෙනුවෙන් නොකළ යුතු ය. සභාවේ අනුමතය. [1977 අංක 24 §120.] [1984 අංක 48 §4.]

(2) යම් ගිවිසුමක් අනුමත කිරීම සභාව විසින් පැහැර හැරිය හොත්, (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා සභාපතිවරයා විසින් කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව එම ගිවිසුමට ඇතුළු විය හැකි ය.

ටෙන්ඩර් සඳහා ප්‍රචාරක දැන්වීම. [1984 අංක 48 §5.]

40. යම් වැඩක් ක්‍රියාත්මක කිරීම සඳහා, යම් සේවයක් ඉටු කිරීම සඳහා, යම් බඩු හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා හෝ මේ ආඥා පනතේ කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය වෙන යම් කරුණක් සඳහා රුපියල් දස දහසක් ඉක්මවන වියදමක් යන යම් ගිවිසුම කට එළඹීමට පෙර, සභාවේ යෝජනා සම්මතයක් මගින් අන්‍යාකාර යකින් බලය පවරා තුබුණහොත් හැර, සභාපතිවරයා විසින් ප්‍රචාරක දැන්වීම් මගින් ටෙන්ඩර් කැඳවිය යුතු ය.

සාමාන්‍ය පොදු කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත් කරගැනීම.

41. යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් යොදවනු ලබන කාර්ය සඳහන් නොකොට, නගර සභාවක් විසින් සභාවේ පොදු කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත් කරගත හැකි ය.

ඉඩම් සහ ගොඩනැගිලි අනිවාර්යයෙන් අත් කරගැනීම.

42. නගර සභාවක කාර්ය සඳහා අවශ්‍ය වූ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආණ්ඩුව විසින්, නගර සභාව සඳහා අත්කර ගත හැකි ය.

යම් පොදු කාර්යයක් සඳහා භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීමට නගර සභාවට ඇති බලය.

43. නගර සභාව සංස්ථාපනය කරන ලද්දේ යම් නගරයක් සඳහා ද ඒ නගරයේ නිවැසියන්ගේ හෝ ඒ නිවැසියන්ගෙන් යම් කොට්ඨාසයකගේ සුභ සිද්ධිය සඳහා හෝ සභාව විසින් පරිපාලනය කරනු ලබන යම් පොදු සේවයක කාර්ය සඳහා යම් දේපළක් ලබා ගෙන එය භාරකාරත්වයේ තබා ගැනීම නගර සභාවක් විසින් කළ හැකි ය. තව ද යම් පොදු කාර්යයක් වෙනුවෙන් භාරකරුවකු ලෙස කටයුතු කිරීම ද ඒ සභාව විසින් කළ හැකි ය.

---

## III වන කොටස

### මංමාවත් පිළිබඳ බලතල සහ කාර්ය

#### මංමාවත්

මංමාවත් සහ ගමනාගමනය සඳහා නගර සභාව පොදු බලධාරියා විය යුතු බව.

44. (1) වෙන යම් බලධරයකු වෙත නීතියෙන් පවරා ඇති බලතල සහ මගකිරීම්වලට යටත්ව, එක් එක් නගරයක නගර සභාව, නගරයේ පරිපාලන සීමා ඇතුළත, ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත් සහ ගමනාගමනය පිළිබඳ කාර්ය සඳහා මේ ආඥා පනත යටතේත් නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත යටතේත්, තත් කාර්යය සඳහා කලින් කල පනවනු ලබන වෙන යම් ප්‍රඥප්තියක් යටතේත් සභාවට පවරා ඇති සියලු බලතල සහිත පොදු පරිපාලන අධිකාරිය විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියම යක් මගින් කලින් කල කළ හැකි විධානවලට යටත්ව, එක් එක් නගරයක නගර සභාව, නගරය ඇතුළත පිහිටා තිබෙන යම් ප්‍රසිද්ධ මංමාවතක් ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා වූ පරිපාලන අධිකාරිය විය යුතු අතර ප්‍රසිද්ධ මංමාත් ඔස්සේ වූ ගොඩනැගිලි, මංමාවත්වලට කර ඇති බාධාකිරීම්, මංමාවත් ප්‍රසර්පණය කිරීම්, මංමාවත්වලට හානි පැමිණවීම සහ මංමාවත්වලට කෙරෙන කරදර සම්බන්ධයෙන් 72 වන වගන්තියේ සිට 92 වන වගන්තිය දක්වා





වූ වගන්තිවලින් (ඒ වගන්ති දෙක ද ඇතුළුව) පවරා ඇති බලතල සහ කාර්ය, මෙකී කාර්යයන් සඳහා එබඳු යම් ප්‍රධාන මංමාවත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට ද ඒ නගර සභාවට හිමිකම තිබිය යුතු ය.

මංමාවත් සහ එළිමහන් භූමි සම්බන්ධයෙන් සභාවේ සාමාන්‍ය බලතල.

45. වෙන යම් අධිකාරියකට නීතියෙන් අයිති බලතලවලට සහ මගකිරීම්වලට යටත්ව, නගරය ඇතුළත වූ සියලුම මංමාවත් හෝ එළිමහන් භූමි සම්බන්ධ හෝ ඒ පිළිබඳව පැනනඟින සියලු පොදු අයිතිවාසිකම්, සම්බන්ධතා පහසුකම් ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහාත් පොදු කාර්යයන් සඳහා එකී මංමාවත් සහ එළිමහන් භූමි උපයෝගී කර ගැනීම, ක්‍රමවත් බවට පත් කර ගැනීම, සුදුසු වන ලෙස සකස් කර ගැනීම සහ වැඩිදියුණු කර ගැනීම සඳහාත් අවශ්‍ය සියලු පියවරවල් ගැනීම සෑම නගරයකම නගර සභාවක කාර්යය විය යුතු අතර එසේ සියලු පියවරවල් ගැනීමට එකී සෑම නගර සභාවකට ම මෙයින් බලය පවරනු ලැබේ.

නගර සභාව වෙත සතු කොට ඇති මංමාවත්.

46. නගරයක් ඇතුළත වූ, ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත්, වෙන යම් ප්‍රඥප්තියක් ප්‍රකාර එකී මංමාවත් ඒවකටත් එසේ සතු කර ඇති පමණට හැර, නගරයේ නගර සභාව වෙත සතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

කාලාපගමනය

47. කාලාපගමන ආඥාපනතේ විධිවිධාන හෝ සන්තකය හෝ භාවිච්චිය මගින් අයිතිවාසිකම් අත් කරගැනීම සම්බන්ධ වූ වෙන යම් නීතියක විධිවිධාන යම් නගරයක් ඇතුළත වූ පාරවල් සම්බන්ධ යෙන් අදාළ නොවිය යුතු ය; තව ද මේ ආඥාපනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර හෝ පසුව එකී යම් පාරක් හෝ ඉන් යම් කොට සක් යම් තැනැත්තකු විසින් කවර ආකාරයකින් හෝ සන්තකයේ සිටීමේ හෝ පාවිච්චි කිරීමේ හේතුව නිසා ඒ පාරෙහි හෝ ඒ කොට සෙහි අයිතිය, සන්තකය හෝ පාවිච්චිය සඳහා හෝ ඒ සම්බන්ධ යෙන් හෝ ඒ තැනැත්තාට තනි අයිතිවාසිකම් කිසිවක හිමිකම් නොලැබිය යුතු ය.

දැන්වීම්වල භාෂාව සහ භාර දිය යුතු පිළිවෙළ.

48. මේ කොටස යටතේ දීමට නියමිත සියලු දැන්වීම් සිංහල සහ දෙමළ යන භාෂාවලින් විය යුතු ය. තවද යම් තැනැත්තකුගේ නමට වූ සෑම දැන්වීමක් ම ඒ තැනැත්තා වෙත පෞද්ගලිකව භාර දීමෙන් හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු වෙත භාර දීමෙන් හෝ ඔහුගේ නිවාසයේ ප්‍රකටව පෙනෙන යම් තැනක ඇලවීමෙන් හෝ භාර දිය හැකි ය.

සුළු පළාත් පාලන ආයතනයක භාරයේ පවත්නා පාරවල් සහ මාවත් පාලනය කිරීම.

49. නගරය ඇතුළත වූ සියලු පොදු පාරවල්වල සහ මාවත්වල පථය සහ සංවර්ධන අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සෑම නගරයක නගර සභාවේ කාර්යය විය යුතු අතර, ඒ සඳහා එකී සෑම සභාවකට ම මෙයින් බලය පවරනු ලැබේ.

අලුත්ම මංමාවත් තැනීමට සහ පවත්නා මංමාවත් දියුණු කිරීමට නගර සභාවට ඇති බලය.

**50.** එක් එක් නගරයේ නගර සභාව විසින් ඒ නගරය ඇතුළත—

(අ) අලුත් පාරවල්, වීථි, පාලම් හෝ වෙනත් මංමාවත් සලකුණු කිරීම හා තැනීම;

(ආ) යම් වීථියක් හෝ (ප්‍රධාන මංමාවතක් නොවන) වෙනත් යම් මංමාවතක් පළල් කිරීම, විවෘත කිරීම සහ විශාල කිරීම;

(ඇ) යම් පොදු වීථියක් හෝ (ප්‍රධාන මංමාවතක් නොවන) වෙනත් යම් මංමාවතක සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හැරවීම, විපථ කිරීම, නතර කිරීම හෝ වැසීම,

ඒ කාර්යය සඳහා අවශ්‍ය යම් දේපළක අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට හෝ එයින් ස්වකීය නීත්‍යානුකූල අයිතිවාසිකම් නැති වුණු යම් තැනැත්තකුට නිසි වන්දි ගෙවා, කළ හැකි ය.

විපථ කිරීම හෝ විශාල කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් කරගැනීම.

**51.** (1) යම් මංමාවතක් හැරවීම, විපථ කිරීම, පළල් කිරීම, විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ ඉඩමක් පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීම යම් නගර සභාවකට අවශ්‍ය වුවහොත් එකී ඉඩම සඳහා සහ එහි ඇති යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරකඩක්, වැටක්, හෝ ගසක් සඳහා ගෙවිය යුතු වන්දිය, කලින් තිබූ මංමාවතේ භාවිත හෝ ඉන් කොටසක් සන්තකයට ගැනීමට ඉඩ දීමෙන් හෝ හුවමාරුවක් වශයෙන් වෙනත් ඉඩමක් දීමෙන් හෝ මෙකී ක්‍රම දෙකින් හෝ ඊට වැඩි ගණනකින් ගෙවීමට සැලැස්වීම සඳහා ඒ සභාව විසින් අයිතිකරු සමඟ එකඟවීමකට එළඹීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ එකඟ වීමක් අනුව නගර සභාවක් විසින් සන්තකයට ලබා ගත් ඉඩමක්, එයි යම් බැඳීමක් හෝ බැඳීම් නොමැතිව, සභාව වෙත සතු වන අතර, (1) වන උපවගන්තිය යටතේ වූ එකඟවීමක් මත, කලින් තිබූ පාරක භූමියෙන් කොටසක් හෝ හුවමාරුවක් වශයෙන් දුන් යම් ඉඩමක් සන්තකයට ගැනීමට සභාව විසින් යම් තැනැත්තකුට ඉඩ දුන් විට දිසාපතිවරයා හෝ සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් සමඟ වූ එකී භූමිය හෝ ඉඩම පිළිබඳ ඔප්පුව පිරිනැමූ කල, එකී භූමිය හෝ ඉඩම විෂයයෙහි ඒ තැනැත්තාට ඇති අයිතිවාසිකමට ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ගෙවීමට නියමිත වන්දිය පිළිබඳ ව නගර සභාව විසින් යම් ඉඩමක අයිතිකරු සමඟ එකඟ වීමකට එළඹිය නොහැකි අවස්ථාවක දී හෝ ඒ අයිතිකරු සොයා ගත නොහැකි අවස්ථාවක දී හෝ යම් ඉඩමක අයිතිකරු සමඟ යම් එකඟ වීමකට එළඹීම ප්‍රායෝගික නොවේ යැයි සභාව විසින් සලකනු ලබන අවස්ථාවක දී, 42 වන වගන්තියෙන් නියමිත ආකාරයට ඒ ඉඩමේ සන්තකය ලබා ගැනීමට සහ අයිතිකරුට වන්දි ගෙවීමට ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම එකඟවීමක් ම ලිය විල්ලකින් විය යුතු ය. එසේ වුවත්, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, එකී යම් එකඟවීමකට හෝ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයකට, අදාළ නොවන්නේ ය.

මංමාවත් විපථ කිරීම හෝ විශාල කිරීම සඳහා ලියවිලි අයිතිකරුවන්ට [illegible].

**52.** යම් මංමාවතක් හැරවීම, විපථ කිරීම, පළල් කිරීම විවෘත කිරීම, විශාල කිරීම හෝ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ ඉඩමක සන්තකය පොදු ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට යම් නගර සභාවකට අවශ්‍ය වී, ඉඩම ඒ කාර්යය සඳහා සභාවට භාර කිරීමටත් ඒ සඳහා වූ වන්දිවලට ඇති සියලු හිමිකම් ඇම අත්හැරීමටත් ඒ ඉඩමේ අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තා කැමති වන්නේ නම්, ඒ බවට සභාපතිවරයා ඉදිරිපිට දී හෝ ඒ කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තකු ඉදිරිපිට දී ඉහත කී තැනැත්තා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශනයක් ඉඩම සභාව වෙත සතු වීම සඳහා ප්‍රමාණවත් වන්නේ ය. ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහ සාක්ෂිකරුවන් විසින් සහතික කිරීම පිළිබඳව, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ නියමයන්ට අනුකූල නොවීමේ හේතුව නිසා ම පමණක් එකී කිසි ම ප්‍රකාශනයක් අවලංගු වූ ලෙස හෝ නීතිය අනුව බලරහිත වූ ලෙස හෝ නොසැලකිය යුතු ය.

[illegible]

**53.** නගර සභාවක් වෙත සතු වූ යම් වීථියක් හෝ වෙනත් මංමාවතක් හෝ යම් වීථියක හෝ වෙනත් මංමාවතක කොටසක්, වීථියක් හෝ මංමාවතක් ලෙස භාවිතා කිරීම නතර වූ කවර හෝ විටෙක, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව සභාව විසින් එකී වීථිය හෝ වෙනත් මංමාවත හෝ එහි කොටස විකිණීම හෝ බදු දීම හෝ අන්තර්ග කිරීම කරනු ලැබිය හැකිය.

[illegible]

**54.** යම් අලුත් වීථියක් හෝ මංමාවතක් සලකුණු කිරීමේ දී හෝ තැනීමේ දී හෝ යම් වීථියක් හෝ මංමාවතක් හැරවීමේ දී, විපථ කිරීමේ දී, පළල් කිරීමේ දී, විවෘත කිරීමේ දී, විශාල කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් වැඩි දියුණු කිරීමේ දී එහි රථ මාර්ගවල සහ අඩි පාරවල්වල කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩම්වලට අතිරේකව එකී වීථිය හෝ මංමාවත දෙපස වීමට අවශ්‍ය නිවාස සහ ගොඩනැගිලි සඳහා වුවමනා ඉඩම් ද නගර සභාවක් විසින් මිල දී ගත හැකි අතර, එම ඉඩම් 39 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව සහ එම ඉඩම්වල ඉදිකළ යුතු නිවාසවල හෝ ගොඩනැගිලිවල වර්ගය සහ ආකාරය පිළිබඳව සභාව විසින් සුදුසු

සැඩි අදහස් කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද, විකිණීම, බදුදීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ද කළ හැකිය.

නගර සභාවක වෙනත් බලතල.

**55.** යම් නගරයක නගර සභාවක් වෙත පැවරී ඇති වෙනත් බලතලවලට හානියක් නොමැතිව, එම නගර සභාව විසින් පහත සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය:—

(1) වීථිවලට ජලය සැපයීම;

(2) යම් වීථියක හෝ මංමාවතක ප්‍රසර්පණ හෝ බාධක සිදුවී ඇති විටෙක එයින් එම වීථිය හෝ මංමාවත නිදහස් කිරීම. එහෙත් මේ සඳහා යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ දී ඒ ප්‍රසර්පණවලට හෝ බාධකවලට වගකිවයුතු තැනැත්තා කවරකු දැයි අනාවී ඇත සිටින අවස්ථාවක, ඒ ක්‍රියා මාර්ගය ගත යුතු වන්නේ ඒ තැනැත්තාට දැන්වීමක් කිරීමෙන් පසුව සහ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම හෝ දැන්වීමේ සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත ඒ බාධක හෝ ප්‍රසර්පණ ඉවත්කිරීම හෝ ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇති විටක පමණය:

[1975 අංක 4 § 4.]

(3) වීථි නාම සහ යම් පෞද්ගලික දේපළක පිහිටි නිවාසවල හෝ ගෙවල්වල අංක ඇඳීම;

(4) පාළු ගෙවල් වසා තැබීම සහ ආරක්ෂා කිරීම;

(5) මෙහි (2) වන සහ (4) වන ඡේද යටතේ කරන ලද යම් ක්‍රියාවක් සඳහා ගිය වියදම, එකී ක්‍රියාව අවශ්‍ය වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ අතපසු කිරීමක් නිසා ද ඒ තැනැත්තාගේ මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කරගැනීම.

වීථි නාම කිරීම.
[1975 අංක 4 § 4.]

**55අ.** අමාත්‍යවරයා විසින්, සිය මෙහෙයීමෙන් ම හෝ නගර සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, යම් වීථියක් හැඳින්විය යුතු නාමය තීරණය කළ යුතු අතර, යම් විටක යම් වීථියක නාමය වෙනස් කිරීම ද ඒ ආකාරයෙන් ම කළ යුතුය.

පෞද්ගලික දේපළ අයිතිකරුවන්ගේ යහපත සඳහා පාරවල්.

**56.** යම් නගරයක් ඇතුළත පිහිටි යම් වත්තක හෝ යම් කර්මාන්ත ව්‍යාපාරයක හෝ ඊට වැඩි ගණනක අයිතිකරු විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලීමක් කරනු ලැබුවා වූ ද එසේ කරන ලද ඉල්ලීමක් මත මිස ඒ ප්‍රදේශය තුළ පාරක් ඉදි කිරීම හෝ පවත්වාගෙන යෑම ජනතා අවශ්‍යතා අනුව සලකා බලන විට සාධාරණ නොවේ ය යන්න ඒ නගරයේ නගර සභාවේ මතය වන්නා වූ ද අවස්ථාවක, ඒ පාර ඉදි කිරීම හෝ පවත්වාගෙන යෑම වෙනුවෙන් දැරීමට සිදුවන වියදම උදෙසා සභාව විසින් අනුමත කරනු ලබන දායක මුදලක් ගෙවීමට යටත්ව ද සුදුසු සාධන පත්‍රයක්





මගින් එකී පාර පොදු පාරක් ලෙස සංස්ථාපනය කරනු ලැබිය යුතු බවට සහ සභාව වෙත සතු කරනු ලැබිය යුතු බවට වූ කොන්දේසියකට යටත්ව ද අදාළ වත්තේ හෝ වතුවල හෝ ව්‍යාපාරයේ හෝ ව්‍යාපාරවල ප්‍රයෝජනයට පාරක් ඉදි කිරීම හෝ පවත්වාගෙන යෑම සඳහා වූ ගිවිසුමක් සභාව විසින් එකී අයිතිකරු හෝ අයිතිකරුවන් සමග ඇති කර ගත හැකිය. තවද එසේ ගිවිසගන්නා ලද සියලු ම දායක මුදල්, ප්‍රයෝජන සැලසුනු ඉඩම් සඳහා නියම කරන ලද විශේෂ වරිපනම් බදු ලෙස සැලකිය යුතු අතර, ඒවා මේ පනත යටතේ පනවන ලද වරිපනම් බදු අයකර ගන්නා ආකාරයෙනම අයකරගත හැකි අතර වරිපනම් බදු සම්බන්ධයෙන් මේ පනතේ ඇති සියලු විධිවිධාන ඒවාට අදාළ වන්නේය.

ට්‍රෑම් රථ මාර්ග ඉදි කිරීමට සහ නඩත්තු කිරීමට ඇති බලය.

**57.** නගර සභාවක් විසින් හෝ එකට සම්බන්ධ වූ නගර සභා දෙකක් හෝ වැඩි ගණනක් විසින් හෝ මහ නගර සභාවක් සමග සම්බන්ධ වූ යම් නගර සභාවක් හෝ නගර සභා විසින් අමාත්‍යවරයාගේ අනුමතය ද ඇතිව, ස්වකීය නිලධරයන් ලවා ඒ සභාවේ හෝ සභාවල පරිපාලන සීමාවන් ඇතුළත ට්‍රෑම් රථ මාර්ගයක් හෝ ට්‍රෑම් රථ මාර්ග ඉදි කිරීම, නඩත්තු කිරීම සහ පාවිච්චි කිරීම කරනු ලැබිය හැකි ය.

ට්‍රෑම් රථ මාර්ග ඉදි කිරීම සඳහා ඉදිරිපත් වන ආරම්භකයන් සමග ගිවිසුම.

**58.** නගර සභාවක් විසින් හෝ එකට සම්බන්ධ වූ නගර සභා දෙකක් හෝ වැඩි ගණනක් විසින් හෝ මහ නගර සභාවක් සමග සම්බන්ධ වූ යම් නගර සභාවක් හෝ නගර සභා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ඒ සභාවේ හෝ සභාවල පරිපාලන සීමා ඇතුළත ට්‍රෑම් රථ මාර්ගයක් හෝ ට්‍රෑම් රථ මාර්ග ඉදි කිරීමට, නඩත්තු කිරීමට සහ පාවිච්චි කිරීමට යම් ආරම්භකයකුට හෝ ආරම්භකයන්ට අයිතිවාසිකම දීමේ කාර්යය සඳහා, එකී ආරම්භකයා හෝ ආරම්භකයන් සමග, මේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල නොවන ගිවිසුමකට එකී ගිවිසුමේ සඳහන් ප්‍රතිෂ්ඨාව සඳහා වූ නියමයන් උඩ ද එහි සඳහන් කොන්දේසිවලට යටත්ව ද එහි ම සඳහන් ආකාරයෙන් ද එළඹිය හැකි ය.

පොදු ගමනාගමන රථ මාර්ග.

**59.** නගර සභාවක් විසින්, වෙනත් යම් ලිඛිත නීතියකින් තත් කාර්යය සඳහා පනවනු ලැබිය හැකි තහනම් කිරීම්වලට සහ සීමා කිරීම්වලට යටත්ව ද ඉන් යම් ප්‍රධාන මංමාවතකට බල පෑමක් සිදු විය හැකි ප්‍රමාණයකට ද මංමාවත් යන විෂය භාරව සිටින අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව ද නගර සභාව සහ එහි නිලධරයන් විසින් හෝ නොඑසේ නම් 58 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයෙන් යම් ආරම්භකයකු විසින් හෝ ආරම්භකයන් විසින්, සභාවේ පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයක පදිංචිකරුවන්ට සේවය කිරීම සඳහා ට්‍රෑම් රථ මාර්ගයක් නොවන යම් ආකාරයක පොදු ගමනාගමන රථ මාර්ගයක් සංවිධානය කොට නඩත්තු කරනු ලැබිය හැකි ය.

*දිරාපත් වූ සහ අන්තරායදායක තත්ත්වයක තිබෙන ගෙවල්.*

**60.** යම් නගරයක යම් වීථියකට හෝ මංමාවතකට යා වූ යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් හෝ ඊට සවි කර ඇති යම් කිසිවක්, අන්තරායදායක වුව ද නොවුව ද, දිරාපත් තත්ත්වයක පවතින බව හෝ කඩා වැටීමට ඉඩ ඇති බව ඒ නගරයේ නගර සභාව සලකන්නේ නම්, අවශ්‍ය යැයි පෙනී ගියහොත් එම වීථිය හෝ මංමාවත ප්‍රයෝජනයට ගන්නා තැනැත්තන්ගේ ආරක්ෂාව සඳහා නිසි රැකුම් වැටක් හෝ වැටක්, සභාව විසින් වහාම ඉදි කරවිය යුතු අතර, ඒ ගෙය, ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටුව හෝ එහි සවි කර ඇති දෙය පවතින තත්ත්වය අනුව අවශ්‍ය වන පරිදි, වහා ම කඩා දමන ලෙස හෝ රැකවරණය කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමට සැලැස්විය යුතු ය.

*දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම.*

**61.** 60 වන වගන්තිය යටතේ නගර සභාවක් විසින් හෝ නගර සභාවක් වෙනුවෙන් හෝ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තා එය භාර දෙනු ලැබූ දින සිට දවස් තුනක් ඇතුළත ඒ දැන්වීමට අනුකූල ව ක්‍රියා කිරීම ආරම්භ නොකළහොත් හෝ නිසි අනලස්භාවයෙන් වැඩ පරිසමාප්ත නොකළහොත්, සම්පූර්ණ වැඩය හෝ ඒ වැඩයෙන් කිරීමට අවශ්‍ය යැයි සභාව අදහස් කරන තරම් කොටස හෝ සභාව විසින් කරවිය හැකි අතර සභාව විසින් දරන ලද සියලු වියදම් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ය. තව ද ඒ වියදම් ගෙවීම පැහැර හැරියහොත් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට එය අය කරගත හැකි වන්නේ ය.

*දිරාපත් වූ ගෙවල්වල ද්‍රව්‍ය විකිණීම.*

**62.** 61 වන වගන්තිය යටතේ යම් නගර සභාවක් විසින් යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ තාප්පයක් හෝ ඉන් යම් කොටසක් කඩා දමනු ලැබුවහොත්, එහි ද්‍රව්‍ය හෝ කඩා දමනු ලැබූ තාක් ද්‍රව්‍ය ප්‍රමාණය ඒ සභාව විසින් විකිණිය හැකි අතර, එයින් ලැබෙන මුදල් දරන ලද වියදම් පියවීමට යෙදවිය හැකි ය. තවද ඒ විකිණීමෙන් ලැබෙන යම් අතිරික්තයක් වුවහොත් එය ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ තාප්පයේ අයිතිකරු විසින් ඉල්ලා සිටි විට ඔහුට ගෙවිය යුතුය:

එසේ වුව ද, එලෙස ඉල්ලීමක් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් මාස දොළසක් ඇතුළත ඒ අතිරික්තය සඳහා ඉල්ලීමක් කරනු නොලැබූ විටක, ඒ අතිරික්තය ප්‍රාදේශීය අරමුදලේ බැරට ගෙවීමට සෑම විට ම සභාවට නිදහස ඇති අතර, එසේ ඉල්ලා නොසිටිනු ලැබූ අතිරික්තය ගෙවීමට හෝ ඒ සඳහා හෝ ඒ සම්බන්ධයෙන් වගඋත්තර කීමට ඇති බැඳීමෙන් ද සභාව නිදහස් වන්නේ ය;

එසේ ම තව දුරටත්, ඉහත සඳහන් කාර්යයන් සඳහා එකී ද්‍රව්‍ය සභාව විසින් විකුණනු ලැබ තිබිය හැකි වුව ද, සම්පූර්ණ වියදම් ගෙවීමට බල කිරීම සඳහා මේ පනතින් සභාවට දී ඇති ප්‍රතිකර්ම ම, එකී විකිණීමෙන් ලත් මුදල් යෙදීමෙන් පසුවත් ගෙවීමට ඉතිරි වී ඇති යම් වියදමක් ගෙවන ලෙස බල කිරීම සඳහා ද සභාවට තිබිය යුතු ය.



## මංමාවත් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම

*මංමාවත් අලුත්වැඩියා කිරීම ආදිය සඳහා නිසි නිලධරයන්ට ඉඩම්වලට ඇතුළු වීමට බලය පවරා ඇති බව.*

**63.** යම් නගරයක නගර සභාවක නිසි නිලධරයා විසින් ද ඔහු විසින් හෝ ඔහු යටතේ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ද සියලු කල්හි අවශ්‍ය සහ සුදුසු සියලු රථ, කරත්ත, සතුන් සහ වෙනත් සියලු දේ සමග ඒ නගරය තුළ ඇති හෝ යෝජිත යම් මංමාවතකට හෝ ඒ අසල ඇති යම් ඉඩමකට ඇතුළු වීම සහ එහි දී එකී යම් මංමාවතක් අනුරේඛනය කිරීමේ, මැනීමේ, සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ ඊට වැටක් බැඳීමේ කාර්යය සඳහා හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ඉදි කිරීම, මැනීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ මේ ආඥා පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කරුණක් හෝ දෙයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේවල්, වෙන් වෙන් ව කිරීම සහ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

*ද්‍රව්‍ය ගැනීමට ඇති බලය.*

**64.** යම් නගරයක නගර සභාවක නිසි නිලධරයා විසින් ද ඔහු විසින් ඔහු යටතේ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ද සියලු සාධාරණ වේලාවක් තුළ දී අවශ්‍ය සහ සුදුසු සියලු රථ, සතුන් සහ වෙනත් සියලු දේ රැගෙන ඒ නගරය තුළ ඇති හෝ යෝජිත යම් මංමාවතක් අනුරේඛනය කිරීමේ, මැනීමේ, සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ ඊට වැටක් බැඳීමේ කාර්යය සඳහා හෝ අනුරේඛනය කිරීම, මැනීම, සෑදීම, නිර්මාණය කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම, වැඩි දියුණු කිරීම හෝ ඊට වැටක් බැඳීම සම්බන්ධයෙන් යම් ආකාරයකින් සහාය වීම සඳහා හෝ; එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩනැගීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා හෝ; ඉහත සඳහන් ප්‍රකාර වූ යම් නිලධරයකුගේ හෝ ඔහු යටතේ සේවයේ නියුක්ත කොට ඇති යම් වැඩකරුවන්ගේ, සතුන්ගේ, රථවල, කරත්තවල, තැනැත්තන්ගේ හෝ දේවල්වල ප්‍රයෝජනය සඳහා එකී යම් මංමාවතක හෝ ඒ අසල අවශ්‍ය වන්නා වූ කවර අන්දමක හෝ කම්කරු නිවාස නැතහොත් ගොඩනැගිලි ඉදි කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා, එබඳු යම් මංමාවතකට යා වූ හෝ ඒ අසල ඇති යම් ඉඩමක් තුළින් හෝ ඉඩමකින් වැලි, ඇට දඬු, කැපූ අතු, ගල්, බොරළු, මැටි හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක සෙවීම, හෑරීම, කැපීම, ගැනීම සහ ඉවත ගෙන යෑම ද යම් තැනැත්තකුගේ ඉඩමක් මැදින්, එය ඉවත ගෙන යෑම නීත්‍යනුකූල වන අතර එකී කටයුතු කිරීමේ දී එවැනි තැනැත්තකු අයුතු අන්දමින් ඇතුළු වන්නකු ලෙස සලකනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ආසන්නයේ ඇති මුඩු බිම්වලින් හෝ පොදු හෝ අත්හල භූමිවලින් සෑහෙන තරම් ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත නොහැකි නම් මිස, ගෙමිදුලකින්, ගෙයකට ප්‍රවේශ වන මාර්ගයකින්, තණ බිස්සකින් හෝ කොටු කර ඇති යම් වත්තකින්, වැව්ලකින්, කුඹුරකින් හෝ කැලයකින් හෝ ඒ මත, එහි අයිතිකරුගේ කැමැත්ත නොමැති ව, එබඳු ද්‍රව්‍ය හෑරීම, කැපීම හෝ ඉවතට ගෙන යෑම නොකළ යුතු අතර එසේ ඒ ද්‍රව්‍ය මුලින් සඳහන් කළ මුඩු බිම්වලින් හෝ අත්හළ භූමිවලින් පහසුවෙන් ලබා ගත හැකි අවස්ථාවක ඒ ද්‍රව්‍ය යම් ප්‍රමාණයක් ලබා ගත හැකි ය ;

එසේ ද වුවත්, එසේ ලබා ගත් සියලු ද්‍රව්‍ය සඳහා සහ ඒ ද්‍රව්‍ය ලබා ගැනීමෙන් සහ ඉවතට ගෙන යෑමෙන් සිදු වූ අලාභය සඳහා ද එහි අයිතිකරුට සෑහෙන වන්දි ගෙවිය යුතු ය ;

එසේ ම තව දුරටත්, එකී ද්‍රව්‍ය කිසිවක් ලබා ගත් යම් ගල් වළක් හෝ වළත්, එය යම් තැනැත්තකුට හෝ සතකුට අන්තරායදායක නොවන පරිදි, ඒ නිලධරයා විසින් ගරාදි වලින් වට කිරීම හෝ වැටක් බැඳ වෙන් කිරීම කරනු ලැබිය යුතු ය.

ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගවාදි සතුන් තබා ගැනීමට ඇති බලය.

65. යම් නගරයක් තුළ ඇති හෝ යෝජිත යම් මංමාවතක් අනුරේඛනය කරන, මනින, සාදන, නිර්මාණය කරන, විවෘත කරන, වෙනස් කරන, හරවන, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන හෝ වැඩි දියුණු කරන අවස්ථාවක හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩනගන, කණින, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන හෝ වැඩි දියුණු කරන අවස්ථාවක ඒ නගරයේ නගර සභාවේ නිසි නිලධරයා විසින්—

(අ) වැඩය කර ගෙන යන අතරතුර, ඒ නිලධරයාගේ වාසය පිණිස හෝ ඔහු විසින් සේවයෙහි නිරත කොට ඇති සේවකයන්ගේ, වැඩකරුවන්ගේ, කම්කරුවන්ගේ, සතුන්ගේ වාසය පිණිස හෝ රථ හෝ වෙනත් දේවල් තැබීම පිණිස ඊට යාවූ හෝ ඒ අසළ ඇති යම් වත්තක තාවකාලික ගොඩනැගිලි සෑදීම සහ ඉදි කිරීම ; සහ

(ආ) ඔහු විසින් සේවයෙහි නිරත කොට ගනු ලබන එබඳු සියලුම සතුන්, ඊට යාවූ හෝ ඒ අසළ ඇති ඉඩම්වල නිසි ලෙස දිගේලි කිරීම සහ ගාල් කිරීමක් අවශ්‍ය තරම් කල් ඒ සතුන් එසේ දිගේලි කර හෝ ගාල් කර තබා ගැනීමක්

නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුව ද. යම් වගා කළ ඉඩමක් හෝ යාබදව, ඒ ගොඩනැගිලි ඉදි කිරීමේ හෝ සතුන් බැඳ තැබීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගත හැකි මුඩු බිම් හෝ පොදු හෝ අත්හල භූමි හෝ ඇති අවස්ථාවක, එබඳු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ එබඳු යම් සතකු තැබීම නොකළ යුතු ය ;

එසේ ම තව දුරටත්, ඉඩමකට යම් අලාභයක් සිදු වූ සෑම අවස්ථාවක දීම එහි අයිතිකරුට සාධාරණ වන්දි ගෙවිය යුතු ය.





යාබද ඉඩම්වලට කුණු වීසි කිරීමට ඇති බලය.

66. යම් නගරයක් ඇතුළත ඇති හෝ යෝජිත යම් මංමාවතක් අනුරේඛනය කිරීමෙහි, කැනීමෙහි, සෑදීමෙහි, නිර්මාණය කිරීමෙහි, විවෘත කිරීමෙහි, වෙනස් කිරීමෙහි, හැරවීමෙහි, අලුත්වැඩියා කිරීමෙහි, ශුද්ධ කිරීමෙහි හෝ වැඩි දියුණු කිරීමෙහි ලා හෝ එහි ඇති හෝ ඊට යම් ලෙසකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් සෑදීමෙහි, කැණීමෙහි, අලුත්වැඩියා කිරීමෙහි, ශුද්ධ කිරීමෙහි හෝ වැඩිදියුණු කිරීමෙහි ලා, එබඳු යම් කර්මාන්ත ස්ථානයකින් ඉවත් කිරීමට අවශ්‍ය වන පස්, කුණු කසළ හෝ ද්‍රව්‍ය ඒ නගරයේ නගර සභාවේ නිසි නිලධරයා විසින් ඒ මංමාවතකට යාවූ හෝ ඒ අසළ ඇති ඉඩම් කිසිවකට වීසි කිරීම නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුව ද, ඒ නිසි නිලධරයා විසින් එකී යම් ඉඩමකට වීසි කරන ලද පස්, කුණු කසළ හෝ ද්‍රව්‍ය සියල්ල ඔහු විසින් සාධාරණ කාලයක් තුළ දී ඒ ඉඩමෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

තාවකාලික පාරක් සෑදීමට ඇති බලය.

67. යම් නගරයක ඇති හෝ යෝජිත යම් මංමාවතක යම් කාර්යයක් හෝ ඊට යම් ලෙසකින් සම්බන්ධ කාර්යයක් ක්‍රියාත්මක කෙරෙන කල්හි ඒ නගරයේ නගර සභාවේ නිසි නිලධරයා විසින් ඒ පාරට යාවූ හෝ ඒ අසළ ඇති භූමි මැදින් තාවකාලික පාරක් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුව ද, යම් ගොඩනැගිල්ලක් පිහිටා ඇති යම් භූමියක් උඩින් හෝ කොටු කොට ඇති වත්තක් හෝ මිදුලක් උඩින් එබඳු පාරක් නොසෑදිය යුතු ය.

ගස් කැපීමට ඇති බලය.

68. යම් නගරයක නගර සභාවක නිසි නිලධරයා විසින්, ඒ නගරය තුළ යම් මංමාවතක වැවෙන හෝ ඊට පාත් වී ඇති හෝ ඊට බාධකව ඇති සියලුම ගස්, පඳුරු හෝ අකුල් සහ ගස්වල සියලු කොළ හෝ අතු හෝ මුල් කපා ඉවත් කිරීම ද යාබද හෝ ඒ අසළ පිහිටි යම් ඉඩමක් මත ඒවා දැමීමද, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන්, සතුන් සහ උපකරණ ගෙන යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු වී, එහි දී ඒ ගස්, පඳුරු, අකුල්, කොළ, අතු හෝ මුල් කැපීම, සිඳීම හෝ ඉවත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු දේ කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුව ද, ඒ නිසි නිලධරයා විසින් එකී යම් ඉඩමක් මත දමන ලද සියලු ගස්, පඳුරු හෝ අකුල් ද ගස්වල සියලු කොළ, අතු හෝ මුල් ද ඔහු විසින් සාධාරණ කාලයක් තුළ දී ඒ ඉඩමෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

වැටවල් ඉදි කිරීමට ඇති බලය.

69. යම් නගරයක නගර සභාවක නිසි නිලධරයා විසින් අවශ්‍ය යැයි ඔහුට පෙනී යන කවර විටක වුව ද, ඒ නගරය තුළ ඇති යම් මංමාවතක පසෙකින් ඇති වැටවල්, බඩවැටි, අගල්, කාණු හෝ ඉවුරු ඉදිකිරීම හෝ සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. තව ද ඒ වැටවල්වලට, බඩවැටිවලට, අගල්වලට, කාණුවලට හෝ ඉවුරුවලට

සම්බන්ධව ඇති එක් එක් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒවා මනා හා ප්‍රමාණවත් අලුත්වැඩියාවෙන් සහ තත්ත්වයෙන් තබා ගත යුතු අතර ඒවා එසේ මනා හා ප්‍රමාණවත් අලුත්වැඩියාවෙන් සහ තත්ත්වයෙන් තබා ගන්නා ලෙස එකී අයිතිකරුට හෝ පදිංචිකරුට මෙයින් නියම කරනු ලැබේ.

අගල් ආදිය කපා විවෘත ව තබා තැනීමට සහ ප්‍රධාන නල ආදිය යෙදීමට ඇති බලය.

**70.** යම් නගරයක් තුළ ඇති යම් මංමාවතක් ඔස්සේ තිබෙන සියලු අගල්, ඇලි, කාණු හෝ දිය ඇලවල් තැනීමට, සෝදා හැරීමට, ශුද්ධ පවිත්‍ර කිරීමට සහ විවෘත කර තැබීමට සහ යම් මංමාවතක් හෝ යෝජිත මංමාවතක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ගොඩනැගීම සඳහා අවශ්‍ය යැයි ඒ නගරයේ නගර සභාවේ නිසි නිලධරයා විසින් සලකනු ලබන, ඒ කාණු, දිය ඇලවල්, ප්‍රධාන නල, උමං, පිඩැලි කට්ටි හෝ පාලම්, ඒ මංමාවතට හෝ යෝජිත මංමාවතට යාව හෝ ඒ අසළ ඇති යම් ඉඩම් හෝ භූමි තුළ හෝ ඒ මැදින් තැනීමට හෝ යෙදීමට ද ඒ නිසි නිලධරයාට බලය තිබිය යුතු ය.

ගල් ආදිය තැබීමට ඇති බලය.

**71.** යම් නගරයක් තුළ වූ යම් පාරක් මත යම් ගල් ගොඩක් හෝ බොරලු ගොඩක් හෝ යම් ලී කොටයක් හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් තැබීමට සහ එම පාර අලුත්වැඩියා කරන කාලය තුළත් අලුත්වැඩියා කිරීම ආරම්භ කිරීමට පෙර සහ අලුත්වැඩියා කිරීම් නිම කිරීමෙන් පසුවත් එම අලුත්වැඩියා කිරීම් පහසු කිරීම සඳහා හෝ ළඟදී අලුත්වැඩියා කරන ලද පාරට අලාභ හානි වැළැක්වීම සඳහා හෝ අවශ්‍ය තරම් කාලයක් ඒ ද්‍රව්‍ය එහි තිබෙන්නට හැරීමටත් ඒ නගරයේ නගර සභාවේ නිසි නිලධරයාට බලය ඇති නමුත් ඒ වීථිය ඔස්සේ ගමන් කරන තැනැත්තන්ට අනතුරක් හෝ පීඩාවක් සිදුවීම වැළැක්වීම සඳහා යෝග්‍ය වූත් සාධාරණ වූත් පූර්වාරක්ෂක විධිවිධාන ඔහු විසින් සැලැස්විය යුතු ය.

### මංමාවත් ඔස්සේ ගොඩනැගිලි ආදිය ඉදි කිරීම

මංමාවත් ඔස්සේ යෝජිත ගොඩනැගිලි පිළිබඳ දැන්වීම.

**72.** (1) යම් නගරයක නගර සභාවට එක් ලිත් මාසයකට කලින් දැන්වීමක් නොදී යම් තැනැත්තකු විසින් ඒ නගරය ඇතුළත යම් මංමාවතක් ඔස්සේ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක් හෝ වැටක් ඉදි කිරීම ආරම්භ කිරීම හෝ එකී යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක් හෝ වැටක් ඉදිකිරීම ආරම්භ කිරීමේ හෝ එය අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා එකී යම් මංමාවතක් මත යම් තාවකාලික වැටක් හෝ කොටුවක් ඉදි කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියමිත දැන්වීම දීම නොසලකා හරින හෝ එම දැන්වීම නොකොට ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක් හෝ වැටක් ඉවත් කරන ලෙස මේ උපවගන්තිය යටතේ නගර සභාව විසින් ඉල්ලා සිටින ලද විටක එසේ කිරීම නොසලකා හරින යම් තැනැත්තකු රුපියල් පන්





සියයකට නොවැඩි දඩයකින් සහ ඉහත සඳහන් පරිදි ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, දොරටුව හෝ වැට ඉවත් කරන ලෙස ඔහුට නියම කිරීමෙන් පසුව එය එසේ කිරීමට ඔහු විසින් ඉඩහරින ලද හෝ අවසර දෙන ලද එක් එක් දවසට රුපියල් දෙසියයකට නොවැඩි වැඩිපුර දඩයකින් ද දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු ය [1984 අංක48 දර.] [1984 අංක48 දර.]

(3) (1) වන උපවගන්තියෙන් නියමිත දැන්වීම නොකොට ඉදි කිරීම ආරම්භ කරන ලද හෝ ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක්, වැටක් හෝ කොරටුවක් නගර සභාව විසින් ඉවත් කිරීම හෝ ඉවත් කරවීම සහ එලෙස ඉවත් කිරීමේ ගාස්තුව 84 වන වගන්තියේ සඳහන් ගාස්තු අය කර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් අය කර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(4) එබඳු යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක්, වැටක් හෝ කොරටුවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ දෙනු ලබන දැන්වීම පිළිබඳව යම් නගර සභාවක් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබිය හැකි නමුදු, එබඳු ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, දොරටුවක්, වැටක් හෝ කොරටුවක් මංමාවත ප්‍රසර්පණය කිරීමක් ලෙස පසුව සොයාගනු ලැබූ විට එය ඉවත් කිරීම සඳහා ඒ නගර සභාවට මෙහි මින් මතු පිරිනමනු ලබන බලයට, මෙහි ඇතුළත් කිසිවකින් හානියක් නොවන බව සැලකිය යුතු ය.

තාවකාලික වැටවල් සහ කොටු ඉදි කිරීම.

**73.** (1) පොදු සේවය සඳහා යම් මංමාවතක යම් කොටසක් තාවකාලික ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා යථා පරිදි බලය ලත් යම් රජයේ නිලධරයකු විසින් එය එලෙස ප්‍රයෝජනයට ගැනීම් 72 වන වගන්තියේ සඳහන් කිසිවකින් වළක්වන ලෙස හෝ යම් නගරයක වැසියන්ගේ නිවාස සහ වෙනත් ගොඩනැගිලි ගොඩනැගීම, කඩා දැමීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් යම් මංමාවතක් මත තාවකාලික වැටවල් සහ කොටු ඉදි කිරීම සඳහා හෝ නගරය ඇතුළත තාවකාලික සැරසිලි සඳහා නගරයේ වැසියන්ට—

(අ) එකී කොටුවල දිග, පළල සහ උස ;

(ආ) මංමාවතක් ඔස්සේ රථ, කරත්ත හෝ බෝට්ටු යෑම ඊම සඳහා තැබිය යුතු ඉඩ; සහ

(ඇ) ඒ බලපත්‍රය ලබන තැනැත්තා විසින්, වැට හෝ කොටුව නියම වශයෙන් පිහිටි අන්දම හෝ ඉන් සිදු වී ඇති යම් බාධකයක් පැහැදිලිව දැක්වීමට ප්‍රමාණවත් ආලෝකයක් ඔහු විසින් වැට හෝ කොටුව නඩත්තු කරනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන කාල සීමාව තුළ ඉර බැසීම සහ ඉර නැගීම අතරතුර දිනපතා ප්‍රදර්ශනය කිරීම

සභා කරුණු සම්බන්ධ කොන්දේසි ඇතුළුව සභාව විසින් සුදුසු යැයි සැළකිය හැකි නියමයන් සහ කොන්දේසි උඩ බල පත්‍රයක් දීමෙන් යම් නගරයක නගර සභාවක් වළක්වන ලෙස නොසැලකිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරමින් ඒ බල පත්‍රයේ කොන්දේසිවලින් කිසිවක් උල්ලංඝණය කරන සෑම තැනැත්තකු සහ ඒ බල පත්‍රයේ කොන්දේසිවලින් නියම කර ඇති ප්‍රකාර තබා තිබෙන යම් ආලෝකයක් ඉවත් කරන හෝ නිවා දමන සෑම තැනැත්තකු රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු ය. [ 1984 අංක48-§7.]

පාරවල් මිස්සේ ගොඩනැගිලි සීමා.

74. (1) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ කුමක් සඳහන් ව තිබුණ ද, යම් තැනැත්තකු විසින්—

(අ) යම් නගරයක් ඇතුළත රථ වාහන ගමනාගමනය සඳහා පාවිච්චි කරන්නා වූ හෝ යෝජිත සහ නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ පළලින් අඩි පනහකට වැඩි පාරක් සඳහා සලස්වනු ලබන වීථි රේඛා නියම කරනු නොලැබූ යම් පාරක මධ්‍යයේ සිට අඩි විසි පහක් වූ (මෙහි මින් මතු "ගොඩනැගිලි සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාවක් ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් ඉදි කිරීම ; හෝ

(ආ) නගරයේ නගර සභාව විසින් දෙන ලද බල පත්‍රයක බලය යටතේ හැර, එබඳු සීමාවක් ඇතුළත එබඳු යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් යළි ඉදි කිරීම හෝ යම් අතිරේක කොටසක් එකතු කිරීම

නීත්‍යනුකූල නොවිය යුතු ය :

එසේ වුව ද, සෑම විට ම, මේ උපවගන්තියේ ඇතුලත් කිසිවක්, නගර සභාව සංස්ථාපනය කරන ලද දිනයෙහි දී පැවති යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක කරනු ලබන යම් අලුත්වැඩියා කිරීම්වලට හෝ—

(i) පයින් යෑම ඊම සඳහා පමණක් යෝජිත, පළලින් අඩි විස්සකට නොඅඩු යම් වීථියක් සම්බන්ධයෙන් ; හෝ

(ii) කසළ ශෝධනය සහ වසුරු බැහැර කිරීම යන කාර්යයන් හෝ වෙනත් විශේෂ සෞඛ්‍යාරක්ෂක කාර්යයක් සඳහා පමණක් යෝජිත, පළලින් අඩි දහයකට නො අඩු යම් පසුපස පටුමගක් හෝ වෙනත් සේවා මගක් සම්බන්ධයෙන්, ඒ වීථිය, පටු මග හෝ ඒ නගර සභාව විසින් අනුමත කරනු ලැබ හෝ එහි මායිම් නියම කරනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ නොවිය යුතු ය.





මේ උපවගන්තියේ ඉහතින් දැක්වූ විධිවිධානවල කාර්යයන් සඳහා, "අලුත්වැඩියා කිරීම" යන්නට යම් යළි ඉදි කිරීමේ හෝ යළි ගොඩනැගීමේ හෝ අතිරේක කොටයක් එකතු කිරීමේ වැඩක් ඇතුළත් වෙතැයි නොසැළකිය යුතු ය.

(2) සෑම නගර සභාවක් ම සංස්ථාපනය කරන ලද දිනයෙන් පසු අවුරුදු හතක් ඇතුළත හෝ යම් අවස්ථාවක විශේෂ කරුණු අනුව අමාත්‍යවරයා විසින් ඉඩ දිය හැකි වැඩිපුර කාල සීමාවක් ඇතුළත—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් වූ සෑම පාරක් මත ම, ඒ වගන්තියෙන් නියම කර ඇති ගොඩනැගිලි සීමා ස්ථිර සළකුණුවලින් ලකුණු කිරීම ;

(ආ) එසේ ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලැබූ එක් එක් පාරක් සම්බන්ධයෙන් වූ විට, ඒ සීමා ඇතුළත පිහිටි හෝ පැතිරී තිබෙන එක් එක් ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි හෝ ඉන් කොටසක වටිනාකම නිශ්චය කොට දැනගෙන වාර්තාගත කිරීම ;

(ඇ) ගොඩනැගිලි සීමා ලකුණු කර නොමැති යම් පාරක් සම්බන්ධයෙන් වූ විට, යම් යළි ඉදි කිරීමක් හෝ අතිරේක කොටසක් එකතු කිරීමක් යන කාර්යයන් සඳහා සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බල පත්‍රයක් දෙනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි වටිනාකම නිශ්චය කොට දැනගෙන වාර්තාගත කිරීම

ඒ සභාවේ කාර්යය විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යයන් සඳහා යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක වටිනාකම :—

(අ) නගර සභාව සහ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ අයිතිකරු හෝ අයිතිකරුවන් අතර වූ එකඟ වීමක් මගින් නියම කළ යුතුය ; නැතහොත්

(ආ) එකඟ වීමක් මගින් එසේ නියම කරනු නොලැබූ අවස්ථාවක දී, ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් නම් කරන ලද එක් බේරුම්කරුවකු ද නගර සභාව විසින් නම් කරන ලද තවත් බේරුම්කරුවකු ද වශයෙන් බේරුම්කරුවන් දෙදෙනකු විසින් කරනු ලබන බේරුම් කිරීමක් මගින් නියම කිරීම හෝ ඒ බේරුම්කරුවන්ට එකී වටිනාකම ගැන එකඟත්වයකට එළඹීමට නොහැකි වුවහොත් බේරුම්කරුවන් විසින් එක්ව තෝරා ගන්නා ලද තීරකයකු විසින් නියම කිරීම, කළ යුතු ය.

(4) යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක ඉන් යම් කොටසක වටිනාකම (2) වන උපවගන්තියේ කාර්යයන් සඳහා නිශ්චය කිරීමෙහි ලා පහත දැක්වෙන මූල ධර්ම පිළිපැදිය යුතුය:—

(අ) යම් පාරක ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් හෝ ඒ ගොඩනැගිල්ලෙන්, මායිම් තාප්පයෙන් හෝ දොරටුවෙන් යම් කොටසක් ඉවත් කළහොත් ඒ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ ඉතිරි වන කොටස නිෂ්ප්‍රයෝජනවත් විය හැකි සහ ඒ හේතුව නිසා පාර පළල් කරන වේලාවෙහි දී ඒ සම්පූර්ණ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව ඉවත් කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ සම්පූර්ණ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ වටිනාකම තීරණය කළ යුතුය. තවද ඒ වටිනාකම විය යුත්තේ ගොඩනැගිලි සීමා නියම කරන වේලාවේ දී ඒ ස්ථානයේ, එනම්, ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ සහ ඊට අනුබද්ධ ඉඩමේ වෙළෙඳ වටිනාකම සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව රහිතව ඉඩමෙහි ඒ වේලාවේ ඇති වෙළෙඳ වටිනාකම අතර වන වෙනසය ;

(ආ) ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක කොටසක් පමණක් යම් පාරක ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි සහ ඒ කොටස වෙන් කොට ඉවත් කරනු ලැබීමෙන් පසුව ඉතිරි කොටස ඒ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ මුල් කාර්යය සඳහා හෝ නීතියෙන් අවකාශ ඇති වෙනත් යම් කාර්යයක් සඳහා සකස් කරගත හැකි වන අවස්ථාවක දී, ගොඩනැගිලි සීමා ඇතුළත වූ කොටසේ වටිනාකම පමණක් නිර්ණය කළ යුතුය : තවද ඒ වටිනාකම විය යුතු වන්නේ—

(i) ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ එම කොටස වෙන් කිරීමේ සහ ඉවත් කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැයෙහි ; සහ

(ii) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වූ විට, ගොඩනැගිල්ලේ එවිට ඉතිරි වන කොටස ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලැබූ වේලාවේ දී ගොඩනැගිල්ල පාවිච්චි කරනු ලැබූ කාර්යය සඳහා පවතින තත්ත්වයට පත් වන අන්දමින් ඒ ගොඩනැගිලි කොටස සකස් කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැයෙහි සහ, මායිම් තාප්පයක් හෝ දොරටුවක් සම්බන්ධයෙන් වූ විට, අවශ්‍ය විය හැකි එකතු කිරීම හෝ අලුත්වැඩියා කිරීම් පරිසමාප්ත කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැයෙහි

සමස්තයය ;



(ඇ) යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක වටිනාකම, නගර සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසුව ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි කරන ලද යම් වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් නිසා වැඩි වී ඇතැයි යම් පාරක් මත ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලබන වේලාවේ දී දැනගත් අවස්ථාවක දී, ඒ වෙනස් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා (1) වන උප වගන්තිය යටතේ වූ බලපත්‍රයක් මගින් බලය දී තිබිය හැකි වුවද, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව යථා තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා වෙනස් කිරීම හෝ වැඩි දියුණු කිරීම අවශ්‍ය වූයේ නම් මිස, වැඩිවීමේ මුදල ගණන් නොගත යුතු ය :

එසේ වුව ද, යම් ඉවත් කරන ලද ප්‍රඥප්තියක් යටතේ සංස්ථාපනය කරන ලද යම් නාගරික දිස්ත්‍රික් සභාවක අනුප්‍රාප්තිකයා වූ යම් නගර සභාවක් සංස්ථාපනය කිරීමේ දිනය ඒ නාගරික දිස්ත්‍රික් සභාව සංස්ථාපනය කිරීමේ දිනය ලෙස මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(5) යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් හෝ ඉන් කොටසක් පිළිබඳ වටිනාකම සම්බන්ධයෙන් (3) වන උප වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, කරනු ලැබූ සෑම තීරණයකම හෝ එළඹුණු සෑම එකඟවීමකම ඉහත කී වටිනාකම නියම කරනු ලැබූයේ හෝ නිශ්චය කරනු ලැබූයේ (4) වන උප වගන්තියේ යම් ඡේදයකට හෝ ඡේදවලට අනුකූලව ද ඒ ඡේදය හෝ ඡේද නිශ්චිතව සඳහන් විය යුතු ය.

(6) ගොඩනැගිලි සීමාවක් ඇතුළත පිහිටි එක් එක් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක හෝ ඉන් කොටසක, (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නියම කරන ලද හෝ තීරණය කරන ලද වටිනාකම සත්‍යයනය කළ හැකි සියලු එකඟවීම් හෝ තීරණ ද සමග ඒ වටිනාකම, නගර සභා කාර්යාලයේ වාර්තාගත කොට තැබිය යුතු ය.

(7) යම් පාරක ගොඩනැගිලි සීමාව ලකුණු කිරීමේ කාර්යය සඳහා, නගර සභාවේ යම් නිලධරයකු, සේවකයකු හෝ කම්කරුවකු, පාරට යාවූ යම් පෞද්ගලික ඉඩමකට ඇතුළු වී, ඒ ඉඩමට හැකිතාක් දුරට ඉතාම අල්ප අලාභයක් සිදුවීම සහතික වන අන්දමින් අවශ්‍ය සියලු පූර්වාරක්ෂක විධිවිධාන සලස්වමින්, පහසු ස්ථානවල ස්ථිර සලකුණු සවිය කිරීම නීත්‍යානුකූල විය යුතු ය. එසේ සිදු වන යම් අලාභයන් සඳහා සභාව වන්දි ගෙවිය යුතු ය.

(8) යම් පාරක ගොඩනැගිලි සීමාව මේ වගන්තිය යටතේ ලකුණු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ ගොඩනැගිලි සීමාව ඇතුළත නොවූ පාරක යම් කොටසක් පාර ඔස්සේ ගොඩනැගිලි පහසුකම් සැලැස්වීමේ කාර්යය සඳහා කුලියට දීමෙන් හෝ බදු දීමෙන් හෝ එබඳු

කොටසක් යම් පොදු කාර්යයක් සඳහා පාවිච්චි කිරීමෙන් හෝ පාවිච්චි කිරීමට අවසර දීමෙන් නගර සභාව වැළැක්වීම මේ ආඥාපනතේ වෙනත් විධිවිධාන අතුරින් යම් විධිවිධානයක සඳහන් කිසිවකින් සිදු වෙතැයි නොසැලකිය යුතු ය.

(9) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 10 වන වගන්තිය යටතේ පළලින් අඩි පනහකට වැඩි පාරක් සඳහා සලස්වනු ලබන වීථි රේඛා නිරූපනය කරනු ලැබූ යම් පාරකට හෝ එබඳු පාරක් සම්බන්ධයෙන් මේ වගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

ගොඩනැගිලි සීමා මඳ ලෙස වෙනස් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**75.** (1) 74 වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිලි සීමාව බල පෑ යම් දේපළක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දේපළ යා වූ පාර හෝ පාරේ කොටස සම්බන්ධයෙන් ගොඩනැගිලි සීමාව මඳ ලෙස වෙනස් කරන මෙන් ඉල්ලීමක් කරන ලද විට, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, එසේ කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තවද පාරවල් ඔස්සේ ගොඩනැගිලි සීමා අදාළ වන මේ ආඥාපනතේ විධිවිධානවල කාර්යයන් සඳහා, ඒ පාර හෝ පාරෙහි කොටස ඔස්සේ වූ ගොඩනැගිලි සීමාව විය යුතු වන්නේ අමාත්‍යවරයා විසින් එසේ මඳ ලෙස වෙනස් කරන ලද ගොඩනැගිලි සීමාව ය.

(2) යම් පාරක ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි ගොඩනැගිලිවල, මායිම් තාප්පවල, දොරටුවල හෝ ඉන් කොටසක වටිනාකම, නගර සභාවක් විසින් නිශ්චිතව දැනගෙන වාර්තාගත කරනු ලැබීමෙන් පසුව අමාත්‍යවරයා විසින් සම්පූර්ණ පාර හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ගොඩනැගිලි සීමාව මඳ ලෙස වෙනස් කරනු ලැබූ අවස්ථාවක දී, එසේ වාර්තාගත කරනු ලැබූ වටිනාකම, ගොඩනැගිලි සීමාව එසේ මඳ ලෙස වෙනස් කිරීම නිසා අවශ්‍ය විය හැකි පරිදි වෙනස් කිරීම හෝ යථාවත් කිරීම නගර සභාවේ කාර්යය විය යුතු ය. තවද එබඳු වටිනාකම්වල සෑම වෙනස් කිරීමක් ම හෝ යථාවත් කිරීමක් ම 74 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කළ යුතු ය.

74 වන වගන්තිය යටතේ වූ සියලු බලපත්‍ර සම්බන්ධයෙන් විය යුතු කොන්දේසිය.

**76.** (1) යම් පාරක ගොඩනැගිලි සීමාව ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් පිහිටා තිබෙන ඉඩම, පාර පළල් කිරීමේ කාර්යය සඳහා පසු කලෙක අත් කරගනු ලබන විටක ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය 78 වන වගන්තියේ විධිවිධානවලට අනුව නිශ්චය කළ යුතු ය යනු ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව යළි ඉදිකිරීම සඳහා හෝ ඊට යම් එකතුවක් කිරීම සඳහා 74 වන වගන්තිය යටතේ නගර සභාවක් විසින් දෙනු ලබන යම් බල පත්‍රයක ඇතුළත් විය යුතු කොන්දේසියක් විය යුතු ය.





(2) (අ) (1) වන උපවගන්තියෙහි දක්වා ඇති විස්තරයෙන් යුක්ත කොන්දේසියක් ඇතුළත් සෑම බල පත්‍රයක් ගැන ද ඒ කොන්දේසිය අදාළ ඉඩම සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව ගැනද සම්පූර්ණ විස්තර නගර සභා කාර්යාලයෙහි ඒ කාර්යය සඳහා තබාගත යුතු නාමලේඛනයක සභාව විසින් සටහන් කළ යුතු අතර ඒ එක් එක් ඉඩම සහ ගොඩනැගිල්ල මායිම් තාප්පය හෝ දොරටුව සහ ඊට අදාළ බල පත්‍රයේ කොන්දේසි සම්බන්ධයෙන් එසේ කරන ලද සටහනේ සහතික පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමට සභාපතිවරයා විසින් සැලැස්විය යුතුය. ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ඒ සියලු පිටපත් යම් ගාස්තුවකින් හෝ බද්දකින් තොරව ලියාපදිංචි කළ යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ යම් සටහනක් ලියාපදිංචි කරනු ලැබූ විට, ඉඩම හෝ ගොඩනැගිල්ල හෝ මායිම් තාප්පය හෝ දොරටුව යම් වේලාවක කවර තැනැත්තකුගේ අයිතියට හෝ සන්තකයට පත් විය හැකි වුවත්, ඒ සටහනේ දක්වා ඇති බල පත්‍රයේ කොන්දේසිය බල පෑ ඉඩම හෝ ගොඩනැගිල්ල හෝ මායිම් තාප්පය හෝ දොරටුව ඒ කොන්දේසියේ භාවය අනුව ඒ කොන්දේසියට යටත් ව තිබිය යුතු ය.

(ඇ) සභා කාර්යාලයේ තබා ඇති නාම ලේඛනය, ඒ ගැන උනන්දුවක් දක්වන යම් තැනැත්තකු විසින් සභාවේ කටයුතු සඳහා කාර්යාලය විවෘතව ඇති යම් වේලාවක පරීක්ෂා කරනු ලැබිය හැකි වන සේ තැබිය යුතු ය.

(ඈ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන, මේ උපවගන්තියේ සඳහන් යම් සටහනකට හෝ සටහනක පිටපතකට අදාළ නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කොන්දේසිවලට යටත් ව, යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් යළි ඉදි කිරීම සඳහා හෝ ඊට යම් එකතුවක් කිරීම සඳහා, එසේ නොවන විටක හිමිකම ඇති යම් තැනැත්තකුට, 74 වන වගන්තියේ නිශ්චිතව සඳහන්ව ඇති ගොඩනැගිලි සීමාව ඇතුළත වූ ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව යළි ඉදිකිරීම පිණිස හෝ ඊට එබඳු එකතුවක් කිරීම පිණිස බලපත්‍රයක් ලැබීමට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, එසේ යළි ඉදි කරන ලද විට හෝ කොටසක් එකතු කරන ලද විට එසේ යළි ඉදි කරන ලද හෝ කොටසක් එකතු කරන ලද ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ දොරටුවක කිසි ම කොටසක් එය මුල් අවස්ථාවේ දික්ව තිබූ ප්‍රමාණයට වඩා පාර මධ්‍යයට ළංවන සේ දික් නොවිය යුතු ය.

(4) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් "යළි ඉදි කිරීම" යන යෙදුමට, බිම සිට අඩි පහක දුර ප්‍රමාණයකට හෝ අඩි පහක දුර ප්‍රමාණයක් ඇතුළත කඩා දමන ලද හෝ අනාඝාතයකින් විනාශ කරන ලද ගොඩනැගිල්ලක කොටසක් වන යම් බිත්තියක් හෝ

ගොඩනැගිල්ලකට දී ඇති රූකුලක් ප්‍රතිසංස්කරණය කිරීමක් ඇතුළත් වන නමුත් නගර සභාවේ මතය අනුව බිත්තියෙහි හෝ රූකුලෙහි අලුත්වැඩියා කිරීමක් ලෙස සාධාරණ අන්දමින් සැලකිය හැකි යම් ක්‍රියාවක් ඇතුළත් නොවේ.

**ආඥාපනත උල්ලංඝනය වන ලෙස ඉදි කරන ලද හෝ යළි ඉදි කරන ලද හෝ ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් පිළිබඳව ක්‍රියා කිරීමට නගර සභාවට ඇති බලය.**

77 යම් තැනැත්තකු විසින් 74 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් යම් නගරයක් ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් ඉදි කරනු ලැබුවහොත් හෝ යළි ඉදි කරනු ලැබුවහොත් හෝ යම් ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට හෝ දොරටුවකට යම් කොටසක් එකතු කරනු ලැබුවහොත්, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව හෝ එකතු කරන ලද ඒ කොටස යම් නිලධරයකු හෝ සේවකයකු ලවා කඩා දැමීමට හෝ ඉවත් කරවීමට ඒ නගරයේ නගර සභාවට හිමිකම තිබිය යුතු අතර, එම කාර්යය සඳහා, නගර සභාවක් වෙත මේ කොටසින් පැවරී ඇති පරිද්දෙම වූ ඇතුළු වී පරීක්ෂා කිරීමට ඇති අයිතිවාසිකම් මෙන්ම මංමාවතක යම් අවහිරයක් හෝ ප්‍රසර්පණයක් හෝ සංකල්පිත අවහිරයක් හෝ සංකල්පිත ප්‍රසර්පණයක් නතර කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්යයන් සඳහා නගර සභාවක් වෙත මේ කොටසින් පැවරී ඇති පරිද්දෙම වූ ඇතුළුවීමේ සහ මැනීමේ බලය ද ඉවත් කිරීම, අවහිර නතර කිරීම සහ ගාස්තු අය කර ගැනීම සඳහා වූ බලය ද නගර සභාවට තිබිය යුතු ය. තව ද ඒ අනුව එබඳු අවහිරවලට හෝ ප්‍රසර්පණවලට අදාළ මේ කොටසේ සියලු විධිවිධාන, ඒවා අදාළ විය හැකි තාක් දුරට, අවශ්‍ය විය හැකි මඳ වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**ගොඩනැගිලි තැනීමෙන් සංවර්ධනය කරන ලද ඉඩම් සම්බන්ධ වන්දි තක්සේරු කිරීමේ මූල ධර්ම**

78 (1) පාරක් මත ලකුණු කර ඇති ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටා ඇති සහ ගොඩනැගිලි සීමාව ඇතුළත සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් පිහිටන ලෙස ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් සංවර්ධනය කරන ලද යම් ඉඩමක් එම පාර පළල් කිරීමේ කාර්යය සඳහා අත්කර ගනු ලබන අවස්ථාවකදී, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එබඳු අවස්ථාවක දී ගෙවිය යුතු වන්දිය නිර්ණය කිරීම, එම පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන විශේෂ විධිවිධානවලට යටත් ව විය යුතු ය:—

(අ) සම්පූර්ණ ගොඩනැගිල්ල හෝ සම්පූර්ණයෙන් යම් මායිම් තාප්පයක් හෝ දොරටුවක් ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටි අවස්ථාවක දී, අත් කරගන්නා ලද ඉඩම රහිතව, ගොඩනැගිල්ලට, මායිම් තාප්පයට හෝ දොරටුවට නියම කරනු ලබන වටිනාකම විය යුතුවන්නේ, ගොඩනැගිලි සීමාව ලකුණු කළ වේලාවේ දී 74 වන වගන්තිය යටතේ වාර්තාගත කරන ලද වටිනාකමය. අත්කර ගන්නා වේලාවේ දී ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ වෙළෙඳ අගය යන දෙකින් කවරක් හෝ අඩු එක ය. තව ද





ඉහත කී කාර්යය සඳහා ඒ වෙළෙඳ අගය විය යුතුවන්නේ අත්කර ගන්නා වේලාවේදී ගොඩනැගිල්ලට, මායිම් තාප්පයට හෝ දොරටුවට අනුබද්ධ ඉඩම් ද සහිතව ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි වෙළෙඳ අගය සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව රහිතව ඒ වේලාවේ ඒ ඉඩමේ ඇති වෙළෙඳ අගය අතර ඇති වෙනස ය;

(ආ) ගොඩනැගිල්ලේ හෝ යම් මායිම් තාප්පයක හෝ දොරටුවක කොටසක් පමණක් ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටි සහ 74 වන වගන්තිය යටතේ වාර්තාගත කරන ලද වටිනාකම වූ කලී එම වගන්තියේ (4) (අ) වන උපවගන්තියට අනුකූලව සම්පූර්ණ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ වටිනාකම වන අවස්ථාවක දී, අත් කර ගත් ඉඩම රහිතව ඒ ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි ඒ කොටසට නියම කරනු ලබන වටිනාකම විය යුතුවන්නේ, එසේ වාර්තාගත කරන ලද වටිනාකම ය. අත් කර ගන්නා ලද වේලාවේ දී සම්පූර්ණ ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි වෙළෙඳ අගය ය යන දෙකින් කවරක් හෝ අඩු එක ය. තවද ඉහත කී කාර්යය සඳහා ඒ වෙළෙඳ අගය විය යුතු වන්නේ අත් කරගත් වේලාවේ දී සම්පූර්ණ ඉඩමට, මායිම් බිත්තියට හෝ දොරටුවට අනුබද්ධ ඉඩම ද සහිතව සම්පූර්ණ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ වෙළෙඳ අගය සහ සම්පූර්ණ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ දොරටුව රහිතව ඒ වේලාවේ ඒ ඉඩමේ ඇති වෙළෙඳ අගය අතර ඇති වෙනස ය;

(ඇ) ගොඩනැගිල්ලේ හෝ යම් මායිම් තාප්පයක හෝ දොරටුවක කොටසක් පමණක් ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටි සහ 74 වන වගන්තිය යටතේ වාර්තාගත කරන ලද වටිනාකම වූ කලී එම වගන්තියේ (4) (ආ) වන උපවගන්තියට අනුකූලව එම කොටසේ වටිනාකම වන අවස්ථාවක දී, අත්කර ගත් ඉඩම රහිතව ඒ ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි ඒ කොටසෙහි නියමිත වටිනාකම විය යුතු වන්නේ එසේ වාර්තාගත කරන ලද වටිනාකම ය. අත් කරගත් වේලාවේ දී ගොඩනැගිලි සීමාව ඇතුළත වූ ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ දොරටුවෙහි ඒ කොටසේ වටිනාකම ය යන දෙකින් කවරක් හෝ අඩු එක ය. තව ද, ඉහත කී කාර්යය සඳහා ඒ වටිනාකම විය යුතු වන්නේ—

(i) ඒ වේලාවේ දී ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ දොරටුවේ ඒ කොටස වෙන් කිරීමේ හෝ ඉවත් කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැයෙහි; සහ

(ii) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වූ විට, ගොඩනැගිල්ලේ එවිට ඉතිරි වන කොටස ඒ වේලාවේ දී පාවිච්චි කරනු ලබන කාර්යය සඳහා පවතින තත්ත්වයට පවත්නා අන්දමින් ඒ ගොඩනැගිලි කොටස සකස් කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැය සහ මායිම් තාප්පයක් හෝ දොරටුවක් සම්බන්ධයෙන් වූ විට, අවශ්‍ය විය හැකි එකතු කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් එම වේලාවේ දී පරිසමාප්ත කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැයෙහි

සමස්තය ය;

(ඈ) සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසුව යම් වේලාවක 74 වනවගන්තිය උල්ලංඝණය කරමින් ඉදි කරන ලද හෝ එම වගන්තියෙන් නියමිත බල පත්‍රය රහිතව යලි ඉදි කරන ලද හෝ කොටස් එකතු කරන ලද හෝ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් සම්බන්ධයෙන් කිසි ම වන්දියක් නොගෙවිය යුතු ය.

(ඉ) ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි රහිතව ඉඩමට නියම කරන ලද වටිනාකම විය යුතු වන්නේ අත් කර ගන්නා වේලාවේ දී ඉඩමේ වෙළෙඳ අගය ය.

(ඊ) ඉඩම වූ කලී යම් එක් තැනැත්තකුට හෝ තැනැත්තන් සමූහයකට අයිති යම් ස්ථානයක කොටසක් පමණක් වන අවස්ථාවක දී—

(i) ඒ ස්ථානයේ ඉතිරි කොටසේ ඉදිරිපස සිට පසුපස දක්වා ඇති ඉඩ, අත් කර ගත යුතුව ඇති ගොඩනැගිල්ලට සමාන ස්වභාවයකින් යුක්ත ගොඩනැගිල්ලක් සඳහා එය ගොඩබිමක් විධියෙන් පාවිච්චි කරනු ලැබීමට ප්‍රමාණවත් නම්, ඉඩමට නියම කරනු ලබන වෙළෙඳ අගය විය යුතු වන්නේ ආසන්න ප්‍රදේශයේ පාරකට මුහුණ ලා ඇති එවැනි ඉඩමක එම වේලාවේ දී ඇති වටිනාකමෙන් අඩකි; තවද

(ii) ඒ ස්ථානයේ ඉතිරි කොටසේ ඉදිරිපස සිට පසු පස දක්වා ඇති ඉඩ, (i) වන ඡේදයේ සඳහන් කාර්යය සඳහා ප්‍රමාණවත් නොවේ නම්, ඉඩමට නියම කරනු ලබන වෙළෙඳ අගය විය යුතු වන්නේ ආසන්න ප්‍රදේශයේ පාරකට මුහුණ ලා ඇති එවැනි ඉඩමක එම වේලාවේ දී ඇති වටිනාකම ය;

(උ) ඉඩම අත් කර ගැනීමෙන් හෝ එහි පිහිටි යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ දොරටුවක් කඩා දැමීමෙන් පසුව පාරෙහි කරන ලද යම් පළල් කිරීමක් නිසා එම





අයිතිකරුට ම හෝ අයිතිකරුවන්ට ම අයිති වෙන යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක වටිනාකමෙහි වීමට ඉඩ ඇති යම් වැඩි වීමක් පිළිබඳව සැලකිල්ල දැක්විය යුතු ය;

(ඌ) ගොඩනැගිල්ල පිළිබඳව වුවත් ඉඩම පිළිබඳව වුවත්, අත් කර ගැනීමේ අනිවාර්ය ස්වභාවය සම්බන්ධයෙන් කිසි ම අතිරේක වන්දියක් නොගෙවිය යුතු ය.

(2) (i) වන උපවගන්තියේ (ඊ) (II) වන ඡේදයේ සඳහන් යම් අවස්ථාවක දී, සභාව මුලින් අත් කර ගැනීමට අදහස් කළ කොටස සඳහා එම ඡේදය යටතේ නියම කරන ලද වටිනාකමේ අනුපාතිකය අනුව අයිතිකරුගේ සම්පූර්ණ ස්ථානය ම අත් කර ගන්නා ලෙස නගර සභාවෙන් ඉල්ලා සිටීමට ඔහුට නිදහස තිබිය යුතු ය.

ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටි ඉඩමෙහි අයිතිකරු සඳහා යාබද ඉඩමක් අත් කරගැනීමට සභාවට ඇති බලය.

**79.** නගරයක් තුළ පිහිටි පාරකට යාව ඇති යම් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිවාසිකම ඒ පාරෙහි ලකුණු කර ඇති ගොඩනැගිලි සීමාව නිසා සීමා වන විටක සහ ඒ තැනැත්තා එම ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අභිලාෂයෙන් සිටින විටක, එකී මුලින් සඳහන් ඉඩමට පිටුපසින් පිහිටා වූ ද ඒ සීමා කිරීම නොවීණි නම් ඒ අයිතිකරු විසින් භුක්ති විඳිය හැකිව තිබුණු ස්වභාවයේ ම ගොඩනැගිලි පහසුකම් ඔහුට සැපයෙන තරම් සෑහෙන ප්‍රමාණයකින් යුක්ත වූ ද යම් ඉඩමක් ඒ තැනැත්තාගේ ඉල්ලීම පිට ඔහුගේ වියදමින් ඔහු සඳහා නගර සභාව විසින් අත් කර ගනු ලැබිය හැකි ය. එකී යම් කාර්යයක් සඳහා අවශ්‍ය සියලු ඉඩම් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ඉඩම් ලෙස සලකනු ලැබිය යුතු අතර, 78 වන වගන්තියේ විධිවිධාන ඒ ඉඩම් තක්සේරු කිරීමට අදාළ විය යුතු ය.

### මංමාවත්වලට ඇති බාධක

හිමිකම ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය.

**80.** (1) යම් නගර සභාවක පාලනය යටතේ ඇති යම් මංමාවතක හෝ ඊට යාබදව ම පිහිටි රජයට අයිති යම් භූමි ඉඩමක හෝ වෙනත් යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක්, කොටුවක් හෝ බාධකයක් ඉදි කර හෝ සාදා ඇති බව එම නගර සභාවට පෙනී ගිය කවර හෝ අවස්ථාවක දී, ඒ ගොඩනැගිල්ල හෝ කොටුව ඉදි කරන ලද හෝ ඒ බාධකය ඇති ස්ථානයේ අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තා වෙත, ඒ හිමිකම ඔහුට ලබා දීමට හේතු කාරක වූ සැම ඔප්පුවක්, ලේඛනයක් සහ සාධන පත්‍රයක් ම ඉදිරිපත් කරන ලෙස නියම කරමින් ඒ සභාව විසින් ලිඛිත දැන්වීමක් භාර දීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) පහත සඳහන් යම් අවස්ථාවක, එනම්—

(අ) යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරුගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ තොරතුරු දන්වන ලෙස සභාව විසින් ඉල්ලා සිටින ලද විටක, ඒ ස්ථානයේ ප්‍රෝක්ත අයිතිකරු නොවන ඒ ස්ථානයේ පදිංචිකරු විසින් එසේ දන්වීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක ; හෝ

(ආ) යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරු ඒ ස්ථානය පිළිබඳ අයිතිය පිළිබඳ හිමිකම් පෑමට පදනම් කර ගන්නා වූ ද තම සන්තකයේ ඇත්තා වූ ද සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීමෙන් දවස් දහයක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක ; හෝ

(ඇ) අදාළ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය තම සන්තකයේ නැති යම් ස්ථානයක ප්‍රෝක්ත අයිතිකරු, ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය සන්තකයේ තබාගෙන සිටින තැනැත්තාගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ විස්තර නගර සභාවට සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක ; හෝ

(ඈ) එකී යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් තම සන්තකයේ ඇති තැනැත්තකු, එය ඉදිරිපත් කරන ලෙස සභාව විසින් ලිඛිත ව ඉල්ලා සිටිනු ලැබීමෙන් දවස් දහයක් ඇතුළත එය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවක

එසේ ප්‍රතික්ෂේප කරන්නා වූ සෑම පදිංචිකරුවකු ම, ප්‍රෝක්ත අයිතිකරුවකු ම හෝ තැනැත්තකු ම රුපියල් පන් සියයකට නො වැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. [1984 අංක 48 §8.]

**ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමේ බලයට පරීක්ෂා කිරීමේ බලය ද ඇතුළත් විය යුතු බව.**

81. (i) 80 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලෙස නගර සභාවක් විසින් ඉල්ලන ලද සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ම එය අදාළ වන ස්ථානයේ දී හෝ නගර සභාව විසින් නියම කරනු ලබන වෙනත් ස්ථානයක දී ඉදිරිපත් කළ යුතු ය ; තව ද ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට එම වගන්තියෙන් පවරන ලද බලයට, අවශ්‍ය විය හැකි පරිදි ඒ ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර පරීක්ෂා කිරීමට සහ ඒවායේ පිටපත් ගැනීමට ඇති බලය ද ඇතුළත් වන බව සැලකිය යුතු ය.





(2) තත් කාර්යය සඳහා නගර සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් පරීක්ෂා කිරීමට හෝ එහි පිටපතක් ගැනීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තකු ම රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. [1984 අංක 48 §9.]

**ස්ථානයක් මැනීමට ඇති බලය.**

82. 80 (1) වන වගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී ඉදි කරන ලද හෝ සාදන ලද ගොඩනැගිල්ල හෝ කොටුව හෝ බාධකය නිසා යම් මංමාවතක හෝ මංමාවතකට යාව පිහිටි යම් රජයේ ඉඩමක ප්‍රසර්පණයක් සිදු වී තිබේ දැයි නිශ්චය වශයෙන් දැන ගැනීමට නගර සභාවට හැකි වීම පිණිස, තත් කාර්යය සඳහා නගර සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි පරිදි ඒ ස්ථානය මැනීමටත් ඒ මැනීමේ කාර්යයන් සඳහා ඒ ස්ථානයට සහ ඇතුළු වීම අවශ්‍ය යැයි ඔහු අදහස් කරන වෙනත් කවර හෝ ස්ථානයකට ඇතුළු වීමත් නීත්‍යනුකූල වන්නේ ය.

**ප්‍රසර්පණයක් බව පෙනෙන අවස්ථාවකදී අයිතිවාසිකම් ඔප්පු කිරීම අයිතිකරුට භාර කාර්යයක් බව.**

83. (1) යම් නගර සභාවක පාලනය යටතේ ඇති යම් මංමාවතක පථය නිසි බලය නොමැතිව වෙනස් කර තිබෙන බව හෝ නවත්වා තිබෙන බව හෝ ඊට අවහිරයක් කර තිබෙන බව හෝ එහි ප්‍රසර්පණයක් කර ඇති බව ඒ නගර සභාවට පෙනී යන කවර හෝ අවස්ථාවක දී, ඒ මංමාවත වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ හෝ ඒ නැවැත්වීම හෝ බාධකය සිදු කරන ලදැයි හෝ ප්‍රසර්පණය සිදු වී ඇතැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමක ද ඒ ඉඩමේ පදිංචිකරු වෙත, සභාව විසින් හෝ සභාවේ විධානය පරිදි ඉඩම මැන තිබෙන බවට ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාව විසින් කළ යුතු අතර ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන ස්ථානයක දී ඒ මැනුම් පිඹුර ඒ පදිංචිකරු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි බව ද ඒ දැන්වීම භාර දුන් දින සිට මාසයක් ඇතුළත ඔහු විසින් හෝ, ඔහු එම ඉඩම දරන්නේ යම් තැනැත්තකුගේ බලය යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඒ පිළිබඳ ව ස්වකීය හිමිකම තහවුරු කිරීම සඳහා සහ එබඳු යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම වැළැක්වීම සඳහා නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබුවහොත් මිස, 84 වන වගන්තියෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට ඒවා ඉවත් කිරීම සඳහා සභාව විසින් ක්‍රියා කරන බව ද ඉන් දැන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිත ව නියමිත කාලය ඇතුළත නීති කෘත්‍ය ආරම්භ කරනු නොලැබුවහොත් හෝ නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබූ මුත් ඒවා යථා පරිදි පවත්වාගෙන යනු නොලැබුවහොත්, 84 වන වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට එකී යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහා ම ඉවත් කරවීම සභාවේ යුතුකම වන්නේ ය.

(3) නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබූ අවස්ථාවක, යම් මංමාවතක පථය වෙනස් කරන ලදැයි හෝ වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ හෝ නැවැත්වීම හෝ බාධකය හෝ ප්‍රසර්පණය සිදු කරන ලදැයි කියන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමේ අයිතිකරු බවට හිමිකම් පාන තැනැත්තාට ඒ ඉඩමට ඇති හිමිකම ඔප්පු කිරීම ඔහුට භාර කාර්යයක් වන්නේ ය.

බාධක හෝ ප්‍රසර්පණ ඉවත් කිරීම.

84. (1) යම් නගර සභාවක පාලනය යටතේ ඇති යම් මංමාවතක බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහාම ඉවත් කරන ලෙස හෝ අස් කරන ලෙස ඒ බාධකය හෝ ප්‍රසර්පණය සිදු කළ යම් තැනැත්තකුට සභාව විසින් තත් කාර්යය සඳහා සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ මාර්ගයෙන්, වාචිකව හෝ ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය; තව ද ඒ නියමය ලැබූ තැනැත්තකු විසින් සෑහෙන කාලයක් ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ ඒ නියමය ලැබිය යුතු නිසි තැනැත්තා කවරෙක් ද යන්න ගැන යම් සැකයක් ඇති වුව හොත් ඒ දැන්වීම ඒ බාධකයෙහි හෝ ප්‍රසර්පණයෙහි සාධාරණ කාලයක් අලවා තිබීමෙන් පසුව සභාව විසින් එබඳු යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් නොපමාව ම ඉවත් කරවීම හෝ නතර කරවීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමේ හෝ නතර කිරීමේ කාර්යය සඳහා නගර සභාව විසින් හෝ නගර සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන් සමග සහ අවශ්‍ය විය හැකි උපකරණ සහ ද්‍රව්‍ය ද රැගෙන යම් ගෙයකට, වත්තකට, කොටුවකට හෝ වෙනත් ස්ථානයකට ඇතුළු වී, ඒ ඉවත් කිරීම හෝ නතර කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා හෝ පියවර ආරම්භ කිරීම හෝ ආරම්භ කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමෙහි ලා හෝ නතර කිරීමෙහි ලා නගර සභාව විසින් දරන ලද වියදම්, එම වියදම් එසේ දරන්නට සිදු වූයේ යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයට අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා ද ඒ තැනැත්තා විසින් ඒ වියදම් ඉල්ලූ විට නොගෙවන ලද අවස්ථාවක දී සභාවේ සභාපතිවරයා විසින් ඒ වියදම් ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය* වෙත සහතික කළ යුතු අතර ඒ වියදම් ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කරගන්නා ආකාරයට ඒ අධිකරණය විසින් අය කරගත යුතු ය. එසේ අය කරගන්නා ලද සියලුම මුදල් අධිකරණය විසින් නගර සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

* අධිකරණ සංවිධාන පනතේ 32 වන වගන්තිය ද බලන්න.





(4) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම හෝ නතර කිරීම ඒ ස්ථානයට ඇති හිමිකම දක්වන සියලුම ඔප්පු ලේඛන සහ සාධන පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව කරන ලද නමුත් ඒ ස්ථානය ඊට හිමිකම් පාන පාර්ශ්වකරුගේ දේපළ යැයි නිශ්චිත ව ඇති අවස්ථාවක දී, ඉන් සිදු වන සියලුම අලාභ හා හානි සඳහා නගර සභාවෙන් වන්දි ලැබීමට ඒ පාර්ශ්වකරු හිමිකම් ලැබිය යුතු ය; එහෙත් ඒ සියලු ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ ස්ථානයේ අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු හෝ අතපසු කරනු ලැබූ නමුත්, එසේ නැත හොත් ඒ ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ පසු දවස් දහයක් ඇතුළත ඉදිරිපත් කරනු නොලැබූ නමුත් එබඳු ගෙවනැගිල්ලක්, කොටුවක් හෝ ප්‍රසර්පණයක් එකී යම් නගර සභාවක් විසින් ඉවත් කිරීමට සලස්වනු ලැබූ අවස්ථාවකදී ඒ ස්ථානය එහි අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරුගේ දේපළ වශයෙන් විනිශ්චය කරනු ලැබුවද, ඉන් සිදු වූ යම් අලාභයක් හෝ හානියක් සඳහා යම් වන්දියක් ලැබීමට ඒ පාර්ශ්වකරු හිමිකම් නොලැබිය යුතු ය.

මංමාවත් ආදියට හානි පැමිණවීම

සැතපුම් ගල්, පාලම් ආදිය විනාශ කිරීම.

[1984 අංක 48 § 10.]

*85. පහත දැක්වෙන යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය :—

(1) යම් මංමාවතකට අයත් වූ හෝ පාරවල් සෑදීමේ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ඒ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කපා ඇති යම් වළක් හෝ ගල් වළක් හෝ ඒ ආසන්නයේ ඉදි කර ඇති යම් සැතපුම් ගලක්, සැතපුම් කණුවක්, මායිම් ගලක්, මායිම් කණුවක්, ලාම්පු කණුවක්, නියැමක කණුවක් හෝ යම් පාලමක්, බෝක්කුවක්, තාප්පයක්, ආරුක්කුවක්, බිත්තියක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, සීල් දොරක්, ඉවුරක්, ආධාර බැම්මක්, ගොඩැල්ලක්, කරුවක්, කුලුණක්, ලාම්පුවක්, අත්වැලක්, දම්වැලක් හෝ වැටක් ඕනෑකමින්ම හෝ නොසැලකිලිමත්කමින් විනාශ කිරීම, උගුල්ලා දැමීම, විකෘති කිරීම, පෙරලා දැමීම, කැඩීම හෝ ඊට හානි පැමිණවීම ; හෝ

(2) යම් මංමාවතක් ප්‍රයෝජනයට ගනු ලැබීම තාවකාලික ලෙස වැළැක්වීම සඳහා හෝ එය අලුත්වැඩියා කරන අතරතුර එහි එහා මෙහා ගමන් කරන තැනැත්තන්ට අනතුරක් හෝ හානියක් සිදු වීම වැළැක්වීම සඳහා යම් නිසි බලධරයකුගේ විධානය මත එහි තබන ලද හෝ ඉදි කරන ලද යම් වැටක්, කණුවක්, ගලක්, ලී කොටයක් හෝ වෙනත් දෙයක් ඕනෑකමින් ම හෝ නීතිවිරෝධී ලෙස ඉවත් කිරීම ; හෝ

* 1979.07.02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.

(3) නිසි බලධරයකුගේ අවසරය නොමැති ව යම් මංමාවතකින් ගල්, බොරලු, වැලි හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ මඩ, කුණු සුළඟට ගසාගෙන යන දේ හෝ පස් එකතු කිරීම, ගොඩ ගැසීම හෝ රැගෙන යෑම ; හෝ

(4) යම් මංමාවතකට හානි සිදු වන අන්දමින් ඒ මංමාවතේ හෝ මංමාවතෙන් ඉවතට හෝ ඒ මංමාවත මතට හෝ ඒ මංමාවත තුළට යම් හස්තියකු, ගවයකු, අශ්වයකු, ඌරකු හෝ වෙනත් සතකු හෝ යම් වාහනයක් ගෙන යෑම හෝ දැක්වීම හෝ ඒ මංමාවතට අලාභ හානි කිරීමට එකී යම් සතකුට ඉඩ හැරීම ; හෝ

(5) යම් පාරකට යාබද යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරුව සිටිමින් ඒ පෑළේ සිට හෝ ඒ පාරේ සිට දිවෙන යම් අගලක හෝ කාණුවක සිට තමාගේ ඉඩම මැදින් හෝ ඉඩම තුළට ගලන ජලය එසේ ගලායාම අවහිර වීමට ඉඩ හැරීම හෝ ඒ ඉඩමේ හෝ ගෙයි සිට වතුර, කැලි කසළ හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ දෙයක් එකී යම් පාරකට ගලාගෙන ඒමට හෝ ගසාගෙන ඒමට ඉඩ හැරීම හෝ ඔහුගේ ගෙය හෝ ඉඩම ඉදිරිපිට ඇති යම් කාණුවක ජලය ගලා යෑමට බාධා වන පරිදි ඒ කාණුවේ කුණු හෝ අපවිත්‍ර ද්‍රව්‍ය එක් රැස් වීමට ඉඩ හැරීම ; හෝ

(6) නගර සභාවෙන් කලින් ලබා ගත් එකඟත්වය නොමැති ව ඔහුගේ ඉඩමේ කරනු ලබන යම් ක්‍රියාවකින් යම් පාරක වූ යම් කාණුවක් හෝ බෝක්කුවක් ඔස්සේ හෝ එබඳු කාණුවකින් හෝ බෝක්කුවකින් නිදහසේ ජලය ගලා යෑමට බාධා කිරීම ; හෝ

(7) යම් මංමාවතකට අලාභ සිදු වන පරිදි, ඒ මංමාවත මත යම් දැව දණ්ඩක්, ගලක් හෝ වෙනත් දෙයක් රෝද සහිත වාහනයකින් නොවන වෙනත් ක්‍රමයකින් ඇදගෙන යෑම හෝ ගෙන යෑම හෝ රෝද සහිත වාහනයක් තුළ සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් පටවා ගෙන යන යම් දැව දණ්ඩක්, ගලක් හෝ වෙනත් දෙයක් ඒ මංමාවත මත ඇදී යෑමට හෝ ඇතිල්ලෙමින් යෑමට ඉඩ හැරීම ; හෝ

(8) යම් පාරක් මත හෝ ඒ හරහා යම් වේල්ලක්, අගලක්, කාණුවක් හෝ ජල මාර්ගයක් සෑදීම හෝ සෑදීමට සැලැස්වීම හෝ වෙනත් ක්‍රමයකින් යම් පාරක් මතුපිට කැඩීම හෝ ඊට අලාභ හානි සිදු කිරීම ; හෝ

(9) නගර සභාවේ අවසරය නොමැතිව හෝ ඒ අවසරයේ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල නොවන ක්‍රමයකින් ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් යම් මංමාවතක හෝ මංමාවතක් ඔස්සේ හෝ මංමාවතක් යට හෝ



මංමාවතක් මත යම් කාණුවක්, කුලුණක්, ලැම්පුවක්, කම්බියක්, කළයක්, වැටක් හෝ වෙනත් පිරියතක්, ද්‍රව්‍යයක් හෝ වැඩ බිමක් ඉදි කිරීම, සිටුවීම, දැමීම හෝ ගොඩ නැගීම ; හෝ

(10) යම් පාරක පැති කාණුවේ පිට ගැටය අවුරා පාර දෙසට නෙරා යන සේ තමාගේ ගෙට අලුත් කොටසක් එකතු කිරීම හෝ යම් තාවකාලික ආධාරක මගින් හෝ වෙනත් ක්‍රමයකින් පාරක යම් කොටසක් මත හෝ එහි පැති කාණුව මත යම් වර්ගයක බඩු විකිණීම පිණිස තැබීම හෝ පැති කාණුවලට කවර හෝ අන්දමකින් හානි සිදු වන ආකාරයට තමාගේ වාසස්ථානය ඉදිරිපිට කරත්තවලට බඩු පැටවීමට හෝ බඩු බෑමට සැලැස්වීම.

86. නගර සභාවක පාලනය යටතේ අලුත් මංමාවතක ඉදි කරන ලද විට හෝ තිබෙන මංමාවතක යම් අලුත්වැඩියා කිරීමක් ක්‍රියාත්මක කරන ලද විට, ඉදි කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම වීමෙන් පසු එක් මාසයකට නොවැඩි නිශ්චිත කාල සීමාවක් තුළ එම මංමාවතෙහි යම් සතකු පිට යෑම හෝ යම් සතකු දක්කීම හෝ යම් වාහනයක් ධාවනය කිරීම, එම මංමාවතෙහි පාලනය දරන නගර සභාව විසින් එම මංමාවතෙහි හෝ එම මංමාවතට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් තහනම් කිරීම නීත්‍යානුකූල විය යුතු ය ; තව ද, ඒ දැන්වීම උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

සෑදීමෙන් පසු අලුත් පාරක් එක්තරා කාලයක් තුළ පාවිච්චි කිරීම.

[1984 අංක 48 §11.]

87. පැත්තකින් කාණුවක් තනා හෝ හාරා ඇති යම් මංමාවතකට යා වූ යම් ගෙයක හෝ ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ මංමාවතේ සිට ඒ ගෙට හෝ ස්ථානයට අවතීර්ණ වීමේ මාර්ගයක් අවශ්‍ය වුවහොත් ඒ කාණුවේ දිගින් අඩි තුනකට කිසි විටකවත් අඩු නොවිය යුතු ප්‍රමාණයක් ආවරණය වන පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් නගර සභාව සෑහීමට පත් වන ආකාරයට දැමීමට ඔහු බැඳී සිටින්නේ ය ; තව ද යම් තැනැත්තකුට එසේ පිහිටි යම් ගෙයකට හෝ ස්ථානයකට ඒ මංමාවතේ සිට අවතීර්ණ වීමට අයිතිය ඇති බවට ද ඒ පාලම, වේදිකාව හෝ ආරුක්කුව සැපයිය යුතු බවට ද නගර සභාව සෑහීමට පත්ව ඇති විට, එම පාලම, වේදිකාව හෝ ආරුක්කුව වහා ම ඉදි කරන ලෙස එම ගෙයි හෝ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නගර සභාව විසින් නියම කිරීමෙන්, සාධාරණ කාලයක් ඇතුළත එසේ එය ඉදි කිරීම ඔහු පැහැර හැරියහොත් නගර සභාව විසින් එම වැඩය කරවීමත් ඒ සඳහා ගිය වියදම් 84 වන වගන්තියේ සඳහන් වියදම් අය කර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගැනීමත් නීත්‍යානුකූල වන්නේ ය.

කාණුව උඩින් තමාගේ ගෙට යෑමට පාලමක් ආදිය සෑදීමට අයිතිකරු හෝ පදිංචිකරු බැඳී සිටින බව.

මංමාවත්වලට හානි පැමිණෙන අන්දමට ගස් වැවෙන්නට ඉඩ හැරීම.

*88. තමා අයිතිකරු වන හෝ තමා පදිංචි ව සිටින යම් ස්ථානයක, යම් මංමාවතකට හානියක් සිදු වන අයුරින් යම් ගසක් වැවෙන්නට ඉඩ හරින යම් තැනැත්තකු ඒ හානිය නතර කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔහුට නියම කරමින් නගර සභාව විසින් ඔහුට දැන්වීමක් භාර දීමෙන් පසුව ද දැන්වීමෙහි ඒ කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුව ද එසේ වැවෙන්නට ඉඩ හරින්නේ නම් ඔහු රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. තවද අවශ්‍ය පියවර ගැනීම වරදකරු විසින් පැහැර හැර ඇති විටක, ඔහු එසේ වරදකරු කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකු* ඉදිරියේ ද ඒ මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ පියවර නගර සභාව විසින් ගත යුතු බවටත් ඒවායේ වියදම් 84 වන වගන්තියේ සඳහන් වියදම් අය කර ගැනීම සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කරගන්නා ලෙසත් විධාන කළ හැකි ය.

[1984 අංක 48 §12.]

ආසන්න ඉඩම් එළි කිරීමෙන් ඒවායේ වතුර බැස්සවීමෙන් හෝ කැළෑ කැපීමෙන් මංමාවත්වලට හානි සිදු කිරීම.

89. (1) යම් මංමාවතකට හානියක් වීමට හේතු විය හැකි පරිදි ජලය හෝ මඩ රොන් පිටට ගලා යෑමේ හෝ ගලා යෑම වැඩි වීමේ හේතුව නිසා ඒ මංමාවතේ තත්ත්වය නරක් වීමට හේතු විය හැකි පරිදි ඒ මංමාවත ආසන්නයේ පිහිටි යම් ඉඩමක් එළි කිරීම, එහි වතුර බැස්සවීම හෝ කැළෑ කැපීම ආදී යම් ක්‍රියාවක් කිරීමට අදහස් කරන විට—

(අ) තමාගේ යෝජිත ක්‍රියාව ගැන නගර සභාව වෙත ලියවිල්ලකින් දැන්වීමක් කිරීම ; සහ

(ආ) නගර සභාව විසින් ගනු ලබන පියවරවලට අතිරේක ව මංමාවතකට සිදු වන හානිය හෝ ඒ මංමාවතේ තත්ත්වය නරක් වීම වැළැක්වීමට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු පියවර තම වියදමින් ගැනීම

එකී ක්‍රියාව කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති දැන්වීම නොදී ඒ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් කිරීමට භාර ගන්නා හෝ එහි සඳහන් නියමයන්ට අනුකූල ව ක්‍රියා කිරීම අන්‍යාකාරයකින් පැහැර හරින යම් තැනැත්තකු එකී ක්‍රියා නිසා සිදු වූ යම් අලාභයක් සඳහාත් ඒ ක්‍රියාවල ප්‍රතිවිපාකයක් වශයෙන් සිදු විය හැකි හෝ සිදු විය හැකි යැයි බලාපොරොත්තු වූ යම් අලාභයක් වැළැක්වීමේ

* 1979.07.02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.



නගර සභා



හෝ ඊට පිළියම් යෙදීමේ කාර්යය සඳහා නගර සභාව විසින් දරන ලද වියදම් කිසිවක් සඳහාත් වග කිව යුතු අතර එබඳු යම් අලාභයක හෝ වියදම්වල මුදල 84 වන වගන්තියේ සඳහන් වියදම් ලබාගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කරගත හැකි ය.

## මංමාවත්වල කෙරෙන කරදර ආදිය

වැරදි.

*90. (1) නගරයක් ඇතුළත යම් මංමාවතකට යන ආකාරයට හෝ යම් මංමාවතක් මත යම් ගස්තියකු, ගවයකු, මී හරකකු, අශ්වයකු, බැටලුවකු, එළුවකු හෝ වෙනත් සතකු ලිහා දමන හෝ ලිහා ඇමීමට ඉඩ හරින හෝ ඕනෑ ම වර්ගයක සතකු ඒ සතාගේ පිට උඩ බඩු පැටවීම සඳහා හෝ උගේ පිට උඩ ඇති බඩු බෑම සඳහා හෝ ඒ සතා අයත් යම් කරත්තයකට හෝ බෝට්ටුවකට බඩු පැටවීම සඳහා හෝ එහි ඇති බඩු බෑම සඳහා හෝ අවශ්‍ය කාලය තුළ ඒ සතා බැඳ තබන හෝ දිගේලි කරන විටක හැර, යම් මංමාවතක් තරා හෝ එය වෙතට යෑමට ඉඩ ලැබෙන යම් ආකාරයකින් බැඳ තබන හෝ දිගේලි කරන හෝ බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හරින සෑම තැනැත්තකු ම රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය:

[1984 අංක 48 §13.]

එසේ වුව ද, යම් මංමාවතක් මතට හෝ ඒ තුළට එවැනි යම් සතකු යා හැකි වන ආකාරයට යම් මංමාවතක් මත හෝ ඒ තුළ ඒ සතා හමු වන හෝ බැඳ හෝ දිගේලි කර තබා ඇති අවස්ථාවක, ඒ සතාගේ අයිතිකරු විසින් ප්‍රතිවිරුද්ධ තත්ත්වය සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත් කරන්නේ නම් මිස, ඔහු විසින් අවස්ථෝචිත පරිදි ඒ සතා ලිහා දමා ඇති බව හෝ ලිහා ඇමීමට ඉඩ හැර ඇති බව හෝ බැඳ තබා ඇති බව හෝ දිගේලි කර ඇති බව හෝ බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හැර ඇති බව හෝ සලකනු ලැබිය යුතු ය.

(2) නගරයක් ඇතුළත යම් පාරක හෝ ඇළක බැඳ තබා ඇති හෝ අයාලේ හැසිරෙන හෝ බිම හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකුගේ අයිතිකරුවකු රුපියල් පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය. තව ද එකී යම් පාරක හෝ ඇළක බැඳ සිටින, අයාලේ හැසිරෙන, බිම හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකු දකින යම් තැනැත්තකු විසින් එම ඌරා අල්ලා ගැනීම, ඌට වෙඩි තැබීම, හෝ අන්‍යාකාරයකින් ඌ විනාශ කිරීම නීත්‍යනුකූල වන්නේ ය. තව ද ඒ තැනැත්තා කැමති නම් ඒ වරද සිදු වූ ප්‍රදේශයේ යම් සාම නිලධරයකු හෝ පොලිස් නිලධරයකු

[1984 අංක 48 §13.]

* 1979.07.02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.

වෙත ඒ ඌරා ගෙන යා හැකි අතර ඒ නිලධරයා විසින් නොපමාව ම ඒ ඌරා විකුණා ඒ විකිණීමෙන් ලත් මුදල ඒ තැනැත්තා වෙත ගෙවිය යුතු ය.

(3) නගරයක් ඇතුළත—

(අ) යම් පාරක් ප්‍රයෝජනයට ගැනීමට බාධාවක් කිරීමට තරම් වන පරිදි ඒ පාරෙහි හෝ පාරේ පසෙක පැදුරු, ඇඳුම් හෝ කවර ස්වභාවයක හෝ යම් ද්‍රව්‍ය කිසිවක් එල්ලා තබන හෝ අනාකාරයකින් ප්‍රදර්ශනය කර තබන ;

(ආ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක් යම් පාරක් මත අහඹුවකින් කැඩුණහොත් මිස, එකී කරත්තයක් හෝ රථයක් එහි වියගසෙහි ගොනුන්, අශ්වයන් හෝ වෙනත් සතකු බැඳ නොමැතිව හෝ ඊට ඇදා නොමැතිව යම් පාරක තබන හෝ තැබීමට ඉඩ හරින සහ එවැනි අහඹුවකින් කැඩීමක දී නම් ඒ කරත්තය හෝ රථය ඉවත් කර ගෙන යෑමට අවශ්‍ය කාලයට වඩා වැඩි කාලයක් එය ඒ පාරෙහි තබාගෙන සිටින හෝ තබාගෙන සිටීමට ඉඩ හරින ;

(ඇ) රථ වාහන ආඥාපනතින් හෝ මෝටර් රථ ගමනාගමන පනතින් නියම කර ඇති පරිදි ලාම්පු සවි නොකරන ලද යම් වාහනයක් ඉර බැසීමෙන් පැය කාලකට පසුව සිට ඉර පෑයීමට පැය කාලකට පෙර දක්වා යන කාල පරිච්ඡේදය ඇතුළත යම් පාරක තිබෙන්නට ඉඩ හරින ;

(ඈ) යම් දිය ඇලක් පාවිච්චි කිරීමට බාධා පැමිණෙන අන්දමින් ඒ දිය ඇලේ යම් බෝට්ටුවක් හෝ තෙප්පමක් දමා යන ;

(ඉ) යම් ගල්, ගඩොල්, පහුරු, ලී, වැලි, හුණු, සතුන්ගේ කසළ, පිදුරු, කුණු හෝ යම් අගලකින් හෝ කාණුවකින් ගොඩ දමන ලද මඩ හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් යම් පාරක, ගඟක හෝ ඇළක දමන හෝ ඊට විසි කරන සහ ඒ ද්‍රව්‍යය හෝ දෙය ඉවත් කිරීමට නියායෙන් ම අවශ්‍ය විය හැකි කාල සීමාවට වැඩි කාලයක් තිබෙන්නට ඉඩ හරින ;

(ඊ) ලී, ලෑලි, යකඩ හෝ වෙනත් බඩු, ඒ ද්‍රව්‍යයක කොන් දෙකෙන් කවර හෝ කොනක් යම් කරත්තයක හෝ වෙනත් රථයක රෝද හෝ දෙපැත්ත ඉක්මවා පිටට නෙරා සිටින ලෙස පටවනු ලැබ ඒ කරත්තය හෝ රථය යම් පාරක තල්ලු කරගෙන, ඇදගෙන හෝ පදවාගෙන යන ;

(උ) යම් මංමාවතක හෝ ඒ මත යම් ගොඩනැගිල්ලක්, වේදිකාවක්, පාලමක්, අගලක් හෝ වැටක් හෝ වෙනත් බාධකයක් තනා හෝ තැනීමට සලස්වා යම් මංමාවතක් ප්‍රසාරණය කරන ;



(ඌ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක්, කන්දක් හෝ ආරෝහණ භූමියක් නගිද්දී හෝ බසිද්දී එය ඇගිරීමට හෝ එය නතර කිරීමට උපයෝගී කරගත් ගලක්, ලීයක් හෝ වෙනත් දෙයක් යම් වීථියක් මත තිබීමට සලස්වන හෝ තිබීමට ඉඩ හරින ; හෝ

(එ) යම් මංමාවතක් ඔස්සේ වෙන යම් තැනැත්තකු ගමන් කිරීම හෝ ඔහුගේ ආරක්ෂාව යටතේ තිබෙන යම් රථයක්, බෝට්ටුවක්, පහුරක් හෝ වෙනත් වාහනයක් සැම සිතාමතා යම් ආකාරයකින් වළක්වන

සෑම තැනැත්තකු ම රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

> [1964 අංක 48 §13.]

(4) නගරයක් ඇතුළත යම් ඇලක හෝ ගංගාවක පනාදුවෙන් යාත්‍රා කිරීමට අවහිර වන හෝ යම් අන්දමකින් බාධාවක් වන අයුරින් ඒ ඇලේ හෝ ගංගාවේ කොටුවක් හෝ වැටක් හෝ වෙනත් යම් බාධකයක් සාදන හෝ තබා ගන්නා සෑම තැනැත්තකු ම රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු ය. එසේ සාදා ඇති හෝ තබා ගන්නා එකී යම් කොටුවක්, වැටක් හෝ බාධකයක් නගර සභාව විසින් කඩා දැමීම හෝ අනාකාරයකින් විනාශ කිරීම සහ ඒ සඳහා ගිය වියදම් 84 වන වගන්තියෙහි සඳහන් වියදම් අය කරගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

> [1964 අංක 48 §13.]

91. (1) යම් නගරයක පරිපාලන බල සීමා ඇතුළත පිහිටි මංමාවතක හෝ ඒ අවට බැඳ, දිගේලි කර හෝ අයාලේ යමින් සිට තමාට හමු වන යම් ගවයකු, මී හරකකු, අශ්වයකු, බැටළුවකු, එළුවකු හෝ ඌරකු, ඒ සතා යම් කරත්තයකට හෝ බෝට්ටුවකට අයත් නම් සහ බඩු පටවන හෝ බඩු බාන තුරු ඒ කරත්තයේ හෝ බෝට්ටුවේ හෝ බැඳ ඇත්නම් ද මිස, ඒ නගරයේ නගර සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අල්ලා ගැනීම ද එසේ අල්ලා ගන්නා ලද සෑම සතකු ම ඒ සතුන් ගාල් කිරීම සඳහා සභාව විසින් පිහිටුවනු ලැබ ඇති කොටුවේ තැබීම ද නීත්‍යනුකූල වන්නේ ය.

> අයාලේ යන ගවයන් අල්ලා ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ අල්ලා ගනු ලබන කිසි ම සතකු, ඒ සතා අල්ලා ගනු ලැබුවේ කවර තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ඒ සතා කොටුවේ තබාගෙන සිටියා වූ එක් එක් දිනය සඳහා ද, සභාව විසින් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන කලින් කලට යෝජනාවක් මගින් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවනු ලැබුවහොත් මිස, ඒ සතාගේ අයිතිකරුට භාර නොදිය යුතු ය.

> [1984 අංක 48 §14.]

(3) යම් සතකු අල්ලා ගැනීමෙන් පසු ව දවස් දහයක් ඇතුළත කොටුවේ තබා ඇති ඒ සතා සම්බන්ධ ව යම් තැනැත්තකු විසින් හිමිකම් පානු නොලැබුවහොත් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති අය කිරීම් ගෙවනු නොලැබුවහොත්, සභාව විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද, ඒ විකිණීමෙන් ලත් මුදලින් එම සතා අල්ලා ගත් තැනැත්තා වෙත සහ ආරක්ෂක භාරකාරත්වය සහ නඩත්තුව වෙනුවෙන් සතා කොටුවේ තැබීමට යෙදෙන එක් එක් දිනයක් සඳහා සභාව විසින් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන, කලින් කලට යෝජනාවක් මගින් නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබීමෙන් පසුව ඉතිරි වන යම් ශේෂයක් සභාව විසින් ආරම්භ කරනු ලැබ ඇති ප්‍රාදේශීය අරමුදලට ගෙවීම ද විකිණීමේ දින සිට එක් අවුරුද්දක් වූ කාල සීමාවක් ඇතුළත ඒ ශේෂයට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් ඒ මුදලට හිමිකම් කියනු නොලැබුවහොත් සහ ඒ මුදල ලබා නොගත හොත් ඒ ශේෂය ප්‍රාදේශීය අරමුදලට ගෙවීම ද නීත්‍යානුකූල වන්නේ ය.

[1984 අංක 48 §14.]

(4) සත්ව ආඥාපනතේ කුමක් සඳහන් ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන සෑම නගරයක ම බල සහිත වන්නේ ය.

නඩයන් අල්ලන්නන්ගේ හෝ උරන් අල්ලන්නන්ගේ කටයුතුවලට මැදිහත් වීම.

*92. 91 වන වගන්තිය යටතේ හෝ 90 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සතකු ඇල්ලීමට බලය ලත් යම් තැනැත්තකුගේ නීත්‍යානුකූල භාරයෙන් එම සතා ඉවත් කර ගෙන යන හෝ ඒ තැනැත්තාගේ බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි දී හෝ ඉටු කිරීමෙහි දී ඒ තැනැත්තාට යම් අන්දමකින් ගිරිහැර කරන හෝ බාධා පමුණුවන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු* ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

[1984 අංක 48 §15.]

විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට බලය පැවරීම සඳහා නගර සභාවට ඇති බලය.

**විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීම**

93. ට්‍රෑම් රථ මාර්ග සම්බන්ධ යම් වැඩ පිළිවෙළක, ගෑස්, විදුලි බලය, ජලය හෝ වෙනත් මහජන සේවයක් සැපයීමේ හෝ යම් පෞද්ගලික ව්‍යවසායක හෝ අරමුණක කාර්යයන් සඳහා යම් නගර සභාවක පාලනය යටතේ ඇති ප්‍රධාන මංමාවත් නොවන මංමාවක් ප්‍රයෝජනයට ගැනීමට ද මංමාවත් යන විෂය භාර කරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව ප්‍රධාන මංමාවත් එසේ ප්‍රයෝජනයට ගැනීමට ද එකී මහජන සේවය, අරමුණ හෝ ව්‍යවසාය සඵල අන්දමින් සංස්ථාපනය කිරීමේ හෝ පවත්වාගෙන යෑමේ හෝ එය වෙනස් කිරීමේ හෝ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සභාව අදහස් කරන සියලු ම වැඩ කිරීමට ද සියලු ඉදිකිරීම් හෝ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට ද, නඩත්තු

* 1979.07.02 වන දින අංක 43/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.



කිරීමට ද (මෙහි මින් මතු "ප්‍රවර්ධකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට හෝ යම් පුද්ගල මණ්ඩලයකට හෝ නීතිය මගින් සංස්ථාපනය කරන ලද යම් පළාත් පාලන ආයතනයකට බලය පැවරීම සඳහා ඒ නගර සභාව විසින් තනිව ම හෝ වෙනත් යම් නගර සභාවක් සමග අනුබද්ධව තත් කාර්යය සඳහා වූ යම් විශේෂ ප්‍රඥප්තියක ඇති නියමයන්ට යටත්ව එකී ප්‍රවර්ධකයකු සමග කලින් කල ගිවිසුමකට එළඹිය හැකි ය.

අතුරු ව්‍යවස්ථා.

94. (1) 93 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක කාර්යය සඳහා ද ගිවිසුම අදාළ වන යම් මහජන සේවයක්, පෞද්ගලික ව්‍යවසායක් හෝ අරමුණක් සම්බන්ධව මහජනයාගේ, නගර සභාවේ සහ ප්‍රවර්ධකයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ඉටු වීම සහතික කිරීම සඳහා ද නගර සභාව විසින් පහත සඳහන් කාර්යයන් උදෙසා (ඒ වෙනුවෙන් යම් විශේෂ ප්‍රඥප්තියක් මගින් විධිවිධාන සලස්වා ඇති තාක් ප්‍රමාණයට හැර) අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය:—

(අ) එම අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව—

(i) සභාව වෙත සතු කොට ඇති යම් මංමාවතක පස්, ගල් සහ පදික වේදිකා කඩාලීමට ;

(ii) ඒ මංමාවත ඇතුළත හෝ යට කසළ කාණු, කාණු හෝ උමං විවර කිරීමට සහ කඩාලීමට ;

(iii) ඒ මංමාවතේ ඒ ඔස්සේ, එහි යට හෝ ඒ මත යම් කාණුවක්, තාලුණක්, ලාම්පුවක්, කම්බියක්, නළයක්, අත්වැලක් හෝ වෙනත් යන්ත්‍රයක්, ද්‍රව්‍යයක් හෝ කර්මාන්තයක් ස්ථිර ලෙස හෝ තාවකාලික ලෙස ඉදි කිරීමට, සවි කිරීමට හෝ පිහිටුවීමට ;

(iv) ඒ මංමාවතේ හෝ ඒ අසල ඇති යම් පොදු සේවා මාර්ගයක්, කම්බියක් හෝ වෙනත් උපකරණයක් හෝ යන්ත්‍රයක් පිහිටා ඇති ආකාරය වෙනත් යම් පොදු සේවාවක කාර්යයන් සඳහා වෙනස් කිරීමට

ප්‍රවර්ධකයන්ට සහ ඔවුන්ගේ අනුයෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩකරුවන්ට හෝ සභාවේ නියෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩකරුවන්ට බලය පැවරීම ;

(ආ) එකී අතුරු ව්‍යවස්ථා මගින් දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වන අලාභ හැකි තාක් අඩුවෙන් සිදු වන පරිදි ක්‍රියා කරන ලෙස සහ එකී බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි සලසන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම ;

(3) යම් සතකු අල්ලා ගැනීමෙන් පසු ව දවස් දහයක් ඇතුළත කොටුවේ තබා ඇති ඒ සතා සම්බන්ධ ව යම් තැනැත්තකු විසින් හිමිකම් පානු නොලැබුවහොත් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති අය කිරීම් ගෙවනු නොලැබුවහොත්, සභාව විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද, ඒ විකිණීමෙන් ලත් මුදලින් එම සතා අල්ලා ගත් තැනැත්තා වෙත සහ ආරක්ෂක භාරකාරත්වය සහ නඩත්තුව වෙනුවෙන් සතා කොටුවේ තැබීමට යෙදෙන එක් එක් දිනයක් සඳහා සභාව විසින් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන, කලින් කලට යෝජනාවක් මගින් නියම කරනු ලබන යම් මුදලක් ගෙවනු ලැබීමෙන් පසුව ඉතිරි වන යම් ශේෂයක් සභාව විසින් ආරම්භ කරනු ලැබ ඇති ප්‍රාදේශීය අරමුදලට ගෙවීම ද විකිණීමේ දින සිට එක් අවුරුද්දක් වූ කාල සීමාවක් ඇතුළත ඒ ශේෂයට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් ඒ මුදලට හිමිකම් කියනු නොලැබුවහොත් සහ ඒ මුදල ලබා නොගත හොත් ඒ ශේෂය ප්‍රාදේශීය අරමුදලට ගෙවීම ද නීත්‍යනුකූල වන්නේ ය.

[1984 අංක 48 §14.]

(4) සත්ව ආඥාපනතේ කුමක් සඳහන් ව තිබුණ ද මේ වගන්තියේ විධිවිධාන සෑම නගරයක ම බල සහිත වන්නේ ය.

*92. 91 වන වගන්තිය යටතේ හෝ 90 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සතකු ඇල්ලීමට බලය ලත් යම් තැනැත්තකුගේ නීත්‍යනුකූල භාරයෙන් එම සතා ඉවත් කර ගෙන යන හෝ ඒ තැනැත්තාගේ බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි දී හෝ ඉටු කිරීමෙහි දී ඒ තැනැත්තාට යම් අන්දමකින් ගිරිහැර කරන හෝ බාධා පමුණුවන යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු* ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

ගවයන් අල්ලන්නන්ගේ හෝ ඌරන් අල්ලන්නන්ගේ කටයුතුවලට මැදිහත් වීම.

[1984 අංක 48 §15.]

**විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීම**

විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට බලය පැවරීම සඳහා නගර සභාවට ඇති බලය.

93. ට්‍රෑම් රථ මාර්ග සම්බන්ධ යම් වැඩ පිළිවෙළක, ගෑස්, විදුලි බලය, ජලය හෝ වෙනත් මහජන සේවයක් සැපයීමේ හෝ යම් පෞද්ගලික ව්‍යවසායක හෝ අරමුණක කාර්යයන් සඳහා යම් නගර සභාවක පාලනය යටතේ ඇති ප්‍රධාන මංමාවත් නොවන මංමාවක් ප්‍රයෝජනයට ගැනීමට ද මංමාවත් යන විෂය භාර කරනු ලැබ සිටින අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව ප්‍රධාන මංමාවත් එසේ ප්‍රයෝජනයට ගැනීමට ද එකී මහජන සේවය, අරමුණ හෝ ව්‍යවසාය සඵල අන්දමින් සංස්ථාපනය කිරීමේ හෝ පවත්වාගෙන යෑමේ හෝ එය වෙනස් කිරීමේ හෝ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සභාව අදහස් කරන සියලු ම වැඩ කිරීමට ද සියලු ඉදිකිරීම් හෝ යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට ද, නඩත්තු කිරීමට ද (මෙහි මින් මතු "ප්‍රවර්ධකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට හෝ යම් පුද්ගල මණ්ඩලයකට හෝ නීතිය මගින් සංස්ථාපනය කරන ලද යම් පළාත් පාලන ආයතනයකට බලය පැවරීම සඳහා ඒ නගර සභාව විසින් තනිව ම හෝ වෙනත් යම් නගර සභාවක් සමග අනුබද්ධව හෝ කාර්යය සඳහා වූ යම් විශේෂ ප්‍රඥප්තියක ඇති නියමයන්ට යටත්ව එකී ප්‍රවර්ධකයකු සමග කලින් කල ගිවිසුමකට එළඹිය හැකි ය.

* 1979.07.02 වන දින අංක 43/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.





අතුරු ව්‍යවස්ථා.

94. (1) 93 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක කාර්යය සඳහා ද ගිවිසුම අදාළ වන යම් මහජන සේවයක්, පෞද්ගලික ව්‍යවසායක් හෝ අරමුණක් සම්බන්ධව මහජනයාගේ, නගර සභාවේ සහ ප්‍රවර්ධකයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ඉටු වීම සහතික කිරීම සඳහා ද නගර සභාව විසින් පහත සඳහන් කාර්යයන් උදෙසා (ඒ වෙනුවෙන් යම් විශේෂ ප්‍රඥප්තියක් මගින් විධිවිධාන සලස්වා ඇති තාක් ප්‍රමාණයට හැර) අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :—

(අ) එම අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව—

(i) සභාව වෙත සතු කොට ඇති යම් මංමාවතක පස්, ගල් සහ පදික වේදිකා කඩාලීමට ;

(ii) ඒ මංමාවත ඇතුළත හෝ යට කසළ කාණු, කාණු හෝ උමං විවර කිරීමට සහ කඩාලීමට ;

(iii) ඒ මංමාවතේ ඒ ඔස්සේ, එහි යට හෝ ඒ මත යම් කාණුවක්, නාලිකාවක්, ලාම්පුවක්, කම්බියක්, නළයක්, අත්වැලක් හෝ වෙනත් යන්ත්‍රයක්, ද්‍රව්‍යයක් හෝ කර්මාන්තයක් ස්ථිර ලෙස හෝ තාවකාලික ලෙස ඉදි කිරීමට, සවි කිරීමට හෝ පිහිටුවීමට ;

(iv) ඒ මංමාවතේ හෝ ඒ අසල ඇති යම් පොදු සේවා මාර්ගයක්, කම්බියක් හෝ වෙනත් උපකරණයක් හෝ යන්ත්‍රයක් පිහිටා ඇති ආකාරය වෙනත් යම් පොදු සේවාවක කාර්යයන් සඳහා වෙනස් කිරීමට

ප්‍රවර්ධකයන්ට සහ ඔවුන්ගේ අනුයෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩකරුවන්ට හෝ සභාවේ නියෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩකරුවන්ට බලය පැවරීම ;

(ආ) එකී අතුරු ව්‍යවස්ථා මගින් දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වන අලාභ හැකි තාක් අඩුවෙන් සිදු වන පරිදි ක්‍රියා කරන ලෙස සහ එකී බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි සලසන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම ;

(ඇ) ඒ අතුරු ව්‍යවස්ථා යටතේ කිරීමට ප්‍රවර්ධකයන්ට බලය ලැබී ඇති යම් වැඩක් හැකි තාක් ඉක්මණින් සම්පූර්ණ කරන ලෙසත් ඉවත් කිරීමට, වෙනස් කිරීමට හෝ ඒ සඳහා සම්බන්ධ වීමට ඒ අතුරු ව්‍යවස්ථා අනුව බලය ලැබී ඇති යම් මංමාවතක්, කසළ කාණුවක්, කාණුවක් උමගක් හෝ යම් යන්ත්‍රයක් හෝ උපකරණයක් නැවත ඉදි කරන ලෙස, අලුත්වැඩියා කරන ලෙස හෝ ප්‍රකෘතිමත් කරන ලෙසත් ඒ ප්‍රවර්ධකයන්ට නියම කිරීම;

(ඈ) තමන්ගේ වැඩවල ප්‍රතිඵලයක් වශයෙන් ගොඩනැඟෙන සියලු ම කුණු කසළ ඉවත් කරන ලෙස සහ අස් කරන ලෙස සහ ඒ සම්බන්ධයෙන් මහජන ආරක්ෂාව සඳහා නිසි පූර්වාරක්ෂක විධිවිධාන සලස්වන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම;

(ඉ) මේ වගන්තිය යටතේ වූ යම් අතුරු ව්‍යවස්ථාවක් මගින් බලය දී ඇති යම් වැඩවලට අවහිර කිරීම හෝ ඊට බාධා කිරීම තහනම් කිරීම.

(2) සභාව වෙත සතු නොවූ නොමැති යම් ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට, එම ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුවන්ගේ සහ පදිංචිකරුවන්ගේ කැමැත්ත පළමුවෙන් ලබා නොගෙන යම් ඇතුළු වීමකට හෝ එහි යම් ද්‍රව්‍යයක් හෝ යන්ත්‍රයක් ඉදි කිරීමට හෝ තැන්පත් කිරීමට හෝ යම් වැඩක් කිරීමට මේ වගන්තිය යටතේ වූ කිසිම අතුරු ව්‍යවස්ථාවක් මගින් බලය නොපැවරිය යුතු ය.

අසාමාන්‍ය රථ වාහන ධාවනය නිසා දරන්නට සිදු වන වියදම්.

95. (1) යම් නගර සභාවක පාලනය යටතේ ඇති යම් මංමාවතක අධික බරක් ගෙන යෑමෙන් හෝ අසාමාන්‍ය රථ වාහන පැදවීමෙන් සිදු වන හෝ සිදු වීමට ඉඩ ඇති අලාභ හේතුකොටගෙන එම මංමාවත නඩත්තු කිරීමෙහි ලා සභාව විසින් අති මහත් වියදමක් දරා ඇති බව, අවට ප්‍රදේශයේ මංමාවත් නඩත්තු කිරීමේ සාමාන්‍ය වියදම් සැලකීමට ගැනීමේ දී එම සභාවට පෙනී ගිය අවස්ථාවක දී ඒ බර හෝ ඒ රථ වාහන ගෙන ගියේ හෝ පැදවූයේ යම් තැනැත්තකුගේ නියමයකින් ද එසේ නැතහොත් යම් තැනැත්තකුගේ නියමයක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ තැනැත්තාගෙන් හෝ, ඒ අධික බර හෝ අසාමාන්‍ය රථ වාහන ගමනාගමනය සම්බන්ධයෙන් එක් කෙනකුට වැඩි තැනැත්තන් ගණනක් විසින් වග කිව යුතු අවස්ථාවක දී අධික බර හෝ අසාමාන්‍ය රථ වාහන ධාවනය නිසා සිදු වූ හෝ සිදු වීමට ඉඩ තිබූ හානිය හේතුකොටගෙන සභාව විසින් දරන ලද බවට නිසි බලය ඇති අධිකරණයක් සෑහීමට පත් වන පරිදි ඔප්පු කළ හැකි වියදම් ප්‍රමාණය, අදාළ අධිකරණයේ මතය අනුව එක් එක් තැනැත්තාට සාධාරණව නියම කළ හැකි තාක් ප්‍රමාණානුකූල ව එසේ දරන ලද වියදමේ සමානුපාතික කොටසක් සභාව විසින් ඒ එක් එක් තැනැත්තාගෙන් අය කරගත හැකි ය.





(2) මේ වගන්තිය යටතේ නගර සභාවක් විසින් වියදම් අය කර ගන්නේ හෝ අය කරගත හැකි වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් එබඳු බර හෝ රථ වාහන සම්බන්ධයෙන් ණය සමථය කිරීමක් වශයෙන් සභාවට මුදල් ගෙවීම සඳහා එම සභාව සමග එකඟ වීමකට එළඹිය හැකි අතර එකී එකඟ වීම අනුව මුදල් ගෙවන අවස්ථාවක දී ඒ තැනැත්තාට විරුද්ධ ව මේ වගන්තිය යටතේ නඩු පැවරීය හෝ නීති කෘත්‍යයක් පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් වියදම් අය කරගැනීම සඳහා වූ නීති කෘත්‍ය ඒ වියදම් දරන ලද කාලයේ සිට මාස දොළහක් ඇතුළත ආරම්භ කළ යුතු අතර, යම් වියදමක් දරන ලද්දේ දීර්ඝ කාල සීමාවක් මුළුල්ලේ වූ යම් විශේෂ ගිවිසුමක හෝ වැඩක ප්‍රතිඵලයක් වශයෙන් වූ අවස්ථාවකදී, ඒ නීති කෘත්‍යය, ඒ ගිවිසුම හෝ වැඩය අවසාන වීමෙන් පසු මාස හයක් ගත වීමට පෙර ආරම්භ කළ යුතු ය.

## නිලධරයන් ආදීන්ගේ බලතල, කාර්ය සහ වගකීම්

96. නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ නගරයක සීමා ඇතුළත ඇති සියලු මංමාවත් සම්බන්ධයෙන්, මේ කොටස අදාළ වන්නා වූ වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලබන වෙන් වෙන් බලතල සහ අධිකාර සභාවේ සභාපතිවරයා විසින් සහ ඒ වෙනුවෙන් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද සියලු තැනැත්තන් විසින් ම හෝ ඔවුන්ගේ සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සහ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

පොදු වැඩ භාරව සිටින නිලධරයන් වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග.

97. නගර සභාවේ විධානයෙන් හෝ නගර සභාව අනුප්‍රාප්තිකයා වන යම් අධිකාරියක් විසින් හෝ එහි විධානයෙන් හෝ සාදන ලද යම් පිඹුරක් හෝ මැනීමක්, මේ කොටස යටතේ වූ යම් නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවහොත්, සභාවේ හිමිකම් පෑමට සම්බන්ධ වන ප්‍රමාණයට ඒ පිඹුර හෝ මැනීම එහි දක්වා ඇති කරුණු පිළිබඳව එම හිමිකම් පෑම ගැන විවාද කරන පාර්ශවය විසින් ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, තීරණාත්මක සාක්ෂිය ලෙස සැලකිය යුතුවාක් මෙන් ම එලෙසින් ම පිළිගත යුතු ය.

නිසි නිලධරයා විසින් කරනු ලබන මැනීම තීරණාත්මක සාක්ෂිය විය යුතු බව.

98. මේ කොටස අදාළ වන වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලැබ ඇති බලතල හෝ අධිකාර කිසිවක් යම් නගර සභාවක සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ බලය පිට ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා යම් පාඩුවක් හෝ අලාභයක් විඳින සෑම තැනැත්තකුට ම (ඒ පාඩුව හෝ අලාභය ඒ තැනැත්තාගේ ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ නොසැලකිල්ලක් නිසා සිදු වූ අවස්ථාවක දී හැර) වන්දිය සඳහා හිමිකම ඇති වීමෙන් පසු ව මාස තුනක් ගත වීමට පෙර යම් වේලාවක ඔහු විසින් වන්දි සඳහා සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් එකී පාඩුව හෝ අලාභය

බලය ලත් නිලධරයන් විසින් දේපළවලට හානි කිරීම සඳහා වන්දි.

සඳහා වන්දි ලැබීමට ඔහුට හිමිකම ලැබිය යුතු ය. ඉහත කී කාල සීමාව ඇතුළත එබඳු ඉල්ලීමක් ඉදිරිපත් කිරීම එකී යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, සිදු වී යැයි කියන පාඩුව හෝ අලාභය සඳහා වන්දි වෙනුවෙන් ඔහුගේ හිමිකම් පෑමට ඉඩ නොදිය යුතු අතර ඔහු ඒ වන්දි ලබා ගැනීමෙන් වළක්වාලිය යුතු ය.

බේරුම් කිරීම.

**99.** යම් හේතුවක් නිසා 98 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් වන්දියක ප්‍රමාණය ගැන, නගර සභාව සහ හිමිකම් පාන්නා අතර එකඟත්වයක් ඇති නොවූ අවස්ථාවකදී සභාව විසින් නම් කළ යුතු එක් තැනැත්තකු ද හිමිකම් පාන්නා විසින් නම් කළ යුතු තවත් තැනැත්තකු ද වශයෙන් වූ බේරුම්කරුවන් දෙදෙනකු විසින් එකී වන්දි ප්‍රමාණය තීරණය කළ යුතු ය. බේරුම්කරුවන් දෙදෙනාට එකඟත්වයට එළඹිය නොහැකි වුවහොත් ඔවුන් විසින් තීරකයකු පත් කළ යුතු අතර සභාව සහ හිමිකම් පාන්නා විසින් එකඟ වන ලද නියමයන් අනුව, අවස්ථාවෝචිත පරිදි, බේරුම්කරුවන් හෝ තීරක විසින් දෙන ලද තීරණය අවසානාත්මක විය යුතු ය.

රාත්‍රි කාලයේ දී මංමාවත් මත ගල් ආදිය දමා යන නිලධරයන් සහ කොන්ත්‍රාත්කරුවෝ.

**100.** යම් මංමාවතක යම් වැඩක් භාරව සිටින නගර සභාවක යම් නිලධරයකු විසින් හෝ යම් නගර සභාවක් සමග වූ යම් ගිවිසුමක් අනුව යම් මංමාවතක කටයුතුවල යෙදී සිටින යම් තැනැත්තකු විසින් එම මංමාවත මත යම් ගල් ගොඩක්, බොරලු ගොඩක්, කුණු ගොඩක් හෝ කවර හෝ වෙනත් ද්‍රව්‍ය ගොඩක් දැමුවහොත් හෝ දැමීමට සැලැස්වුවහොත් සහ එම මංමාවතක ඔස්සේ ගමන් කරන යම් තැනැත්තකුට අනතුරක් වන පරිදි හෝ පෞද්ගලික අලාභ හානියක් වන පරිදි ඒ ගොඩ (එබඳු අනතුරක් හෝ අලාභ හානියක් සිදු වීම වැළැක්වීම පිණිස ඔහු විසින් සියලු නිසි සහ සෑහෙන පූර්වාරක්ෂක විධිවිධාන සලස්වා නොමැතිව) රාත්‍රි කාලයේ දී එහි රැඳී තිබීමට ඉඩ හැරියහොත් එකී නිලධරයා හෝ තැනැත්තා රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.

[1984 අංක 48 §16.]

ඇතැම් අවස්ථාවල දී හැර මාර්ග නිලධරයෙකු හෝ මාර්ග කොන්ත්‍රාත්කරුවකු දඩයට යටත් නොවන බව.

**101.** 100 වන සහ 226 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති ප්‍රකාර හැර, යම් මංමාවතක යම් වැඩක් භාරව සිටින නගර සභාවක යම් නිලධරයකු හෝ සභාව යටතේ වූ යම් කොන්ත්‍රාත්කරුවකු, ඒ නිලධරයාගේ තනතුරේ කාර්ය ඉටු කිරීමෙහිලා ඒ නිලධරයා විසින් කරන ලද හෝ ඒ කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ කොන්ත්‍රාත්කරු විසින් කරන ලද යම් ක්‍රියාවක් සඳහා අපරාධ නඩු පැවරීමකට හෝ යම් දඩයකට මේ කොටසේ සඳහන් කිසිවක් නිසා යටත් නොවිය යුතු ය.

පොලිස් නිලධරයන් සහ මුලාදෑනීන් විසින් මේ කොටසේ විධිවිධාන බලාත්මක කළ යුතු බව.

**102.** තමන් පිළිවෙලින් පත් කරනු ලැබ සිටින ප්‍රදේශ සහ කොට්ඨාශ ඇතුළත මේ කොටසට පටහැනිව කෙරෙන සියලු වැරදි වැළැක්වීමෙහිලා ආධාර හා උපකාර කිරීම පොලිස් හමුදාවේ සියලු නිලධරයන්ගේ සහ සාමාන්‍යයෙන් සියලු මුලාදෑනීන්ගේ කාර්යය විය යුතු ය.





## IV වන කොටස

## මහජන සෞඛ්‍යය පිළිබඳ බලතල සහ යුතුකම්

### මහජන සෞඛ්‍ය

නගර සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය විය යුතු බව.

**103.** එක් එක් නගරයක නගර සභාව වෙන යම් බලධරයකු වෙත නීතියෙන් පැවරී ඇති බලතලවලට සහ වගකීම්වලට යටත් ව, ඒ නගරය ඇතුළත මහජන සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයක් සඳහා වූ පොදු පරිපාලන අධිකාරිය විය යුතු අතර, මේ ආඥාපනතින්, කරදර පිළිබඳ ආඥාපනතින්, නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතින් සහ ඒ සඳහා තත් කාලයේ බල පවත්නා යම් ලිඛිත නීතියකින් ඊට පවරා ඇති සියලු බලතල ඒ කාර්ය සඳහා ක්‍රියාත්මක කිරීමේ හිමිකම ඒ සභාවට තිබිය යුතු ය.

### ජලාපවහනය

සභාව විසින් පොදු කාණු ඉදි කළ යුතු බව.

**104.** එක් එක් නගරයේ නගර සභාව විසින් ඒ නගරයේ යම් ප්‍රදේශයක ඵලදායි ජලාපවහනය සඳහා අවශ්‍ය යැයි පෙනී යන ප්‍රධාන නළ හෝ වෙනත් කාණු, නාසළ කාණු සහ ජල මාර්ග කලින් කල සෑදීම, වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම කළ හැකි අතර, අවශ්‍ය වුවහොත් යම් වීථියක හෝ වීථියක් ලෙස සැලසුම් කර ඇති හෝ අදහස් කර ඇති යම් ස්ථානයක් මැදින්, හරහා හෝ යටින් සහ (මේ වෙනුවෙන් ලියවිල්ලකින් සෑහෙන දැන්වීමක් කිරීමෙන් පසුව) සිදු වන අලාභ හැකි තාක් අඩු වන ලෙස ද, යම් අලාභයක් සිදු වුවහොත් ඒ වෙනුවෙන් සම්පූර්ණ වන්දි සලසමින් ද යම් කොටු කර ඇති ඉඩම් හෝ වෙනත් කවර අන්දමක හෝ ඉඩම් තුළට ඒ මැදින් හෝ යටින් ද ඒවා දැමිය හැකි ය.

කාණු අලුත්වැඩියා කිරීමට, වෙනස් කිරීමට සහ වසා දැමීමට සභාවට ඇති යුතුකම.

**105.** (1) එක් එක් නගරයේ නගර සභාව විසින් ඒ නගරයෙහි පොදු කාණු, බෝක්කු, පීලි සහ ජල මාර්ග සියල්ල හෝ ඉන් කිසිවක් පවත්වා ගෙන යෑම ද කලින් කල අලුත්වැඩියා කිරීම ද සුදුසු යැයි ඒ සභාවට පෙනෙන ආකාරයට ඒවා විශාල කිරීම, වෙනස් කිරීම, උඩින් ආරුක්කු දැමීම හෝ වෙනත් ආකාරවලින් වැඩි දියුණු කිරීම ද කළ යුතු අතර ඒවායින් යමක් නිෂ්ප්‍රයෝජන හෝ අනවශ්‍ය බව සභාව විසින් අදහස් කරන විටක, කිසිම කරදරයක් සිදු නොවන අන්දමින් එය වසා දැමීම, පිරවීම හෝ විනාශ කිරීම කළ හැකි ය.

(2) යම් කාණුවක්, බෝක්කුවක්, පීල්ලක් හෝ ජල මාර්ගයක් වසා දැමීමේ, පිරවීමේ, විනාශ කිරීමේ හෝ වෙනස් කිරීමේ හේතුව නිසා, යම් තැනැත්තකුට එහි නීත්‍යානුකූල පාවිච්චියට ඇති අයිතිය නැති වූ අවස්ථාවකදී, සභාව විසින් ඒ වෙනුවට වෙනත් ඵලදායී ආදේශක වැඩ පිළිවෙලක් අනලස්ව සැපයිය යුතු ය.

පොදු කාණුවලට සම්බන්ධ වන අන්දමින් බලය රහිතව කාණු සෑදීම පිළිබඳ දණ්ඩනය.
[1984 අංක 48 § 17.]

**106.** ප්‍රථමයෙන් නගර සභාවේ ලිඛිත එකඟත්වය ලබා නොගෙන, යම් නගරයක් ඇතුළත පොදු කසළ කාණුවකට හෝ කාණුවකට සම්බන්ධ වන අන්දමින් යම් කාණුවක් සාදන හෝ සෑදීමට සලස්වන කවරකු වුවද, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු අතර, එසේ සාදන ලද කාණුව සභාව විසින් කඩා බිඳ දැමීමට, වෙනස් කිරීමට, නැවත සෑදීමට හෝ සභාව සුදුසු යැයි සිතන අයුරින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකි විය යුතු ය; තවද, සභාව විසින් ඒ වෙනුවෙන් දරන ලද සියලු වියදම්, වරදට වරදකරු වූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අය කර ගත හැකි විය යුතු ය.

නගර සභාවේ එකඟත්වය නොමැතිව කාණු උඩින් ගොඩනැගිලි ආදිය ඉදි නොකළ යුතු බව.

**107.** යම් නගරයක නගර සභාවේ ලිඛිත එකඟත්වය ලබා නොගෙන එම නගරය තුළ ඇති යම් පොදු කාණුවක්, කසළ කාණුවක්, බෝක්කුවක්, අගලක් හෝ දිය පාරක් උඩින් කිසිම අලුත් ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතු ය. තවද, එසේ යම් ගොඩනැගිල්ලක් ඉදි කරන ලද අවස්ථාවක දී, සභාව විසින් එය කඩා බිඳ දමනු ලැබීමට හෝ සභාව සුදුසු යැයි සිතන අන්දමින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකි විය යුතු ය. තවද, සභාව විසින් ඒ වෙනුවෙන් දරන ලද වියදම්, වරදට වරදකරු වූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි එය අයකර ගත හැකි විය යුතු ය.

කාණු පිළිබඳ සාමාන්‍ය පාලනය.

**108.** (1) යම් නගරයක් තුළ ඇති සෑම පෞද්ගලික කාණුවක් ම, එම නගරයේ නගර සභාවේ පරීක්ෂණය සහ පාලනය යටතේ විය යුතු අතර, ඒ කාණුව අයිති වන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ හෝ ඒ කාණුව ඉදි කරනු ලැබුවේ යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක ප්‍රයෝජනය සඳහා ද ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුවන්ගේ වියදමින්, සභාව නියම කරන පරිදි ගොඩනැගිය යුතු හෝ වෙනස් කළ යුතු හෝ අලුත්වැඩියා කළ යුතු හෝ නිසි අයුරින් තබාගත යුතු වන්නේ ය.

(2) තත් කාර්යය සඳහා සභාව විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව දින අටක් ඇතුළත, එම දැන්වීමේ නිශ්චිතව සඳහන්ව තිබිය හැකි පරිදි එබඳු යම් කාණුවක් වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම හෝ මනා තත්ත්වයට පත් කිරීම ඒ කාණුව අයිති වන යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක අයිතිකරු විසින් නොසලකා හරිනු ලැබුවහොත්, සභාව විසින්, අවශ්‍ය අන්දමින් එකී කාණුව වෙනස් කිරීමට, අලුත්වැඩියා කිරීමට හෝ මනා තත්ත්වයට පත් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, සභාව විසින් ඒ වෙනුවෙන් දරන ලද වියදම් අයිතිකරු විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් එය අය කරගත හැකි විය යුතු ය.

වැහි වතුර සහ කුණු කසළ ගසා ගෙන යෑමට බාධා කිරීම.
[1984 අංක 48 §18.]

**109.** නගරයක් ඇතුළත පිහිටියා වූ ද වැහි වතුර හෝ කුණු කසළ ගලා බසින්නා වූ ද යම් ස්වාභාවික දිය පාරක්, ඇළක්, වැවක්, වගුරක් හෝ ඉන් යම් කොටසක් ඒ වැහි වතුර හෝ කුණු කසළ ඇතුළු වීම සඳහා විවෘතව තිබිය යුතු යැයි එම නගරයේ නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරන ලද කවර අවස්ථාවක දී වුව ද, එම යෝජනාව පිළිබඳ ලිඛිත දැන්වීමක් සභාවෙන් ලැබීමෙන් පසු, වැහි වතුර හෝ කුණු කසළ නිර්බාධිතව ගසා ගෙන යාමට බාධා වන හෝ අවහිර වන අන්දමින් එකී යම් දිය පාරක් ඇළක්, වැවක් හෝ වගුරක් පුරවන හෝ පුරවා තබීමට අවසර දෙන යම් තැනැත්තකු රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය:

එසේ වුවද—

(අ) එකී ස්වාභාවික දිය පාර, ඇළ, වැව හෝ වගුර, එහි අයිතිකරු විසින් වැහි වතුර සහ කුණු කසළ ඇතුළු වී ගසාගෙන යෑමට සභාවේ මතය අනුව ප්‍රමාණවත් සහ සුදුසු විය හැකි වෙනත් ඇළක් හෝ කාණු නලින් සපයනු ලැබුවහොත්, පිරවිය හැකි ය: තවද

(ආ) එබඳු වෙනත් ඇළක් හෝ කාණුවක් සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් සභාව විසින් ප්‍රදානය කළ හැකි ය.

වැසිකිළි

වැසිකිළි පහසුකම් පිළිබඳව සභාවේ යුතුකම්.

**110.** (අ) එක් එක් නගරයක් ඇතුළත වූ සියලු නිවාස, ගොඩනැගිලි සහ ඉඩම් සඳහා ප්‍රමාණවත් සහ නිසි අන්දමේ වැසිකිළි පහසුකම් සපයනු ලැබීම නිසැක කර ගැනීම සඳහා ඵලදායී පියවර ගැනීම;

(ආ) එක් එක් නගරයක් ඇතුළත මහජනයා ගැවසෙන සියළු ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි පහසුකම් සැපයීම; සහ

(ඇ) එක් එක් නගරයක් ඇතුළත සියලු පොදු සහ පෞද්ගලික වැසිකිළි නිසි අයුරින් සහ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යන බව නිසැක කර ගැනීම

ඒ එක් එක් නගරයේ නගර සභාවේ යුතුකම විය යුතු ය.

අතිරේක වැසිකිළි ගොඩනගන ලෙස නියම කිරීමට හෝ ගොඩනැගීමට සැලැස්වීමට සභාවට හැකි බව.

**111.** (1) යම් ගෙයක් හෝ ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සඳහා යම් වැසිකිළියක් නොහොත් වැසිකිළි හෝ අතිරේක වැසිකිළියක් නොහොත් වැසිකිළි සැපයිය යුතු යැයි නගර සභාව අදහස් කරන අවස්ථාවක දී, සභාව විසින් තත් කාර්යය සඳහා ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු මාස දෙකක් ඇතුළත, ඒ දැන්වීමෙ සඳහන්ව තිබිය හැකි නියමයන්ට අනුකූලව ඒ නිවාසයේ, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු විසින් වැසිකිළිය හෝ වැසිකිළි ඉදි කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙන ලද යම් දැන්වීමක සඳහන් නියමයන්, එම උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කොට ඇති කාල සීමාව ඇතුළත සභාපතිවරයා සෑහීමට පත් වන අයුරින් පිළිපදිනු නොලැබුවහොත්, ඒ වැසිකිළිය හෝ වැසිකිළි ඉදි කිරීමට

සැලැස්වීමට සභාවට නිදහස තිබිය යුතු ය. තවද, එකී ඉදි කිරී සඳහා වැය කරන ලද වියදම්, දැන්වීමේ නියමයන් පිළිපැදීම පැහැ හැරි තැනැත්තා විසින් ගෙවිය යුතු අතර එකී වියදම් මෙහි මින් ම විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අය කරගත හැකි විය යුතු ය.

මිනිසුන් සේවා නියුක්ත කරන තැනැත්තන් විසින් වැසිකිළියක් හෝ වැසිකිළි ආදිය සපයා නඩත්තු ලැබීමට සැලැස්වීමට සභාවට හැකි බව.

**112.** (1) නගර සභාවකට සුදුසු යැයි පෙනී යන පරිදි වැසිකිළිය හෝ වැසිකිළි සපයා නඩත්තු කරන ලෙස, නගරය තුළ වැඩකරුව හෝ කම්කරුවන් සේවයේ යොදවා ගෙන සිටින යම් තැනැත්තා ඒ නගර සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් විධානය කරනු ල මත් එසේ සපයනු ලබන වැසිකිළිය හෝ නිසි අයුරින් තබා ගැ මට සහ දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමට ඒ සභාව විසින් සලස්ව ලැබීමත් නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාර දෙන ලද යම් දැන්වීම නියමයන් පිළිපදිනු නොලැබූ අවස්ථාවක දී, නගර සභාව විසි අවශ්‍ය වැසිකිළිය හෝ වැසිකිළි ඉදි කරනු ලැබීම හෝ වැසිකිළිය හෝ වැසිකිළි නිසි අයුරින් තබා ගැනීමටත් දිනපතා ශුද්ධ පවිත්‍ර කිරී මත් සලස්වනු ලැබීම කළ හැකි ය. තවද සභාව විසින් ඒ සඳ දරන ලද වියදම්, දැන්වීමේ නියමයන් පිළිපැදීම පැහැර හ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධා සලස්වනු ලැබ ඇති පරිදි අය කරගත හැකි විය යුතු ය.

පෞද්ගලික වැසිකිළි කොටු කිරීම පැහැර හැරීම.

**113.** (1) වැසිකිළියක් පිහිටි යම් නිවසක හෝ ගොඩනැගිල්ල හෝ ඉඩමක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, අවට ප්‍රදේ ශයේ පදිංචිව සිටින හෝ ඒ අසලින් එහා මෙහා ගමන් කර තැනැත්තන්ට ඒ වැසිකිළිය නොපෙනෙන ලෙස සෑහෙන වහලකින් සහ බිත්තියකින් හෝ වැටකින් ආවරණය කර තැබිය යුතු අත එකී යම් අයිතිකරුවකු විසින් හෝ පදිංචිකරුවකු විසින් විවෘ වැසිකිළියක් හෝ යම් වීථියක් දෙසට විවෘත වන දොරක් හෝ පිරික්සුම් දොරක් සහිත වැසිකිළියක් තබාගනු ලැබීම නීත්‍යානුකූ නොවිය යුතු ය.

[1984 අංක 48 §19.]

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින් කිසිවක් පිළිපැදී පැහැර හරින හෝ උල්ලංඝණය කරන යම් ගෙයක හෝ ගො නැගිල්ලක හෝ ඉඩමක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු, ඒ උල්ලංඝනය නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පනහක් වූ දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

එසේ වුව ද, යම් විවෘත වැසිකිළියක් හෝ යම් වීථියක් දෙසට විවෘත වන දොරක් හෝ පිරික්සුම් දොරක් සහිත යම් වැසිකිළියක් එවකටත් පවතින සහ එයින් කරදරයක් නොවන අවස්ථාවක දී නගරයේ නගර සභාව විසින්, සුදුසු යැයි සභාව විසින් සලකිය හැකි කාලයක් තව දුරටත් ඒ වැසිකිළිය තබාගැනීමට ස්වකීය අභිමතය අනුව අවසර දිය හැකි ය.





**114.** (1) යම් නගරයක් ඇතුළත වූ සියලු වැසිකිළි සහ වැසිකිළි වළවල්, එම නගරයේ නගර සභාවේ සමීක්ෂණයට සහ පාලනයට යටත් විය යුතු අතර ඒ වැසිකිළි අයිති වන ගෙවල්, ගොඩනැගිලිවල හෝ ඉඩම්වල සහ වැසිකිළි ඉදි කරන ලද්දේ යම් ගෙවල්වල, ගොඩ නැගිලිවල හෝ ඉඩම්වල ප්‍රයෝජනය සඳහා ද ඒ ගෙවල්වල, ගොඩ නැගිලිවල හෝ ඉඩම්වල ඒ ඒ අයිතිකරුවන්ගේ වියදමින්, සභාව නියම කරන පරිදි ඒ වැසිකිළි සහ වැසිකිළි වළවල් වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් තබා ගැනීම ද කළ යුතු ය.

වැසිකිළි පිළිබඳ සාමාන්‍ය පාලනය.

(2) සභාව නියම කරන ආකාරයෙන් වැසිකිළිය හෝ වැසිකිළි වළ වෙනස් කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස හෝ නිසි තත්ත්වයෙන් තබාගන්නා ලෙස හෝ දන්වමින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එක් මාසයක් ඇතුළත හෝ දැන්වීමේ නිශ්චය කරනු ලැබ තිබිය හැකි වෙනත් යම් කාල සීමාවක් ඇතුළත, එසේ කිරීම යම් වැසිකිළියක් හෝ වැසිකිළි වළක් අයිති වන යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු පැහැර හැරියොත්, නියමිත පරිදි ඒ වැසිකිළිය හෝ වැසිකිළි වළ වෙනස් කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට හෝ නිසි තත්ත්වයෙන් තබා ගැනීමට සභාව විසින් සලස්වනු ලැබිය හැකි ය. තවද ඒ සඳහා සභාව විසින් දරන ලද වියදම්, අයිතිකරු විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අය කරගත හැකි විය යුතු ය.

***115.** (1) යම් තැනැත්තකු විසින් යම් නගරයක් ඇතුළත—

නගර සභාවේ විධානවලට හෝ අතුරු ව්‍යවස්ථා වලට පටහැනි වන අන්දමින් වැසිකිළි ආදිය සඳහා හෝ වෙනස් කරන තැනැත්තන්ට දණ්ඩනය.

(අ) එම නගරයේ නගර සභාවේ විධානයන්ට පටහැනිව හෝ මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානවලට පටහැනිව යම් වැසිකිළියක් හෝ වැසිකිළි වළක් ඉදි කරනු ලැබුවහොත් ; හෝ

(ආ) කඩා ඉවත් කරන ලෙස හෝ වසා දමන ලෙස සභාව විසින් නියම කරන ලද්දේ යම් වැසිකිළියක් හෝ වැසිකිළි සම්බන්ධයෙන් ද ඒ වැසිකිළිය හෝ වැසිකිළි වළ පාවිච්චි කිරීම නොකඩව කරනු ලැබුවහොත් ; හෝ

(ඇ) 111 වන සහ 112 වන වගන්ති යටතේ යම් වැසිකිළියක් ඉදි කරන ලෙස හෝ සපයන ලෙස හෝ නඩත්තු කරන ලෙස හෝ නියමයක් කරන ලද විටක එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්

ඒ තැනැත්තා රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

[1984 අංක 48 § 20.]

* 1979. 07. 02 වන දින අංක 43/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමඟ කියවිය යුතු අධිකරණ සංවිධාන පනතේ 33 වන වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබේ.



6—CM 012084

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය අදාළ වන යම් අවස්ථාවක දී නගර සභාව සුදුසු යැයි සලකන අන්දමින් වැසිකිළියේ හෝ වැසිකිළි වලේ වෙනස් කරවීමට නගර සභාව විසින් සැලැස්විය යුතු ය. ඒ සඳහා ගිය වියදම්, ඒ වැසිකිළිය හෝ වැසිකිළි වළ අනිසි ලෙස ඉදි කළ හෝ සෑදූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අය කර ගත හැකි විය යුතු ය.

වැසිකිළි ආදිය පරීක්ෂා කිරීම.

**116.** (1) නගරයක නගර සභාව විසින් හෝ තත් කාර්යය සඳහා ඒ සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් මේ ආඥාපනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, නගරය ඇතුළත ඇති යම් වැසිකිළියක් හෝ වැසිකිළි වළක් පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සහායකයන් සහ මැඩකරුවන් සමග යම් ගෙයකට, ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට යම් වේලාවක ඇතුළු වීමත් ඒ සභාව හෝ නිලධරයා සුදුසු යැයි සිතිය හැකි අවස්ථාවක දී හැකි තරම් අඩුවෙන් අලාභ සිදු කරමින් පොළොව කැණීමත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් පරීක්ෂණයක දී, යම් වැසිකිළියක් හෝ වැසිකිළි වළක් මනා අයුරින් හෝ මනා තත්ත්වයෙන් නොපවතී යැයි හෝ එය සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසු මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය වන යම් අන්දමකින් හෝ සභාවේ විධි විධානවලට පටහැනිව යම් අන්දමකින් ඉදිකර තිබේ යැයි හෝ පෙනී ගියහොත් ඒ පරීක්ෂණය පිළිබඳ වියදම්, ඒ වැසිකිළිය හෝ වැසිකිළිවළ අයිතිව තිබිය හැකි තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි අය කරගත හැකි විය යුතු ය.

(3) යම් වැසිකිළියක් හෝ වැසිකිළි වළක්, නිසි අයුරින් හෝ නිසි තත්ත්වයෙන් පවතින බව සහ මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය කරමින් හෝ සභාවේ විධානවලට පටහැනිව ඉදි කර නොමැති බව පෙනී ගියහොත්, සභාව විසින් හෝ සභාවේ බලය ලත් නිලධරයා විසින් හැකි ඉක්මණින් පොළොව වසා දැමීමට සලස්වා යථා තත්ත්වයට පත් කරවිය යුතු අතර එවැනි අවස්ථාවක දී ඊට ගිය වියදම් සභාව විසින් දැරිය යුතු ය.

වැසිකිළි කඩා ඉවත් කරන ලෙස හෝ වැසිකිළි වළවල් වසන ලෙස හෝ නියම කිරීමට නගර සභාවට ඇති බලය.

**117.** (1) නගරයක් ඇතුළත පිහිටි යම් ගෙයක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක ඇති වැසිකිළියක් හෝ වැසිකිළි වළක් ඒ නගරයේ නගර සභාවේ හෝ තත් කාර්ය සඳහා සභාව විසින් බලය පවරනු ලද යම් නිලධරයකුගේ මතය අනුව නිර්මාණ දෝෂයකින් යුක්ත වන හෝ අදහස් කරන ලද කාර්යය සඳහා අයෝග්‍ය වන හෝ කරදරයක් ඇති කිරීමට තුඩු දිය හැකි අවස්ථාවක දී, ඒ වැසිකිළිය හෝ වැසිකිළි වළ අලුත්වැඩියා කිරීමට, වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ ඒ වෙනුවට වළ වැසිකිළියක් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ ඒ වෙනුවට වළ වැසිකිළියක් තැනීමට ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ නගර සභාව විසින් හෝ එකී බලය ලත් නිලධරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.







[1984 අංක 48 § 21.]

(2) (1) වන උපවගන්තිය යටතේ තත් කාර්යය සඳහා දැන්වීමක් භාර දීමෙන් පසු එක් මාසයක කාල සීමාවක් ඇතුළත හෝ දැන්වීමෙහි නිශ්චිතව සඳහන්ව තිබිය හැකි වෙන යම් කාල සීමාවක් ඇතුළත දැන්වීම අදාළ වන වැසිකිළිය හෝ වැසිකිළි වළ අලුත් වැඩියා කිරීමට, වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ කඩා ඉවත් කිරීමට හෝ ඒ වෙනුවට වළ වැසිකිළියක් සැපයීමට යම් අයිතිකරුවකු විසින් හෝ පදිංචිකරුවකු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වැසිකිළිය හෝ වැසිකිළි වළ අලුත්වැඩියා කිරීමට, වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ කඩා ඉවත් කිරීමට සහ ඒ වෙනුවට වළ වැසිකිළියක් සැපයීමට නගර සභාව විසින් හෝ බලය ලත් නිලධරයා විසින් සලස්වනු ලැබිය හැකි අතර, ඒ සම්බන්ධයෙන් සභාව විසින් හෝ නිලධරයා විසින් දරන ලද වියදම්, අයිතිකරු විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි අය කරගනු ලැබිය හැකි විය යුතු ය.

## මලාපවහනය සහ කසළ ශෝධනය

මලාපවහනය සහ කසළ ශෝධනය සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**118.** නගරයේ සෑම කොටසක ම පහත සඳහන් කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර හැකි තාක් දුරට ගැනීම ඒ එක් එක් නගරයේ සභාවේ කාර්යය විය යුතු ය:—

(අ) අඩි පාරවල් ද ඇතුළුව වීථි නිසි පරිදි අතුගා පවිත්‍ර කිරීම සඳහා සහ වීථිවල ඇති කසළ එකතු කර ඉවත් කිරීම;

(ආ) සියලු ම ගෙවල්වල කසළ නිසි කාල සීමා තුළ දී විධිමත් ලෙස ඉවත් කිරීම සහ සියලු වැසිකිළි සහ වැසිකිළි වළවල් නිසි කාල සීමා තුළ දී විධිමත් ලෙස පවිත්‍ර කිරීම; සහ

(ඇ) වීථිවල ඇති කසළ, ගෙවල්වල කසළ සහ මල නිසි පරිදි බැහැර කිරීම.

එකතු කරනු ලබන සියලුම කසළ සභාවේ දේපළ විය යුතු බව.

**119.** මේ කොටසේ විධිවිධාන යටතේ නගර සභාවක් විසින් එකතු කරනු ලබන සියලුම වීථි කසළ, නිවාස කසළ, මල හෝ එවැනි වෙනත් ද්‍රව්‍ය සභාවේ දේපළ විය යුතු අතර, ඒ සියලු ද්‍රව්‍ය විකිණීම හෝ බැහැර කිරීම සඳහා සභාවට පූර්ණ බලය තිබිය යුතු ය.

කසළ බැහැර කිරීම සඳහා සහ උපකරණ තැබීම සඳහා ස්ථාන.

**120.** මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලැබූ විට කසළ, නිවාස කසළ, මල සහ එවැනි වෙනත් ද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමට ද එම කාර්යය හෝ මේ ආඥාපනතේ වෙනත් කාර්ය අතුරින් යම් සඳහා අවශ්‍ය වන සියලු ම වාහන, සතුන්, උපකරණ සහ වෙනත් දේ තැබීමට ද පහසු ස්ථාන සෑම නගර සභාවක් විසින් කලින් සැපයිය යුතු අතර මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලබන එකී කසළ, මල හෝ එවැනි වෙනත් ද්‍රව්‍ය, කරදරයක් වන අන්දමින් බැහැර නොකරන බවට වග බලා ගැනීමට අවශ්‍ය සියලු වැඩ පිළිවෙළවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන ඒ සභාව විසින් සැලැස්විය යුතු ය.

## සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි

සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සම්බන්ධයෙන්ය සභාවේ කාර්ය.

**121.** නගරය තුළ ඇති ගෙවල් සහ ගොඩනැගිලි මේ ආඥාපනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක විධිවිධානවලින් නියමිත අන්දමේ සනීපාරක්ෂක තත්ත්වයක පවත්වාගෙන යන බව සැක හැර දැන ගැනීමේ අදහසින් නගරයේ සෑම කොටසක ම කලින් කල පරීක්ෂණයක් පැවැත්වීමට සැලැස්වීම ද ඒ විධිවිධාන නගරය ඇතුළේ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ද එක් එක් නගරයේ නගර සභාවේ කාර්යය විය යුතු ය.

පවත්නා ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාවේ බලය.

**122.** (1) සභාව සංස්ථාපනය කරනු ලැබූ දිනයේ පැවතියේ වුව ද එසේ නැතහොත් පසුව ඉදි කරනු ලැබුවේ වුව ද නගරය තුළ පිහිටි යම් ගොඩනැගිලි හෝ ගොඩනැගිලි කට්ටි, වසංගතයක් ඇති වීමේ හේතුව නිසා හෝ ඒ ගොඩනැගිලි එකිනෙකට ළංව ඇති ආකාරය නිසා හෝ ජලාපවහනය නොමැති වීම නිසා හෝ කසළ ශෝධනය කළ නොහැකි වීම නිසා හෝ, එහි හෝ ඒ අවට ප්‍රදේශයේ නිවැසියන්ගේ සෞඛ්‍යයට අවදානමක් බවට පත් වී ඇති බවට යම් නගරයක නගර සභාව සෑහීමට පත් වූ කවර අවස්ථාවක දී වුව ද ඒ ගොඩනැගිල්ල වෙනස් කිරීම ඇතුළුව ඒ අවදානම දුරලීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකන අන්දමේ ක්‍රියා, දැන්වීමේ සඳහන් කාලය ඇතුළත කරන ලෙසට වූ දැන්වීමක් එහි අයිතිකරුවන් වෙත හෝ පදිංචිකරුවන් වෙත හෝ සභාවේ අභිමතය පරිදි එම ගොඩනැගිලි තනා ඇති ඉඩමේ අයිතිකරු වෙත හෝ සභාව විසින් භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් භාර දෙනු ලැබූ අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කළ හෝ අතපසු කළ යම් අවස්ථාවක ඒ ගොඩනැගිලි කඩා දැමීමට සැලැස්වීම හෝ අවදානම දුරලීම සඳහා අවශ්‍ය යැයි සභාව සලකන අන්දමට ඒ ගොඩනැගිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සැලැස්වීම, සභාව විසින් ඒ වෙනුවෙන් බලය දෙනු ලද යම් නිලධරයකු විසින් කළ හැකිය.





(3) ගොඩනැගිලි කිසිවක් (2) වන උපවගන්තිය යටතේ කඩා දමන ලද අවස්ථාවක, එක් එක් ගොඩනැගිල්ලේ ද්‍රව්‍ය, විකිණිය හැකි නම්, වෙන වෙනම විකිණීමට සභාව විසින් හෝ බලය ලත් නිලධරයා විසින් සැලැස්විය යුතු අතර, ඉන් ලැබෙන මුදල් ගොඩනැගිල්ලේ අයිතිකරුට ගෙවිය යුතු ය. අයිතිකරු කවුරුන් දැයි නොදන්නේ නම් හෝ හිමිකම පිළිබඳ ආරාවුලක් ඇත් නම්, ඒ මුදල ගෙවනු ලැබීම සඳහා ඊට හිමිකම් ඇති තැනැත්තා විසින් නිසි බලය ඇති අධිකරණයකින් ආඥාවක් ලබා ගන්නා තෙක් සභාව විසින් ඒ මුදල තැන්පත් කර තබාගත යුතු ය.

නිවාස තුළ තදබදය.

**123.** නගරය තුළ පිහිටි යම් ගෙයක් එහි පදිංචිකරුවන්ගේ හෝ අසල්වාසීන්ගේ සෞඛ්‍යයට අන්තරාදායක හෝ හානිකර වන තරමට ජනයාගෙන් තදබද වී ඇති බව නගර සභාවට පෙනී යන්නා වූ ද පදිංචිකරුවන් එක පවුලකට වඩා වැඩි ගණනකින් යුක්ත වන්නා වූද කවර හෝ අවස්ථාවකදී, ඒ තදබදය නැති කිරීම සඳහා සභාව විසින් නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පැවරිය යුතු අතර එවිට අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන ආඥාවක් ඒ අධිකරණය විසින් කළ යුතු ය; ඒ තදබදයට ඉඩ දෙන එක් එක් තැනැත්තා ඒ ආඥාවෙන් අනතුරුව ඒ තදබදය දිගට ම පැවති එක් එක් දවසට රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය

[1984 අංක 48 § 22]

ගෙවල් පරීක්ෂා කිරීමට සහ හුණු ගෑමට සභාවට ඇති බලය.

**124.** යම් නගරයක නගර සභාව විසින් තම නිලධරයන් අතුරින් යම් නිලධරයකු මගින්, ඉර උදාවත් ඉර බැසීමත් අතර යම් වේලාවක නගරය තුළ පිහිටි යම් ගෙයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම ද, එහි මුලුමනින් ම හෝ එහි යම් කොටසක ඇතුළත හා පිටත හුණු ගාන ලෙස හෝ එය හෝ ඒ කොටස වෙනත් අයුරකින් පිරිසිදු කරන ලෙස ලියවිල්ලකින් වූ නියමයකින් විධාන කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය; තව ද ඒ ගෙයි හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ පදිංචිකරු එම නියමය තමා වෙත භාර දෙනු ලැබීමෙන් දවස් හතක් ඇතුළත ඒ විධානයට අනුකූලව ක්‍රියා කිරීම අතපසු කළහොත්, සභාව විසින් එම වැඩය කරවිය හැකි අතර ඒ සඳහා දරනු ලැබූ වියදම් අයිතිකරු විසින් ගෙවිය යුතු ය. ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට අය කර ගත හැකි වන්නේ ය.

අවසර නොමැතිව ගෙවල් හෝ පැලවල් පොල් අතුවලින් සෑදීම හෝ සෙවිළි කිරීම නොකළ යුතු බව.

**125.** (1) සභාවේ සභාපතිවරයාගේ අවසරය පළමුවෙන් ලබා නොගෙන යම් තැනැත්තකු විසින්, නගර සභාවක් සංස්ථාපනය කොට ඇති යම් නගරයක් ඇතුළත (වාසය සඳහා හෝ සතුන් ගාල් කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා පාවිච්චි කිරීමට වුව ද) පිටිවහලය හෝ බිත්ති තණකොළ වලින්, කොළ වලින්, සෙවිලි අතුවලින්, පොල් අතුවලින්, පැදුරු වලින් හෝ වෙනත්

එවැනි යම් දැවෙනසුලු ද්‍රව්‍යයකින් යුක්ත ව, යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ සෑදීම නීත්‍යානුකූල නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් අවසරය දෙන සෑම අවස්ථාවක දී ම එම අවසරය, නිශ්චිත කාල සීමාවකට ද අවසරය අදාළ වන ගොඩනැගිල්ලේ වහළට සහ බිත්තිවලට පාවිච්චි කරන ලද ඒ දැවෙන සුලු ද්‍රව්‍ය වෙනුවට සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන නොදැවෙන සුලු හෝ කල් පවත්නා ද්‍රව්‍ය හැකි ඉක්මනින් යොදන බව නිසැක කර ගැනීමේ කාර්යය සඳහා ලිඛිතව නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ද දිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වර්ගයට අයත් වන යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් එම උපවගන්තියෙන් නියමිත අවසරය නොමැතිව තනනු ලැබුවහොත්, එම ගෙයි, පැලේ, මඩුවේ හෝ වෙනත් ගොඩනැගිල්ලේ ප්‍රකට ව පෙනෙන කොටසක දැන්වීමක් ඇලවීමෙන් නොපමාවම හෝ සභාපතිවරයා විසින් දැන්වීමේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස එහි අයිතිකරුට හෝ ඒ ගොඩනැගිල්ල ඉදි කර හෝ තනා ඇති හෝ තනන භූමියේ අයිතිකරුට සභාව විසින් දැන්වීමක් දිය යුතු ය.

(4) යම් ගෙයක්, පැලක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් නොපමාව (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත කඩා ඉවත් කරනු නොලැබුවහොත්, සභාපතිවරයා විසින් ඒ ගොඩනැගිල්ල කඩා ඉවත් කරවිය යුතු අතර එසේ කිරීම සඳහා සභාපතිවරයා විසින් දරන ලද වියදම් ගොඩනැගිල්ලේ හෝ එය තනා ඇති භූමියේ අයිතිකරු විසින් ගෙවිය යුතු ය. තව ද ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට අය කරගත හැකි වන්නේ ය.

## කරදර

කරදර පරීක්ෂා කිරීම.

**126.** මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් පැවරී ඇති බලතල යටතේ නතර කිරීමට උචිත කරදර කවරේ දැයි නිශ්චය කර ගැනීමේ සහ ඒ කරදර නතර කිරීම පිණිස මේ ආඥාපනතේ හෝ ඒ වෙනත් ප්‍රඥප්තියේ හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අභිප්‍රායයෙන් කලින් කළ නගරය තුළ පරීක්ෂණයක් කිරීමට සැලැස්වීම එක් එක් නගරයේ නගර සභාවේ කාර්යය විය යුතු ය.

පෞද්ගලික ස්ථානවල තිබෙන අහිතකර ජලාශ පුරවා දැමීමේ බලය.

**127.** (1) නගර සභාවෙන් සංස්ථාපනය කොට ඇති යම් නගරයක් තුළ යම් පෞද්ගලික ඉඩමක පිහිටා තිබෙන යම් පෞද්ගලික ජලාශයක් හෝ පහත් වගුරු බිමක් හෝ යම් අපවිත්‍ර හෝ ගලා නොබසින ජලයක් සෞඛ්‍යයට අහිතකර බව හෝ අසල්වැසියන්ට අප්‍රසන්න බව සභාවට පෙනී ගිය අවස්ථාවක දී, එම ජලාශය හෝ වගුරු බිම ශුද්ධ පවිත්‍ර කරන ලෙස හෝ පුරවන ලෙස හෝ එම අපවිත්‍ර හෝ ගලා නොබසින ජලය බස්වා හරින ලෙස හෝ ඉවත් කරන ලෙස හෝ සභාව විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් එම ඉඩමේ අයිතිකරුට නියම කළ යුතු ය.



(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙන ලද යම් අයිතිකරුවකු එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත එම දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අතපසු කළහොත් සභාව විසින් හෝ සභාවේ නිලධරයන් සහ වැඩකරුවන් විසින් එම ඉඩමට ඇතුළු වී, (1) වන උපවගන්තියේ සඳහන් කාර්යයන් සියල්ල සඳහා හෝ ඉන් කිසිවක් සඳහා හෝ අවශ්‍ය සියලු ක්‍රියා කරනු ලැබිය හැකි ය. තව ද, ඒ සඳහා දරන ලද වියදම් ඉඩමේ අයිතිකරු විසින් ගෙවිය යුතු අතර ඒ වියදම් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට අය කරගත හැකි වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ඉඩම් එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකුට අයිතිව ඇති අවස්ථාවක දී, ඒ උපවගන්තියේ සඳහන් වියදම්, සභාව විසින් නිශ්චය කරනු ලබන අනුපාතයකට අනුව ඒ වෙන් වෙන් අයිතිකරුවන් අතර කොටස් කර ඔවුන්ගෙන් අය කරගත යුතු ය.

ළමයකු විසින් කරන පිඩාව. [1984 අංක 48 § 23.]

**127අ.** වයසින් අවුරුදු දොළහකට අඩු ළමයකු රැක බලාගන්නා හෝ ඔහුගේ භාරකාරත්වය දරන සෑම තැනැත්තකුම, ඒ ළමයා විසින් යම් වීථියක හෝ එහි පසෙක හෝ පීඩාවක් කිරීම නොවළක්වන්නේ නම්, ඒ සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

පොදු නාන ස්ථාන [1984 අංක 48 § 23.]

**127ආ.** (1) නෑම හෝ සතුන් හෝ රෙදි සේදීම සඳහා වෙන් කරනු ලැබ නැති යම් පොදු ස්ථානයක හෝ දැන්වීමේ සඳහන් කරන ලද වේලාවන් හෝ තැනැත්තන් හැර වෙනත් වේලාවන් තුළ හෝ තැනැත්තන් විසින් නෑම හෝ සතුන් හෝ රෙදි සේදීම සහ පොදු ස්ථානයන්හි ජලය කවර අන්දමකින් හෝ අපවිත්‍ර කරන හෝ ඒ ජලය පාවිච්චියට අහිතකර හෝ නුසුදුසු කරන සියලු ක්‍රියාවන් හෝ නාන ස්ථාන හෝ රෙදි සෝදන ස්ථාන පාවිච්චි කරන තැනැත්තන්ට හිරිහැරයක් හෝ හිංසාවක් සිදු කරන ක්‍රියාවන්, ප්‍රසිද්ධ දැන්වීමක් මගින් සභාව විසින් තහනම් කරනු ලැබිය හැකි ය. ඒ දැන්වීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ගැසට් පත්‍රයෙහි සහ යටත් පිරිසෙයින් එක් සිංහල පුවත් පතක, එක් දෙමළ පුවත් පතක සහ එක් ඉංග්‍රීසි පුවත් පතක ද පළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට පටහැනිව නාන, සෝදන හෝ යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු, රුපියල් පන් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

ජලාශවලට හෝ ජල කර්මාන්ත වලට ගලා යන ඇළවල් අපවිත්‍ර කිරීම. [1984 අංක 48 § 23]

**127ඇ.** යම් නගර සභාවකට අයත් ජලකර්මාන්තයක කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ජලාශයක හෝ එවැනි යම් ජලාශයකට ජලය ගලා යන්නා වූ හෝ ජලය එක්රැස් කරන්නා වූ යම් ඇළක හෝ ජල මාර්ගයක නාන හෝ රෙදි හෝ වෙනත් යම් දෙයක්

සෝදන නැතහොත් එවැනි ජලාශයකට, ඇලකට හෝ ජල මාර්ග **කට කුණු රොඩු, ඉවත ලන ද්‍රව්‍ය හෝ අපවිත්‍ර ද්‍රව්‍ය ගලායැමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් එය අපවිත්‍ර වීමට හෝ අපිරිසිදු** මිශ්‍ර වීමට ඉඩ හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු ව අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන් සියයකට නො වැඩි දඩයකට ද අඛණ්ඩව කරන වරදක් සම්බන්ධයෙන් වන වි එසේ අඛණ්ඩව වරද කිරීම ගැන වරදකරු කරනු ලැබීමෙන් පෙ ඒ වරද ගැන අවධානය යොමු කරමින් සභාවෙන් ලිඛිත දැන්වීම භාර දෙනු ලැබූ දිනට පසු වරද අඛණ්ඩව කරන එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය

කර්මාන්තශාලා වලින් සිදුවන අපවිත්‍ර වීම.
[1984 අංක 48 § 23.]

127 ඇ. (1) අසල්වාසීන්ගේ සෞඛ්‍යයට හානිකර වන හෝ අහිතකර වන ලෙසින් අපවිත්‍ර වීම සිදුවන ආකාරයෙන් යම් නගර සභාවක පාලන සීමාව තුළ යම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යැමට සලස්වන යම් තැනැත්තකු වර කට වරදකරු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට, ලඝු නඩු විභාග කින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක, ඒ කර්මාන්ත ශාලාව නිසා සිදු වන අප **විත්‍ර වීම ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ඒ මහේස්ත්‍රාත්වරයා** විසින්—

(අ) ඒ කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය වෙනුවෙන් මේ ආ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා වක විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන බල පත්‍රයක් සඳහා ගෙවිය යුතු වන ගාස්තුව මෙන් දෙගුණයකට සමාන දඩයක්, ඒ දවසේ ප්‍රමාණය සිය සාමාන්‍ය අධිකරණ බලය **පාවිච්චි කිරීමේ දී මහේස්ත්‍රාත්වරයකු විසින් පැනවිය** හැකි දඩයේ ප්‍රමාණය ඉකුත් කරන්නේ වී නමුදු, පන වනු ලැබීමට ද, එසේ අය කරගනු ලබන මුදල සභාවේ අරමුදලට ගෙවනු ලැබීම ද, නැතහොත්

(ආ) ඒ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යැම නතර කරනු ලැබීම ද

සඳහා ආඥා කරනු ලැබිය යුතු ය.

තැනැත්තෙකුගේ හෝ දේපළක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස්වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් නගර සභාවක සභාපති වරයකුගේ බලතල.
[1984 අංක 48 §23.]

127 ඉ. (1) යම් නගර ප්‍රදේශයක් තුළ වූ යම් ගසකින්, ගසක **යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කොටසකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානියක් සිදු වන හෝ සිදු** වීමට ඉඩ ඇති අවස්ථාවක නැතහොත් එය, යම් ගොඩනැගිල්ලක පදිංචි **කරුවන්ට අන්තරායදායක ලෙස හෝ යම් ප්‍රසිද්ධ මහා මාර්ගයක ගමන් කරන්නන්ගේ** ආරක්ෂාවට අන්තරායදායක තත්ත්වයක පවතින අවස්ථාවක, ඒ ප්‍රදේශයේ සභාවේ සභාපතිවරයා විසින්, ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව





සඳහන් විය හැකි කාලයක් ඇතුළත, ඒ ගස, ඒ ගසේ අත්ත, කඳ, ගෙඩිය හෝ වෙනත් කොටස ආරක්ෂිතව බැඳ තැබීමට හෝ කපා ඉවත් කිරීමට, ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකු ම විසින්, ඒ දැන්වීමේ නියම කර ඇති කාලය තුළ එහි නියමයන් ඉටු කරනු ලැබිය යුතු අතර, ඒ කාලය ඇතුළත ඒ නියමයන් ඉටු කිරීම ඒ තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරන හෝ අතපසු කරන අවස්ථාවක් වේ නම්, එවැනි අවස්ථාවක, සභාපති වරයා හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් ඒ සඳහා බලය පව රන ලද යම් නිලධරයකු හෝ කම්කරුවකු ඒ දැන්වීමේ සඳහන් ඉඩමට ඇතුළු වී, ඒ නිවේදනයෙන් ඒ තැනැත්තාට කරන්නට නියම වී තිබූ දෙය කරනු ලැබිය හැකි අතර, ඒ වෙනුවෙන් දරන්නට සිදු වන වියදම්, සභාවට අය විය යුතු ණයක් ලෙස සලකා ඒ තැනැත්තාගෙන් අය කරගනු ලැබිය හැකි ය.

127ආ වන වගන්තියේ, 127ඇ වන වගන්තියේ සහ 127ඇ වන වගන්තියේ කාර්ය සඳහා “අපවිත්‍ර වීම” යන්නෙන්, මහජන සෞඛ්‍ය ආරක්ෂාවට හෝ ශුභ සිද්ධියට නැතහොත් සතුන්ට, පක්ෂීන්ට, වන සතුන්ට, මසුන්ට හෝ ජලජ ජීවීන්ට නැතහොත් වෘක්ෂලතාදියට අනතුරුදායක හෝ අනාතුරුදායක විය හැකි තත්ත්වයක් ඇති කරවීමට යම් අභිවෘද්ධි දායක ප්‍රයෝජනයට ගැනීමකට අහිතකර ලෙස බල පාන අහ දමින්, ඉවත ලන ද්‍රව්‍ය, පිට කිරීමෙන්, දැවීමෙන් හෝ තැන්පත් කිරීමෙන් පරිසරයේ කවර හෝ කොට සක භෞතික, තාප, රසායනික, ජෛවීය හෝ විකිරණශීලී ගුණාංග වල කෙළින් ම හෝ වෙනත් ආකාරයයකින් කෙරෙන යම් වෙනස් කිරීමක් අදහස් වේ.

ගෝඝාතක ස්ථාන සඳහා බලපත්‍ර දීම.

128. (1) යම් නගරයක නගර සභාව විසින් සපයන ලද ස්ථාන යක් නොවන, ඒ නගරය තුළ වූ යම් ස්ථානයක් ගෝඝාතක ස්ථාන **යක් ලෙස පාවිච්චි කිරීම සඳහා තමාට අභිමත පරිදි කලින් කල** බල පත්‍රයක් දීමට සහ අවශ්‍ය ලෙස තමාට පෙනී ගිය හැකි පරිදි එම බල පත්‍රය අත්හිටුවීමට සහ අවලංගු කිරීමට මෙයින් බලය පවරනු ලැබ ඇති සභාවේ සභාපතිවරයාගෙන් එබඳු බල පත්‍රයක් ලබාගතහොත් මිස, එබඳු කිසි ම ස්ථානයක් ගෝඝාතක ස්ථාන යක් ලෙස පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

[1981 අංක 61 § 14.]

(2) (නගර සභාව විසින් සපයනු ලබන ස්ථානයක් නොවන) (1) වන උපවගන්තිය යටතේ බල පත්‍රයක් දෙනු නොලැබූ යම් ස්ථානයක් හෝ දෙනු ලැබූ යම් බල පත්‍රයක් අත්හිටුවනු ලැබූයේ හෝ අවලංගු කරනු ලැබූයේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානය ගෝඝාතක ස්ථානයක් වශයෙන් පාවිච්චි කරනු ලබන සෑම තැනැත්තකුට ම රුපියල් හයසියයකට නොවැඩි දඩයකින්

සහ එකී ගෝෂාතක ස්ථානය පාවිච්චි කිරීම නතර කරන ලෙස ද තැනැත්තාට නියම කරමින් සභාපතිවරයා විසින් ඔහු වෙත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව ඒ වරද තව දුරටත් කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් පන් සියයකට නොවැඩි තව දුරටත් වූ දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන වැසීමේ ආඥාව.

[1981 අංක 61 § 15.]

128 අ. (1) මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බල පත්‍රයක් නොමැතිව යම් තැනැත්තකු, යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ, තමා විසින් හෝ තම වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ඒ ස්ථානය පාවිච්චි කිරීම නොකඩව කර ගෙන යන අවස්ථාවක, සභාපතිවරයා, ලේකම්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් වැසීමේ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත, මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ තැනැත්තා සභාවෙන් බල පත්‍රයක් ලබා ගන්නා තුරු ඒ ස්ථානයෙහි ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී සභාපතිවරයා, ලේකම්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බල පත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය දිගට ම පාවිච්චි කරන බව දක්වමින් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වැසීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයාට වහා ම කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි සඳහන්, ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර, ඒ පිස්කල්වරයා විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීම සඳහා එකී පිස්කල්වරයා හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යැයි සලකන යම් සහායකයන් ද සමඟ ස්ථානයට ඇතුළු වීමට ඒ ආඥාව ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධරයාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.



## V වන කොටස

## මහජනෝපකාර සේවා

මහජනෝපකාර සේවා පිහිටුවා පවත්වාගෙන යෑමට නගර සභාවට ඇති බලය.

**129.** නගරයක නගර සභාවක් විසින් තනිව ම හෝ වෙන යම් පළාත් පාලන ආයතනයක් සමඟ සම්බන්ධව සහ (ආණ්ඩුවේ ආධාර ඇතිව හෝ නැතිව) කෙළින් ම හෝ යම් ප්‍රරෝහකයකු හෝ ප්‍රරෝහක මණ්ඩලයක් මගින් එම නගරය ඇතුළත යම් ස්ථානයක හෝ ප්‍රදේශයක කාර්යය සඳහා එකී ස්ථානයේ හෝ ප්‍රදේශයේ වාසය කරන හෝ එහි ගැවසෙන තැනැත්තන්ගේ යහපත සඳහා පහත සඳහන් මහජනෝපකාර සේවා අතුරින් යම් සේවයක් පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය හැකි ය :—

(අ) ජල සම්පාදනය ;

(ආ) වීථි, පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි ආලෝක කිරීම ;

(ඇ) විදුලි ආලෝකය හෝ බලය සැපයීම ;

(ඈ) වෙළෙඳ පොළවල් ;

(ඉ) පොදු නාන ගෙවල් සහ නාන ස්ථාන ;

(ඊ) වැසිකිළි සඳහා වැසිකිළි ලැලි නිෂ්පාදනය කොට පිරිවැය මිලට සැපයීම ;

(උ) දුප්පත් පංති සඳහා නිවාස පහසුකම් සැපයීම ;

(ඌ) පිහිටුවීම සහ පවත්වාගෙන යෑම පිළිබඳව වෙන යම් නීතියක් මගින් පැනවිය හැකි තහනමකට හෝ සීමා කිරීමකට යටත්ව, වෙන යම් ආකාරයක පොදු සේවයක්.

මහජනෝපකාර සේවා සඳහාවූ වියදම් ගෙවීමේ ආකාරය.

**130.** (1) මේ කොටස යටතේ පිහිටුවීමට හෝ පවත්වාගෙන යෑමට නගර සභාවට බලය දෙනු ලැබ ඇත්තේ යම් මහජනෝපකාර සේවයක් සම්බන්ධයෙන් ද ඒ මහජනෝපකාර සේවය පිහිටුවීමේ හෝ පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා, සභාව විසින්—

(අ) සභාවේ ආදායමෙන් වැය වන යම් වියදමක් සඳහා මුදල් සැපයීම ; හෝ

(ආ) අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි සීමාවන්ට සහ නිදහස් කිරීම්වලට යටත්ව, එකී සේවයෙන් ප්‍රයෝජනය ලබන ප්‍රදේශය සඳහා විශේෂ ගාස්තු ප්‍රමාණයක්, අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව, අය කිරීම ; හෝ

(ඇ) එම සේවය සැලැස්වීම සඳහා එකී සේවයෙන් ප්‍රයෝජනය ලබන ස්ථානයේ අයිතිකරුවන් හෝ පදිංචි කරුවන් සමඟ ගිවිසුමකට එළඹීම සහ එකී සේවය සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි ගාස්තු ප්‍රමාණය අය කිරීම සහ ලබා ගැනීම ; හෝ

(ඈ) එකී සේවයෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් සාධාරණ යැයි සැලකිය හැකි අන්දමේ ගාස්තු අය කිරීම ; හෝ

(ඉ) සභාව සමග එළඹි යම් එකඟ වීමක් අනුව හෝ සභාව විසින් නිකුත් කරන ලද යම් බල පත්‍රයක් යටතේ ය ප්‍රරෝහකයකු හෝ ප්‍රරෝහක මණ්ඩලයක් මගින් එ යම් පොදු සේවයක් පිහිටුවන ලද හෝ පවත්වාගෙන යන අවස්ථාවක දී, එම සේවයෙන් ප්‍රයෝජනය ලබ තැනැත්තන්ගෙන්, සභාව විසින් අනුමත කරනු ලැබ හැකි ගාස්තු අය කිරීම

කළ හැකි ය.

[1979 අංක 57 § 4.] (2) යම් පසුගිය වර්ෂයක දී (1ආ) වන උපවගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද විශේෂ වරිපනම් බද්ද—

(අ) ප්‍රමාණවත් සේවා නොසලස්වා නියම කරනු ලැබ තිබෙ බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ විශේෂ වරිපනම් බද්ද අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද ගාස්තු ද අත් හැරීම අවස්ථානුගත කරුණු අනුව යුක්ති සහගත හා සාධාරණ බව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද අවස් ථාවක, ඒ විශේෂ වරිපනම් බද්ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ විශේෂ වරිපනම් බද්ද අය කරගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත් හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබ නීත්‍යනුකූල විය යුතු ය.

[1979 අංක 57 § 4.] (3) නියම කරනු ලැබූ යම් විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත් හැරීමට (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී වරි පනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් වෙනුවට ගි කිරීම; හෝ

(ආ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක ඒ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීමට ; හෝ

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකු අයිතිවාසිකමක් නැත්තේ ය.



යාබද ප්‍රදේශවලට සැපයුම.

**131.** යම් නගරයකට යාබද යම් ප්‍රදේශයක් තුළ පිහිටි යම් ස්ථානයකට යම් මහජනෝපකාර සේවයක් සැපයීම සඳහා ඒ නගරයේ නගර සභාව විසින් එකී යාබද ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ එකඟත්වයට යටත්ව, ඒ ස්ථානයේ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් සමග ගිවිසුමකට එළඹිය හැකි අතර එම සැපයීම සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ද ඒ ගාස්තුවල ප්‍රමාණය නියම කිරීම ද කළ හැකි ය.

සභාවේ සාමාන්‍ය බලතල.

**132.** මේ ආඥාපනත යටතේ පිහිටුවීමට හෝ පවත්වාගෙන යෑමට යම් නගර සභාවකට බලය දී තිබෙන යම් මහජනෝපකාර සේවයක් පිහිටුවීමේ හෝ පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා ඒ නගර සභාව විසින් යම් ගිවිසුමකට එළඹිය හැකි අතර, මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, ඒ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු ස්ථාන, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිල දී ගැනීම, බද්දට ගැනීම කුලියට ගැනීම, ඉදි කිරීම හෝ නඩත්තු කිරීම සහ ඒ වෙනුවෙන් අවශ්‍ය විය හැකි සියලු වැඩ, කාරණා සහ දේවල් කිරීම සහ ඉටු කිරීම ද කරනු ලැබිය හැකි ය.

## ජල සම්පාදනය

ගෘහ කාර්යයන් සඳහා පොදු ජල කණුවලින් නොමිලේ ලැබෙන ජල සම්පාදනය ලැබීම සඳහා බදු ගෙවන්නන්ට අයිතිවාසිකම ඇති බව.

**133.** නගරයක් ඇතුළත යම් ප්‍රදේශයක පදිංචිකරුවන්ගේ යහපත සඳහා ඒ නගරයේ නගර සභාව විසින් පොදු ජල සම්පාදනයක් පිහිටුවනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී, එකී ජල සම්පාදනය පිළිබඳ කාර්යයන් ද ඇතුළත් වූ කාර්යයන් සඳහා විශේෂ ජල ගාස්තුවක් හෝ සාමාන්‍ය ගාස්තුවක් සභාව විසින් අය කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රදේශය තුළ වූ යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට, ඔහුගේ ම සහ ඔහුගේ ගෙදර නිවැසියන්ගේ හෝ ඔහුගේ නිවස කුලියට ගෙන සිටින්නන්ගේ හෝ ඔහුගේ ස්ථානයේ පදිංචිව සිටින වෙනත් තැනැත්තන්ගේ ගෘහ කාර්යයන් සඳහා තවත් ගාස්තුවක් නොගෙවා පොදු ජල කණුවලින් ජල සම්පාදනයක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකම් තිබිය යුතු ය.

" ගෘහ කාර්ය " යන්නෙහි අර්ථය.

**134.** යම් අශ්වයන්, ගවයන් හෝ රථ වාහන විකිණීම හෝ කුලියට දීම පිණිස තබා ඇති අවස්ථාවක දී ඒ අශ්වයන් හෝ ගවයන් හෝ රථවාහන සේදීම සඳහා වූ ජල සම්පාදනයක් හෝ යම් වෙළඳාමක්, නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ වතුරමල් හෝ පිහිණුම් පොකුණු සඳහා හෝ යම් විසිතුරු හෝ යාන්ත්‍රික කාර්යයන් සඳහා හෝ වාරිමාර්ග කාර්යයන් සඳහා වූ ජල සම්පාදනයක් ගෘහ කාර්යයන් සඳහා වූ ජල සම්පාදනයකට ඇතුළත් නොවිය යුතු ය.

පෞද්ගලික සේවය සඳහා වූ ගිවිසුම.

**135.** නගර සභාවක් විසින් ගෘහ කාර්යයන් සඳහා නොවන ජල සම්පාදනයක් හෝ ගෘහ කාර්යයන් සඳහා යම් ස්ථානයක පෞද්ගලික ජල සම්පාදනයක්, සභාව සහ එසේ ජලය ලබාගැනීමට කැමති තැනැත්තන් අතර එකඟත්වයෙන් ඇති කර ගන්නා ... හෝ ඒ සඳහා වූ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි ප්‍රමා... අනුව සහ නියමයන් සහ කොන්දේසි අනුව දෙනු ලැබිය හැකි ...

## වෙළෙඳ පොළවල්

වෙළඳ පොළවල් සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

**136.** (අ) එක් එක් නගරයක වැසියන්ට සේවය සඳහා අව... විය හැකි සියළු පොදු වෙළෙඳ සැල් ඒ නගර... ඇතුළත පිහිටුවීම හා පවත්වාගෙන යෑම ... ඒ සියලු වෙළෙඳ පොළවල්වල තිබි අන්දම්... කසළ ශෝධනය, සේදීම, විෂබීජ නාශනය ... මලාපවහනය කරන බවට වග බලා ගැනීම ;

(ආ) මේ ආඥාපනත යටතේ බලපත්‍ර දෙනු ලැබ නගර... ඇතුළත පිහිටි සියළු පෞද්ගලික වෙළෙ... පොළවල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම ... පාලනය කිරීම ;

එකී එක් එක් නගරයේ නගර සභාවේ කාර්යය විය යුතු ...

අළුත් පෞද්ගලික වෙළඳ පොළවල් සඳහා බලපත්‍ර දීම.

**137.** නගර සභාවක් සංස්ථාපනය කර තිබෙන යම් නගරය... ඇතුළත කිසි ම අලුත් වෙළෙඳ පොළක්, ඒ සභාවේ සභාපතිවර... විසින් නිකුත් කරන ලද බලපත්‍රයක කොන්දේසි යටතේ සහ ... කොන්දේසිවලට අනුකූලව හැර, පිහිටුවනු නොලැබිය යුතු ය.

පවත්නා පෞද්ගලික වෙළඳ පොළවල් සඳහා බලපත්‍ර දීම.

**138.** (1) යම් නගරයක් සඳහා නගර සභාවක් සංස්ථාපන... කරන ලද දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ... එම නගරය ඇතුළත එම දිනය වන විට පවත්නා කිසි ... පෞද්ගලික වෙළෙඳ පොළක්, ඒ සභාවේ සභාපතිවරයා විසි... නිකුත් කරන ලද බලපත්‍රයක කොන්දේසි යටතේ සහ ... කොන්දේසිවලට අනුකූලව හැර, තවදුරටත් පවත්වාගෙන ය... නොලැබිය යුතු ය.

(2) පවත්නා පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා වූ සෑ... ඉල්ලීමක්—

(අ) පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති 'අ' ආකෘතියේ... සාරානුකූල විය යුතු අතර, ඒ ආකෘතියේ විධිවිධා... සලස්වනු ලැබ ඇත්තේ යම් ප්‍රකාශයක් සඳහා ද ... ප්‍රකාශය සහ සභාවේ තත් කාලයේ බලපවත්නා අතු... ව්‍යවස්ථාවලින් නියම කළ හැකි හෝ එබඳු අතු... ව්‍යවස්ථා නොමැති නම් සභාපතිවරයා විසින් නියම කර... ලැබිය හැකි අන්දමේ පිඹුරු සහ පිරිවිතර ද ඒ සම... ඉදිරිපත් කළ යුතු ය ; තව ද





(ආ) සභාව සංස්ථාපනය කරන ලද දිනයේ සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත එම පෞද්ගලික වෙළෙඳ පොළේ අයිතිකරු විසින් ස්වකීය අත්සන යොදා ඉදිරිපත් කළ යුතු ය.

(3) වාර්ෂික වටිනාකම පිළිබඳ තක්සේරුව, බලපත්‍ර ගාස්තු, වන්දි හෝ අත්කර ගැනීම් සම්බන්ධයෙන් පැන නැගිය හැකි සියලු ප්‍රශ්නවලදී, (1) වන උපවගන්තිය මගින් නියම කර ඇති සෑම ප්‍රකාශයක් ම එහි සඳහන් සියලු විස්තර සම්බන්ධයෙන්. එම ප්‍රකාශය කරන ලද අයිතිකරුට විරුද්ධව වූ තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

බලපත්‍ර අවුරුදු පතා ගතයුතු බව සහ නියමිත ගාස්තු වකට යටත් විය යුතු බව.

**139.** (1) නගර සභාවක් විසින් පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම, පළමු වන උපලේඛනයෙහි දක්වා ඇති 'ආ' ආකෘතියට සාරානුකූල විය යුතු අතර, මේ ආඥාපනතේ විධිවිධානවලටත් සභාවේ තත් කාලයේ බලපවත්නා අතුරු ව්‍යවස්ථාවලටත් එක් එක් අවස්ථාවේ කරුණු අනුව පැනවීමට අවශ්‍ය යයි සභාපතිවරයා විසින් සැලකිය හැකි, එමෙන් ම එකී අතුරු ව්‍යවස්ථාවට අනුකූල නොවන්නා වූ විශේෂ කොන්දේසිවලටත් යටත් විය යුතු ය.

(2) පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා වූ සෑම බලපත්‍රයක් ම එය දෙනු ලැබුනේ යම් වර්ෂයක් සඳහාද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක්වන දිනයෙන් අවසන් විය යුතු ය.

(3) පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා වූ සෑම බලපත්‍රයක් ම අවුරුදු පතා අලුත් කළ හැකි විය යුතු අතර, ඒ බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදී සහ අලුත් කරනු ලබන සෑම අවස්ථාවකදී ම, 162 වන වගන්තිය යටතේ පනවනු ලැබිය හැකි ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

අලුත් පෞද්ගලික වෙළඳ පොළවල් නියමිත තත්ත්වයන්ට අනුකූල විය යුතු බව.

**140.** යම් අලුත් පෞද්ගලික වෙළෙඳ පොළක්, මේ ආඥාපනත යටතේ වූ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි මඳ වෙනස් කිරීම්වලට සහ එකතු කිරීම්වලට යටත්ව දෙවන උපලේඛනයෙහි නියම කර ඇති තත්ත්වයන්ට අනුකූල වුවහොත් මිස, ඒ වෙළෙඳ පොළ සඳහා කිසි ම බල පත්‍රයක් නොදිය යුතු ය.

වෙළඳ පොළවල් ශුද්ධ පවිත්‍ර කිරීම සහ එහි කසළ ශෝධනය.

**141.** පෞද්ගලික වෙළෙඳ පොළක කසළ ශෝධනය, එහි භූමිය සේදීම, එහි විෂ බීජ නාශකය සහ මලාපවහනය සඳහා අයිතිකරු විසින් සතුටුදායක විධිවිධාන සලස්වනු ලැබ ඇති බවට සභාපතිවරයා සෑහීමට පත්වන තුරු, ඒ වෙළෙඳ පොළ සඳහා කිසි ම බල පත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

අලුත් පෞද්ගලික වෙළඳ පොළවල් වලට තිබිය වර ප්‍රසාද නොවිය යුතු බව.

**142.** යම් අලුත් පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා මේ ආඥාපනත යටතේ දෙන ලද සෑම බලපත්‍රයක් ම, එකී පෞද්ගලික වෙළෙඳ පොළ වෙනුවට පොදු වෙළෙඳ පොළක් පිහිටුවීම මහජන සහපතට ඉවහල් වේ යැයි සභාව විසින් යම් විටක තීරණය කරනු ලැබුවහොත්, සභාවේ සභාපතිවරයා විසින් එකී පෞද්ගලික වෙළෙඳ

පොළේ බල පත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය; තවද එම පෞද්ගලික වෙළෙඳ පොළේ අයිතිකරුට, එකී ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් යම් වන්දියක් ලැබීමට හිමිකම් නොතිබිය යුතු ය යන කොන්දේසියට යටත් විය යුතු ය.

අලුත් බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයාට ඇති බලය.

**143.** එවකටත් පවතින හෝ පිහිටුවීමට අරමුණු කොට ඇති පොදු හෝ පෞද්ගලික වෙළෙඳ පොළවල්වලින් ප්‍රදේශයේ අවශ්‍යතාවන් ප්‍රමාණවත් ලෙස සැපයෙන බවට නගර සභාවක සභාපතිවරයා සෑහීමට පත් වුවහොත්, යම් අලුත් පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා බල පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාව සංස්ථාපනය කරනු ලද දිනයට පෙර එක් අවුරුද්දක් ඇතුළත පිහිටුවන ලද යම් පෞද්ගලික වෙළෙඳ පොළක් සම්බන්ධයෙන් යම් බල පත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

පවත්නා පෞද්ගලික වෙළඳපොළවල්වලට බලපත්‍ර දීම ප්‍රතික්ෂේප කිරීම.

**144.** නගර සභාවක් සංස්ථාපනය කරන ලද දිනයේ දී පවත්නා (එකී දිනයට පෙර එක් අවුරුද්දක් ඇතුළත පිහිටුවන ලද වෙළෙඳ පොළක් නොවන) යම් පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා පහත සඳහන් අවස්ථාවල දී බල පත්‍රයක් දීම හෝ බල පත්‍රයක් අලුත් කිරීම සභාවේ සභාපතිවරයා විසින් වන්දි ගෙවීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. ඒ අවස්ථා නම්:—

(අ) එකී වෙළෙඳ පොළ, දෙවන උපලේඛනයෙහි නියම කර ඇති තත්ත්වයන්ට අනුකූල නොවන විටක එකී වෙළෙඳ පොළ ඉහත කී තත්ත්වයන්ට අනුකූල කිරීමට, සභාපතිවරයාගේ මතය අනුව, අවශ්‍ය වෙනස් කිරීම්, එකතු කිරීම් හෝ වැඩි දියුණු කිරීම්, සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධාරණ කාලයක් ඇතුළත, ඒ අවස්ථාවේ යෙදී ඇති කරුණු අනුව එකී තත්ත්වයන් පිළිබඳව නගර සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි මඳ වෙනස් කිරීම් ඇතොත් ඒවාට යටත්ව, කිරීමට එහි අයිතිකරු විසින් අතපසු කරනු ලැබූ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී;

(ආ) එකී වෙළෙඳ පොළේ සහජ දෝෂ හේතුකොටගෙන හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ එකී වෙළෙඳ පොළ ඉහත කී තත්ත්වයන්ට හෝ එකී තත්ත්වයන් පිළිබඳව අනුමත කිරීමට සභාව කැමතිව සිටිය හැකි මඳ වෙනස් කිරීම්වලට අනුකූල වන සේ වැඩිදියුණු කළ නොහැකි බවට නගර සභාව සෑහීමට පත්ව ඇති අවස්ථාවක දී;

(ඇ) යම් පෞද්ගලික වෙළෙඳ පොළක පවතින තත්ත්වය හේතු කොටගෙන හෝ වෙන යම් හේතුවක් නිසා හෝ එකී වෙළෙඳ පොළ මහජනයාගේ සෞඛ්‍යාරක්ෂාව, ආරක්ෂාව හෝ පහසුව ගැන සැලකීමේ දී අමනෝඥ බවට නගර සභාව සෑහීමට පත්ව ඇති අවස්ථාවක දී:





එසේ වුව ද, මේ වගන්තිය යටතේ සභාපතිවරයාගේ හෝ නගර සභාවේ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. තවද ඒ අභියාචනය ඉදිරිපත් කරන ලද විට, අමාත්‍යවරයා විසින්, සභාපතිවරයාගේ හෝ නගර සභාවේ තීරණය ස්ථිර කරනු ලැබීම හෝ ඉහත කී තත්ත්වයන් පිළිබඳව අමාත්‍යවරයා විසින් ඒ අවස්ථාවේ පවතින කරුණු අනුව සාධාරණ යැයි සහ පොදු යහපතට අනුකූල යැයි සැලකිය හැකි, මඳ වෙනස් කිරීම්වලට අනුකූල බවට වෙළෙඳ පොළ පත් කරන බවට යටත්ව, බල පත්‍රයක් නිකුත් කිරීමට නියම කරනු ලැබීම හෝ අමාත්‍යවරයා විසින් යුක්ති සහගත යැයි සිතිය හැකි වෙනත් නියමයක් කරනු ලැබීම හෝ කළ හැකි ය.

අවුරුදු තිහකට ඉහත පිහිටුවනලද වෙළඳ පොළවල් පිළිබඳ විශේෂ විධිවිධාන.

**145.** (1) නගර සභාව සංස්ථාපනය කරන ලද දිනයට පෙරාතුව අවුරුදු තිහකට වැඩි කාලයක් පවත්වා ගෙන ගිය බවට සභාව සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබූ සහ 144 වන වගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් විස්තර ප්‍රකාර වූ යම් වෙළෙඳ පොළක් සම්බන්ධයෙන් සභාව විසින් තම අභිමතය පරිදි පහත සඳහන් පරිදි ක්‍රියා කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස විධානය කරනු ලැබුව හොත් එසේ ක්‍රියා කළ යුතු ය:—

(අ) ඒ පෞද්ගලික වෙළෙඳ පොළෙහි ඒ දක්වා කරන ලද ව්‍යාපාරය සඳහා සෑහෙන ඉඩකඩ, එවකටත් පිහිටුවන ලැබ ඇති හෝ මේ ආඥාපනත යටතේ පිහිටුවීමට නියමිත යම් ප්‍රාදේශීය පොදු වෙළෙඳ පොළක, සභාව විසින් සලස්වනු ලැබිය හැකි අතර, ඉන් පසුව එකී පෞද්ගලික වෙළෙඳ පොළ වසා දමා එකී ව්‍යාපාරය එසේ සපයන ලද අලුත් ස්ථානයට ගෙන යන ලෙස එකී පෞද්ගලික වෙළෙඳ පොළේ අයිතිකරුට හෝ එය පරිහරණය කරන්නාට විධානය කරනු ලැබිය හැකි ය; තවද

(ආ) (අ) ඡේදය යටතේ සභාව විසින් දෙන ලද විධාන පිළිපදිනු ලැබුවහොත්, එකී අයිතිකරු හෝ එය පරිහරණය කරන්නා සහ ඔහුගේ අනුප්‍රාප්තිකයන්, පොල්මෑකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ පැවරුම්ලාභීන් විසින්, සභාවේ තත් කාලයේ බල පවත්නා අතුරු ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය යන කොන්දේසියට සහ බද්දේ කොන්දේසිවලටත් යටත්ව සහ එහි නියම කර ඇති කුලිය ගෙවීමට යටත්ව, සභාව විසින් එහි අයිතිකරු වෙත හෝ පරිහරණය කරන්නා වෙත අවුරුදු පනහකට නොවැඩි කාලයකට ඒ ස්ථානය බදු දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බද්දක් යටතේ, ගෙවිය යුතු කුලිය වූකලී සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි සාධාරණ මුදලක් විය යුතු අතර, එය සෑම පස් අවුරුද්දකට පසු ම

ප්‍රතිශෝධනය කළ යුතු ය. ප්‍රථම පස් අවුරුදු කාල සීමාව සඳහා එ
කුලිය, එකී ඉඩකඩ සැපයීමේ පිරිවැයෙන් සියයට දහයකට නොවැ
විය යුතු අතර, ඉන් පසුව එළඹෙන සෑම පස් අවුරුදු කාල සීමාව
සම්බන්ධයෙන් ම, බදු දුන් ස්ථානයෙන් පූර්ව පස් අවුරුද්ද සඳහ
ලැබුණු සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයකට නොවැ
විය යුතු ය.

(3) ඒ වාර්ෂික ලාභ ප්‍රමාණය සම්බන්ධයෙන් යම් ආරාවුල
පැනනැඟුනහොත්, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කෙරෙන අභියාච
යකට යටත්ව, ඒ ආරාවුල සභාපතිවරයා විසින් නිරවුල් කළ යුතු

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බද්දක් යටතේ අ
විය යුතු කුලිය බද්දේ කොන්දේසි අනුව ගෙවනු නොලැබුවහො
හෝ බදු ගැනුම්කරු විසින් හෝ බදු දුන් ස්ථානය තන් කාලයේ
පරිහරණය කරන තැනැත්තා විසින් බද්දේ කොන්දේසි හෝ
ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා පිළිපදිනු ලැබී
නිරන්තරයෙන් පැහැර හරිනු ලැබුවහොත්, සභාව විසින්, බද්ද
අයිතිවාසිකම ඇති තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට ලියවිල්
කින් වූ දැන්වීමක් මගින් අවස්ථාව සලස්වා දෙනු ලැබීමෙන් පසු
එකී බද්ද අවලංගු කරනු ලැබිය හැකිය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ සභාව විසින් කරන
යම් නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අමා
වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඒ අභියාච
ඉදිරිපත් කරන ලද විට, අමාත්‍යවරයා විසින් යුක්තිසහගත
සලකනු ලැබිය හැකි අන්දමේ නියමයක් කිරීමට ඔහුට බලය තිබ
යුතු ය.

වෙළඳ පොළ සඳහා තාවකාලික බලපත්‍රයක් දීමට ඇති බලය.

**146.** පොදු අවශ්‍යතා සඳහා පොදු වෙළෙඳ පොළක් තුළ සු
විධිවිධාන වහාම සැලැස්වීමට යම් නගර සභාවකට නුපුළුවන් අව
ස්ථාවක දී, පවත්නා යම් පෞද්ගලික වෙළෙඳ පොළක්, දෙවන
ලේඛනයේ නියම කර ඇති තත්ත්වයන්ට හෝ ඒ පිළිබඳව අනු
කොට ඇති යම් මඳ වෙනස් කිරීම්වලට අනුකූල නොවූනත් ඒ
පෞද්ගලික වෙළෙඳ පොළ තාවකාලික ලෙස පවත්වාගෙන ය
මහජන පහසුව සඳහා අවශ්‍ය යැයි පෙනීගියහොත්, ඒ නගර සභ
විසින් එය එසේ පවත්වාගෙන යෑමට ඉඩ දෙනු ලැබිය හැකි අත
මේ ආඥාපනතේ විධිවිධාන යටතේ මතු යම් දිනක ක්‍රියා කිරී
සභාවට ඇති අයිතිවාසිකම් වලට හානියක් නොමැතිව, එම පෞ
ගලික වෙළෙඳ පොළ සඳහා තාවකාලික බල පත්‍රයක් නිකුත් කිරී
ද එම සභාව විසින් කළ හැකි ය.





පෞද්ගලික වෙළඳපොළක් වසා දැමීම සඳහා වන්දි.

**147.** (1) මේ ආඥාපනත යටතේ බල පත්‍රයක් දෙනු ලැබූ හෝ බල පත්‍රයක් දෙනු ලැබීමට සුදුසු කම් ඇති (145 වන වගන්තිය අදාළ වන වෙළෙඳ පොළක් නොවන) යම් පෞද්ගලික වෙළෙඳ පොළක්—

(අ) වෙළෙඳ පොළක් වශයෙන් සහමුලින් ම වසා දැමීම ; හෝ

(ආ) පොදු වෙළෙඳ පොළක් වශයෙන් සභාව විසින් පවරාගනු ලැබීම

පොදු යහපත සඳහා හේතු වේ යැයි නගර සභාවක් හැඟීමට පත් වන අවස්ථාවක දී, සභාව විසින් ඒ අවස්ථා දෙකෙන් කවර හෝ අවස්ථාවක දී මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව වන්දි ගෙවීමට යටත්ව එකී වෙළෙඳ පොළ වසා දැමීමට විධාන කරනු ලැබිය හැකි ය ; නැතහොත් පොදු වෙළෙඳ පොළක් ලෙස පවරා ගෙන පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වෙළෙඳ පොළක් වසා දමන ලද අවස්ථාවක දී ගෙවිය යුතු වන්දිය වූකලී ගිවිසුමක් මගින් අන්‍යාකාරයකින් සමථයකට පත් වුවහොත් හැර, මේ ආඥාපනත යටතේ වෙළෙඳ පොළක් වශයෙන් පාවිච්චි කරනු ලැබ තිබුණහොත් ඒ ස්ථානයේ වටිනාකම සහ ඒ ස්ථානය වෙළෙඳ පොළක් වශයෙන් නොව ඒ ප්‍රදේශය තුළ ම උපරිම වාසිය ලබා ගැනීම සඳහා ඒ අන්දමේ ස්ථානයක් යොදාගනු ලැබ ඇති හෝ යොදාගනු ලැබීමට ඉඩ ඇති වෙන යම් ප්‍රාදේශීය කාරණයක් සඳහා පාවිච්චි කරනු ලැබ තුබුණහොත් ඒ ස්ථානයේ වටිනාකම අතර වෙනසක් පවත්නා වෙළෙඳ පොළේ ගොඩනැගිලි එබඳු යම් කාර්ය යන් සඳහා සකස් කරගැනීමේ පිරිවැය සම්බන්ධ දීමනාවක් ගණ ඉදකේ එකතුව විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වෙළෙඳ පොළක් පොදු වෙළෙඳ පොළක් වශයෙන් පවත්වාගෙන යෑම සඳහා නගර සභාව විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක දී ගෙවිය යුතු වන්දිය වූකලී මේ ආඥාපනත යටතේ වෙළෙඳ පොළක් වශයෙන් පාවිච්චි කරනු ලැබ තිබුණහොත් ඒ ස්ථානයේ වටිනාකම ය.

(4) මේ ආඥාපනත යටතේ වෙළෙඳ පොළක් ලෙස පාවිච්චි කරනු ලබන වෙළඳ පොළ ස්ථානයේ වටිනාකම ඇස්තමේන්තු කිරීමෙහි ලා ඒ අවට ප්‍රදේශයේ පොදු වෙළෙඳ පොළක් හෝ අලුත් පෞද්ගලික වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබුවහොත් එකී වෙළෙඳ පොළ ස්ථානය පිළිබඳ වටිනාකමේ ඇතිවීමට ඉඩ ඇති අගය ක්ෂය වීම ගැන ද සැලකිල්ල දැක්විය යුතු ය.

ග්‍රාමීය වෙළඳ පොළවල් සභාව වෙත සතු වීම.

**148.** ගම් ප්‍රදේශවලට අදාළ යම් ප්‍රඥප්තියක් යටතේ යම් ග්‍රාමීය වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබ ඇති යම් තැනක් මේ ආඥා පනත යටතේ නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ විට එකී වෙළෙඳ පොළ ඒ නගරයේ නගර සභාව වෙත සතු විය යුතු අතර, ඒ වෙළෙඳ පොළ මේ ආඥාපනතට යටත් විය යුතු ය.

වෙළඳපොළවල් පැවරීම.

**149.** නගර සභාවක් විසින් මේ ආඥාපනත යටතේ පරිපාලනය කරනු ලබන යම් පොදු වෙළෙඳ පොළක කළමනාකරණය, ඒ සභාව විසින් යම් ගම් සභාවක් සමඟ වැඩ පිළිවෙළක් ඇති කර ගැනීමෙන් පසුව, එම ගම් සභාව වෙත පවරනු ලැබිය හැකි ය.

පෞද්ගලික වෙළෙඳ පොළවල්වල බලපත්‍ර අත්හිටුවීමට ඇති බලය.

**150.** නගර සභාවක් විසින් මේ ආඥාපනත යටතේ පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා බල පත්‍රයක් දෙන ලද සහ එකී බල පත්‍රයේ වලංගු කාලය ඇතුළත යම් කලක බල පත්‍ර ලාභියා විසින් මේ ආඥාපනත යටතේ පෞද්ගලික වෙළෙඳ පොළවල්වලට අදාළ වන තත්ත්වයන්ට සහ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක දී, ඒ පැහැර හැරීම හරිගැස්සිය යුතු කාල සීමාවක් නියම කරමින් නගර සභාව විසින් හෝ නගර සභාවේ බලය යටතේ ඔහු වෙත භාර දෙනු ලැබූ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ පැහැර හැරීම පිළිබඳව ඔහුගේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව, සභාපතිවරයා විසින් එකී වෙළෙඳ පොළේ බල පත්‍රය, බල පත්‍ර ලාභියා විසින් ඒ පැහැර හැරීම හරිගස්සනු ලබන තුරු අත්හිටුවනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය.

බලය නොලත් වෙළඳපොළක් පවත්වාගෙන යාම සඳහා දණ්ඩනය

[1984 අංක 48 §24.]

**151.** යම් නගරයක නගර සභාවක් සංස්ථාපනය කරන ලද දිනයේ සිට මාස හයක් වූ කාල සීමාවක් ඉකුත් වීමෙන් පසුව, ඒ නගරය තුළ වූ යම් ස්ථානයක් මේ ආඥාපනත යටතේ බල පත්‍රයක් නොදුන්නේ හෝ දුන් බල පත්‍රයක් අත්හිටුවනු ලැබ ඇත්තේ යම් පෞද්ගලික වෙළෙඳ පොළක් සම්බන්ධයෙන් ද ඒ වෙළෙඳ පොළ පාවිච්චි කරන යම් තැනැත්තකු රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු අතර, බලපත්‍රය අත්හිටුවීම පිළිබඳ ලිඛිත දැන්වීම එකී තැනැත්තා වෙත භාර දෙනු ලැබීමෙන් පසුව එකී වරද දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් වූ තවත් දඩයකින් දඬුවම් ලැබිය යුතු ය.

වෙළඳ ප්‍රදේශය.

**152.** (1) නගර සභාවේ පාලනය යටතේ යම් පොදු වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබූ නගරයක් ඇතුළත යම් තැනක, මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා මගින් ඒ වෙළෙඳ පොළ සඳහා (මෙහි මින් මතු "වෙළෙඳ ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රදේශයක් ඒ සභාව විසින් වෙන් කරනු ලැබිය හැකි අතර, සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බල පත්‍රවලට අනුකූල නොවන ආකාරයකින් ඒ ප්‍රදේශය ඇතුළත මස්, කුකුළු ආදී සතුන්, මාළු, පලතුරු හෝ එළවළු විකිණීම තහනම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් අවස්ථාවක දී, වෙළෙඳ ප්‍රදේශය ඇතුළත එකී වෙළෙඳ පොළ නොවන වෙනත් අවසර ලත් ස්ථානයක දී මස්, කුකුළු ආදී සතුන් සහ මාළු,





පලතුරු හෝ එළවළු විකිණීම පිණිස සභාපතිවරයා විසින් බල පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි අතර එම බල පත්‍රය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි ගාස්තු පනවා අය කරගනු ලැබිය හැකි ය.

(3) පොදු වෙළෙඳ පොළ මගින් හෝ (2) වන උපවගන්තිය යටතේ කලින් අවසර දෙන ලද වෙනත් ස්ථානයක් හා සම්බන්ධ වී එකී වෙළෙඳ පොළ මගින් වෙළෙඳ ප්‍රදේශයේ පොදු අවශ්‍යතා සඳහා සෑහෙන පහසුකම් සලස්වා ඇති බවට නගර සභාවට සෑහීමකට පත්ව ඇති යම් විටක, එකී පොදු වෙළෙඳ පොළේ හැර, එසේ නැතහොත්, සභාව එසේ තීරණය කළහොත්, එකී වෙළඳ පොළේ සහ අවසරලත් එකී සෙසු ස්ථානයේ හැර, වෙළෙඳ ප්‍රදේශය ඇතුළත වෙන තැනක මස්, කුකුළු ආදී සතුන් සහ මාළු, පලතුරු හෝ එළවළු විකිණීම, මේ ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් මගින් සභාව විසින් තහනම් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියෙහි සඳහන් යම් අවස්ථාවක දී, වෙළඳ ප්‍රදේශය ඇතුළත මස්, කුකුළු ආදී සතුන් සහ මාළු, පලතුරු හෝ එළවළු විකිණීම පිණිස (අවස්ථාවෝචිත පරිදි) කිසි ම බල පත්‍රයක් හෝ වැඩි දුරටත් වූ බල පත්‍රයක් නිකුත් නොකළ යුතු යැයි සභාව විසින් අතුරු ව්‍යවස්ථා මගින් විධාන කරනු ලැබිය හැකි අතර, එබඳු කිසි ම බල පත්‍රයක් නිකුත් නොකළ යුතු යැයි සභාව විසින් තීරණය කරනු ලැබුවහොත්, වෙළෙඳ ප්‍රදේශය ඇතුළත පොදු වෙළෙඳ පොළ නොවන වෙනත් ස්ථානයක එකී ද්‍රව්‍යවලින් කිසිවක් විකිණීම කරගෙන යන යම් තැනැත්තකු විසින් ඒ විකිණීම පොදු වෙළෙඳ පොළට මාරු කරන ලෙස (පොදු වෙළෙඳ පොළෙහි ඒ කාර්යය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැලැස්වීමෙන් පසුව) ඒ තැනැත්තාට සභාව විසින් නියම කරනු ලැබිය හැකි ය.

(5) නියමිත ස්ථානවල දී විකිණීම නොකරන හෝ විකිණීමේ කාර්යයන් සඳහා පොදු මාර්ගවල හෝ වෙනත් පොදු ස්ථානවල නියැලී නොසිටින සංචාරක වෙළෙන්දන් විසින් කුකුළු ආදී සතුන් සහ පලතුරු හෝ එළවළු විකුණනු ලැබීමට අතුරු ව්‍යවස්ථාවක් මගින් හෝ අන්‍යාකාරයකින් අවහිර කිරීම සඳහා මේ වගන්තියේ වූ කිසිවක් නගර සභාවකට බලය දී ඇතැයි නොසැලකිය යුතු ය.

---

## VI වන කොටස

### අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථා සෑදීමට සභාවට ඇති බලය.

**153.** මේ ආඥාපනතින් අවසර දෙනු ලැබිය හැකි හෝ නියම කළ හැකි අන්දමේ නොහොත් මේ ආඥාපනත යටතේ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ සහ යුතුකම් ඉටු කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය ලෙස සභාවට පෙනී යා හැකි අන්දමේ වූ ද මේ ආඥාපනතේ

විධිවිධානවලට අනුකූල නොවන්නා වූ ද අතුරු ව්‍යවස්ථා කලින් කල සෑදීමටත් එසේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමටත් සෑම නගර සභාවකට ම බලය තිබිය යුතු ය.

[1981 අංක 61. § 16]

(2) යම් නගර සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය සංඝෘහිත වන යම් එස් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝණය නොකඩව තව දුරටත් කරගෙන යන විටක, බලය ඇති අධිකරණයක් විසින් ඊට වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලය ලත් වෙනත් නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝණය තව දුරටත් නොකඩව කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකින් යුක්ත දණ්ඩනයක් ඒ අතුරු ව්‍යවස්ථාවෙන් පැනවිය හැකි ය.

[1981 අංක 61 § 16]

වැරදි සමථයකට පත් කිරීමේ බලය

[1981 අංක 61 §17.]

153 අ. (1) 157 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා 153 වන වගන්තිය යටතේ කලින් වරදකරු කරනු ලැබ නැත් නම්, වරද සමථයකට පත් කරන ලෙස වරදකරු ඉල්ලා සිටින්නේ නම්, සභාපතිවරයා විසින්, 153 වන වගන්තිය යටතේ ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු අතර, එවැනි යම් වරදකරුවකුට විරුද්ධව නඩු පැවරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ විටක සභාපතිවරයා විසින් අධිකරණයේ කැමැත්ත ඇතිව ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් පිළිගන්නා ලද මේ මුදල් ප්‍රමාණයක් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

අතුරු ව්‍යවස්ථා අනුමත කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.

154. (1) මේ ආඥාපනත යටතේ කිසි ම අතුරු ව්‍යවස්ථාවක් හෝ යම් අතුරු ව්‍යවස්ථාවක සංශෝධනය කිරීමක්, වෙනස් කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු සහ එකී අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු, බල නොපෑ යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, (1) වන උපවගන්තිය මගින් නියම කර ඇති නිවේදනයත් සමග ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලැබූ විට, එසේ සාදන ලදැයි උද්දේශිත එකී සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, එය මේ ආඥාපනතේ ම පනවනු ලැබූ විටක මෙන්, 156 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගු විය යුතු සහ බල පැවැත්විය යුතුවාක් මෙන් ම එකී අතුරු ව්‍යවස්ථාවේ සෑම උල්ලංඝණයක් ම මේ ආඥාපනත යටතේ වූ වරදක් විය යුතු ය.



අතුරු ව්‍යවස්ථාවල පිටපත් සැපයීම.

155. මේ ආඥාපනත යටතේ සිංහල සහ දෙමළ භාෂාවලින් සාදනු ලැබ පළ කරන ලද සියලු අතුරු ව්‍යවස්ථාවල පිටපත්, ඒ අතුරු ව්‍යවස්ථා අදාළ වන්නා වූ නගරයේ නගර සභා කාර්යාලයේත් කොමසාරිස්වරයාගේ කාර්යාලයේත් තබාගත යුතු අතර ඒවා පරීක්ෂා කළ හැකි විය යුතුවාක් මෙන් ම මහජනයාට විකිණීම සඳහා සූදානම් ව තිබිය යුතු ය.

අවසර නොදීමට හෝ සංශෝධනය කිරීමට අතුරු ව්‍යවස්ථා යටත් බව.

156. මේ ආඥාපනත යටතේ සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, 154 වන වගන්තිය යටතේ එය පළ කිරීමෙන් පසුව හැකි තාක් ඉක්මණින්, එකී අතුරු ව්‍යවස්ථාවට අවසර නොදීම නොකරන ලෙසට වූ යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම හෝ කළ හැකි ය. ඒ අතුරු ව්‍යවස්ථාව පාර්ලිමේන්තුව විසින් පරිච්ඡින්න කිරීමේ හෝ සංශෝධනය කිරීමේ නිවේදනය නොපමාව ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. තවද එකී පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම ඒ පළ කිරීමේ දින සිට, එහෙත් ඒ දිනයට පෙරාතුව එම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලැබ තිබිය හැකි යම් දෙයකට හෝ ආරම්භ කර තිබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නොමැතිව, බල පැවැත්විය යුතු ය.

අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විය හැකි කරුණු.

157. පහත සඳහන් කාර්යයන් සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා හෝ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සෑදීමට ඇති බලය, මේ කොටස යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට යම් නගර සභාවකට ඇති බලයට, එහෙත් එමගින් පවරනු ලබන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ඇතුළත් විය යුතු ය:—

(1) කාර්ය පටිපාටිය—

(අ) සභාවේ රැස්වීම් සහ එහි කාරක සභා රැස්වීම් පිඩිමත් කිරීම ද;

(ආ) සභාවේ කටයුතුවලට ආනුෂංගික වූ ඇස්තමේන්තු, අයවැය, ප්‍රකාශන සහ වාර වාර්තා සකස් කිරීමේ ආකාරය ද;

(ඇ) සභාවේ ගිණුම් පවත්වා ගෙන යා යුතු ආකාරය ද

ඇතුළුව.

(2) නිලධරයෝ—

(අ) ධුර ඇති කිරීම, නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, වැටුප්, දීමනා හෝ වෙනත් පාරිශ්‍රමික ගෙවීම, අසනීපයක දී, ආපදාවක දී හෝ ණයගැතිබවක දී නිලධරයන්ට හෝ සේවකයන්ට සහන හෝ ආධාර දීමේ කාර්යය සඳහා පිහිටුවා ඇති යම් යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම, විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික සැපයීම, එකී නිලධරයන්ට සහ සේවකයන්ට නිවාඩු දීම සහ මියගිය නිලධරයන්ගේ

හෝ සේවකයන්ගේ වැන්දඹුවන්ට, දරුවන්ට, කිබිටුම නෑයාට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික සැපයීම ද;

(ආ) සියලු නිලධරයන් සහ සේවකයන් විසින් ඔවුන්ගේ වෙන් වෙන් කාර්ය යථා පරිදි ඉටු කිරීම ද

ඇතුළුව.

(3) වෙන කිසි ම ප්‍රකාශිත විධිවිධානයක් සලස්වා නොමැත්තා වූ ද මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු වූ ද යම් බද්දක් අය කර ගැනීම සහ එබඳු යම් බද්දක කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි සියලු වාර වාර්තා සහ තොරතුරු සැපයීම ද ඇතුළුව බදු පැනවීම.

[1979 අංක 42 §11.] (3අ) මේ ආඥාපනත යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන සියලු වාර වාර්තා සහ තොරතුරු සැපයීම.

(4) ණය—

(අ) ඇප තැබීමේ විධිය සහ ආකාරය ද;

(ආ) ඇවර කිරීමේ වැඩ පිළිවෙළ ද;

(ඇ) ණය ආපසු ගෙවීමේ හෝ ඇප නිදහස් කිරීමේ ක්‍රමය සහ පිළිවෙළ ද;

(ඈ) යම් ණයක් පිළිබඳ කොන්දේසි සහ ණයට ගත් මුදල් විසර්ජනය කිරීම ද;

ඇතුළුව.

* (5) තක්සේරු බදු සහ ගාස්තු පැනවීම, අය කිරීම සහ අය කර ගැනීම—

(අ) ගොඩනැගිලි, ඉඩම් සහ ගෙපත් තක්සේරු කිරීම ද;

(ආ) එකී තක්සේරු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම ද;

(ඇ) විරෝධතා විභාග කොට නිශ්චය කිරීම ද;

(ඈ) සභාවේ පරිපාලන සීමා ඇතුළත පිහිටි නිශ්චල දේපළ පිළිබඳ උකස් සහ උකස් හිමියන්ගේ ලිපිනය සභාවේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සහ එකී ලියාපදිංචි කිරීම් සඳහා ගාස්තු පැනවීම සහ අය කරගැනීම ද;

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදී. එහි 76 වන වගන්තිය බලන්න.





(ඉ) වරිපනම් බදු, බදු හෝ ගාස්තු අය කරගැනීම සඳහා තහනමට ගන්නා ලද නිශ්චල දේපළ විකිණීම පිළිබඳ ලිඛිත දැන්වීම් එකී ලියාපදිංචි කරන ලද උකස් හිමියනට තැපැල් කිරීම ද;

ඇතුළුව.

(6) ඉඩම් සහ දේපළ—

(අ) එළිමහන් ස්ථාන සහ පොදු විනෝදය සඳහා වූ ස්ථාන සැපයීම, පාලනය කිරීම සහ කළමනාකරණය ද;

(ආ) මුඩු හෝ පොදු ඉඩම්වල ආරක්ෂාව ද;

(ඇ) නගර සභාව වෙත සතු කරනු ලැබ ඇති හෝ නගර සභාවේ පාලනය යටතේ ඇති නිශ්චල දේපළවල නඩත්තුව සහ කළමනාකරණය, ඒ දේපළවලින් වැලි, බොරලු, ගල්, කැබොක් හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම විධිමත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන යම් බලපත්‍ර සඳහා ගාස්තු අය කිරීම ද;

(ඈ) පොදු තණ බිම් ආරක්ෂා කිරීම, විධිමත් කිරීම සහ සැපයීම සහ ඒවා පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීම ද;

(ඉ) පෞද්ගලික හෝ පොදු ඉඩම්වල මායිම් සහ වැටවල් පිහිටුවා ආරක්ෂා කිරීම ද;

(ඊ) යම් පොදු සේවා කාර්යයක් සඳහා නඩත්තු කරනු ලබන යම් කම්බි, නළ, නිරවුරු හෝ උපකරණ හෝ ඒවාට දී ඇති රුකුල්වලට කරනු ලබන අලාභයක් වැළැක්වීමේ හෝ ඒවා අලුත්වැඩියා කිරීමේ හෝ ඒවායේ ඇති දෝෂයකට ප්‍රතිකර්ම කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික ඉඩම්වලට ඇතුළු වීමට බලය පැවරීම ද;

(උ) යම් මංමාවතක සිට පෙනෙන පරිදි විදහා පා ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් සභාව විසින් නිකුත් කරනු ලබන යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම ද

ඇතුළුව.

(7) මංමාවත්—

(අ) අලුත් වීථි එකෙල්ලි කිරීම, මට්ටම් කිරීම, පළල් කිරීම සහ ඉදි කිරීම ද;

(ආ) වීථි ශුද්ධ පවිත්‍ර කිරීම, වීථිවලට ජලය සැපයීම සහ වීථි ආලෝක කිරීම ද;

(ඇ) වාහනවල බර සහ වේගය සීමා කිරීම, යම් පාලමක්, පාරක්, වීථියක් මත හෝ යම් ස්ථානයක වාහන පාවිච්චි කිරීමෙන් මහජනයාට අනතුරක් සිදු විය හැකි හෝ එකී පාලමට,

පාරට හෝ වීථියට අලාභ සිදු වීමට ඉඩ ඇති විය හැකි අවස්ථාවක දී එකී පාච්චිය වැළැක්වීම හෝ සීමා කිරීම ඇතුළුව වීථි සහ මංමාවත් පැවිච්චි කිරීම සහ එහි රථ ධාවනය විධිමත් කිරීම ද;

(ඈ) මංමාවත්වල පෙරහැරවල්, රැස්වීම් සහ සංගීතය පැවැත්වීම විධිමත් කිරීම ද;

(ඉ) මංමාවත්වල අවහිර, ප්‍රසර්පණ, ප්‍රක්ෂේපණ සහ වෙනත් මැදිහත්වීම් වැළැක්වීම, නතර කිරීම, අධික්ෂණය කිරීම සහ විධිමත් කිරීම ද;

[1963 අංක 5 § 3.] (ඊ) යම් වීථියක හෝ වීථියකට යාව සිටින සේ දැන්වීම් පුවරු හා වෙනත් තාවකාලික ව්‍යුහයන් ඉදි කිරීම හෝ යම් වර්ගයක සැරසිල්ලක් කිරීම හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම ද;

(උ) මංමාවත්වල හෝ ඒ අසළ ගොඩනැගිලි ඉදි කිරීමේ සහ වෙනත් ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදු විය හැකි අනතුරුවලින් මහ ජනයා ආරක්ෂා කිරීම ද;

(ඌ) යම් මංමාවතක සිට පෙනෙන පරිදි විදහා පා ඇති හෝ ප්‍රදර්ශණය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම සහ පාලනය කිරීම සහ එසේ විදහා පානු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ද;

ඇතුළුව.

(8) ගොඩනැගිලි, ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු—

(අ) ස්ථාවරත්වය ඇති කිරීමේ, ගින්නෙන් වැළැක්වීමේ සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ බලාපොරොත්තුව ඇතිව එකී ගොඩනැගිලි ද්‍රව්‍ය විධිමත් කිරීම ද;

(ආ) බාධා රහිතව වාතය හැමීමට සහ ආරක්ෂා වීමට සහ කසළ ශෝධනය පහසු වීමට ඉඩ ලැබෙන ලෙස යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සමූහයක් අසළ ඉඩ තැබීම ද;

(ඇ) දොර ජනෙල්වල දිග පළල, පොළොවේ මට්ටම, වහලේ උස, සාමාන්‍ය වාතාශ්‍රය සහ ජලාපවහනය ද;

(ඈ) වැසිකිළිවල සංඛ්‍යාව සහ ස්වභාවය ද;

(ඉ) ව්‍යුහයේ අත්තිවාරම සහ ස්ථාවරභාවය;

[1979 අංක 42 §11.] (ඉඉ) අලුත් ගොඩනැගිලි ඉදිකිරීම හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම හෝ සඳහා වූ සැලැස්මවල් පරීක්ෂා කිරීම හා සලකා බැලීම සඳහා ගාස්තු අය කිරීම ද;

(ඊ) ගොඩනැගිලි අභිමුඛයේ රේඛා ද;

ඇතුළුව.





(9) පොදු සෞඛ්‍යය සහ සැප විහරණ ක්‍රම—

(අ) ජලාපවහනය ද;

(ආ) මලාපවහනය සහ කසළ ශෝධනය ද ඒ සඳහා ගාස්තු අය කිරීම ද;

(ඇ) සියලු කාණු, වැසිකිළි, කසළ වළවල්, අළු වළවල් සහ සෞඛ්‍යාරක්ෂක පහසුකම් හා උපකරණ පරීක්ෂා කිරීම, විධිමත් කිරීම සහ නඩත්තු කිරීම ද;

(ඈ) පොදු සෞඛ්‍යාරක්ෂක පහසුකම් විධිමත් කිරීම සහ එහි කළමනාකරණය ද;

(ඉ) නවාතැන් ගෙවල් සහ ගෙපත් ගොඩනැගිලි විධිමත් කිරීම, අධික්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ඊ) ස්වයංක්‍රියව හෝ යාන්ත්‍රිකව හෝ ශබ්දය ජනනය කරන නැතහොත් ප්‍රතිජනනය කරන ග්‍රැමෆෝන් යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, ඇම්ප්ලිෆයර් යන්ත්‍ර සහ වෙනත් උපකරණ ක්‍රියා කරවීම විධිමත් කිරීම හා පාලනය කිරීම ඇතුළුව කරදර නැවැත්වීමද;

(උ) සෞඛ්‍යයට අහිතකර ආහාර පාන ද්‍රව්‍ය තහනමට ගැනීම, අයිම් කිරීම, ඉවත් කිරීම සහ විනාශ කිරීම ද ඒවා විකිණීම සහ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම වැළැක්වීමද;

(ඌ) හෝටල්, බේකරි, භෝජන ශාලා, ආපන ශාලා සහ තේ සහ කෝපි කඩ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(එ) කොණ්ඩා කපන ස්ථාන සහ බාබර් සාප්පු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ඒ) කිරි පට්ටි සහ කිරි විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ඔ) විකිණීමට ඉඩ දිය හැකි කිරිවල නිශ්චිත සම්මත තත්ත්වය නියම කිරීම ද නිශ්චිත සම්මතයට පහත් තත්ත්වයකින් යුත් කිරි විකිණීම වැළැක්වීම ද;

(ඕ) යම් කිරි යොදය, වෙඩරු හෝ කේජු සැම්පලයක් සම්බන්ධයෙන්—

(i) (උකු කළ කිරි සහ මුදවාපු කිරි ද ඇතුළුව) අමිශ්‍ර කිරිවල යොදයේ, වෙඩරුවල හෝ කේජුවල අඩංගු යම් සංයෝගී ද්‍රව්‍යයක ඌනතාවයක්, හෝ

(ii) එබඳු යම් සැම්පලයක් ගනු ලැබූ කිරි යොදය, වෙඩරු හෝ කේජු යම් ප්‍රඥප්තියක හෝ තත් කාලයේ බල පවත්නා යම් අනුරූ ව්‍යවස්ථාවක කාර්යයන්

සඳහා, අමිශ්‍ර හෝ පිරිසිදු නොවන බවට හෝ සෞ
යට හානිකර බවට, ඊට පටහැනි තත්ත්වය ඔප්
කරනු ලබන තුරු, පූර්ව නිගමනයක් ඇති කර
එකී සැම්පලයේ තිබී සොයාගත් වතුර ප්‍රමාණය ෙ
වෙනත් බාහිර ද්‍රව්‍ය ප්‍රමාණය

නිශ්චය කිරීම ද;

(ක) ආහාර පාන ද්‍රව්‍ය, සංචාරක වෙළෙඳුන් විසින් විකිණීම ස
හෝටල්වල, සාප්පුවල සහ වෙළෙඳපොළවල් නොව
ස්ථානවල විකිණීම ද ඇතුළුව, එකී ද්‍රව්‍ය විකිණීම විධිම
කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද

(ග) පීඩාකාරී හෝ අන්තරායදායක යැයි නගර සභාව විස
සලකනු ලබන වෙළෙඳාම් විධිමත් කිරීම, අධීක්ෂණය කිරී
පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ඝ) පොල් ලෙලි පෙඟවීම සඳහා පොදු ඇළ්වල, ගංගාවල, කළ
වල අහ මෝය කටවල්වල ඇති ලෙලි වළවල්වල දිග පළ
සහ ඒවායේ භාවිතය විධිමත් කිරීම සහ ඒ වළවල් පාවිච්
කිරීම සඳහා වූ අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම ද;

(ජ) පෞද්ගලික ළිඳවල ඇති ලිං විධිමත් කිරීම, අධීක්ෂණ
කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ට) මිදහනාර, අයිස් කර්මාන්ත ශාලා සහ සිසිල් බීම කර්මාන්
ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරී
සහ පාලනය කිරීම ද;

(ඩ) තම තමන්ගේ ඉඩම් පදුරුවලින් සහ කුණු කසලවලින්
නිදහස් කර තබා ගන්නා ලෙසත් තමතමන්ගේ වාස
ස්ථානයේ මිදුල පිරිසිදු සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන්
තබාගන්නා ලෙසත්, නාගරික ප්‍රදේශය තුළ සිටින අයිතිකරු
වන්ට සහ පදිංචිකරුවන්ට බල කිරීම ද;

(ණ) මැලේරියාව මර්දනය කිරීම ද මදුරුවන් සහ රෝග පතුරුව
සාමීන් විනාශ කිරීම ද;

(ත) පොකුණුවල, දිය කඩිතිවල, විවෘත අගල්වල, කසළ කානුව
කාණුවල සහ අප්‍රසන්න ස්වභාවයකින් යුක්ත හෝ සෞ
යට හානිකර වීමට ඉඩ ඇති යම් ජලවහන, කැලි කස
වතුර, ද්‍රව්‍ය හෝ දේවල් අඩංගු වන හෝ එකතු කිරීම සඳ
භාවිතා කරන ස්ථානවල වතුර ඉවත් කිරීම, ඒවා ශුද්
පවිත්‍ර කිරීම, ආවරණය කිරීම හෝ පිරවීම ද;

(ද) ගෙවල්, වාසස්ථාන සහ මහජනයා රැස්වන හෝ පූජනී
ස්ථාන අයිතිකරුවන් විසින් හෝ පදිංචිකරුවන් විසි
හෝ ඒවා භාරව සිටින හෝ පාලනය කරන තැනැත්තන්
විසින් ශුද්ධ කරනු ලැබීම, පවිත්‍ර කරනු ලැබීම, ඒවා
වාතාශ්‍රය ලැබීමට සලස්වනු ලැබීම සහ ඒවායේ විෂ බීජ
නාශනය කරනු ලැබීම ද;



(න) වසංගත රෝග, ජනපද රෝග හෝ ස්පර්ශයෙන් බෝවෙන
රෝග වැළැක්වීම හෝ ප්‍රශමන කිරීම සහ ඒ රෝග පවතින
අතරතුර මියයන තැනැත්තන් ඉක්මනින් භූමදාන කිරීම
ද;

(ප) පොදු නාන ස්ථාන සහ සතුන් සහ රෙදි සෝදන ස්ථාන
පිහිටුවීම, නඩත්තු කිරීම සහ විධිමත් කිරීම ද ඇතුළුව
සේදීම සහ නෑම ද;

(පප) කර්මාන්ත අපද්‍රව්‍ය විධිමත් කිරීම සහ පාලනය කිරීම; [1987 අංක 18 § 8]

(බ) පොදු සෞඛ්‍ය ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම සඳහාත්
කරදර මැඩ පැවැත්වීම සඳහාත් අවශ්‍ය විය හැකි වූ ද මේ
ආඥාපනතින් විධිවිධාන විශේෂයෙන් සලස්වා නොමැත්තා
වූ ද වෙනත් සියලු කාර්යයන් ද

ඇතුළුව.

(10) සතුන්—

(අ) ගෝඝාතක ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම,
පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද ඒවා පාවිච්චි කිරීම
සඳහා ගාස්තු අය කිරීම සහ අය කර ගැනීම ද;

(ආ) ගවයන්, අශ්වයන්, බැටළුවන්, එළුවන් සහ ඌරන් තබා
ගැනීම හෝ කොටු කිරීම ද;

(ඇ) දඬුවෙතේ යන ගවයන්, බැටළුවන්, එළුවන් සහ ඌරන් ද
ගාල් පාවිච්චි කිරීම සඳහා ගහ සතුන් ගාල් කර තබා
ගැනීමේ පිරිවැය සඳහා වූ ගාස්තු පැනවීම, අය කිරීම සහ
අය කර ගැනීම ද;

(ඈ) සතුන් අතර වසංගත රෝග බෝවීම මැඩපැවැත්වීම ද,
සතුන් සඳහා නිරෝධායන ස්ථාන නඩත්තු කිරීම සහ
විධිමත් කිරීම ද ඒ ස්ථාන පාවිච්චි කිරීම සඳහා ගාස්තු
අය කිරීම ද;

(ඉ) වන සතුන් සහ කැලෑ කුරුල්ලන් රැක බලා ගැනීම සහ
ආරක්ෂා කිරීම ද;

(ඊ) දඬුවෙතේ යන බල්ලන් විනාශ කිරීම ද;

(උ) (අනවශ්‍ය වේදනාවක් හෝ දුක් විඳීමක් සිදු වීමට ඉඩ ඇති
යම් අන්දමකින් පණ ඇති සතුන් විකිණීම සඳහා ප්‍රදර්ශ
නය කර තැබීම සීමා කිරීම ද ඇතුළුව) සතුන්ට වධ
හිංසා කිරීම වැළැක්වීම ද;

(ඌ) ගව මඩු ගාල් සහ නතර කරන ස්ථාන විධිමත් කිරීම සහ
අධීක්ෂණය කිරීම ද ඒවා පිහිටුවන ස්ථාන පාලනය
කිරීම ද

ඇතුළුව.

(11) පොදු සහ පෞද්ගලික වෙළෙඳ පොළවල් සහ පොළවල්

(අ) ඒවා පිහිටුවීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම ද;

(ආ) ඒවා තුළ පිහිටුවනු ලබන ගාණ්ඩාගාල මිල විධිමත් කිරීම ඇතුළුව, ඒවා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්

කිරීම සහ පාලනය කිරීම ද;

(ඇ) ඒවා තුළ මලාපවහනය කිරීම සහ කසළ ශෝධනය ද ඒ සම්බන්ධයෙන් සිදු වන කරදර වැළැක්වීම ද;

(ඈ) ඒවා ඇතුළත සහ ඒ තදාසන්න සමීපයෙහි වාහන පාල සහ නිසි සංවිධානය රැකගැනීම ද;

(ඉ) වෙළෙඳ පොළවල් තුළ වැසිකිලි, නාන ස්ථාන, ගෝනා ස්ථාන, ජල සම්පාදනය සහ ආලෝකය සැපයීම, ඒ පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ද;

(ඊ) කඩ පිල් සහ වෙළෙඳ මැසි වෙන් කර දීම ද;

(උ) ආහාර පරීක්ෂා කිරීම සහ සෞඛ්‍යාරක්ෂාවට හානි ආහාර ද්‍රව්‍ය තහනම්ට ගැනීම ද;

(ඌ) යම් ආහාර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය ප්‍රථම වරට ඉදිරිපත් කි හෝ විකිණීම තහනම් කිරීමට සෑහෙන හේතු අ අවස්ථාවක එබඳු තහනමක් කිරීම ද;

(එ) යම් නිශ්චිත ද්‍රව්‍යයක් විකිණීම, සම්පූර්ණයෙන් විශේෂ බල පත්‍රවලට යටත්ව, තහනම් කිරීම සහ විශේෂ බල පත්‍ර සඳහා ගාස්තු අය කිරීම ද;

(ඒ) ගිනිතැබීම්වලින් ආරක්ෂාව සැලැස්වීම ද;

(ඔ) යම් වෙළෙඳ පොළක් හෝ පොළක් තාවකාලිකව වැසීම

(ඕ) වෙළෙඳ පොළ භාරකරුවන් විසින් සහ වෙනත් සේව යන් විසින් ඔවුන්ගේ කාර්ය යථා පරිදි ඉටු කරනු ල ද;

(ක) පොදු වෙළෙඳ පොළවල් සම්බන්ධයෙන් වන විට, වෙළේ පොළ ස්ථානය හෝ ඉන් යම් කොටසක් සහ එහි ගෙ නැගිලි සහ නාන ස්ථාන පාවිච්චි කිරීම සඳහා ගාස් හෝ කුලී නියම කිරීම සහ අය කර ගැනීම ද එබඳු ගාස්තු හෝ කුලී එකතු කිරීමේ අයිතිවාසිකම බදු දීම ද;

(ග) පොදු වෙළෙඳ පොළවල් සම්බන්ධයෙන් වන විට, වෙළේ ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම ද 152 වන වගන්ති අනුකූලව ඒ ප්‍රදේශය ඇතුළත විකිණීම සඳහා බලප දීම ද විකිණීම සීමා කිරීම හෝ තහනම් කිරීම ද;





(ච) පෞද්ගලික වෙළෙඳ පොළවල් හෝ පොළවල් සම්බන්ධයෙන් වන විට, ඒ වෙළෙඳ පොළවල් හෝ පොළවල් සඳහා බලපත්‍ර දීම ද බලපත්‍රය පිළිබඳ කොන්දේසි සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ද;

(ජ) පෞද්ගලික වෙළෙඳ පොළවල් හෝ පොළවල් සම්බන්ධයෙන් වන විට, ඉඩ පහසුකම්, මලාපවහනය, පාරවල්, වාතාවකාශ, උපකරණ සහ සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා සම්බන්ධයෙන් පවත්වා ගත යුතු තත්ත්වයන් ද;

(ට) පෞද්ගලික වෙළෙඳ පොළවල් සහ පොළවල් සම්බන්ධයෙන් වන විට, පවත්නා ගොඩනැගිලි ප්‍රකෘතිමත් කිරීම, වෙනස් කිරීම, විශාල කිරීම සහ වැඩිදියුණු කිරීම ද නගර සභාවට දැනුම් දීමෙන් පසුව සභා අනුමත කරන ලද සැලැස්මවල්වලට අනුකූලව සියලු අළුත් ගොඩනැගිලි ඉදි කිරීම ද:

ඇතුළුව.

(12) ජල කර්මාන්තය—

(අ) මහජන ප්‍රයෝජනය හෝ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සපයනු ලබන ජලය අපතේ යෑම, අයුතු ලෙස පාවිච්චි කිරීම, අනිසි ලෙස පරිභෝජනය කිරීම හෝ අපවිත්‍ර කිරීම වැළැක්වීම ද;

(ආ) පිළිවෙලින්, ජලය ගෙන යෑම, පාවිච්චියට දීම, විධිමත් කිරීම හා රැස් කර තැබීම සඳහා යොදා ගනු ලබන නළ-කපාට, කරාම, තුණ්ඩ, කසළ පෝච්චි, ජල වැසිකිලි සහ වෙනත් උපකරණ හා භාජන හෝ ඉන් කිසිවක් පාවිච්චි කරන ආකාරය විධාන කිරීම සහ ඒවායෙහි ප්‍රමාණය, ස්වභාවය, ශක්තිය, ද්‍රව්‍ය සහ ඒවා හෝ ඉන් කිසිවක් පිළියෙළ කරන ක්‍රමය, ඒවායේ හෝ ඉන් කිසිවක පිහිටුම, නැතහොත් ඒවා වෙනස් කිරීම, ඉවත් කිරීම, අලුත් කිරීම හා අලුත්වැඩියා කිරීම ද;

(ඇ) පොදු ජල සම්පාදනය ජල කණු යෙදීමෙන් විධිමත් කිරීම සහ එම ජල කණු පාවිච්චිය විධිමත් කිරීම ද;

(ඈ) පෞද්ගලික සේවා මගින් ජලය සැපයීම හා ඒ සඳහා යොදා ගත යුතු ද්‍රව්‍ය හා නිරවුරු විධිමත් කිරීම ද;

(ඉ) මිණුම් ක්‍රමයට ජලය සැපයීම හා ඒ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් යොදාගනු ලබන ද්‍රව්‍ය, මීටර්, ආම්පන්න සහ නිරවුරු විධිමත් කිරීම ද;

(ඊ) පෞද්ගලික සේවා මගින් ගෘහ කාර්යයන් නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම කළ යුතු වන්නේ යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් හා කොන්දේසි සහ එසේ සපයනු ලබන ජලය සඳහා ගෙවිය යුතු මිල ගණන් විධිමත් කිරීම ද;

(ඵ) එසේ සපයන ලද ජලය සම්බන්ධයෙන් අය විය යුතු ගාස්තු අය කර ගැනීම දඩයක් අය කර ගන්නා ආකාරයෙන් ම කරනු ලැබීම ද;

(ඔ) ජල කණිත්තවලින් සපයනු ලබන ජලය සැපයීමට හා පාලනය කිරීමට අදාළ වූ සහ අතුරු ව්‍යවස්ථා අවශ්‍ය යයි පෙනී යන්නා වූ වෙනත් සෑම කාර්යයක් ද

ඇතුළුව.

(13) පොදු සේවා පිහිටුවීම සඳහා, නඩත්තු කිරීම සඳහා ක්‍රියා කරවීම සඳහා සහ සැපයීම සඳහා ද ඒ සම්බන්ධයෙන් ගාස්තු අය කර ගැනීම සඳහා ද අවශ්‍ය සියළු කරුණු ඇතුළුව එකී පොදු සේවා.

(14) පාන්වල මිමි හෝ දිග පළල සහ ඒවා සෑදීම සහ ඒවායේ තත්ත්වය විධිමත් කිරීම.

[1987 අංක 18 § 3.] (14අ) මෝටර් වාහන නවත්වා තැබීමට ස්ථාන සැපයීමෙන් හා ඒ ස්ථානවල මෝටර් වාහන නවත්වා තැබීම සඳහා වූ නියමිත ගාස්තුව අය කර ගැනීමෙන් නගර සභා ප්‍රදේශය ඇතුළත මෝටර් වාහන නවත්වා තැබීම පාලනය කිරීම:

එසේ වුව ද, මේ ඡේදයේ ඇතුළත් වූ විධිවිධාන ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ මෝටර් වාහන සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

[1987 අංක 18 § 3] (14ආ) වෙරළබඩ මසුන් ඇල්ලීමට ඇති බාධක ඉවත් කිරීම.

(15) ප්‍රාදේශීය පොදු සම්බන්ධතා, පහසුකම් සහ සැප විහරණ භූමි ආරක්ෂා කිරීම සඳහා සහ වර්ධනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා අවශ්‍ය විය හැකි වූ ද ඉහත සඳහන් ස්වභාවයේ හෝ අනානුකාරයක වූ ද වෙනත් සියලු කාර්ය.

---

## VII වන කොටස

### මුදල්

### ප්‍රාදේශීය අරමුදල

ප්‍රාදේශීය අරමුදල සහ එහි සංයුතිය.

**158.** (1) සෑම නගර සභාවක් විසින් ම එහි සාමාන්‍ය මුදල් කාර්යයන් සඳහා ප්‍රාදේශීය අරමුදලක් පිහිටුවිය යුතුය.

(2) එම ප්‍රාදේශීය අරමුදලට—

(අ) හතරවන උපලේඛනයේ සඳහන් කර ඇති දඩ මුදල් සහ දණ්ඩන මුදල්;

(ආ) පස්වන උපලේඛනයේ සඳහන් කර ඇති සියලු මුද්දර ගාස්තු;

(ඇ) අමාත්‍යවරයා විසින් කරන ලද යම් විශේෂ විසර්ජනයකට යටත්ව අමාත්‍යවරයා විසින් සභාවට වෙන් කර ඇති සියලු දීමනා;





(ඈ) මේ ආඥාපනතේ බලය යටතේ අය කරන සියලු වරිපනම් බදු, බදු, තීරු බදු, ගාස්තු සහ වෙනත් අය කිරීම්;

(ඉ) විකිණීම්වලින්, බදු දීම්වලින් හෝ සභාවේ වෙනත් ගනුදෙනුවලින් ලැබෙන සියලු මුදල්;

(ඊ) සභාව වෙත සතු වී ඇති යම් දේපළකින් හෝ යම් පොදු සේවයක් ක්‍රියාත්මක කිරීමෙන් සභාව ලබාගන්නා සියලු ආදායම්;

(උ) ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් ප්‍රකාර සභාව අනුප්‍රාප්තිකයා වන හෝ ඒ ප්‍රඥප්තිය ප්‍රකාර යැයි සංකල්පිතව සභාව අනුප්‍රාප්තිකයා වන යම් පළාත් පාලන ආයතනයකට පවරා දෙනු ලැබූ යම් ආදායම් ප්‍රභවයකින් උපචිත වන සියලු මුදල්;

(ඌ) පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් හෝ වෙනත් ආකාරයකින් හෝ සභාවට කලින් කල විසර්ජනය කරනු ලබන හෝ පවරා දෙනු ලබන සියලු මුදල් හා සියලු ආදායම් ප්‍රභව;

(එ) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්යය ඉටු කිරීමේ දී වෙනත් ආකාරවලින් සභාවට උපචිත වන සියලු මුදල්

ගෙවිය යුතු ය.

(3) නගර සභාවකට ලැබී ප්‍රාදේශීය අරමුදලට ගෙවිය යුතුව ඇත්තා වූ සියලු මුදල්, ළඟ ම ඇති කච්චේරියෙහි තැන්පත් කිරීම හෝ අනුමත කළ බැංකුවක ඒ අරමුදලේ නම දරන ගිණුමක බැරට තැබීම කළ යුතු ය.

මේ වගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන්, යම් මහ නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක හෝ යම් නගර සභාවක මුදල් තැන්පත් කරනු ලැබිය හැකි බැංකුවක් වශයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කර දක්වන ලද බැංකුවක් අදහස් වේ.

(4) ප්‍රාදේශීය අරමුදලින් සභාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවිය හැකි යම් කොටසක්, භාර ආඥාපනතේ 20 වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් සුරැකුම් පත් අතුරින් යම් සුරැකුම් පතක ආයෝජනය කළ හැකි ය.

ප්‍රාදේශීය අරමුදල යෙදවීම.

**159.** (1) එක් එක් නගර සභාව විසින් පිහිටුවන ලද ප්‍රාදේශීය අරමුදලින් පහත දැක්වෙන ගෙවීම් කළ යුතු ය:—

[1971 අංක 18 § 20.]

(අ) මේ ආඥාපනත යටතේ හෝ වෙනයම් ප්‍රඥප්තියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමේ දී සභාව විසින් හෝ සභාවේ ලේකම් හෝ වෙන යම් නිලධරයකු විසින් දරන ලද වියදම්; සහ

(ආ) කම්කරු වන්දි ආඥාපනත යටතේ වූ යම් බැඳීමක් සම්බන්ධයෙන් සභාව විසින් ගෙවිය යුතු වන සියලු මුදල්; සහ

(ඇ) සභාවට අයිති හෝ සභාව වෙත සතු කරනු ලැබූ යම් දේපලක් රක්ෂණය කිරීම සඳහා වූ හෝ කම්කරු වන්දි ආඥාපනත යටතේ සභාවට ඇතිමට සිදු වන යම් බැඳීමකට සම්බන්ධව රක්ෂණය සඳහා වූ වාරික වශයෙන් සභාව විසින් ගෙවිය යුතු වන සියලු මුදල්; සහ

(ඈ) හදිසි අනතුරක් නිසා හෝ සභාව විසින් භාවිත කරනු ලබන යම් යන්ත්‍රෝපකරණයක, යන්ත්‍රයක හෝ උපකරණයක දෝෂයක් නිසා හෝ බාහිර පාර්ශවකරුවකුගේ බලය නොලත් හෝ නීත්‍යානුකූල නොවන මැදිහත් වීමක් නිසා හෝ මේ ආඥාපනත මගින් හෝ ඒ යටතේ සභාව වෙත හෝ සභාවේ නිලධරයන් වෙත හෝ සේවකයන් වෙත පැවරී ඇති බලතල අතුරින් කිසිවක් ක්‍රියාත්මක කළ අවස්ථා වශයෙන් අනියම් ලෙස පමණක් ආරෝපනය කළ හැකි අවස්ථාවල දී හානි සිදු වන හෝ වෙන යම් අලාභයක් සිදු වන හෝ මරණයට පත් වන (සභාවේ සේවකයන් නොවන) යම් තැනැත්තන්ට හෝ යම් තැනැත්තන්ගේ යැපෙන්නන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන් ගෙවීමට සභාව විසින් තීරණය කළ හැකි සියලු මුදල්; සහ

[1987 අංක 18 § 3] (ඈඈ) දිළිඳු ජනයාට සහනය ලබාදීම, අනාථ තැනැත්තන් හෝ ශාරීරික වශයෙන්, මානසික වශයෙන් හෝ සාමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ රැකවරණය, ප්‍රජා සංවර්ධනය ව්‍යාපෘති හෝ සේවා නියුක්ති වැඩ සටහන් සඳහා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල්;

(ඈඈඈ) ආගමික චරිත්‍රවිධි සහ උත්සව සංවිධානය කිරීම, දහම් පාසල් සහ ශාසනාරක්ෂක මණ්ඩල පවත්වාගෙනයාම, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, සාහිත්‍ය සහ සංස්කෘතික වටිනාකමින් යුත් පොත් ප්‍රකාශනය කිරීම සහ කලාකරුවන්ට, ග්‍රන්ථ කර්තෘවරුන්ට සහ ශිල්පීන්ට ත්‍යාග ප්‍රදානය කිරීම පිළිබඳ වියදම් සඳහා වූ ආධාර මුදල් ඇතුළුව ආගම සහ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමෙහිලා සභාව විසින් සම්මත කරන ලද සියලු ආධාර මුදල්;

(ඉ) සභාවට ලැබුණා වූ ද ගෙවූ තැනැත්තා වෙත ආපසු ගෙවන ලෙස යම් ලිඛිත නීතියකින් සභාවට බලය දී හෝ නියම කර ඇත්තා වූ ද සියලු මුදල්; සහ

1981 අංක 61 18.] (ඉඉ) 209අ වන වගන්තිය යටතේ ස්ථානවල පදිංචිකරුවන් වෙත දිරිගැන්වීමේ දීමනා වශයෙන් ගෙවීම සඳහා සභාව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්; සහ





(ඊ) යම් වර්ෂයක මුළු එකතුව රුපියල් පන්දහසකට වැඩි නොවන ලෙස සභාව විසින් දරනු ලැබිය හැකි වියදම් හා නාගරික පිළිගැනීම් හෝ පොදු යහපතට හෝ යම් ආගමික, පුණ්‍යාධාර, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික සිද්ධීන් සම්බන්ධව අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව සභාව විසින් කරනු ලැබිය හැකි වියදම්; සහ [1958 අංක 14 § 2.] [1984 අංක 48 § 25]

(ඊඊ) සභිකයන්ගේ නිවාස ස්ථානවලට නිල දුරකථන පහසුකම් සැපයීම සහ නඩත්තු කිරීම පිණිස සභාව විසින් දරනු ලබන සියළු වියදම්; සහ [1986 අංක 39 § 6.]

(උ) යම් වර්ෂයක මුළු එකතුව රුපියල් දෙදහස් පන්සියයකට වැඩි නොවන ලෙස සභාව විසින් වෙන් කරනු ලබන දායක මුදල් හා පොදු උත්සව සහ විනෝද කටයුතු, යම් පුස්තකාල සඳහා ආධාර හෝ අධ්‍යාපනික, විනෝදාත්මක, පුණ්‍යාධාර සහ යහසාධක ආයතන හෝ යම් ආගමික, පුණ්‍යාධාර, සංස්කෘතික, සෞඛ්‍ය හෝ අධ්‍යාපනික කටයුතුවල පිරිවැය සඳහා අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව සභාව විසින් වෙන් කරනු ලබන දායක මුදල්; සහ [1958 අංක 14 § 2.] [1984 අංක 48 § 25.]

(උඋ) 193 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට අනුකූලව සභාපතිවරයාට, උපසභාපතිවරයාට සහ සභිකයන්ට ගෙවිය යුතු සියලු දීමනා; සහ [1977 අංක 24 § 30.]

(ඌ) පළාත් පාලනයට අදාළ කරුණු සලකා බැලීම සඳහා නගර සභාවල සභිකයන්ගේ හෝ නිලධරයන්ගේ යම් රැස්වීමකට හෝ සම්මේලනයකට සහභාගී වන සභාවේ සභිකයන්ගේ හෝ නිලධරයන්ගේ ගමන් වියදම් පියවීම සඳහා සභාව විසින් වෙන් කරනු ලබන සියලු මුදල්; සහ

(එ) නගර සභා සම්මේලනයකට නගර සභාව විසින් යම් වර්ෂයක් තුළ ගෙවිය යුතු, මුළු එකතුව රුපියල් එක් දහසකට හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අන් ප්‍රමාණයක මුදලකට වැඩි නොවන මුදලක්. [1984 අංක 48 § 25.]

(2) ප්‍රාදේශීය අරමුදලින් මුදල් ගෙවීම සඳහා වූ සියලු චෙක්පත් හෝ අණපත්, 193 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලින් නියමිතව තිබිය හැකි ආකාරයට අත්සන් කොට නිකුත් කළ යුතු ය.

විශ්‍රාම වැටුප, වාර්ෂිකය, පාරිතෝෂිකය හෝ විශ්‍රාමික දීමනාව කරුණා සහගතව ගෙවීම.

**159අ.** (1) නගර සභාවක් විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, එම සභාව විසින් පිහිටුවන ලද ප්‍රාදේශීය අරමුදලින්—

(අ) ඒ සභාවේ නිලධරයකුව හෝ සේවකයකුව සිට විශ්‍රාම ලබන හෝ විශ්‍රාම ලැබූ; හෝ

(ආ) ඒ සේවයෙන් මාරු වී යන හෝ මාරු වී ගොස් ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ලබන හෝ විශ්‍රාම ලැබූ, [1959 අංක 7 § 2.]

විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාමික දීමනාවක් ඒ නිලධරයා හෝ සේවකයා වශයෙන් තමාගේ යම් සේවා කාලයක් සඳහා ඒ සභාවේ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ හෝ පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද යම් විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ කිසිම විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාමික දීමනාවක් හෝ කිසිම ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් ලැබිය නොහැකි යම් තැනැත්තකුට ප්‍රදානය කළ හැකිය.

(2) කිසිම විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් හෝ කිසිම ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් ඒ සභාවේ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ හෝ පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවන ලද යම් ක්‍රමයක් හෝ අරමුදලක් යටතේ යම් නගර සභාවක සේවය කොට මියගිය නිලධරයකුගේ හෝ සේවකයකුගේ වැන්දඹුවට, දරුවන්ට, කිට්ටුම නෑයාට හෝ යැපෙන්නන්ට ගෙවිය නොහැකි නම්, ඒ සභාව විසින්, රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, ඒ වැන්දඹුවට, දරුවන්ට, ළඟම නෑයාට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක්, ඒ සභාව විසින් පිහිටුවන ලද ප්‍රාදේශීය අරමුදලින් ප්‍රදානය කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියෙහි හෝ (2) වන උපවගන්තියෙහි වූ කිසිවකින්, ඒ වගන්ති දෙක අතුරින් කවර හෝ වගන්තියක් යටතේ විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාමික දීමනාවක් ලැබීමේ යම් අයිතිවාසිකමක් යම් තැනැත්තකු වෙත පිරිනැමී ඇතැයි තේරුම් නොගත යුතු ය.

පාරිතෝෂික ක්‍රමයක් පිහිටු වීමේ බලය.

[1959 අංක 7 § 2.]

**159ආ.** (1) රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව නගර සභාවක් විසින් ඒ සභාවේ තාවකාලික නිලධරයන්ට සහ සේවකයන්ට, ඒ සභාවේ සේවය ඔවුන් විසින් අවසන් කරනු ලැබූ විට පාරිතෝෂිකයක් ගෙවීමේ ක්‍රමයක් සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම සහ ඒ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එකී ක්‍රමයක් පිහිටුවීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නගර සභාවක් විසින් එසේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථා, ඒ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වීමට පෙර ඒ නගර සභාවේ සේවය අවසන් කළ නිලධරයන්ට සහ සේවකයන්ට ද අදාළ වන ලෙස සෑදිය හැකි ය.

## වරිපනම් බදු සහ බදු පැනවීම

වරිපනම් බදු පනවා අය කිරීමට ඇති බලය.

**160.*** (1) නගරයක නගර සභාවක් විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සීමාවලට, අනුසීමාවලට සහ කොන්දේසිවලට යටත්ව ද අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව ද එම සභාව විසින් ඒ නගරය ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක හෝ යම් නිශ්චිත දේපළ වර්ගයක වාර්ෂික තක්සේරුව අනුව වරිපනම් බද්දක් පනවා අය කරනු ලැබිය හැකි ය.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදී. එහි 76 වන වගන්තිය බලන්න.





(1අ) වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා වැඩි වරිපනම් බදු ප්‍රමාණයක්, (1) වන උපවගන්තිය යටතේ වූ බලතල ප්‍රකාර, සභාව විසින් පැනවිය හැකි ය. [1981 අංක 10 § 3.]

(1ආ) (අ) සභාව විසින් (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් නොඉක්මවන වාර්ෂික වටිනාකමක් ඇති සියලු නේවාසික ස්ථාන, සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, වරිපනම් ගෙවීමෙන් නිදහස් කළ හැකි ය. [1981 අංක 10 § 3]

(ආ) නිදහස් කරනු ලැබිය හැකි නේවාසික ස්ථානවල වාර්ෂික වටිනාකමේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සභාව විසින්—

(i) සභාව පිහිටුවා ඇත්තේ යම් නගරයක ද එම නගරයේ සංවර්ධන මට්ටම;

(ii) වඩා අඩු වාර්ෂික වටිනාකමක් ඇති නේවාසික ස්ථානවලට සභාව මගින් සලසන ලද සේවාවල හා පහසුකම්වල ස්වභාවය;

(iii) යම් නිදහස් කිරීමක් දීමේ හේතුවෙන් සිදු විය හැකි ආදායම් අඩු වීම හා ඒ අඩුව පියවාගැනීම සඳහා සභාව විසින් යෝජනා කරනු ලබන ක්‍රියා මාර්ග

සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ විධිවිධාන යටතේ යම් නේවාසික ස්ථානයක් නිදහස් කරනු ලැබූ විට එකී නිදහස් කරනු ලැබීමේ වාසිය එහි පදිංචිකරුට උපචිත විය යුතු ය.

(2) සභාව විසින් නගරයේ වෙන් වෙන් ප්‍රදේශ හෝ කොටස් සඳහා සපයනු ලබන සේවා අනුව ඒ එක් එක් ප්‍රදේශය හෝ කොටස සඳහා වෙන් වෙන් වරිපනම් බදු පැනවීම සභාව විසින් කරනු ලැබිය හැකි ය.

(2අ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද වරිපනම් බද්ද— [1979 අංක 57 § 5.]

(අ) ප්‍රමාණවත් සේවා නොසලකා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් බද්ද අය කරගනු ලැබීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීම අවස්ථානුගත සියලු කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ වරිපනම් බද්ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් බද්ද අය කරගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

[1979 අංක 57 § 5] (2ආ) නියම කරනු ලැබූ යම් වරිපනම් බද්දක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ ඒ වරිපනම් බද්ද අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත්හැරීමට (2අ) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් බද්ද ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී අත්හරිනු ලැබූ වරිපනම් බද්දේ සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් බද්ද ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම ; හෝ

(ආ) ඒ වරිපනම් බද්ද ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී වරිපනම් බද්ද සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත්හැරීම

සභාව විසින් කළ යුතුය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.

(3) යම් වර්ෂයක් සඳහා යම් වරිපනම් බදු පැනවීමේ දී, සභාව විසින්, ඊට කලින් වූ වර්ෂයේ බල පැවැත්වූ වරිපනම් බද්ද ම වෙනසක් නොමැතිව පැනවීමට සම්මත කරනු ලබන අවස්ථාවක, ඒ වරිපනම් බදු පනවා අය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ලබාගැනීම අවශ්‍ය නොවිය යුතුය.

*(5) තම වරිපනම් බදු කලින් ගෙවන වරිපනම් බදු ගෙවන්නන්ට හිමිකම් ලැබිය හැකි වට්ටම් ප්‍රමාණය නිශ්චය කරමින් අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

වරිපනම් බදුවලින් නිදහස් කිරීම. **161.**† 160 වන වගන්තිය යටතේ පනවන ලද යම් වරිපනම් බද්දකින්—

(අ) සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ආගමික, අධ්‍යාපනික හෝ පුණ්‍ය කටයුතු සඳහා භාවිතා කරනු ලබන සියලු ඉඩම් සහ ගොඩනැගිලි ;

(ආ) මුර සේවාසන් භාරයේ තිබෙන සියලු ගොඩනැගිලි;

(ඇ) සියලු භූමදාන සහ ආදාහන භූමි ;

(ඈ) අයිතිකරුගේ දරිද්‍රතාව හේතුකොටගෙන සභාව විසින් එම බද්දෙන් විශේෂයක් වශයෙන් නිදහස් කරනු ලැබිය හැකි යම් නිශ්චල දේපළක් ;

(ඉ) යම් විශේෂ පොදු සේවයක කාර්යයන් සඳහා අය කළ යුතු ලෙස සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ වරිපනම් බද්දක යම් නිරූපිත කොටසක් සම්බන්ධයෙන් වන විට, ඒ සේවයෙන් ප්‍රයෝජනයක් නොලබන යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි හෝ සභාව සෑහීමට පත් වන අයුරින් එකී සේවය හෝ එවැනි සේවයක් සඳහා වෙනත් විධිවිධාන සලස්වා ඇති යම් ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් නිශ්චල දේපළක්

නිදහස් විය යුතුය.

බදු සහ බලපත්‍ර ගාස්තු පැනවීමට සභාවට ඇති බලය. **162.** (1) නගරයක නගර සභාවක් විසින් සාදනු ලැබිය හැකි සීමාවලට, අනුසීමාවලට සහ කොන්දේසිවලට යටත්ව, එම සභාව විසින් නගරය ඇතුළත පහත සඳහන් බදු සහ බලපත්‍ර ගාස්තු පනවා අය කරනු ලැබිය හැකි ය :—

(අ) රථවාහන සහ සතුන් වෙනුවෙන් බද්දක් ;

(ආ) සභාව විසින් නිකුත් කරනු ලැබිය හැකි බලපත්‍ර සම්බන්ධයෙන් ගාස්තුවක් ;

(ඇ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනයම් ආකාරයක බද්දක්.

(2) මේ වගන්තිය යටතේ යම් වර්ෂයක් සඳහා යම් බද්දක් පැනවීමේ දී, කලින් වර්ෂය තුළ බල පැවැත් වූ බද්ද ම වෙනසක් නැතිව අය කිරීමට සභාව සම්මත කරන අවස්ථාවක දී, ඒ බද්ද පනවා අය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවිය යුතු ය.

වාහන සහ සතුන් පිළිබඳ බද්ද. [1979 අංක 42 §13.] **163.** (1) වාහන හා සතුන් සම්බන්ධයෙන් 162 වන වගන්තිය යටතේ නියම කිරීමට නගර සභාවකට බලය දී ඇති බද්ද, ඒ නගර සභාව පිහිටුවා ඇති නගරය තුළ සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන්නා වූ හෝ භාවිත කිරීමට අදහස් කරනු ලබන්නා වූ ද තුන් වන උපලේඛනයේ විස්තර කර ඇත්තා වූ ද වාහන හා සතුන් සියල්ල නැතහොත් ඉන් යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ වාර්ෂික බද්දක් විය යුතු අතර, ඒ බදු ප්‍රමාණය ඒ උපලේඛනයේ පිළිවෙළින් දක්වා ඇති බදු ප්‍රමාණ විය යුතු ය.

(2) වාහන හෝ සතුන් පිළිබඳ බද්ද—

(අ) රජයේ හෝ සභාවේ දේපළ වන යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් ; හෝ

* 160 වන වගන්තියේ (4)වන උප වගන්තිය 1986 අංක 39 දරණ පනතේ 68 වන වගන්තිය අනුව ඉවත් කරන ලදී.

† වරිපනම් සහ තක්සේරු ආඥාපණතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදී. එහි 76 වන වගන්තිය බලන්න.

(ආ) නගරය ඇතුළත මාණ්ඩලික, රෙජමේන්තු හෝ වෙනත් පොදු කාර්යයක් ඉටු කරන හමුදා නිලධරයන්ට අයත් අනුමත කර ඇති අශ්වයන් සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ; හෝ

(ඇ) වාහන විකුණන නිර්ව්‍යාජ වෙළෙන්දන් විසින් විකිණීම පිණිස තබාගනු ලබන්නා වූ ද වෙන යම් කාර්යයක් සඳහා පාවිච්චි නොකරනු ලබන්නා වූ ද එබඳු වාහන සම්බන්ධයෙන් ; හෝ

(ඈ) වාහන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ බල පත්‍ර ගාස්තුවකට හෝ මෝටර් වාහනවලට අදාළව තත් කාලයේ බල පවත්නා යම් ප්‍රඥප්තියක් යටතේ බද්දකට හෝ යටත් වන වාහන සම්බන්ධයෙන්

අය කිරීම හෝ ගෙවීම් නොකළ යුතු ය.

(3) වාහන සහ සතුන් පිළිබඳ බද්ද, සභාව විසින් නියම කරනු ලැබිය හැකි හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි දිනයක දී වාර්ෂිකව කලින් ගෙවිය යුතු ය.

(4) වාහන සහ සතුන් පිළිබඳ බද්දට යටත් වන යම් වාහනයක් හෝ සතකු අයිතිව සිටින හෝ භාරව සිටින හෝ පාලනය කරන එක් එක් තැනැත්තා විසින් එකී බද්ද, ඒ වාහනය හෝ සතා නගරයේ පරිපාලන සීමා ඇතුළත තිස් දවසක් පාවිච්චි කරනු ලැබීමෙන් හෝ පාවිච්චි කිරීම සඳහා තබාගැනීමෙන් පසු අප්‍රමාදව ගෙවිය යුතු නමුත්, තිස් දවසකට අඩු කාලයක් තමාට අයිතිව තුබූ යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් කිසි ම තැනැත්තකු මේ වගන්තිය යටතේ ගෙවීමකට යටත් නොවිය යුතු ය.

(5) අයිතිය වෙනස් වූ වර්ෂය සඳහා එවකටත් බද්දයක් ගෙවනු ලැබ ඇති යම් වාහනයක් හෝ සතකු පිළිබඳව බද්දක් ගෙවීමට කිසි ම තැනැත්තකු අයිතිය වෙනස් වීමේ හේතුව නිසා යටත් නොවිය යුතු ය.

(6) යම් කුලී ඉස්තාල භාරකරුවකුගෙන් හෝ කුලියට දීම සඳහා සතුන් තබාගන්නා හෝ පාවිච්චි කරන වෙනත් තැනැත්තකුගෙන්, ඒ ඉස්තාලයේ හෝ ඒ තැනැත්තා තබාගන්නා වාහන හෝ සතුන් පිළිබඳව, තුන්වන උපලේඛනය අනුව ගෙවිය යුතු බද්ද සමථය කිරීමෙහි ලා සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදලක්, සභාපතිවරයා විසින්, එක් විටක එක් අවුරුද්දකට වැඩි නොවන යම් කාල සීමාවක් සම්බන්ධයෙන් භාර ගනු ලැබිය හැකි ය.

(7) මේ ආඥාපනත යටතේ යම් බද්දකට යටත් වන යම් වාහනයක් හෝ සතකු එක් නගරයකට වැඩි නගර සංඛ්‍යාවක පරිපාලන සීමා ඇතුළත පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ඒ වාහනය හෝ සතා ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අපේක්ෂා කරනු ලබන නගරය සම්බන්ධයෙන් එක් බද්දකට පමණක් ඒ වාහනය හෝ සතා යටත් විය යුතු අතර, එබඳු යම් බද්දකට යටත් වන යම් වාහනයක් හෝ සතකු ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන්නේ හෝ පාවිච්චි කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ යම් පරිපාලන සීමා ඇතුළත ද ඒ පරිපාලන සීමා සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැඟුනහොත්, ඒ ප්‍රශ්නය කොමසාරිස්වරයා විසින් තීරණය කළ යුතු ය.





(8) යම් වාහනයක් හෝ සතකු, මේ ආඥාපනතේ 162 වන වගන්තිය යටතේ පනවනු ලැබ ඇති බද්දටත් මහ නගර සභා ආඥාපනතේ 245 වන වගන්තිය යටතේ පනවනු ලැබ ඇති බද්දටත් සාමාන්‍ය වශයෙන් යටත් වන අවස්ථාවක දී, ඒ වාහනය හෝ සතා,—

(අ) නගර සභාවක හෝ මහ නගර සභාවක පරිපාලන සීමා ඇතුළත එම වාහනය හෝ සතා තබාගනු ලැබ ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ නගර සභාව වෙත හෝ ඒ මහ නගර සභාව වෙත ; හෝ

(ආ) නගර සභාවක හෝ මහ නගර සභාවක පරිපාලන සීමා ඇතුළත එම වාහනය හෝ සතා තබාගනු ලැබ නොමැති අවස්ථාවක දී, ඒ වාහනය හෝ සතා ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන්නේ යම් නගර සභාවක හෝ මහ නගර සභාවක පරිපාලන සීමා ඇතුළත ද ඒ නගර සභාව වෙත හෝ මහ නගර සභාව වෙත

ගෙවිය යුතු එක් බද්දකට පමණක් යටත් විය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ අය කරගත යුතු බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටීමෙන් පසු දවස් හතක් ඇතුළත එය ගෙවීම ඒ බද්ද ගෙවීමට යටත් වන යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබුව හොත්, ඒ පැහැර හැරීම ගැන සභාවේ ලේකම් විසින් මහෙස්ත්‍රාත් අධිකරණය* වෙත පැමිණිලි කළ යුතුය. තවද අය විය යුතු එම මුදල් ප්‍රමාණය, අධිකරණය විසින් පනවන ලද දඩයක් වූ විටක මෙන් අය කරගැනීමට එම අධිකරණය විසින් කටයුතු කරගෙන යා යුතු අතර, එසේ අය කරගන්නා මුදල් ප්‍රමාණය ප්‍රාදේශීය අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. [1971 අංක 48 § 21.]

164. (1) පැනවීමට නගර සභාවකට 162 වන වගන්තියෙන් බලය දී ඇති බල පත්‍ර ගාස්තුව, මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව වූ යම් විශේෂ කාර්යයක් සඳහා යම් ස්ථානයක් හෝ තැනක් පාවිච්චි කිරීමට බලය පවරමින් සභාව විසින් දෙන ලද එක් එක් බල පත්‍රය සම්බන්ධයෙන් පැනවිය යුතු ය. බලපත්‍ර ගාස්තු.

* අධිකරණ සංවිධාන පණතේ 32 වන වගන්තිය ද බලන්න.

[1979 අංක 42 § 4.]

[1985 අංක 20 § 8.]

(2) බල පත්‍ර ගාස්තු ප්‍රමාණය, බල පත්‍ර ලබාගත යුතු වන්නේ යම් ස්ථානයක් සඳහා ද ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන, යම් ගාස්තු ප්‍රමාණයක් විය යුතු ය. තව ද, යම් කර්මාන්තයක කාර්ය සඳහා ස්ථානය පරිහරණය කිරීමට බල පත්‍රයෙන් බලය ලැබෙන අවස්ථාවක—

(අ) ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම;

(ආ) ඒ කර්මාන්තයේ ව්‍යාපාර පිරිවැටුම;

(ඇ) ඒ කර්මාන්තයෙන් උපයනු ලැබිය හැකි ලාභය; සහ

(ඈ) ඒ කර්මාන්තය කරගෙන යෑමේ දී සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යවශ්‍ය ස්වභාවය සැලකිල්ලට ගත යුතු ය;

එසේ වුව ද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම පහත දැක්වෙන I වන තීරයේ සඳහන් යම් සීමාවක් තුළ වැටෙන්නේ නම්, ඒ සඳහා අය කල හැකි උපරිම බල පත්‍ර ගාස්තු II වන තීරයේ ඊට අනුරූපව දක්වා ඇති මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය:—

| I වන තීරය | II වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම— | රු. ශ. |
| රු. 750 නොඉක්මවන විට ... | ... 500 00 |
| රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට ... | ... 750 00 |
| රු. 1500 නොඉක්මවන විට ... | 1,000 |

එසේ ම තව දුරටත්, ඒ ස්ථානය, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොලක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොල (1968 අංක 10 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක එසේ අය කළ යුතු බල පත්‍ර ගාස්තුව, බල පත්‍ර ගාස්තු අය කරනු ලැබූ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය සඳහා එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොළේ ලැබීම්වලට අනුකූලව විය යුතු අතර එය ඒ ලැබීම්වලින් සියයට එකක් නොඉක්මවිය යුතු ය. ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ පවත්වාගෙන යනු ලබන පළමුවන වර්ෂය එය වන අවස්ථාවක, ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බල පත්‍ර ගාස්තුව තීරණය කොට අය කරනු ලැබිය යුතු ය.

[1968 අංක 10 § 6.]

[1985 අංක 20 § 8.]





මේ වගන්තියෙහි කාර්ය සඳහා හෝටලයකට, ආපන ශාලාවකට නැතහොත් නවාතැන් පොළකට අදාළව යෙදී ඇති විට, "ලැබීම්" යන්නෙන් ඒ හෝටලය, ආපන ශලාව නැතහොත් නවාතැන් පොළ සම්බන්ධයෙන් එළඹගෙන ඇති ගනුදෙනුවලින් හෝ ඒ හෝටලය, ආපන ශාලාව නැතහොත් නවාතැන් පොළ පවත්වාගෙන යෑමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු නැතහොත් ලැබීමට ඇති මුළු මුදල අදහස් වේ.

බදුවලට අදාළ අතුරු ව්‍යවස්ථා.

165. වාහන සහ සතුන් පිළිබඳ බද්ද නොවන්නා වූ ද 162 වන වගන්තිය යටතේ පනවනු ලබන්නා වූ ද යම් බද්දක්, මේ ආඥා පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි ප්‍රමාණයකින් යුත්ත විය යුතු අතර, එසේ නියම් කළ හැකි කොන්දේසිවලට ද යටත් විය යුතුය.

ඇතැම් කර්මාන්ත විෂයයෙහි බදු නියම කිරීම.

[1979 අංක 42 § 15.]

165අ. (1) යම් නගර සභාවක පාලන සීමා තුළ කර ගෙන යන යම් කර්මාන්තයක් විෂයෙහි බද්දක් නියම කොට අය කිරීම ඒ නගර සභාව විසින් කළ හැකි ය.

(2) එසේ (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන බද්ද, ඒ කර්මාන්තය කර ගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුකූලව ඒ සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයක වාර්ෂික බද්දක් විය යුතුය:

එසේ වුවද, එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මෙහි පහත දැක්වෙන I වන තීරයේ ඇතුලත් යම් ප්‍රමාණයක් අතරට වැටෙන අවස්ථාවක, ඒ ස්ථානය සම්බන්ධයෙන් අය කළ යුතු බද්ද II වන තීරයේ ඊට අනුරූප සටහනේ දැක්වෙන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතුය:

| I වන තීරය | II වන තීරය |
|---|---|
| | රු. ශ. |
| රු. 1,500 නොඉක්මවන විට ... | ... 1,000 00 |
| රු. 750 නොඉක්මවන විට ... ... | ... 500 00 |
| රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට | ... 750 00 |
| රු. 1500 නොඉක්මවන විට | 1,000 00 |

එසේම තව දුරටත්. යම් කර්මාන්තයක් සඳහා මේ ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ එම ආඥා පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ හෝ බල පත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, එවැනි කර්මාන්තයක් සඳහා ඉහත සඳහන් බද්ද නියම කිරීම හෝ අය කිරීම හෝ නොකළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද බද්ද, සභාව විසින් තීරණය කරනු ලබන දිනයක දී හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති දිනයක දී හෝ, ඒ කර්මාන්තය කරගෙන යන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියම කරන ලද යම් බද්දක් ගෙවිය යුතු ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින හතක ඇතුළත ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, සභාව පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත, ඒ පැහැර හැරීම ලේකම්වරයා විසින් වාර්තා කළ යුතු ය. මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණයට වඩා එසේ අය විය යුතු මුදල වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කරගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය. [1986 අංක 39§69]

කර්මාන්ත කිහිපයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ගාස්තුව හෝ බද්ද තීරණය කිරීම.

[1985 අංක 20 § 9 ]

**165අඅ.** නගර සභාවක් විසින් 164 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සම්බන්ධයෙන් ගාස්තුවක් හෝ 165අ වන වගන්තිය යටතේ කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්දක් නියම කොට අය කිරීමට සම්මත කරනු ලබන හා පවත්වාගෙන යනු ලබන කර්මාන්තය එම ස්ථානයේ ම පවත්වාගෙන යනු ලබන වෙනත් බොහෝ කර්මාන්ත අතුරින් එකක් වන අවස්ථාවක සභාව විසින් ඒ කර්මාන්තයේ කාර්යය සඳහා යොදනු ලද ස්ථානයේ බිම් ප්‍රමාණයේ කොටස් කළ වාර්ෂික වටිනාකම පදනම් කොට ඒ ගාස්තුව හෝ බද්ද තීරණය කරනු ලැබිය යුතුය.

වෙළෙඳ ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් වූ බද්ද.

[1929 අංක 42 § 15.]

[1985 අංක 20 § 10.]

**165ආ.** (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ බලපත්‍රයේ අවශ්‍ය නොවන නැතහොත් 165අ වන වගන්තිය යටතේ කිසි ම බද්දක් නොගෙවිය යුතු යම් වෙළෙඳ ව්‍යාපාරයක් යම් නගර සභාවක පාලන සීමා තුළ කරගෙන යන සෑම තැනැත්තකු ම විෂයයෙහි වාර්ෂික බද්දක්, ඒ බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉ[illegible]නින්ම වූ වර්ෂයේ දී ඒ ව්‍යාපාරයේ ලැබීම්වලට අනුකූලව හා පහත දැක්වෙන ප්‍රමාණ නො ඉක්මවා, ඒ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කොට අය කළ හැකි ය:—

| I වන තීරය | II වන තීරය |
|---|---|
| | ගෙවිය යුතු බද්ද |
| ව්‍යාපාරයෙන් වර්ෂයක ලැබීම්— | රු. ශ. |
| (i) රු. 6,000 නොඉක්මවන විට ... | නැත |
| (ii) රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට ... | 90 00 |
| (iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට ... | 180 00 |
| (iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට ... | 360 00 |
| (v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට ... | 1,200 00 |
| (vi) රු. 1,50,000 ඉක්මවන විට ... | 3,000 00 |





එසේ වුව ද, ස්ථිර ස්ථානයක තම වෙළෙඳ ආයතනය පවත්වාගෙන නොයන්නා වූ හෝ තම ව්‍යාපාරයේ කටයුතු සඳහා පොදු මාර්ගවල නැතහොත් පොදු ස්ථානවල ස්ථාපනය නොවන්නා වූ හෝ චාරිකා වෙළෙඳුන්ට මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(1අ) නගර සභාවක පරිපාලන සීමාවන් තුළ යම් වෘත්තියක යෙදෙන සෑම තැනැත්තකුගෙන් ම ඒ සභාව විසින් නියම කළ හැකි හෝ අය කළ හැකි උපරිම බද්ද වශයෙන් අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් නිශ්චය කර ඇති ප්‍රමාණයක් නො ඉක්මවන බද්දක් ඒ නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කොට වාර්ෂිකව අය කරගනු ලැබිය හැකි ය. 1985 අංක 20 § 10 ]

(2) (1) වන උපවගන්තියේ (1අ) වන උපවගන්තිය හෝ යටතේ ගෙවිය යුතු බද්ද සභාව විසින් නියම කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථා වලින් නියම කර ඇති හෝ දිනයක දී ගෙවිය යුතු ය. [1965 අංක 20 §10 ]

(3) මේ වගන්තිය යටතේ නියම කරන ලද යම් බද්දක් යම් දිනයක දී ගෙවන ලෙස, ඒ බද්ද ගෙවීමට යටත් තැනැත්තකුගෙන් ඉල්ලා සිටි විට, එසේ ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින හතක් ඇතුළත දී ඒ බද්ද ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඒ පැහැර හැරීම සභාව පිහිටි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ලේකම්වරයා විසින් වාර්තා කළ යුතු ය. මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණයට වඩා එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය වැඩි වුව ද ඒ නොතකා, අය විය යුතු එකී මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ක්‍රියා කළ යුතු අතර එසේ අය කර ගනු ලබන මුදල ඒ සභාවේ අරමුදලට ගෙවිය යුතු ය. [1986 අංක 39 § 70]

මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) “වෙළෙඳ ව්‍යාපාරය” යන්නට, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදකයකුගේ හෝ තමා කරන යම් ගනුදෙනුවක් නැතහොත් සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් නැතහොත් ගාස්තුවක් අය කරන යම් තැනැත්තකුගේ ව්‍යාපාරයෙන් හෝ ස්වාධීන කොන්ත්‍රාත් කරුවකුගේ ව්‍යාපාරය ද ඇතුළත් වන නමුත් පෞද්ගලික පොළක දී භාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය විකිණීමේ රක්ෂාව හෝ රජයෙන් ආධාර දීමනා ගෙවනු ලබන්නා වූ නැතහොත් කලින් එවැනි ආධාර දීමනා ගෙවනු ලැබුවා වූ ද දැනට එවැනි ආධාර දීමනා ගෙවනු නොලබන්නා වූ ද අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වා ගෙන යෑමේ රක්ෂාව ඊට ඇතුළත් නොවේ; තවද [1985 අංක 20 § 10]

(ආ) "ලැබීම්" යන්න යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් එළඹ ගෙන ඇති ගනුදෙනුවලින් නැතහොත් ඒ ව්‍යාපාරය කර ගෙන යෑමේ දී ඉටු කරනු ලබන සේවාවලින් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ මුළු මුදල් ප්‍රමාණය අදහස් වන අතර, පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ද ඊට ඇතුළත් වේ:—

(අ) මුදල් සපයන්නකු, මුදල් ණයට දෙන්නකු නැතහොත් උකස් බඩු ගන්නකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ණයට දෙන ලද මුදල්, ඒ ණය සම්බන්ධයෙන් ඔහු ලබා ගත් නැතහොත් ඔහුට ලැබීමට ඇති පොලිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු නැතහොත් වෙනත් අය කිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල් ප්‍රමාණ;

(ආ) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වන විට සහ

(ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව බ්‍රෝකර් කෙනෙකු නැතහොත් කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන විට—

(i) ඔහු විසින් විකුණන ලද ඉඩමක් නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද ඉඩමක් සම්බන්ධයෙන් වන විට, ඒ විකිණීමට අදාළව ඔහු විසින් කරන ලද ගනු දෙනු නැතහොත් ඔහු ඉටු කළ සේවා කිසිවක් සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබීමට ඇති හෝ කොමිස් මුදල් නැතහොත් ගාස්තු;

(ii) ඔහු විසින් විකුණන ලද නැතහොත් ඔහුගේ මූලිකත්වයෙන් විකුණන ලද බඩු කිසිවක් සම්බන්ධයෙන් වන විට, ඒ බඩු මිල දී ගත් තැනැත්තා විසින් ඒ බඩු සඳහා ගෙවන ලද හෝ ගෙවීමට ඇති හෝ මුළු මුදල;

(ඇ) (කොටස් බ්‍රෝකර් කෙනෙකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනෙකු නොවන) යම් බ්‍රෝකර් කෙනකු හෝ කොමිස් නියෝජිතයකු හෝ සම්බන්ධයෙන් වන විට, ඔහු—

(i) ශ්‍රී ලංකාවේ පදිංචිව නොසිටින යම් තැනැත්තකුගේ බඩු ඒ තැනැත්තා සඳහා විකුණන්නේ නම් හෝ විකිණීමේ මූලිකත්වය දරන්නේ නම්, හෝ

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බඩු කිසිවක් සම්බන්ධයෙන් යම් අපනයනකරුවකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, හෝ

(iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ව්‍යාපාරයක් කර ගෙන යන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් ඒ තැනැත්තාගේ බඩු කිසිවක් ශ්‍රී ලංකාවේ දී විකිණීමට මූලික වන්නේ නම් සහ ඒ විකිණීමෙන් ලැබෙන සම්පූර්ණ මුදල එකී වෙනත් තැනැත්තාගේ වෙළෙඳ ව්‍යාපාරයේ ලැබීම්වලට ඇතුළත් වන්නේ නම්

එවැනි විකිණීමක දී, එසේ ක්‍රියා කිරීමක දී නැතහොත් එවැනි විකිණීමකට මූලික වීමක දී ඒ බ්‍රෝකර් තැනගේ කොමිස් නියෝජිතයා විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඔහු විසින් ඉටු කරන ලද යම් සේවයක් සම්බන්ධයෙන් ඔහු විසින් ලබා ගන්නා ලද නැතහොත් ඔහුට ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු ද, කොටස් බ්‍රෝකර් කෙනකු හෝ නිෂ්පාදන බ්‍රෝකර් කෙනකු සම්බන්ධයෙන් වන විට ඒ බ්‍රෝකර් හෝ කොමිස් නියෝජිතයා හෝ විසින් කරන ලද යම් ගනුදෙනුවක් නැතහොත් ඉටු කරන ලද යම් සේවයක් සඳහා ඒ බ්‍රෝකර්ට හෝ කොමිස් නියෝජිතයාට ලැබුණු නැතහොත් ලැබීමට ඇති කොමිස් මුදල් හෝ ගාස්තු; සහ

(ඈ) යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාඨශාලාවක් හෝ පවත්වා ගෙන යන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු ලාභ අතහැර, ඒ අධ්‍යාපන ආයතනය හෝ පාඨශාලාව හෝ පවත්වා ගෙන යෑමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල් ප්‍රමාණය අදහස් වන නමුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබීමට ඇති හෝ යම් මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ.

165ඈ. (1) නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ, ඒ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක— සංවර්ධනය නොකළ ඉඩම් වලින් බදු අය කිරීම. [1979 අංක 43 § 15.]

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදි කර නොමැති නම්;

[1985 අංක 20 § 11]

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමා අතර ඇති අනුපාතය, යෝජනා සම්මතයක් මගින් සභා විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා නම් හෝ

(ඇ) ස්ථාවර නැතහොත් නිතිපතා කැරෙන ගොවිතැනකට ඉඩම යොදවා නැත්නම්

ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකකට නොවැ ප්‍රමාණයක බද්දක් ඒ සභාව විසින් ඒ ඉඩමේ අයිතිකරුගෙ වාර්ෂිකව අය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ඉඩමක භූමියේ ප්‍රාග්ධ තක්සේරු කරන සෑම අවස්ථාවක දී ම, මහ නගර සභා ආ පනතේ 235 වන සහ 236 වන වගන්තිවල විධිවිධාන, අව වෙනස් කිරීම් සහිත ව, ඊට අදාළ කළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, " භූමියේ ප්‍රාග්ධන අගය " යන් යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ ඉඩමේ ඇති ගො නැගිලි සියල්ල අතහැර හා උකස්කර, බදුකර, අවහිර හෝ වෙනත් බැඳීම් සියල්ලෙන් තොරව ඒ ඉඩම පමණක් විවෘත වෙළෙ පොළෙහි දී විකුණනු ලැබුවහොත් ඒ ඉඩම සඳහා ගෙවනු ලැබි හැකි මිල ගණන ඉන් අදහස් වේ.

ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අය කිරීම.

[1979 අංක 42 § 15.]

**165ඇ.** (1) නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩම වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසි වෙන්දේසියේ නැතහොත් වෙනත් යම් ආකාරයකින් විකුණ ලැබුවහොත්, ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සම බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩ විකුණා ලත් මුදලින් ඒ සභාවට ගෙවිය යුතු ය.

[1986 අංක 39 § 71]

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ගෙවි ලෙස ඉල්ලා සිටි දිනය ඉකුත් වීමෙන් පසු දින දහහතරක් තුළ දී බද්ද ගෙවනු නොලැබුව හොත්, ඒ පැහැර හැරීම, ඒ සභාව පිහි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණ වෙත ලේකම් වරයා විසින් වාර්තා කළ යුතු ය. එසේ අය විය යු මුදල් ප්‍රමාණය මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයක ප්‍රමාණ ඉක්මවා ගිය ද ඒ නොතකා, ඒ මුදල ඒ අධිකරණය විසින් නිය කරන ලද දඩයක් වූ පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණ විසින් ක්‍රියා කළ යුතු අතර, එසේ අය කර ගනු ලබන මුදල සභාවේ අර මුදලට ගෙවිය යුතු ය.





**වරිපනම් බදු සහ බදු තක්සේරු කිරීම සහ අයකර ගැනීම**

වරිපනම් බදු සහ බදු තක්සේරු කිරීම.

**166.*** මේ ආඥාපනත යටතේ යම් වරිපනම් බද්දක කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් තක්සේරු කිරීම, මහ නගර සභා සීමා ඇතුළත වූ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ මහ නගර සභා ආඥාපනතේ 235 වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයෙන් අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිතව කළ යුතු අතර, 233 වන 242 වන, 243 වන වගන්තිවල සහ 236 වන වගන්තියේ සිට 241 වන වගන්තිය දක්වා වගන්තිවල සියලු විධිවිධාන, සමග එකී වගන්තියේ සියලු විධිවිධාන මේ ආඥාපනතේ කාර්යය සඳහා කරනු ලබන එබඳු සෑම තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් ම, අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

එසේ වුවද, එබඳු තක්සේරුවක් කරන තෙක්, පොලිස් ආඥාපනත යටතේ හෝ එය සංශෝධනය කරමින් සම්මත කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ තක්සේරු බදුවල කාර්යයන් සඳහා යම් නිශ්චල දේපළක් පිළිබඳව තීරණය කරන ලද යම් වටිනාකමක්, මේ ආඥාපනත යටතේ ඒ දේපළේ වාර්ෂික වටිනාකම අනුව වූ යම් වරිපනම් බද්දක කාර්යය සඳහා ඒ දේපළේ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.

වාර වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට සභාපතිවරයාට ඇති බලය.

**167.*** (1) නගර සභාවක් සංස්ථාපනය කරන ලද නගරයක් ඇතුළත යම් වරිපනම් බද්දක් හෝ බද්දක් යථා පරිදි පනවා අය කිරීම සඳහා එම නගර සභාවේ සභාපතිවරයාගේ මතය අනුව අවශ්‍ය විය හැකි යම් තොරතුරක් නිශ්චය වශයෙන් දැනගැනීමේ කාර්යය සඳහා, මේ ආඥාපනත යටතේ වූ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි හෝ ඒ අතුරු ව්‍යවස්ථා සාදන තෙක් සභාව විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයෙන් වූ සියලු වාර වාර්තා ද ඒ විස්තර පිළිබඳ සියලු ප්‍රකාශ ද එසේ නියමිත හෝ විධානය කරනු ලැබිය හැකි ආකෘතියක් අනුව ඉදිරිපත් කරන ලෙස, සභාපතිවරයා විසින් එබඳු වරිපනම් බද්දකට හෝ බද්දකට යටත් වන හෝ යටත් වන බවට කල්පිත සියලු තැනැත්තන්ට හෝ මේ ආඥාපනත යටතේ යම් වරිපනම් බද්දක් හෝ බද්දක් පනවනු ලැබූ හෝ පනවනු ලැබිය හැකි යම් දේපළක අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විය හැකි හෝ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් ලෙස පරිකල්පිත සියලු තැනැත්තන්ට හෝ, සභාපතිවරයා විසින් සුදුසු යැයි සිතනු ලැබුවහොත්, නගරය ඇතුළත වූ සෑම ගෘහ මූලිකයකුට ම, ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ හැකි ය.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදී. එහි 76 වන වගන්තිය බලන්න.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් දැන්වීමක් භාර දෙනු ලැබූ සියලු තැනැත්තන් විසින් ඒ දැන්වීම භාර දෙන ලද යම් ආකෘතියක්, දවස් දහහතරක් ඇතුළත හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි හෝ ඒ දැන්වීමේ නිශ්චිත ලෙස සඳහන් කළ හැකි වැඩිපුර කාලයක් ඇතුළත අකුරින් පුරවා, අත්සන් කොට, දිනය යොදා, සභාවේ කාර්යාලයට භාර දීම හෝ යැවීම කළ යුතු ය. එසේ නැතහොත් දන්වන ලෙස ඒ දැන්වීමෙන් නියම කර ඇති යම් තොරතුරක් ඉහත සඳහන් පරිදි ම දන්විය යුතු ය.

[1984 අංක 48 § 26.]

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් ආකෘතියක් භාර ගැනීම හෝ එය යථා පරිදි පුරවා භාර දීම හෝ යැවීම හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තොරතුරක් සැපයීම සඳහා නියමිත හෝ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත එම ආකෘතිය යථා පරිදි භාර දීම හෝ යැවීම හෝ එම තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ නොසැලකිලිමත් ලෙස වාර වාර්තාවක් සපයන හෝ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් තමාට වාසි වන පරිදි යම් වැරදි තොරතුරක් සපයන යම් තැනැත්තකු රුපියල් එක්දහසකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යයන් අනුව යම් කාර්යයක් සඳහා කරනු ලබන සියලු ප්‍රකාශ මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

තමා අභිමුඛයට තැනැත්තන් කැඳවීමට සභාපතිවරයාට ඇති බලය.

**168.*** (1) යම් වරිපනම් බද්දක් හෝ බද්දක් ගෙවීමට යටත් බවට නගර සභාවක සභාපතිවරයාට විශ්වාස කිරීමට හේතු ඇති යම් තැනැත්තකුට හෝ මේ ආඥාපනත යටතේ යම් වරිපනම් බද්දක් හෝ බද්දක් පනවනු ලැබ ඇති හෝ පනවනු ලැබිය හැකි යම් දේපළක අයිතිකරු විය හැකි හෝ අයිතිකරු ලෙස පරිකල්පිත යම් තැනැත්තකුට හෝ එබඳු යම් දේපළක් සම්බන්ධයෙන් යම් තොරතුරක් දීමට සමත් යැයි විශ්වාස කිරීමට සභාපතිවරයාට හේතු ඇති වෙන යම් තැනැත්තකුට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඉදිරියට කැඳවනු ලැබිය හැකි ය; නැතහොත් ඒ වෙනුවෙන් සභාපතිවරයා විසින් පත් කරනු ලබන වෙන නිලධරයකු ඉදිරියට කැඳවනු ලැබිය හැකි ය. තවද ඒකී බැඳීම් සම්බන්ධයෙන් එබඳු යම් තැනැත්තකු ඉනික්බිති දිවුරුම් පිට පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ එසේ පත් කරන ලද නිලධරයාට හැකි වන අතර, එසේ පරීක්ෂා කරනු ලබන සෑම තැනැත්තකු වෙත යොමු කරනු ලබන සියලු ප්‍රශ්නවලට සත්‍ය ලෙස පිළිතුරුදීම ඔහුගේ කාර්යය විය යුතු ය.

[1984 අංක 48 § 27.]

(2) කැඳවීමට අවනත වෙමින් පෙනී සිටීම හෝ පරීක්ෂණයට යටත් වීම නීත්‍යානුකූල සහන හේතුවක් නොමැතිව පැහැර හරින, මේ වගන්තිය යටතේ කැඳවනු ලබන යම් තැනැත්තකු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදි. එහි 76 වන වගන්තිය බලන්න.



(3) යම් තැනැත්තකුට සම්බන්ධතාවක් ඇති යම් දේපළක වටිනාකම පිළිබඳව හෝ ඒ තැනැත්තාට ඒ දේපළෙහි ඇති සම්බන්ධතාවේ වටිනාකම පිළිබඳව ඒ තැනැත්තා විසින් මේ වගන්තිය යටතේ හෝ 167 වන වගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක්, ඒ දේපළෙහි හෝ ඒ සම්බන්ධතාවෙහි වටිනාකම ප්‍රශ්නයට භාජනය වී ඇති යම් නීති කෘත්‍යයක දී හෝ කාරණයක දී ප්‍රකාශය හෝ ප්‍රකාශනය කරන ලද දිනයේ දී හෝ එය කරනු ලැබුයේ යම් දිනයකට අදාළව ද ඒ දිනයේ දී ඒ දේපළෙහි තුබූ හෝ ඒ තැනැත්තාට දේපළෙහි ඇති සම්බන්ධතාවේ ඇතිව තුබූ වටිනාකම, ඒ ප්‍රකාශයෙහි හෝ ප්‍රකාශනයෙහි ඊට ආරෝපිත වටිනාකම බවට, ඒ ප්‍රකාශය හෝ ප්‍රකාශනය කළ තැනැත්තාට විරුද්ධව තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

පරීක්ෂණ පැවැත්වීම සඳහා සභාපතිවරයාට ඇති බලය.

**169.** (1) යම් වරිපනම් ගාස්තුවක් හෝ බද්දක් ගෙවීමට යම් තැනැත්තකුගේ බැඳීම පිළිබඳ තොරතුරක් නිශ්චිතව දැන ගැනීමේ හෝ එහි සත්‍යාසත්‍යභාවය තහවුරු කර ගැනීමේ කාර්යය සඳහා, එහි වරිපනම් බද්දට හෝ බද්ද යටත් වන හෝ යටත් යැයි සලකනු ලබන යම් ස්ථානයකට හෝ යම් බද්දක් ගෙවිය යුතු වන යම් වාහනයක්, සතකු හෝ වෙනත් දෙයක් ඇති හෝ ඇතැයි සැලකිය හැකි ස්ථානයකට හිරු උදාව හා හිරු බැසීම අතරතුර ඕනෑම වේලාවක, නගර සභාවේ සභාපතිවරයාට හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් නිලධරයකුට ඇතුළුවී එය පරීක්ෂා කර බැලිය හැකි ය.

1984 අංක 48 § 28

(2) මේ වගන්තිය අනුව ක්‍රියා කරන අතරතුර සභාපතිවරයාට හෝ එම කාර්යය සඳහා පත් කරන ලද නිලධරයාට නීත්‍යානුකූල සහන හේතුවක් නොමැතිව බාධා පමුණුවන **යම් තැනැත්තකු** රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය.

වරිපනම් බදු සහ බදු අයකර ගැනීම

[1971 අංක 48 § 22.]

**170.*** (1) නගර සභාවක් විසින් මේ ආඥාපනත යටතේ පනවා අය කරනු ලබන සියලු වරිපනම් බදු සහ බදු ද, සභාවක් විසින් බදු දෙනු ලැබ ඇති යම් ස්ථානයක් සම්බන්ධයෙන් අය විය යුතු සියලු ගෙවල් කුලී ද, සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, යටතේ අය කරගත යුතු සියලු ගාස්තු ද අය කර ගැනීම සඳහා වෙන පිළිවෙළක්, මේ ආඥාපනතින් හෝ ඒ යටතේ හෝ යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ නිශ්චිතව සලසා නොමැති අවස්ථාවක දී ඒවා මහා නගර සභා ආඥාපනත යටතේ වරිපනම් බදු, බදු සහ ගෙවල් කුලී අය කර ගත යුතු ආකාරයෙන් ම සභාවේ ලේකම් විසින් අය කර ගනු ලැබිය හැකි විය යුතු ය. තවද, වරිපනම් බදු, බදු සහ ගෙවල් කුලී අය කර ගැනීම හෝ අය නොකර අත්හැරීම සහ සභාවේ කුලී නිවැසියන්ගේ වාස බද්ද අවසාන කිරීම සම්බන්ධයෙන් අදාළ, එම ආඥාපනතේ 252 වන වගන්තියේ සිට 266 වන වගන්තිය දක්වා වූ වගන්තිවල සියලු විධිවිධාන, අවශ්‍ය මද වෙනස් කිරීම් සහිතව, ඒ අනුව අදාළ විය යුතු ය.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශ තුළ බල නොපැවැත්විය යුතු ය. එහි 76 වන වගන්තිය බලන්න.

*(2) රජයට අයත් වූ ද, යම් නගරයක් ඇතුළත පිහිටියා වූ ද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යම් නගරයක නගර සභාව විසින් මේ ආඥාපනත යටතේ පනවනු ලබන යම් වරිපනම් බද්දක් ගෙවීම ඒ දේපළේ බදු ගැනුම්කරු විසින් හෝ එහි පදිංචිකරු විසින් පැහැර හරිනු ලැබ ඇති සහ ඒ බදු ගැනුම්කරුගේ හෝ ඒ පදිංචිකරුගේ චංචල හෝ නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීම සඳහා (1) වන උපවගන්තියේ එවැනි අවස්ථාවල දී අදාළ කරවන නීතියේ විධිවිධාන අනුව වරෙන්තුවක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, මොන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ඒ බදු ගැනුම්කරුගේ හෝ පදිංචිකරුගේ යම් චංචල හෝ නිශ්චල දේපළක් තිබිය හැකි යම් ප්‍රදේශයක් තුළ, ඒ ප්‍රදේශය ඒ නගරයේ සීමා ඇතුළත පිහිටියත් නැතත්, ඒ වරෙන්තුව, එය නිකුත් කරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද ඒ නිලධරයා විසින් ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය.

නගර සභාවට අය විය යුතු ගෙවීම් අයකර ගැනීම.

[1971 අංක 48 § 28.]

**170අ.†** (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ යම් ආඥාපනතක් යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ යම් බද්දක්, දඩ මුදලක්, දණ්ඩන මුදලක්, දඩුවම් වශයෙන් වූ ගෙවීමක්, ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක, එකී යම් විධිවිධානයක හෝ එකී යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ බද්ද, දඩ මුදල, දඩුවමක් වශයෙන් වූ ගෙවීම, ගාස්තුව හෝ වෙනත් ගෙවීම අය කරගෙන එය නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම සභාවේ ලේකම්ගේ කාර්යය විය යුතු ය.

(2) මේ ආඥාපනත හෝ මේ ආඥාපනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් නොවන යම් ලිඛිත නීතියක් යටතේ යම් වරිපනම් බද්දක්, බද්දක්, කුලියක්, ගාස්තුවක්, අය බද්දක්, ජෛන්ද ගාස්තුවක්, දඩ මුදලක්, දඬුවමක් වශයෙන් වූ ගෙවීමක් හෝ වෙන යම් ගෙවීමක් නගර සභාවට අය විය යුතුව තිබෙන අවස්ථාවක, ඉහත කී ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ වරිපනම් බද්ද, බද්ද, කුලිය, ගාස්තුව, අය බද්ද, ජෛන්ද ගාස්තුව, දඩ මුදල, දඬුවමක් වශයෙන් වූ ගෙවීම හෝ වෙනත් ගෙවීම අය කර ගෙන එය නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම සභාවේ ලේකම් ගේ කාර්යය විය යුතු ය.

සභාවට අය විය යුතු මුදල් අය නොකර අත්හැර දැමීම.

**171.** යම් තැනැත්තකුගෙන් සභාවට අය විය යුතු (අය නොකර අත්හැර දැමීම සඳහා 170 වන වගන්තියෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති මුදලක් නොවන) යම් මුදලක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් නොසැලකිය යුතු තරම් සැයි හෝ අය කර ගත නොහැකි යැයි හෝ එය ගෙවීමට බැඳී සිටින තැනැත්තාගේ දරිද්‍රතාව හේතුකොටගෙන ඒ මුදල ලියා අත්හැරිය යුතු යැයි හෝ සභාවට පෙනී ගියහොත්, සභාව විසින් යෝජනා සම්මතියක් මගින් එය අය නොකර අත්හැර දමනු ලැබිය හැකි ය.

විධිමත්භාවයේ අඩුපාඩුවක නිසා වරිපනම් බදු ආදිය දෝෂාභියෝගයට ලක් නොවිය යුතු බව.

**172.*** මේ ආඥාපනතේ බලය යටතේ වූ කිසි ම තක්සේරුවක් හෝ අයැදුමක් හෝ වරිපනම් බද්දක් නොහොත් බද්දක් අය කර ගැනීමක් හෝ ගෙවන ලෙස ඉල්ලා සිටීමක් සහ තහනමට ගෙන විකිණීමක්, ඒ වරිපනම් බද්ද හෝ බද්ද ගෙවීමට බැඳී සිටින යම් තැනැත්තකුගේ නමේ හෝ ඒ වරිපනම් බද්දට හෝ බද්දට යටත් යම් දේපළක් හෝ දෙයක් පිළිබඳ විස්තරයක යම් වැරදීමක් හෝ තක්සේරු මුදලෙහි යම් වැරදීමක් හෝ විධිමත් භාවය පිළිබඳ වෙන යම් වැරදීමක් හේතුකොටගෙන දෝෂාභියෝගයට ලක් නොවිය යුතු අතර බල රහිතවීමට ද යටත් නොවිය යුතු ය.

ණය

වරිපනම් බදු සහ බදු ඇපයට තබා මුදල් ණයට ගැනීමට නගර සභාවට ඇති බලය.

**173.** (1) නගර සභාවක් විසින් ඒ නගර සභාවේ කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි මුදලක් හෝ මුදල් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන්ගෙන් හෝ සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ පුද්ගල මණ්ඩලයකින්, අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව, ණයට ගනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

එසේ වුව ද, ඒ සභාව විසින් එවකටත් ලබාගෙන ඇති සියලු ණය මුදල් සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති ගණන, යම් මුදලක් ණයට ගැනීමට බලාපොරොත්තු වන වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය තුන ඇතුළත සභාව විසින් ලබාගනු ලැබූ සම්පූර්ණ ආදායමට වැඩි නොවන්නේ නම්, එකී මුදල ණයට ගැනීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවිය යුතු ය.

(2) නගර සභාවක් විසින් ලබාගනු ලබන සෑම ණය මුදලක් ම, එම අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ලබාගත් විටක නම් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි සහ වෙනා යම් විටක නම් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පොලී ප්‍රමාණයකට සහ ඒ ණය මුදල ආපසු ගෙවීමේ කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(3) නගර සභාවක් විසින් ණයට ගනු ලැබූ මුදලක් හෝ මුදල් හෝ ඉන් කොටසක් එසේ ණයට දෙනු ලැබිය හැකි වන්නේ යම් ණයට දෙන්නකු හෝ ණයට දෙන්නන් විසින් ද නැති නම් ඔවුන් වෙනුවෙන් ද එකී ණයට දෙන්නා හෝ ණයට දෙන්නන් වෙත, මේ ආඥාපනත යටතේ අය කරගනු ලබන හෝ පනවනු යම් වරිපනම් බද්දක් හෝ බද්දක මුදල හෝ ඉන් යම් කොටසක් හෝ සභාවට අයත් යම් දේපළක් හෝ සභාවට උපචිත වන වෙන යම් ආදායම් ප්‍රභවයක් හෝ ඉන් යම් කොටසක්, ඒ මුදල හෝ මුදල් සහ ඒ සඳහා එකතු වන පොලිය ආපසු ගෙවීම ආරක්ෂණය කිරීමේ කාර්යය සඳහා සභාව විසින් උකස් කොට පවරා දෙනු ලැබිය හැකි ය.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශවලට අදාළවීම ලිහිල් කරන ලදි. එහි 76 වන වගන්තිය බලන්න.

* වරිපනම් සහ තක්සේරු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රදේශතුළ බල නොපැවැත්විය යුතුය.. එහි 76 වන වගන්තිය බලන්න.

† මෙය ව්‍යවස්ථාපිත අංකයක් නොව හුදෙක් පහසුව සඳහා යොදන ලද අංකයකි. 1971 අංක 48 ආඥාපනතේ 28 වන වගන්තිය බලන්න

ණයට ගැනීමේ බලතල සීමාකිරීම.

**174.** (1) යම් නගර සභාවකින් අය විය යුතු (මේ ආඥාපනතේ වුව ද වෙන යම් ප්‍රඥප්තියක වුව ද බලය යටතේ ලබා ගනු ලැබූ) සියලු ණය සම්බන්ධයෙන් යම් විටක ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණයේ සමස්තය කලින් වූ වසර අවුරුද්ද සඳහා සියලු වරිපනම් බදුවලින්, බදුවලින්, දේපළවලින් සහ වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් සභාවට ලැබුණු සාමාන්‍ය වාර්ෂික ආදායමෙන් දස ගුණයක සමස්තයට හෝ, අවුරුදු පහකට වඩා නොපැවැති නගර සභාවක් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, සභාව විසින් තක්සේරු කරන ලද එවැනි එක් අවුරුද්දක ආදායමෙන් දස ගුණයක සමස්තයට හෝ නොවැඩි විය යුතු ය.

එසේ වුව ද, යම් නගර සභාවක ණය සම්බන්ධයෙන්, ඒ සභාව සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ණය ගැති වී සිටින යම් විටක, මේ වගන්තියෙන් නියම කොට ඇති සීමාව, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක සඳහන් කරනු ලැබිය හැකි ප්‍රමාණයක් දක්වා ඉක්මවන ලෙස, ඒ නියමය මගින් බලය දෙනු ලැබිය හැකි ය.

(2) මේ කොටස යටතේ වූ ණය සම්බන්ධයෙන් දෙනු ලබන සියලු සුරැකුම් පත් ; මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

ණය ලබා ගැනීම සම්බන්ධයෙන් වූ සභාවේ බලතල සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කළහැකි අවස්ථා.

[1977 අංක 24 § 31.]

**174අ.** නගර සභාවට නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන යම් වැඩක් කිරීමේ කාර්යය සඳහා ණයක් ලබාගැනීම අනුමත කිරීම සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත්, සභාපතිවරයා විසින්, කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව, එම ණය ලබාගත හැකි අතර, 173 වන සහ 174 වන වගන්තිවල විධිවිධාන යටතේ සභාව වෙත පැවරී ඇති සියලු බලතල, එම බලතල සභාපතිවරයා වෙත එම වගන්තිවලින් පැවරී ඇත්තක් සේ සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

සුරැකුම්පත් ආදියෙහි ආකෘතිය.

**175.** මේ කොටස යටතේ යම් ණයක කාර්යයක් සඳහා දෙනු ලබන යම් සුරැකුම් පතක ආකෘතිය සහ ඒ සුරැකුම් පත ක්‍රියාත්මක කිරීමේ ආකාරය ද, ණයට ගත් යම් මුදල් ආපසු ගෙවීමේ ක්‍රමය සහ පිළිවෙළ ද යම් ණයක් ගෙවා නිම කිරීමේ වැඩ පිළිවෙළ ද, මේ ආඥාපනත යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවලින් හෝ නියෝග වලින් නියම කරනු ලැබිය හැකි පිළිවෙළකට සහ එබඳු යම් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග නොමැති විටක, මහ නගර සභා ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව සහ එමෙන් ම ප්‍රාදේශීය ණය සහ සංවර්ධන ආඥාපනතේ විධිවිධාන වලට යටත්ව ද විය යුතු අතර, එකී විධිවිධාන, අවශ්‍ය මද වෙනස් කිරීම් සහිතව, මේ ආඥාපනත යටතේ යම් නගර සභාවකට දුන් යම් ණයක් සම්බන්ධයෙන් එබඳු අවස්ථාවල දී අදාළ විය යුතු ය.





## ගිණුම්, ඇස්තමේන්තු සහ අය වැය ලේඛනය

සභාව විසින් ගිණුම් පොත් තබා ගත යුතු බව.

**176.** (1) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් යුක්ත පොතක් හෝ පොත් සපයා නගර සභා කාර්යාලයේ තබා ගත යුතු බවත් සභාව විසින් ලබාගෙන මේ ආඥාපනතේ කාර්යයන් සඳහා හෝ ඒ වෙනුවෙන් වැය කරන ලද සියලු මුදල් පිළිබඳ සහ ඒ මුදල් ගෙවනු ලැබුයේ යම් භාණ්ඩ, ද්‍රව්‍ය සහ දේවල් වෙනුවෙන් ද ඒ භාණ්ඩ, ද්‍රව්‍ය සහ දේවල් පිළිබඳ සත්‍ය සහ විධිමත් ගිණුම් ඒ පොත්වල ඇතුළත් කළ යුතු බවත් සෑම නගර සභාවක් විසින් ම කලින් කල නියම කොට විධාන කළ යුතු ය.

(2) නගර සභාවක ගිණුම් පොතක් හෝ පොත් බලය ඇති අධිකරණයක කැඳවීම් නියෝගයක් අනුව හැර යම් හේතුවක් නිසා හෝ කවර හෝ ව්‍යාජයක් යටතේ හෝ සභා කාර්යාලයෙන් පිටත ගෙන නොයා යුතු ය.

(3) නගර සභාවක ගිණුම් පොතක් හෝ පොත් සියලු සාධාරණ වේලාවන්හි සභාවේ සභිකයන් විසින් සහ සභාව විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුළත පදිංචි සෑම ගෘහමූලිකයකු විසින් ම පරීක්ෂා කරනු ලැබීම සඳහා තබා තිබිය යුතු අතර, සභාවේ යම් සභිකයකු හෝ එකී යම් ගෘහමූලිකයකු විසින් එකී පොතක හෝ පොත්වල පිටපත් හෝ උධෘත කිසිදු ගෙවීමක් නොමැතිව ලබාගත හැකි ය.

වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.

**177.** (1) සෑම නගර සභාවක් විසින් ම එක් එක් වර්ෂයේ ජනවාරි මාසය තුළ දී හෝ කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව සභාව විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් කාල සීමාවන් ඇතුළත දී, පෙරාතුව ම වූ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයෙන් අවසාන වන වර්ෂය තුළ හෝ කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව සභාව විසින් විධාන කරනු ලැබිය හැකි දොළොස් මාසයක් වූ වෙනත් කාල සීමාවක් තුළ, මේ ආඥාපනත ප්‍රකාර ලැබුණු සහ ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ සත්‍ය ගිණුමක් සහ එදිනට වූ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කිරීමට සැලැස්විය යුතු අතර, සභාවේ සභාපතිවරයා විසින් හෝ ඒ කාර්යය සඳහා සභාව විසින් පත් කරනු ලැබිය හැකි සභාවේ වෙනත් නිලධරයකු විසින් යම් සම්ප්‍රදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේ දී දිවුරුම් පිට සත්‍යයනය කරන ලද සහ නිවැරදි බවට සභාවේ එක් සභිකයකු විසින් සහතික කරන ලද එම ගිණුමේ සහ ප්‍රකා

ශයේ පිටපතක් හෝ අනුපිටපතක් සභාවේ තැන්පත්ව තැබිය යුතු ය. තවද ඒවා සභාව විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුළත පදිංචි යම් ගෘහමූලිකයකු හෝ සම්බන්ධතාවක් දක්වන යම් පාර්ශ්වකරුවකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා තබා තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුමේ සහ ප්‍රකාශයේ සාරාංශයක්, මහජනයා විසින් දැන ගැනීම් සඳහා, ඊට පසුව එළඹෙන මාර්තු මස පළමුවන දිනට පෙර හෝ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සභාව විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් දිනයකට පෙර, ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

අය වැය ලේඛණය.

178. (1) සෑම නගර සභාවක සභාපතිවරයා විසින්, එක් එක් වර්ෂයක් තුළ, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් යුක්ත වූ ද,

(අ) නිසි අය ශීර්ෂ යටතේ විෂයාංක සහිතව, පිළියෙල කළ යෝජිත වියදම් පිළිබඳ විස්තර;

(ආ) වරිපනම් බදු නොවන ප්‍රභවයන්ගෙන් සභාවට ලැබෙන ආදායම් පිළිබඳ ඇස්තමේන්තුවක්;

(ඇ) යෝජිත වියදම් සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍ය වරිපනම් බදුවල හෝ බදුවල ඇස්තමේන්තුවක්

ඇතුළත් වූ ද, ඊළඟ අනුප්‍රාප්ති වර්ෂය සඳහා වූ අය වැය ලේඛනයක් සභාවේ අතුරු ව්‍යවස්ථාවලින් හෝ 193 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලින් නියම කරනු ලැබ ඇති දිනයේ දී හෝ ඊට පෙර පිළියෙල කොට සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් වර්ෂයක් අතරතුර යම් අලුත් වැය විෂයාංකයක් හෝ විෂයාංක ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන කවර විටක වුව ද, සභාපතිවරයා විසින්, යෝජිත වියදමේ විස්තර ඇතුළත් පරිපූරක අය වැය ලේඛනයක් පිළියෙල කොට සභාවට ඉදිරිපත් කළ යුතු ය.

[1979 අංක 13 § 2.]

(3) නගර සභාවක සෑම වාර්ෂික අය වැය ලේඛනයක ම හෝ පරිපූරක අයවැය ලේඛනයක ම පිටපතක් නගර සභා කාර්යාලයේ දී පරීක්ෂා කිරීම සඳහා තබා තිබිය යුතු ය.

අය වැය ලේඛණය සම්බන්ධයෙන් සභාපති වරයාගේ බලතල.

[1977 අංක 24 § 132.]

178අ. මේ අය වැය ලේඛනයක හෝ පරිපූරක අය වැය ලේඛනයක සියලු ම විෂයයන් හෝ ඉන් යම් විෂයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඊට යම් විෂයයක් එක් කරනු ලැබුවහොත්, සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවන්නේ නම්, ඔහු විසින් එම අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය නව දුරටත් සලකා බැලීම සඳහා සභාව වෙත නැවතත් ඉදිරිපත් කළ යුතු ය. අය වැය ලේඛනයක් හෝ පරිපූරක අය වැය ලේඛනයක් නැවතත් සභාවට ඉදිරිපත් කරනු ලැබ එය එසේ





නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් සති දෙකක් ඇතුළත සම්මත කරනු නොලැබූ අවස්ථාවක, එම අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය, එය සභාව විසින් සම්මත කරනු නොලැබීම නො තකා සභාවේ යථා පරිදි පිළිගන්නා ලද අය වැය ලේඛනය හෝ පරිපූරක අය වැය ලේඛනය ලෙස සැලකිය යුතු ය.

අය වැය ලේඛණයේ යෝජිත වියදම් වල වෙනස් කිරීම.

[1977 අංක 24 § 133.]

179. අවශ්‍යතාවක් ඇති වූ විටක කවර වර්ෂයක දී වුව ද ඒ වර්ෂය සඳහා පිළිගනු ලැබ ඇති අය වැය ලේඛනයේ හෝ යම් පරිපූරක අය වැය ලේඛනයක හෝ කවර ශීර්ෂයක් යටතේ වුව ද වියදම් අඩු කිරීමේ හෝ වැඩි කිරීමක්, අය වැය ලේඛනයේ එක් ශීර්ෂයක් යටතේ විසර්ජන කොට ඇති මුදල වෙනත් යම් ශීර්ෂයක් යටතට මාරු කිරීමක්, එකී අය වැය ලේඛනයෙන් හෝ පරිපූරක අය වැය ලේඛනයෙන් අනුමත කර ඇති මුළු වියදම් ප්‍රමාණ නොඉක්මවන බවට වග බලා ගනිමින් සභාපතිවරයා විසින් කළ හැකි ය.

වාර්ෂික පරිපාලන වාර්තාව.

180. (1) සෑම නගර සභාවක ම සභාපතිවරයා විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසුව හැකිතාක් ඉක්මණින්, එය මුදල් වර්ෂය ඇතුළත ප්‍රදේශීය අරමුදල නිධියෙන් ලැබුණු හෝ වියදම් වූණු මුදල්වල ස්වභාවය සහ ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයන් ද සමග එම වර්ෂය ඇතුළත සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් පිළියෙල කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කොට ඇති වාර්තාව සහ ප්‍රකාශය, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් යුක්ත විය යුතු අතර, ඒවා සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තවද, ඒවා පළමුවෙන් සභාවට ඉදිරිපත් කරන ලද දිනයේ සිට සති හයක් ඇතුළත හෝ කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් කාල සීමාවක් ඇතුළත, ඒවා ඒ සම්බන්ධයෙන් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි යම් යෝජනා සම්මත ද සමග, කොමසාරිස්වරයා මගින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## විගණනය

විගණනය.

181. (1) සෑම නගර සභාවක ම ගණන්, ආණ්ඩුව විසින් මුදල් වර්ෂයේ එක් එක් අර්ධයක් ඇතුළත විගණනය කළ යුතු අතර, සෑම නගර සභාවක් විසින් ම, යම් මුදල් වර්ෂයක යම් අර්ධයක් සඳහා වන එක් එක් විගණනයක් සම්බන්ධයෙන්, පහත සඳහන් අයුරින් ගණන් බලන ලද ගාස්තුවක් ඒ විගණනය පිළිබඳ පිරිවැය වෙනුවෙන් දායක මුදලක් වශයෙන් ආණ්ඩුවට ගෙවිය යුතු ය. එනම්:—

(අ) එබඳු යම් මුදල් වර්ෂයක් තුළ නගර සභාවක ආදායමෙහි සමස්තය රුපියල් හැත්තෑපන් දහසකට සමාන වන හෝ ඊට අඩු වන අවස්ථාවක දී, ඒ ආදායමේ ප්‍රමාණයෙන් සියයට එකක්; සහ

(ආ) එබඳු යම් මුදල් වර්ෂයක යම් අර්ධයක් තුළ නගර සභාවක ආදායමෙහි සමස්තය රුපියල් හැත්තෑපන් දහසකට වැඩි වන අවස්ථාවක දී, ඒ ආදායමෙහි පළමු වන රුපියල් හැත්තෑ පන් දහස සඳහා සියයට එකක් සහ ඒ ආදායම රුපියල් හැත්තෑ පන් දහස ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද ඒ ප්‍රමාණය සඳහා සියයට භාගයක් ද

වශයෙනි.

(2) මේ ආඥාපනත යටතේ ගණන් විගණනය කිරීමේත් පරීක්ෂා කිරීමේත් කාර්යය සඳහා තමන්ට අවශ්‍ය යැයි විගණකවරයා විසින් සලකනු ලබන සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම් වවුචර හා වෙනත් ලේඛන සහ ලියකියවිලි තමන් වෙත ඉදිරිපත් කරන ලෙස ඒ විගණකවරයා විසින් ලිඛිත කැඳවීම් නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි අතර, ඒ පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම් වවුචර, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් තබාගෙන සිටින නැතහොත් ඒවා වග කිව යුතු ඕනෑම තැනැත්තකුට එකී විගණනයේ දී සහ පරීක්ෂා කිරීමේ දී හෝ අබාලව කල් තබනු ලැබූ එකී විගණනයේ දී සහ පරීක්ෂා කිරීමේ දී ඒ විගණකවරයා ඉදිරියට පැමිණ එකී පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම් වවුචර, ලේඛන හෝ ලියකියවිලි සම්බන්ධයෙන් ප්‍රකාශයක් කොට එම ප්‍රකාශය අත්සන් කරන ලෙස ද නියම කරනු ලැබිය හැකි ය.

ඒ සෑම ප්‍රකාශයක් ම මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියම කරන ලද පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර, ලේඛන හෝ ලියකියවිලි කිසිවක් එසේ ඉදිරිපත් කිරීම හෝ නියම කළ පරිදි ප්‍රකාශයක් කිරීම හෝ ප්‍රකාශයක් අත්සන් කිරීම හෝ යම් තැනැත්තකු විසින් නොසලකා හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්, ඔහු රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු අතර, එම වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩවා කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සියයකට නොවැඩි තවත් දඩයකින් ද දඬුවම් ලැබිය යුතු ය.

[1984 අංක 48 § 29.]

[1984 අංක 48 § 29.]

අධිභාර අය කර ගනු ලැබීම.

**182.** (1) මේ කොටස අනුව ක්‍රියා කරන්නා වූ සෑම විගණකවරයකු ම, ගිණුම්වලට එන, නීතියට පටහැනි යම් විෂයයක් සඳහා ඉඩ දීම ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තාට විරුද්ධ ව හෝ ඒ නීති විරෝධී ගෙවීම් කළ නොහොත් ඊට බලය දුන් තැනැත්තාට විරුද්ධව ඒ ගෙවීම් අධිභාර කිරීමට ඔහු විසින් නියම කළ හැකි ය. තව ද යම් තැනැත්තකුගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතු කොට ගෙන ඇති වූ අඩුවක් නොහොත් පාඩුවක් ඒ තැනැත්තාගෙන් අය කර ගැනීමටත් ඒ තැනැත්තා විසින් ගණන් පෙන්විය යුතු ව තිබුණු, එහෙත් එසේ ගණන් පෙන්වා නැති, යම් මුදලක් ඔහුගෙන් අයකරගැනීමටත් ඒ විගණකවරයා විසින් නියම කළ යුතු අතර, ඒ එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අය විය යුතු මුදල් ප්‍රමාණය කොතෙක් දැයි විගණකවරයා විසින් සහතික කළ යුතු ය.





(2) විගණකවරයා විසින්, යම් තැනැත්තකුට විරුද්ධ ව යම් කරුණක් සම්බන්ධයෙන් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ අධිභාර කිරීමක් කිරීමට ප්‍රථම සුදුසු යැයි ඔහු සිතන පරිදි, ඒ කරුණ සම්බන්ධයෙන් නිදහසට කරුණු කියා සිටීමට හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඒ තැනැත්තාට සලස්වා දිය යුතු අතර, එකී ප්‍රතික්ෂේප කිරීමට හෝ අධිභාර කිරීමට තීරණය කළහොත් ඒ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අධිභාර කිරීමේ තීරණයට හේතු සපයන ලෙස විගණකවරයාගෙන් ඉල්ලා සිටි විටක දී ඔහු විසින් ඒ තැනැත්තාට එම හේතු ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අභියාචනය කිරීම සහ අධිභාර බලාත්මක කිරීම.

**183.** (1) යම් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමකින් හෝ අධිභාර කිරීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි අතර, අභියාචනාධිකරණය විසින් ඒ ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම ස්ථිර කළ හැකි ය. නැතහොත් ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම නීතියට අනුකූල නොවේ යැයි අභියාචනාධිකරණයේ මතය වුවහොත්, ඒ අනුව,, ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාරය කිරීම මඳ ලෙස වෙනස් කළ හැකි ය ; නැතහොත් ඉවත ලිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම, දිසා අධිකරණවල අතුරු ආඥාවලට විරුද්ධව කෙරෙන අභියාචනා සඳහා නියම කරනු ලැබ ඇති සහ ඒ අභියාචනාවල දී පිළිපදිනු ලබන කාලය ඇතුළත ද පිළිපදිනු ලබන ආකාරයෙන් ද පිළිපදිනු ලබන රීතිවලට යටත්ව ද ඉදිරිපත් කිරීම, පවත්වාගෙන යෑම සහ බලාත්මක කිරීම කළ යුතු අතර, ඒ පිළිබඳව ආරම්භ කෙරෙන සියලු නීති කෘත්‍ය, දිසා අධිකරණයක් වෙත කෙරෙන අභියාචන යටත් වන මුද්දර ගාස්තුවලට ම යටත් විය යුතු ය.

(3) අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් විගණකවරයාගේ තීරණය දැනුම් දුන් දින සිට දවස් තිහක් ඇතුළත, (1) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් වෙනුවට, ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, එබඳු අභියාචනයක් කරනු ලැබූ විට, විවාදයට භාජනව ඇති ප්‍රශ්නය ගැන ඒ අවස්ථාවේ ඇති යහගුණ අනුව අමාත්‍යවරයා විසින් තීරණයක් කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය. තවද, යම් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ අධිභාර කිරීමක් නීත්‍යනුකූලව කර ඇති බවත්, එනමුත් ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම අත් හැර දැමීමට තරම් සාධාරණ වන අවස්ථා යටතේ එහි විෂය කරුණ සෑදී ඇති බවත් අමාත්‍යවරයාට පෙනී ගියහොත්, ඒ ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම බලාත්මක කිරීමෙහි ලා

විගණකවරයා විසින් දරනු ලැබ තිබිය හැකි යම් වැයක් වුවහොත් එය ගෙවීමට ද යටත් ව, එම ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම හෝ අධිභාර කිරීම අත්හැර දැමිය යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය. තව ද අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් නියමයක් යටතේ යම් තැනැත්තකුගෙන් ලබා ගන්නා ලෙස විධානය කරනු ලැබ ඇති යම් මුදල් ප්‍රමාණයක්, අය විය යුතු ලෙස විගණකවරයකු විසින් සහතික කරන ලද යම් මුදලක් මේ වගන්තියේ විධිවිධානය යටතේ අය කර ගත හැකි ආකාරයෙන් ම කොමසාරිස්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් නොපමාව අය කර ගත හැකි ය.

(4) යම් නගර සභාවක් විසින් ගෙවන ලද යම් වියදමක් අමාත්‍යවරයා විසින් සම්මත කර තිබුණේ නම්, විගණකවරයා විසින් ඒ වියදමට ඉඩ දීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(5) මේ ආඥාපනත යටතේ යම් තැනැත්තකුගෙන් අය විය යුතු ලෙස විගණකවරයකු විසින් සහතික කරනු ලබන සෑම මුදලක් ම, එම තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර, මුදල ගැන එසේ සහතික කිරීමෙන් පසු දවස් දහහතරක් ඇතුළත ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර, ඒ මුදල එසේ නොගෙවුවහොත් මෙන් ම එබඳු අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, යම් තැනැත්තකුගෙන් ඒ මුදල අය විය යුතු ලෙස එසේ සහතික කරනු ලැබී ද ඒ තැනැත්තාගෙන් ඒ මුදල අය කර ගැනීම කොමසාරිස්වරයාගේ හෝ කොමසාරිස්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු ය. තවද, අය විය යුතු ලෙස එසේ සහතික කරනු ලබන යම් මුදලක්, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයකුට* ඉල්ලීමක් කිරීමෙන් පසුව, එය බලාත්මක කිරීමෙහි ලා වැය වුණු සියලු ගාස්තු සහ වියදම් සමග, ඒ මහේස්ත්‍රාත්වරයා* විසින් පනවනු ලබන දඩයක් අය කරගන්නා ආකාරයෙන් ම අය කර ගත යුතු ය.

(6) යම් ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ අධිභාර කිරීමක් බලාත්මක කිරීමෙහි ලා දරන ලද ගාස්තු සහ වියදම් වශයෙන් ගෙවන ලද හෝ අය කර ගන්නා ලද මුදලක් නොවන්නා වූ ද මේ වගන්තිය යටතේ ගෙවනු ලැබූ හෝ අය කර ගනු ලැබුවා වූ ද සෑම මුදලක් ම සභාවේ ප්‍රාදේශීය අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

* අධිකරණ සංවිධාන පනතේ 32 වන වගන්තිය ද බලන්න.





## VIII වන කොටස

### මධ්‍ය පාලනය

සභාපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සහ නගර සභාව විසුරුවා හැරීම.

1977 අංක 24 134.]

184. (1) කවර අවස්ථාවක දී වුව ද,—

(අ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම්වලට පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ, සභාපතිවරයා විසින් හෝ යම් නගර සභාවක් විසින් හෝ නගර සභාවක සභිකයකු විසින් හෝ නිරතුරුව ම ප්‍රතික්ෂේප කර තිබීම ; හෝ

(ආ) මේ ආඥාපනත මගින් නියම කර ඇති කාර්යය ඉටු කිරීම සභාපතිවරයා විසින් හෝ යම් නගර සභාවක් විසින් හෝ නගර සභාවක යම් සභිකයකු විසින් හෝ ඕනෑකමින් ම නොසලකා හැර තිබීම හෝ එම කාර්ය ඉටු කිරීමේ දී විෂමාචාර සිදු කර තිබීම ; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ නැතහොත් කොමසාරිස්වරයාගේ නියමයන්ට, උපදෙස්වලට හෝ නිර්දේශයන්ට සභාපතිවරයා හෝ යම් නගර සභාවක් හෝ නගර සභාවක යම් සභිකයකු හෝ නිරතුරුව ම අකීකරු වීම නැතහොත් ඒ නියමයන්, උපදෙස් හෝ නිර්දේශ නොතකා හැරීම ; හෝ

(ඈ) සභාපතිවරයාගේ හෝ යම් නගර සභාවක හෝ නගර සභාවක යම් සභිකයකුගේ හෝ අදක්ෂතාව සහ නොමනා පාලනය ; හෝ

(ඉ) මේ ආඥාපනත මගින් පිරිනමා ඇති බලතල කිසිවක් සභාපතිවරයා විසින් හෝ යම් නගර සභාවක් විසින් හෝ නගර සභාවක යම් සභිකයකු විසින් හෝ අනිසි ලෙස යොදවා තිබීම

පිළිබඳ ව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට අමාත්‍යවරයා හැඟීමට පත් වුවහොත්, ඒ එක් එක් අවස්ථාවට අවශ්‍ය පරිදි අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(i) සභාපතිවරයා ධුරයෙන් පහ කළ හැකිය ; නැතහොත්

(ii) සභාවේ සියලු ම සභිකයන් හෝ ඔවුනතුරෙන් යම් සභිකයකු හෝ ධුරයෙන් පහ කළ හැකි ය. එවිට 12 (3) වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය; එසේ නැතහොත්

(iii) සභාව විසුරුවා හැරිය හැකි ය.

තවද, ඒ නියමය හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුව හමුවෙහි තැබිය යුතු ය.

[1977 අංක 24 § 134.]

(1අ). අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, (1) වන උපවගන්තියේ සඳහන් යම් කිසි කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත් වීම් වස්, ඒ කාරණය ගැන මාස තුනක් වූ කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු පත් කළ යුතු ය. එසේ පත් කරන ලද නිලධරයාට, ඒ පරීක්ෂණයට අදාළ ව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිසමක බලතල ඇත්තේ ය.

[1977 අංක 24 § 134.]

(1ආ) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විශ්‍රාම ලත් අධිකරණ නිලධරයකු (1අ) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විටක, ඒ එක් එක් අවස්ථාවට අවශ්‍ය පරිදි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් අමාත්‍යවරයා විසින්,—

(i) සභාපතිවරයාගේ ධුරය තාවකාලිකව නතර කොට, සභාපතිවරයාගේ කාර්ය ඉටු කිරීමට හා ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමට උපසභාපතිවරයාට හෝ උපසභාපතිවරයාගේ ධුරය හිස් වී ඇති අවස්ථාවක හෝ උපසභාපතිවරයාගේ ධුරය තාවකාලිකව නතර කොට ඇති අවස්ථාවක, ඒ ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට නියම කළ හැකි ය; නැතහොත්

(ii) යම් සභිකයකුගේ ධුරය තාවකාලිකව නතර කළ හැකි ය; එසේත් නැතහොත්

(iii) සභාව තාවකාලික ව නතර කොට, සභාවේ සහ එහි සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්ය ඉටු කිරීමටත් ඒ ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය.

(ආ) එසේ (1අ) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තාගේ වාර්තාව ලැබුණු පසු, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කළ හැකි ය; නැතහොත් මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ කළ නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විධාන සහ පරිපූරක, ප්‍රාසංගික සහ ආනුෂංගික විධිවිධාන ඒ නියමයෙහි ඇතුළත් විය යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට, ඊට නීතියේ බලය ඇති විය යුතු ය.





[1977 අංක 24 § 134.]

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් නගර සභාවක සභාපතිවරයා ධුරයෙන් පහ කරනු ලැබූ විටක, ඒ සභාපතිවරයා සභාපති ධුරය මෙන් ම සභාවේ සභික ධුරය ද වහාම හිස් කළ ලෙස සලකනු ලබන අතර, ඒ සඳහා තත් කාලයෙහි වලංගු ව පවත්නා ලිඛිත නීතියේ විධිවිධාන එවිට ඒ පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් නගර සභාවක යම් සභිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබ එසේ ඉවත් කරන ලද සභිකයා වෙනුවට ඒ නියමය අනුව අලුත් සභිකයකු තෝරාපත් කරගනු ලැබූ අවස්ථාවක දී, ඒ අලුත් සභිකයා අමාත්‍යවරයා විසින් මුල් සභිකයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිණි නම් ඔහු ධුරයෙන් ඉවත් විය යුතු දිනයේ දී ධුරයෙන් ඉවත් විය යුතු ය.

[1971 අංක 43 § 4.]

(4අ) (අ) යම් තැනැත්තකු සභාපති ධුරයෙන් හෝ සභාවේ සභික ධුරයෙන් ඉවත් කරමින් (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින්, මුලින් සඳහන් නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි අතර, ඒ තදනන්තර නියමය ගැසට් පත්‍රයෙහි පළ කිරීම නිසා පහත සඳහන් ප්‍රතිඵලය සහ ඒ ප්‍රතිඵලය පමණක් ඇති විය යුතු ය. එනම්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොතකා, ඒ නියමය පළ කරනු ලැබූ දින සිට ඉහත කී (3) වන උපවගන්තියෙහි දැක්වෙන නුසුදුසු වීමට ඒ තැනැත්තා යටත් වීම නතර විය යුතු ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධාන මේ ආඥාපනතේ හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ වෙනත් යම් විධිවිධාන සමග සට්ටනය වන හෝ විධිවිධානවලට අනනුකූල වන අවස්ථාවක (අ) ඡේදයේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් නගර සභාවක් විසුරුවා හරින ලද අවස්ථාවක දී, ඔහු විසින් ඒ නියමය මගින් හෝ තදනන්තර නියමයක් මගින්—

(අ) නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූයේ යම් නගරයක් සඳහා ද ඒ නගරයේ කටයුතු පරිපාලනය කිරීමට සහ ඒ කාර්යය සඳහා ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කළ හැකි කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත්ව, මේ ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාත්මක කිරීම

වත්, යුතුකම් ඉටු කිරීමටත් නිශ්චිත කාලයක් සඳහා හෝ කලින් කල හෝ විශේෂ කොමසාරිස්වරයෙකු හෝ කොමසාරිස්වරුන් පත් කිරීම, සහ

(ආ) ඔහු විසින් යෝග්‍ය යැයි සලකනු ලැබිය හැකි වඩා වැඩි හෝ වඩා අඩු සංඛ්‍යාවකින් සමන්විත අලුත් නගර සභාවක් එම නගරය සඳහා සංස්ථාපනය කිරීම පිණිස අවශ්‍ය විය හැකි විධාන දීම, හෝ

(ඇ) නගරයේ සීමා පටු කිරීම හෝ පුළුල් කිරීම හෝ නැවත නිරූපණය කොට නැවත නිරූපිත නගරය සඳහා නගර සභාවක් සංස්ථාපනය කිරීම පිණිස අවශ්‍ය විය හැකි විධාන දීම

කරනු ලැබිය හැකි ය.

[1961 අංක 1 § 2.]

(5අ) (5) (අ) වන උපවගන්තියේ කාර්යයන් සඳහා, "නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබුයේ යම් නගරයක් සඳහා ද ඒ නගරයේ" යන්නෙන්, විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් පත් කරනු ලැබීමෙන් පසුව 14 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ඒ නගරයට එකතු කරන ලද යම් ප්‍රදේශයක් ද ඇතුළත් වන බව සලකනු ලැබිය යුතු ය.

1968 අංක 42 § 5.]

[1957 අංක 2 § 2.]

[1968 අංක 42 § 5]

(6) නගරයක නගර සභාවක් විසුරුවා හරින ලද විටක එම නගරයේ කටයුතු පරිපාලනය කිරීමට අමාත්‍යවරයා විසින් යම් විශේෂ කොමසාරිස්වරයකු හෝ කොමසාරිස්වරුන් පත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් ඒ විසුරුවා හරින ලද නගර සභාවේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ නගර සභාව වෙත හෝ එහි සභාපතිවරයා වෙත මේ ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පැවරී ඇති සියලු දේපළ සහ ගිවිසුම් යටතේ වූ අයිතිවාසිකම් ද සියලු බලතල ද ඒ විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් වෙත පැවරී ඇති ලෙස සලකනු ලැබීම ද මේ ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ නගර සභාවේ හෝ එහි සභාපතිවරයාගේ සියලු බැඳීම් හා කාර්ය ඒ විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් වෙත මාරු කරනු ලැබූ ලෙස සලකා ඒ නියමයෙහි සඳහන් කාල සීමාව අවසන් වන තෙක් හෝ අමාත්‍යවරයා විසින් අන් ලෙසක් නිශ්චය කරන තෙක් ඒ කාර්ය ඉටු කිරීම ද ඔහුගෙන් හෝ ඔවුන්ගෙන් සිදු විය යුතු ය. තවද 236 වන වගන්තියේ සිට 244 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන, විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් පත් කිරීම සම්බන්ධයෙන් වූ විට, ඒ වගන්තිවල නගර සභාවක් පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් පිළිබඳ සඳහන් කිරීමක් වූවාක් මෙන් සහ ඒ වගන්තිවල පළාත් පාලන ආයතනයක් හෝ ආයතන පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම විසුරුවා හරිනු ලැබූ නගර සභාව පිළිබඳ සඳහන් කිරීමක් වූවාක් මෙන් සහ ඒ ආකාරයෙන් ම, අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.



[1968 අංක 42 § 5]

(7) යම් නගරයක නගර සභාව විසුරුවා හැරීමෙන් පසු ඒ නගරයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු හෝ කොමසාරිස්වරුන් පත් කරනු ලැබීමෙන් පසු යම් වේලාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්—

(අ) අවස්ථානුකූල යැයි තමාට පෙනෙන පරිදි, විසුරුවා හරිනු ලැබූ නගර සභාවේ සභික සංඛ්‍යාවෙන් ම හෝ එයට වැඩි හෝ අඩු සභික සංඛ්‍යාවකින් සමන්විත අලුත් නගර සභාවක් ඒ නගරය සඳහා සංස්ථාපනය කිරීමට අවශ්‍ය විය හැකි විධාන දිය හැකි අතර,

(ආ) ඒ නගරයේ සීමා පටු කොට හෝ පුළුල් කොට හෝ අන් ලෙසකින් නැවත නිරූපණය කොට, ඒ නැවත නිරූපණය කරනු ලැබූ නගරය සඳහා නගර සභාවක් සංස්ථාපනය කිරීමට අවශ්‍ය විය හැකි විධාන දිය හැකි ය.

[1968 අංක 42 § 5.]

(8) විශේෂ කොමසාරිස්වරයකු හෝ කොමසාරිස්වරුන් විසින් නගරයක කටයුතු පරිපාලනය කිරීම අවසන් කිරීමෙන් පසු ඒ නගරය සඳහා අලුත් නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, විශේෂ කොමසාරිස්වරයාගේ හෝ කොමසාරිස්වරුන්ගේ අනුප්‍රාප්තිකයා අලුත් සභාව විය යුතු අතර, 236 වන වගන්තියේ සිට 244 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන, අලුත් සභාව සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ විට, ඒ වගන්තිවල යම් පළාත් පාලන ආයතනයක් හෝ ආයතන පිළිබඳ සියලු සඳහන් කිරීම් විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරුන් පිළිබඳ සඳහන් කිරීම් වූවාක් මෙන් සහ ඒ ආකාරයෙන් ම, අවශ්‍ය මඳ වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී සභාවේ සභාපතිවරයාගේ සහ උපසභාපති වරයාගේ බලතල ලේකම් විසින් ක්‍රියාත්මක කළ යුතු බව.
[1983 අංක 48 § 14.]

**184අ.** සභාපතිවරයා සහ උපසභාපතිවරයා විසින් ධුර දැරීම අවසන් කිරීමේ හේතුවෙන් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට නගර සභාවකට නොහැකි වන අවස්ථාවක, එම ධුර සම්බන්ධයෙන් පුරප්පාඩු ඇති වීම සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව එම පුරප්පාඩු පිරවීම අතර ගත වන යම් කාලයක් ඇතුළත, මේ ආඥාපනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් සභාව, සභාපතිවරයා හෝ උපසභාපතිවරයා වෙත සතු කරනු ලැබූ හෝ පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය ලේකම්ට තිබිය යුතු ය, ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය, ඉටු කරනු ලැබිය යුතු ය.

**185.** (1) යම් නගරයක පොදු සෞඛ්‍යයට අදාළ යම් කාරණු වලට හෝ මේ ආඥාපනත යටතේ අමාත්‍යවරයාගේ සම්මතය, අනුමතය හෝ එකඟත්වය අවශ්‍ය වන යම් කරුණුවලට හෝ අදාළ ලෙස පෙනී යා හැකි සියලු පරීක්ෂණ, කලින් කළ පැවැත්වීමට අමාත්‍යවරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ යම් පරීක්ෂණයක කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබ ඒ පරීක්ෂණය පවත්වන තැනැත්තාට, සාක්ෂිකරුවන් සහ ඔවුන් පරීක්ෂා කිරීම සහ ලිය විලි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතලත් පරීක්ෂණයේ කාර්යය සඳහා සෝදිසි කර බැලීමට අවශ්‍ය විය හැකි ස්ථාන සහ දේවල් සෝදිසි කිරීමේ සියලු බලතලත් තිබිය යුතු ය.

*පරීක්ෂණවල සහ නීති කෘත්‍යවල පිරිවැය.*

186. මේ ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණ හෝ ආරම්භ කරනු ලබන නීති කෘත්‍ය සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා හෝ යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් හෝ ගෙවිය යුතු පිරිවැය පිළිබඳව සහ ඒ පිරිවැය ගෙවිය යුත්තේ යම් පාර්ශ්වයක් විසින් ද ඒ පාර්ශ්වයන් පිළිබඳව හෝ ඒ පිරිවැය දැරිය යුත්තේ යම් අරමුදල්වලින් ද ඒ අරමුදල් පිළිබඳව අමාත්‍යවරයා විසින් නියමයන් කරනු ලැබිය හැකි ය. තවද සෑම නියමයක ම දිසා අධිකරණයෙහි ලියාපදිංචි කළ හැකි අතර, තත් කාර්යය සඳහා ඒ නියමයෙහි නම් කර ඇති යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කරන ලද විටක අධිකරණයේ තඹු තීන්දුවක් බලාත්මක කළ හැකි ආකාරයෙන් ම බලාත්මක කරනු ලැබිය හැකි ය.

*නගර සභාවක් විසින් කාර්ය පැහැර හරිනු ලැබීම ගැන පරීක්ෂණ පැවැත්වීමට ඇති බලය.*

187. (1) මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් හෝ යම් නගර සභාවක් වෙත පවරන ලද යම් කාර්යයක් ඉටු කිරීමට හෝ යම් වැඩක් කිරීමට එම සභාව අපාසු කරන බව හෝ මේ ආඥාපනත යටතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ තම කාර්ය අතුරින් හෝ වගකීම් අතුරින් යමක් ඉටු කිරීමට එම නගර සභාව වෙන අන්දමකින් පැහැර හැර ඇති බව හෝ යම් වේලාවක අමාත්‍යවරයාට පෙනී ගියහොත්, අමාත්‍යවරයා විසින්, දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රත්‍යතික හේතු ඇති බව සභාව විසින් පෙන්වනු ලැබුවහොත් හැර, අදාළ සිද්ධි පරීක්ෂා කොට ඒ පිළිබඳව ඔහු වෙත වාර්තා කිරීමටත් ඒ කාර්යය ඉටු කිරීමේ හෝ ඒ වැඩය කිරීමේ හෝ ඒ පැහැර හැරීම ගැන ප්‍රතිකර්මයක් කිරීමේ කාර්යය සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව නිර්දේශයක් කිරීමටත් ඔහු විසින් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කරනු ලබන බව සභාව වෙත දන්වනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් කරනු ලැබූ යම් සභාවක් විසින් යම් හේතුවක් හෝ ප්‍රමාණවත් හේතුවක් නො දක්වන ලද අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් දැන්වීමේ සඳහන් පරීක්ෂණය පැවැත්වීම සඳහා තැනැත්තකු හෝ තැනැත්තන් පත් කළ යුතු ය. ඒ පරීක්ෂණය හැකි තාක් දුරට ප්‍රසිද්ධියේ පැවැත්විය යුතු ය.





*අවශ්‍ය වැඩ කළ යුතු බව සභාවට නියම කිරීමට සහ ඒ නියමය ක්‍රියාත්මක කිරීමට ඇති බලය.*

188. (1) වන වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමට පත් කරන ලද තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ වාර්තාව ලැබුණු විට, අමාත්‍යවරයා විසින්, නගර සභාව විසින් පැහැර හැර තිබිය හැකි යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ යම් වැඩක් කිරීමේ කාර්යය සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය කුමක්දැයි තීරණය කළ යුතු අතර, අමාත්‍යවරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ අනුව ක්‍රියා කරන ලෙසත් මේ ආඥාපනතින් විධිවිධාන සලස්වනු ලැබ ඇති යම් වරිපනම් බද්දකින් හෝ බද්දකින් හෝ ඊට වැඩි වරිපනම් බදු හෝ බදු සංඛ්‍යාවකින් හෝ එකී යම් වරිපනම් බද්දක් හෝ බද්දක් ඇපයට තබා ලබා ගන්නා ණයක් වශයෙන් ඒ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ලබා ගන්නා ලෙසත් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ක්‍රියා කිරීම සභාව විසින් පැහැර හරිනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් ක්‍රියා මාර්ගය ගැනීමට යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ද නියම කරනු ලැබිය හැකි ය. තවද ඒ පාරිශ්‍රමිකය සහ අමාත්‍යවරයාගේ නියමයට අනුකූලව ගන්නා ලද ක්‍රියා මාර්ග සඳහා වූ පිරිවැය ප්‍රාදේශීය අරමුදලින් ගෙවනු ලැබිය යුතු යැයි ද, අවශ්‍ය නම්, මේ ආඥාපනතින් විධිවිධාන සලස්වනු ලැබ ඇති යම් වරිපනම් බද්දක් හෝ බද්දක් හෝ ඊට වැඩි වරිපනම් බදු හෝ බදු සංඛ්‍යාවක් පනවනු ලැබිය යුතු යැයි ද එසේ නැතහොත් ඒ වරිපනම් බදු හෝ බදු වැඩි කොට අය කරනු ලැබිය යුතු යැයි ද විධාන කළ හැකි ය.

(3) ප්‍රාදේශීය අරමුදලෙන් නීත්‍යානුකූලව ගෙවිය හැකි වියදම් ගැන සභාවට ඇති බලය ද එබඳු යම් වරිපනම් බද්දක් හෝ බද්දක් අය කිරීම හෝ පැනවීමට සහ තමා ලඟ ඇති යම් මුදල් ගෙවන ලෙස සභාවේ සියලු නිලධරයන්ට නියම කිරීමට (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකුටත් තිබිය යුතු අතර, ඒ තැනැත්තා විසින්, ඒ නියමය සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු මුදල් ගෙවනු ලැබීමෙන් අනතුරුව, අතිරික්තයක් වුවහොත් එය සභාව වෙත හෝ සභාවේ අණට ගෙවනු ලැබිය යුතුය.

*ණය ලබා ගැනීමට විධාන කිරීමේ බලය.*

189. යම් වරිපනම් බද්දක් හෝ බද්දක් අය කිරීමට, පැනවීමට හෝ වැඩි කිරීමට අතිරේකව හෝ ඒ වෙනුවට, 188 වන වගන්තිය යටතේ යම් කාර්යයක් ඉටු කිරීමේ, යම් වැඩක් කිරීමේ හෝ යම් පැහැර හැරීමක් ගැන ප්‍රතිකර්ම යෙදීමේ කාර්යය සඳහා යම් ප්‍රාදේශීය වරිපනම් බද්දක හෝ බද්දක ඇපය පිට ණයක් ලබා ගත යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

වියදම් සහතික කිරීමට ඇති බලය.

**190.** 188 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු විසින් දරනු ලැබ ඇති වියදම් ප්‍රමාණය හෝ දරනු ලැබීමට ආසන්නව ඇති වියදම් පිළිබඳ ඇස්තමේන්තුවක් සහ එසේ දරන ලද හෝ දරනු ලැබීමට ආසන්නව ඇති ලෙස ඇස්තමේන්තු කොට ඇති වියදම් ගෙවීමේ කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යම් ණයක ප්‍රමාණය අමාත්‍යවරයා විසින් කලින් කල සහතික කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයාගේ සහතිකයත්, එය අදාළ වන සියලු කාරණා සම්බන්ධයෙන් තීරණාත්මක විය යුතුය.

ණයදීමට ප්‍රාදේශීය ණය කොමසාරිස් වරුන්ට ඇති බලය.

**191.** (1) අමාත්‍යවරයා විසින් ණයක් අවශ්‍ය බව 190 වන වගන්තිය යටතේ සහතික කරනු ලබන කවර අවස්ථාවක දී වුව ද, අවශ්‍ය බවට එසේ සහතික කරන ලද ණය මුදල, ප්‍රාදේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරුන් විසින් යම් ප්‍රාදේශීය වරිපනම් බද්දක හෝ බද්දක ඇපය පිට සහ වෙන යම් ඇපයක් නොමැතිව කොමසාරිස්වරයා වෙත හෝ 188 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු වෙත කලින් දෙනු ලැබිය හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින් හෝ 188 වන වගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තා විසින් යථා පරිදි ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් මගින්, (1) වන උපවගන්තියෙහි සඳහන් ණය මුදල සම්බන්ධයෙන් ගෙවනු ලබන මුල් මුදල සහ පොලිය සඳහා යම් ප්‍රාදේශීය වරිපනම් බද්දක් හෝ බද්දක් වැය බර කරනු ලැබිය හැකි ය. තවද ඒ ප්‍රාදේශීය වරිපනම් බද්ද හෝ බද්ද ඇපයට තබා ඒ ණය මුදල ලබා ගැනීමට සභාවට බලය පවරනු ලැබ ඇති විටක මෙන් සහ ඒ වරිපනම් බද්ද හෝ බද්ද උකසට තබා සභාව විසින් යථා පරිදි සාධන පත්‍රයක් අත්සන් කරනු ලැබ ඇති විටක මෙන් ඒ හැම වැයබරක් ම බලාත්මක විය යුතු ය.

මුල් මුදල සහ පොලිය සභාවෙන් අය කර ගැනීම.

**192.** (1) මේ කොටස යටතේ දරන ලද හෝ දරනු ලැබීමට ඇති යම් වියදමක් ගෙවීම සඳහා ගන්නා ලද යම් ණය මුදලක් සම්බන්ධයෙන් තත් කාලයේ ගෙවිය යුතු මුල් මුදල හෝ පොලිය සභාවෙන් අය විය යුතු ණයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, වෙන යම් ප්‍රතිකර්මවලට අතිරේකව, ඒ ණය, ප්‍රාදේශීය ණය මුදල් සහ සංවර්ධන ආඥාපනතින් විධිවිධාන සලස්වනු ලැබ ඇති අන්දමින් ආපසු ලබා ගනු ලැබිය හැකි ය.

(2) යම් ණය මුදලක අතිරික්තය, ඒ මුදල් ප්‍රමාණය අමාත්‍යවරයා විසින් සහතික කරන ලද විට, (1) වන උපවගන්තියෙහි සඳහන් වියදම් ගෙවනු ලැබීමෙන් පසුව, සභාවේ ප්‍රාදේශීය අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

කාර්ය පටිපාටිය පිළිබඳ පොදු රීති සෑදීමට ඇති බලය.

**193.** (1) නගර සභාවල බලතලවලට සහ යුතුකම්වලට අදාළ මේ ආඥාපනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හෝ බලාත්මක කිරීමට සම්බන්ධ යම් කාරණයක් ගැන නගර සභාවලට සහ එහි නිලධරයන්ට මග පෙන්වීම සඳහා, මේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල නොවන අන්දමින් අමාත්‍යවරයා විසින් කාර්ය පටිපාටිය පිළිබඳව රීති සාදනු ලැබිය හැකි ය.



(2) (1) වන වගන්තිය යටතේ වූ අමාත්‍යවරයාගේ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් කාර්ය සියල්ල හෝ ඒ අතුරින් යම් කාර්යයක් සඳහා සියලු නගර සභාවලට හෝ නිශ්චිතව සඳහන් එක් නගර සභාවකට හෝ ඊට වැඩි ගණනකට අදාළ වන රීති මේ වගන්තිය යටතේ ඔහු විසින් සාදනු ලැබිය හැකි ය :—

(අ) වාර්ෂික අය වැය ලේඛන සහ පරිපූරක අය වැය ලේඛන පිළියෙල කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කිරීම ;

(ආ) සැලසුම් ඇස්තමේන්තු පිළියෙල කරන ලෙස නියම කිරීම සහ ඒ සැලසුම්වල ඇස්තමේන්තුවල පෙන්විය යුතු විස්තර නියම කිරීම.

(ඇ) වෙන් වෙන් සභා විසින් අමාත්‍යවරයා වෙත වාර වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සහ ඒ වාර වාර්තාවල ආකෘතිය සහ ඇතුළත් විය යුතු දේවල් නියම කිරීම ;

(ඈ) නගර සභා විසින් තබාගත යුතු වෙන් වෙන් ගණන් පොත්වල ආකෘතිය සහ ඒ ගණන් විගණනය කරන අන්දම නියම කිරීම ;

(ඉ) යම් වරිපනම් බද්දක් හෝ බද්දක් පැනවීමේ සහ අය කිරීමේ කාර්යයන් සඳහා 167 වන වගන්තිය යටතේ භාවිතා කළ යුතු වාර වාර්තාවල සහ ප්‍රකාශනවල ආකෘතිය නියම කිරීම ;

(ඊ) යම් වරිපනම් බද්දක කාර්යයන් සඳහා යම් නිශ්චල දේපළක වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිය නියම කිරීම ;

(උ) නගර සභාවක නිලධරයන් සහ සේවකයන් සම්බන්ධයෙන්

(i) එක් එක් තනතුරට හෝ තනතුරු පන්තියට හෝ ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ;

(ii) එක් එක් තනතුරට හෝ තනතුරු පන්තියට හෝ ශ්‍රේණියට අනුයුක්ත විය යුතු වැටුප් පරිමාණ ;

(iii) දිය හැකි, නොපැමිණීමේ නිවාඩුවලට කාල සීමාව සහ ඒ පිළිබඳ නියමයන් සහ කොන්දේසි ;

(iv) යම් යුතුකමක් ඉටු කිරීමෙහි ලා දරන ලද වියදමක් ප්‍රතිපූරනය කිරීම වශයෙන් ගෙවිය යුතු යැපීම් හෝ ගමන් වියදම් දීමනාවල ප්‍රමාණ

නියම කිරීම.

(ඌ) නගර සභාවල සභාපතිවරයන්ට, උපසභාපතිවරයන්ට සහ සභිකයන්ට ගෙවිය හැකි දීමනාවල ප්‍රමාණ නියම කිරීම ; [1977 අංක 24 § 135.]

(ඍ) මේ ආඥාපනත යටතේ වූ යම් යුතුකමක් ඉටුකිරීමෙහි ලා දරන ලද වියදමක් ප්‍රතිපූරණ කිරීම් වශයෙන් නගර සභා වල සභිකයන් වෙත ගෙවිය යුතු ගමන් වියදම් හෝ වෙනත් දීමනාවල ප්‍රමාණ නියම කිරීම ;

(එ) නගර සභාවක ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් සභාපති වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නියම කිරීම ;

(ඒ) නගර සභාවක් වෙනුවෙන් ඩැස්පත් හෝ ගෙවීම් ඇණවුම් අත්සන් කර නිකුත් කළ හැකි නිලධරයන් කවුරුන් ද යන බව සහ ඒවා අත්සන් කොට නිකුත් කරන ආකාරය නියම කිරීම ;

(ඔ) 229 වන වගන්තියේ කාර්යයන් සඳහා නගර සභාවේ යම් නිලධරයකු විධායක නිලධරයකු ලෙස ප්‍රකාශයට පත් කිරීම ;

(ඕ) මේ උපවගන්තියේ ඉහත සඳහන් ඡේදවල දක්වා ඇති කාර්යයන්ට සම්බන්ධ හෝ ආනුෂංගික වෙන යම් කාර්යයක්.

රීති අනුමත කිරීම.

194. (1) 193 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ඒ රීතිය අනුමත කළ යුතු යැයි ඉල්ලන යෝජනාවක් මගින්, ඒ රීතිය, එසේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි තාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක් ම, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විට, මෙහි පනවන ලද්දාක් මෙන් වලංගු සහ බල සහිත විය යුතු අතර, ඒ රීතිය, එම කාරණය ම සඳහා හෝ ඒ කාර්යය ම සම්බන්ධයෙන් නගර සභාවක් විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් අභිභවා බල පැවැත්විය යුතු ය.

ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීමේ බලය.

195. අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින්—

(අ) යම් නගර සභාවක් විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුළත, පොදු සෞඛ්‍යාරක්ෂාව සහ පොදු ආරක්ෂාව අරභයා අමාත්‍යවරයාගේ හෝ කොමසාරිස්වරයාගේ මතය අනුව ගත යුතුව ඇති යම් ක්‍රියා මාර්ගයක් ඒ නගර සභාවේ අවධානයට ලක් කිරීම ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවේ යම් කොටසක සාමාන්‍යයෙන් බල පවත්නා ප්‍රතිපත්තිය සමග සභාවේ ප්‍රතිපත්තිය සම්යෝජනය කළ යුතු යැයි අමාත්‍යවරයා හෝ කොමසාරිස් වරයා අදහස් කරන සාමාන්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ යම් ප්‍රශ්නයක දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය කවරේ දැයි යම් නගර සභාවක අවධානයට ලක් කිරීම

කරනු ලැබිය හැකි ය.





නගර සභාවල පොත් ආදිය පරීක්ෂා කිරීමේ බලය.

196. අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්—

(අ) නගර සභාවක් විසින් හෝ එහි පාලනය යටතේ හෝ පාවිච්චි කරනු ලබන, පරිහරණය කරනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන යම් පොදු ගොඩනැගිල්ලක්, නිශ්චල දේපළක් හෝ ආයතනයක් හෝ නගර සභාවේ විධානය යටතේ කරගෙන යන යම් වැඩක් පරීක්ෂා කිරීම ;

(ආ) නගර සභාවක සන්තකයෙහි ඇති හෝ එහි පාලනය යටතේ ඇති යම් පොතක් හෝ ලේඛනයක් ගෙන්වා පරීක්ෂා කිරීම ;

(ඇ) සභාවේ හෝ සභාවේ යම් කාරක සභාවක කටයුතුවලට හෝ කාර්යයන්ට අදාළ ප්‍රකාශ, ගිණුම් වාර්තා, හෝ ලේඛනවල පිටපත් ඉල්ලා සිටීම

කරනු ලැබිය හැකි ය.

කොමසාරිස් වරයාගේ සහ බලයලත් නිලධර යන්ගේ බලය.

197. කොමසාරිස්වරයාට හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද ආණ්ඩුවේ යම් නිලධරයකුට, යම් නගර සභාවක් විසින් පරිපාලනය කරනු ලබන නගරය ඇතුළත, තම තමන්ගේ කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම සඳහා නගර සභාවේ නිලධරයන්ට ඇති පරිදි ම වූ ඇතුළු වී පරීක්ෂා කිරීමේ බලයත් අනෙකුත් බලතල සහ අධිකාරත් තිබිය යුතු ය ;

එසේ වුව ද, කොමසාරිස්වරයා විසින් හෝ බලය ලත් ආණ්ඩුවේ නිලධරයා විසින් හෝ මේ වගන්තිය යටතේ තමාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි දී නගර සභාවේ සභාපතිවරයා විමසමින් ක්‍රියා කළ යුතු ය ;

එසේ ම තව දුරටත්, කොමසාරිස්වරයාට හෝ බලය ලත් ආණ්ඩුවේ නිලධරයාට, මේ වගන්තිය යටතේ තමාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු සාධාරණ සහාය දීම නගර සභාවේ නිලධරයන්ගේ කාර්යය විය යුතු ය.

එක් එක් නගර සභාවක කටයුතු ගැන කොමසාරිස් වරයාගේ වාර්ෂික වාර්තාව.

198. කොමසාරිස්වරයා විසින් එක් එක් අවුරුද්දක් තුළ එක් එක් සභාවක කටයුතු පිළිබඳ සාමාන්‍ය සමීක්ෂණයක් අන්තර්ගත වාර්තාවක් පිළියෙල කොට ඒ වාර්තාව ඒ සභාවේ සභාපතිවරයා වෙත යැවිය යුතු අතර, සභාපතිවරයා විසින්, සභාවේ සභිකයන්ගේ දැන ගැනීම සඳහා ඒ වාර්තාව, එය ලැබීමෙන් පසුව පැවැත්වෙන ඊළඟ සභා රැස්වීමේදී සභාගත කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

වාර්ෂික අය වැය ලේඛණය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

**199.** සෑම නාගර සභාවක වාර්ෂික අය වැය ලේඛනය සහ ඒ අය වැය ලේඛනයෙහි කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම, කොමසාරිස්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, සෑම නාගර සභාවක් විසින් ම එබඳු යම් අය වැය ලේඛනයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් ඉල්ලනු ලැබිය හැකි සියලු වාර්තා, විස්තර හෝ පහදාදීම් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු ය.

නාගර සභාවේ අය වැය ලේඛණය පාලනය කිරීමේ බලය.

**200.** යම් නාගර සභාවක අය වැය ලේඛනය සභාවේ මූදල් තත්ත්වය හේතුකොටගෙන අමාත්‍යවරයාගේ පාලනයට යටත් කිරීම අමාත්‍යවරයාගේ මතය අනුව යෝග්‍ය වන අවස්ථාවක දී, ඒ සභාව සම්බන්ධයෙන් වූ විට, වාර්ෂික අය වැය ලේඛනය සහ ඒ අය වැය ලේඛනයේ යම් වෙනස් කිරීමක්, අමාත්‍යවරයාගේ අනුමතයට යටත් විය යුතු යැයි අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි අතර, එබඳු යම් අවස්ථාවක දී, ඒ අය වැය ලේඛනය සහ ඒ අය වැය ලේඛනයේ යම් වෙනස් කිරීමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ යම් විධානයක් පිළිපැදීම සභාවේ කාර්යය විය යුතු ය.

වාර්ෂික වාර්තාව.

**201.** ශ්‍රී ලංකාවේ නාගර සභා පිළිබඳ පරිපාලන වාර්තාවක් සහ ඒවායේ වැඩ සහ වියදම් පිළිබඳ සමාලෝචනයක් අවුරුදු පතා පිළියෙල කොට පළ කිරීම කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

ඒ සෑම වාර්තාවක් ම සහ සමාලෝචනයක් ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒවා කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අන්දමින් ප්‍රසිද්ධ කරනු ලැබිය හැකි ය.

ආරාවුල් නිරවුල් කිරීම.

**202.** නාගර සභා දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර හෝ යම් නාගර සභාවක් හෝ නාගර සභා සහ වෙන යම් පළාත් පාලන ආයතනයක් අතර, එකී යම් නාගර සභාවක හෝ පළාත් පාලන ආයතනයක අයිතිවාසිකම්, බලතල, කාර්ය හෝ බැදීම් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැගුනහොත් හෝ, එකී යම් අයිතිවාසිකමක්, බලයක්, කාර්යයක් හෝ බැදීමක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමට අදහස් කිරීමේ දී හෝ බලාත්මක කිරීමේ දී පැන නගින යම් ප්‍රශ්නයක දී, සියලු පාර්ශ්වකරුවන් එකඟ වූවහොත් හෝ සියලු පාර්ශ්වකරුවන් එකඟ නොවූන විටක යම් පාර්ශ්වකරුවකු විසින් අමාත්‍යවරයා වෙත ඉල්ලීම් කරනු ලැබුවහොත්, ඒ ආරාවුල අමාත්‍යවරයා විසින් කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි අතර, ඒ ආරාවුල සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් කරනු ලබන යම් නියමයක් විවාදයට භාජනව ඇති සියලු කාරණා අවසාන වශයෙන් නිරවුල් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.





කාලය දීර්ඝ කිරීම ආදිය සඳහා ඇති බලය.

**203.** මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් හෝ නියෝගයක් යටතේ වූ (අධිකරණ කෘත්‍යයක් නොවන) යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් සඳහා නියම කොට ඇති කාලය දීර්ඝ කිරීම හෝ දිනය කල් දැමීම, යම් නාගර සභාවක් විසින් හෝ බල පෑමක් විඳි යම් තැනැත්තකු විසින් ඉල්ලීම් කරන ලද විටක සහ අමාත්‍යවරයා විසින් අවශ්‍ය යැයි සිතනු ලබන පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව, ඔහු විසින් කරනු ලැබිය හැකි අතර, එකී කාලය දීර්ඝ කිරීම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ආනුෂංගික නියමයක් ද ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

කොමසාරිස්වරයා වෙත බලතල පවරා දීම.

**204.** යම් නාගර සභාවක ශක්තතාව ඇතුළත වන යම් කාරණයක් සම්බන්ධයෙන් මේ ආඥාපනත නොවන යම් ප්‍රඥප්තියකින් හෝ ඒ ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා වෙත පැවරී ඇති යම් බලයක්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කොමසාරිස්වරයා වෙත පවරා දීම හෝ නාගර සභාවක් විසින් අමාත්‍යවරයා විමසා එකී යම් බලයක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි විධාන කිරීම හෝ කරනු ලැබිය හැකි අතර, ඒ බලතල සම්බන්ධයෙන් වූ සියලු ප්‍රඥප්ති ඒ අනුව තේරුම් ගත යුතු ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම පාර්ලිමේන්තුව විසින් කරනු ලබන ස්ථිර කිරීමට යටත් විය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය කරුණු

#### ගාස්තු සහ වියදම් අය කර ගැනීම

අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් පැහැරහරිනු ලැබූ වැඩ කරවීමට සහ වියදම් අය කරගැනීමට නාගර සභාවට ඇති බලය.

**205.** මේ ආඥාපනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු ලවා හෝ පදිංචිකරු ලවා යම් වැඩක් කරවා ගැනීමට නාගර සභාවකට අවශ්‍යව තිබිය දී ඒ වැඩය කිරීම පැහැර හරින ලද කවර අවස්ථාවක දී වුව ද, ඒ පැහැර හැරීම සඳහා යම් දණ්ඩනයක් පනවනු ලැබ තිබුණත් නැතත්, නාගර සභාව විසින් ඒ වැඩය කිරීමට සලස්වනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ සඳහා දරන ලද වියදම්, ඒ වැඩය කළ යුතුව සිටි තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, එය, මේ කොටසින් විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි අය කරගත හැකි විය යුතු ය.

පදිංචිකරුගෙන් ගාස්තු අය කිරීමට ඇති බලය සහ ඔහු විසින් එය ගෙවල් කුලියෙන් අඩු කරගත හැකි බව.

**206.** (1) 205 වන වගන්තියෙහි සඳහන් යම් පැහැර හැරීමක් කළ තැනැත්තා ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු වේ නම්, එකී අයිතිකරුට විරුද්ධව නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරා හෝ ආරම්භ කර තිබුණේ හෝ නොතිබුණේ වී නමුදු අතිරේක ප්‍රතිකර්මයක් වශයෙන් නත් කාලයෙහි අයිතිකරුගෙන් අය විය යුතු වියදම් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් ගෙවන ලෙස, ඒ අවස්ථාවේ හෝ ඊට පසු යම් අවස්ථාවක, ඒ අයිතිකරු යටතේ ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචි ව සිටින තැනැත්තාට සභාව විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වියදම් සියල්ල ම හෝ ඉන් යම් කොටසක් ඉල්ලනු ලැබූ විට ඒ පදිංචිකරු විසින් ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී, එම වියදම් එම පදිංචිකරුගේ බඩු හා බඩු බාහිරාදිය විනිග්‍රහණය කිරීමෙන් අය කරගනු ලැබිය යුතු ය.

(3) සභාව විසින් දරන ලද වියදම් සම්බන්ධයෙන් යම් මුදලක් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පදිංචිකරු විසින් ගෙවනු ලැබූ හෝ ඔහුගෙන් අය කර ගනු ලැබූ අවස්ථාවක දී, තමා විසින් අයිතිකරුට ගෙවිය යුතු ගෙවල් කුලියෙන් ඒ මුදල අඩුකර ගැනීමටත්, ඒ මුදල සම්පූර්ණයෙන් තමාට ප්‍රතිපූරණය කරන තෙක් එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ සන්තකය අත්නොහැර තබා ගැනීමටත්, පදිංචිකරුට හිමිකම තිබිය යුතු ය.

අයවිය යුතු ගෙවල් කුලී ප්‍රමාණයට වඩා ගෙවීමට පදිංචිකරුවන් යටත් නොවන බව.

**207.** (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචිකරු විසින් තමාට ගෙවන ගෙවල් කුලියේ ප්‍රමාණය සහ ඒ ගෙවල් කුලිය ගෙවනු ලැබිය යුතු තැනැත්තාගේ ලිපිනය ද හෙළි කරන ලෙස සභාව විසින් ඔහුගෙන් ඉල්ලා සිටි විට එය සත්‍ය ලෙස හෙළි කිරීම අතපසු කරන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් මිස, මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් හෝ රීතියකින් හෝ නියෝගයකින් එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුගෙන් අය කර ගත යුතු වියදම් ගෙවන ලෙස ඉල්ලීම් කරන අවස්ථාවේ දී, එම වියදම් අය කරනු ලබන ස්ථානය සම්බන්ධයෙන් ඔහුගෙන් අය විය යුතු ව ඇති ගෙවල් කුලී ප්‍රමාණයට හෝ ඒ ඉල්ලීම කිරීමෙන් සහ ගෙවල් කුලිය ඔහුගේ ගෙහිමියාට නොගෙවිය යුතු ය යන දැන්වීම කිරීමෙන් පසු යම් අවස්ථාවක දී උපචිත වී ඔහු විසින් ගෙවිය යුතු ව ඇති ගෙවල් කුලී ප්‍රමාණයට වැඩි මුදලක් ගෙවීමට ඒ පදිංචිකරු යටත් නොවිය යුතු ය.

(2) එකී යම් පදිංචිකරුවකුගෙන් ඉල්ලනු ලැබූ මුදල, එසේ ඉල්ලනු ලැබූ වේලෙහි ඔහුගෙන් අය විය යුතුව තිබුණු හෝ ඉන් අනතුරුව උපචිත වූ ගෙවල් කුලියට වඩා වැඩි බව ඔප්පු කිරීමේ භාරය ඒ පදිංචිකරු වෙත පැවරෙන්නේ ය.





(3) ඉහත කී වැඩ සඳහා වූ වියදම් ගෙවීම සම්බන්ධයෙන් යම් අයිතිකරුවකු හා පදිංචිකරුවකු අතර ඇති කර ගනු ලැබූ යම් විශේෂ ගිවිසුමක් කෙරෙහි මෙහි සඳහන් කිසිවක් බල පාන ලෙස සලකනු නොලැබිය යුතු ය.

අයිතිකරු පැහැර හැරිවැඩ පදිංචිකරු විසින් කරවිය හැකි බව හා ගෙවල් කුලියෙන් වියදම් අඩු කර ගත හැකි බව.

**208.** (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් කරවීමට නියමිත වූ යම් වැඩක් ඒ අයිතිකරු විසින් කරවීම පැහැර හරිනු ලැබූ කවර හෝ විටක දී ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු විසින් සභාවේ අනුමතය ඇතිව ඒ වැඩය කරවිය හැකි අතර, ඒ සඳහා වන වියදම්, අයිතිකරු විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය; නැතහොත්, කලින් කළ ඒ අයිතිකරුට ඔහුගෙන් අය විය යුතු වන ගෙවල් කුලියෙන් ඒ මුදල අඩු කර ගනු ලැබිය හැකි ය.

(2) යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ දරන ලද වියදම්, එම උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ලෙස එම ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු විසින් සම්පූර්ණයෙන් ගෙවන තුරු හෝ අඩු කරගනු ලබන තුරු, ඒ ගෙයින්, ගොඩනැගිල්ලෙන් හෝ ඉඩමෙන් ඒ පදිංචිකරු නෙරපීමට අයිතිකරු හිමිකම් නොලැබිය යුතු ය.

පදිංචිකරුවන් විසින් බාධා කරනු ලැබීම.

**209.** මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන අතුරින් කිසිවක්, යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පරිදි කරගෙන යෑමට තමා අදහස් කරන බව එහි අයිතිකරු විසින් ඒ ගෙයි, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු වෙත දැන්වීමෙන් පසුව, එසේ එය කරගෙන යෑමෙහි ලා ඔහු විසින් එහි අයිතිකරු වළක්වනු ලැබුවහොත්, ඒ බව ඔප්පු කරනු ලැබූ විට හා අයිතිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් පිට, සභාව විසින්, ඒ ගෙය, ගොඩනැගිල්ල හෝ ඉඩම සම්බන්ධයෙන් මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන ක්‍රියාත්මක වන පරිදි කරගෙන යෑම සඳහා අවශ්‍ය එකී සියලු වැඩ කරවීමට අයිතිකරුට ඉඩ දෙන ලෙස පදිංචිකරුට නියම කෙරෙන ලිඛිත නියමයක් කරනු ලැබිය හැකි අතර, සුදුසු යැයි සභාව කල්පනා කරන්නේ නම්, ඒ ඉල්ලීමට හෝ නියමයට අදාළ ගාස්තු ඒ අයිතිකරුට ගෙවන ලෙස ඒ පදිංචිකරුට නියම කළ හැකි ය. තවද, නියමයේ දින සිට දවස් අටක් ඉකුත් වීමෙන් පසුවත් ඒ වැඩ කරවීමට අයිතිකරුට ඉඩ දීම ඒ පදිංචිකරු විසින් තව දුරටත් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඒ පදිංචිකරු එසේ ප්‍රතික්ෂේප කිරීම තව දුරටත් කරගෙන යන සෑම දවසක් සඳහා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු වරදකට වරදකරු විය යුතු ය. තව ද, එකී සෑම අයිතිකරුවකු ම, ඒ වැඩය කරවීම ඔහු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොටගෙන යටත් විය හැකි ව තිබූ දණ්ඩණවලින් ඒ ප්‍රතික්ෂේප කිරීම පවත්නා කාලය තුළ නිදහස් කරනු ලැබිය යුතු ය.

දිරිගැන්වීමේ දීමනා ගෙවීම. [1981 අංක 61 § 19]

**209අ.** (1) නිවාස ස්ථාන නඩත්තු කිරීම පිළිබඳ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ කාර්යය සඳහා සහ දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන ඒ ස්ථානවල පදිංචිකරුවන්ට එවැනි ගෙවීම් කිරීම පිණිස නිර්දේශ කිරීම සඳහා සභිකයන් හය දෙනකුට නොඅඩු ගණනකින් සමන්විත වූ කමිටුවක් නගර සභාවක් විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ දී සහ යම් නිවාස ස්ථානයක පදිංචිකරුවකුට දිරිගැන්වීමේ දීමනාවක් ගෙවීම සඳහා යම් නිර්දේශයක් කිරීමේ දී කමිටුව විසින් පහත දැක්වෙන දේ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :—

(අ) නිවාස ස්ථාන හොඳින් නඩත්තු කර, ශක්ති සම්පන්න, පවිත්‍ර හා සෞඛ්‍යයට හිතකර තත්ත්වයකින් පවත්නා බව ; සහ

(ආ) පදික වේදිකාව ඇතුළු වීදිය සහ ඒ ස්ථානය ඉදිරිපස හා ඒ ස්ථානයට යා වූ සියලු පැදුරිප කාණු පිරිසිදුව හා යම් අප ද්‍රව්‍යයකින් තොරව තබා ඇති බව.

(3) කමිටුව විසින්, ස්වකීය නිර්දේශ කිරීමේ කාර්යය සඳහා දවසේ සියලු යුක්ති සහගත වේලාවන්හි දී පදිංචිකරුගේ කැමැත්ත ඇතිව යම් නිවාස ස්ථානයකට ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම ද ඒ ස්ථානයේ පදිංචිකරුගෙන් යම් තොරතුරක් නිසැකව දැන ගැනීම ද කරනු ලැබිය හැකි ය.

අයිතිකරු හා පදිංචිකරු යන දෙදෙනාගෙන් එක් කෙනෙකු විසින්වත් වියදම් නොගෙවූ විට ප්‍රතිකර්මය.

**210.** යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හා පදිංචිකරු යන දෙදෙනාගෙන් එක් කෙනකු විසින්වත් සභාව විසින් දරන ලද වියදම් නොගෙවනු ලැබුව හොත්, ඒ වියදම දරනු ලැබුවේ යම් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ගෙය, ගොඩනැගිල්ල හෝ ඉඩම ඒ වියදමේ මුදල විෂයෙහි ලා වැය බරක් වන අතර, සභාවට අය විය යුතු ණයක් මෙන් ගෙවිය යුතු ය.

වන්දි සහ ගාස්තු ආදිය නිර්ණය කිරීම සහ අය කර ගැනීම.

**211.** (1) මෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති විට හැර, මේ ආඥාපනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ නියෝගයක හෝ රීතියක විධිවිධාන යටතේ අලාභ, ගාස්තු හෝ වියදම් ගෙවිය යුතු වූ සියලු අවස්ථාවල දී, හබයක් ඇති වූ විට එහි මුදල සහ අවශ්‍ය නම්, එය විභාජනය කිරීම පහත සඳහන් ආකාරයෙන් සොයා දැන ගෙන නිර්ණය කරනු ලැබිය යුතු ය :—

(අ) හිමිකම් පාන මුදල රුපියල් එක් සියය නොඉක්මවන අවස්ථාවක, හිමිකම් පෑම් ගැන ලඝු නඩු විභාගයකින් පසු මහෙස්ත්‍රාත්වරයකු විසින් ;



(ආ) හිමිකම් පාන මුදල රුපියල් එක් සියය ඉක්මවන නමුත් රුපියල් එක් දහස් පන් සියය නොඉක්මවන අවස්ථාවක, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති ප්‍රාථමික අධිකරණය විසින් ;

(ඇ) හිමිකම් පාන මුදල රුපියල් එක්දහස් පන්සියය ඉක්මවන අවස්ථාවක, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති දිසා විනිශ්චය කරු විසින්.

(2) (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අවස්ථාවල දී, හිමිකම් පෑම, ඒ සඳහා සිවිල් නඩුවක් පැවරීමෙන් කරනු ලැබිය යුතු ය. පිළිවෙළින් ප්‍රාථමික අධිකරණයට සහ දිසා අධිකරණයට ඉදිරිපත් කරනු ලබන නඩු විභාග කොට නිර්ණය කිරීම විධිමත් කෙරෙන තත් කාලයෙහි පවත්නා නීතියෙන් නියමිත වූ කාර්ය පටිපාටිය අනුව ඒ නඩුව විභාග කොට නිර්ණය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද නිර්ණයකින් අතෘප්ත යම් තැනැත්තකු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ නිර්ණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ වූ නිර්ණයකින් අතෘප්ත යම් තැනැත්තකු විසින්, ඒ නිර්ණයට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකි ය. ඒ සෑම අභියාචනයක් ම අභියාචනාධිකරණය වෙත අභියාචනා කිරීම සම්බන්ධයෙන් පිළිවෙළින් ප්‍රාථමික අධිකරණ කාර්ය සංවිධාන පනතෙහි සහ සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි වූ විධිවිධානවලට යටත් විය යුතු ය.

**212.** 211 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් නිර්ණය කරන ලද වන්දි, අලාභ, ගාස්තු හෝ වියදම් මුදල ගෙවන ලෙස ඉල්ලීමෙන් දවස් හතක් ඇතුළත, එය ගෙවීමට යටත් තැනැත්තා විසින් ගෙවනු නොලැබුවහොත්, ඒ පැහැර හැරීම ගැන ඒ මහෙස්ත්‍රාත්වරයාට පැමිණිලි කරනු ලැබිය හැකි අතර, ඒ මුදල ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අය කර ගනු ලැබිය යුතු ය.

අලාභ ආදිය අයකර ගැනීම.

**213.** මේ ආඥාපනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ, යම් ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් කරවිය යුතු වැඩ සහ ක්‍රියා අතුරින් යම් වැඩක් හෝ ක්‍රියාවක් කරවීමේ දී නගර සභාවක් විසින් යම් වියදම් දරනු ලබන අවස්ථාවක, සභාව විසින් ඒ වියදම්වල මුදල 211 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් අය කර ගත හැකි ය ;

පෞද්ගලික දේපළ වලට කරන ලද වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් අයකර ගැනීම.

ඔහුට නීතිඥවරයෙක් හෝ අනුයෝජිතයෙක් සිටි නම්, ඒ නීතිඥවරයාගේ හෝ අනුයෝජිතයාගේ නම සහ පදිංචි ස්ථානය ද ප්‍රකාශ කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාව හෝ විත්තිකරු වෙත දෙනු ලැබීමෙන් මාසයක් ඉකුත් වන තුරු පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම නඩුවක් ම, නඩු නිමිත්ත පැනනැගීමෙන් පසු ඊළඟ මාස හය ඇතුළත පවරනු ලැබිය යුතු අතර, එය ඉන් පසු පවරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නඩුවක් පිළිබඳ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, එම නඩුව පවරනු ලැබීමට පෙර, පැමිණිලිකරුට ප්‍රමාණවත් හානි පූරණයක් ඉදිරිපත් කරනු ලබන හොත්, එකී යම් නඩුවක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ නඩුවේ දී පැමිණිලිකරු විසින් කිසිවක් අය කර නොගත යුතු අතර, පැමිණිලිකරුගෙන් සිය නඩු ගාස්තු ලබා ගැනීමට විත්තිකරු හිමිකම් ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ හානි පූරණයක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, විත්තිකරු විසින් ඒ නඩුව පවතිමින් තිබෙන අධිකරණයේ අවසරය ඇති ව, වාද පිළිමට පෙර ඕනෑ ම වේලාවක තමා විසින් සුදුසු යැයි සිතනු ලබන මුදලක් ඒ අධිකරණයට ගෙවීම නීත්‍යානුකූල වන අතර, ඉන් පසු, අධිකරණයට මුදල් ගෙවීමට විත්තිකරුවන්ට ඉඩ ලැබෙන අනෙක් නඩුවල දී මෙන් ඒ නඩු කටයුත්ත පවත්වා ගෙන යා යුතු ය.

(5) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නඩුවක් විභාග කරනු ලබන විට, එම උපවගන්තිය යටතේ පැමිණිලිකරු විසින් දෙන ලද දැන්වීමේ සඳහන් නඩු නිමිත්ත නොවන යම් නඩු නිමිත්තක් ඔප්පු කිරීමට ඔහුට අවසර නොදිය යුතු ය. තවද ඒ දැන්වීම ඔප්පු කරනු ලැබුවහොත් හැර, අධිකරණය විසින් විත්තිකරුගේ වාසියට නඩුව තීන්දු කළ යුතු ය.

සභාව සහ එහි නිලධරයන් ආරක්ෂා කිරීම.

221. යම් නගර සභාවක් විසින් කරන ලද කිසිම කාර්යයක් හෝ දෙයක් හා යම් නගර සභාවක් ඇතුළත් වූ කිසිම ගිවිසුමක් සහ යම් නගර සභාවක විධානය යටතේ ඒ සභාවේ යම් සභිකයකු විසින් හෝ ඒ සභාවේ යම් නිලධරයකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද කිසි ම කාර්යයක් හෝ දෙයක්, එසේ කරන ලද කාර්යය හෝ දෙය හෝ එසේ එළැඹුණු ගිවිසුම නගර සභාවක බලතලවලට හා කාර්යාලවලට හෝ සම්බන්ධ වූ මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, නියෝගයක හෝ රීතියක හෝ වෙනත් යම් ප්‍රඥප්තියක කාර්ය සඳහා සද්භාවයෙන් කරන ලද නම් හෝ එළැඹෙන ලද නම්, ඒ කාර්යය, දෙය හෝ ගිවිසුම නිසා ඒ සභාවේ යම් සභිකයකු හෝ එකී යම් නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු පෞද්ගලිකව කවර වූ හෝ යම් නඩුවකට,





වගකීමකට, හිමිකම් පෑමට හෝ ඉල්ලීමකට යටත් නොවිය යුතු අතර එකී යම් සභාවක් විසින් හෝ ඉහත කී පරිදි ක්‍රියා කරන සභිකයකු හෝ එකී සභාවේ නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් දරන ලද වියදම් ප්‍රාදේශීය අරමුදලින් දැරිය යුතු අතර ප්‍රාදේශීය අරමුදලින් ආපසු ගෙවනු ලැබිය යුතු .ය.

(2) වෙනත් යම් බලතලවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, යම් නඩුවක, අපරාධ නඩුවක හෝ වෙනත් නඩු කටයුත්තක විත්තිකරු නගර සභාවක සභිකයකු හෝ නිලධරයකු හෝ ඒ සභාවේ අනුයෝජිතයකු හෝ සේවකයකු වන අවස්ථාවක, ඒ නඩුව, අපරාධ නඩුව හෝ වෙනත් නඩු කටයුත්තක විභාග කොට තීරණය කරනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ දීද ඒ අධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරන තාක් දුරට හැර, ඒ නගර සභාව විසින්, සුදුසු යැයි ඒ නගර සභාව කල්පනා කරන්නේ නම්, ඒ නඩුවේ දී, අපරාධ නඩුවේ දී හෝ නඩු කටයුත්තේ දී නැතහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගාස්තු, අය කිරීම්, වියදම්, අලාභ, දඩ වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විත්තිකරු විසින් ගෙවිය යුතු මුදල් සියල්ල හෝ ඉන් යම් කොටසක් හෝ ප්‍රාදේශීය අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය ;

එසේ වුව ද, යම් නගර සභාවක ගිණුම් විගණනයේදී ඉඩ නොදෙනු ලැබිය හැකි මුදල ඒ නගර සභාවේ යම් සභිකයකු විසින් අනුමත කරනු ලැබුවා වූ හෝ අනුමත කිරීමෙහිලා සම්බන්ධ වූ යම් සභිකයකු විසින් අනුමත කරනු ලැබුවා වූ හෝ අනුමත කිරීමෙහිලා සම්බන්ධ වූ යම් ගෙවීමක මුදල අධිභාරයක් වශයෙන් ඔහුගෙන් අයකර ගැනීමට ඇති බැඳීමෙන් ඒ සභිකයා මේ වගන්තියේ වූ කිසිවක් හේතුකොටගෙන නිදහස් නොවිය යුතු ය.

විධිමත් නොවීම පිළිබඳ සහනය.

222. මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධාන සාරානුකූලව හා බලාන්විත භාවයෙන් යුක්තව පිළිපදිනු ලැබ තිබේ නම්, මේ ආඥාපනත යටතේ හෝ ඒ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කිසි ම නීති කෘත්‍යයක්, එහි විධිමත් භාවය නොමැති වීම නිසා, යම් අධිකරණයක දී නිශ්ප්‍රභ කිරීම හෝ ඉවත ලීම හෝ කරනු නොලැබිය යුතු ය.

## නිලධරයන්ගේ බලතල සහ වගකීම්

සභාපතිවරයාගේ බලතල සභාවේ නිලධරයන් වෙත පවරාදීම.

223. ඉටු කරන ලෙස සහ ක්‍රියාත්මක කරන ලෙස මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින්, රීතියකින් හෝ නියෝගයකින් නගර සභාවක සභාපතිවරයා වෙත බලය දී ඇති සියලු කාර්ය සහ බලතල, සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා සාමාන්‍ය වශයෙන් හෝ විශේෂයෙන් ලිඛිතව බලය පවරන ලද සභාවේ යම් නිලධරයකු විසින්, සභාපතිවරයාගේ විධානයන්ට සහ පාලනයට යටත්ව, ඒ ලිඛිත බලයේ සඳහන් කළ හැකි කාල සීමාවක් සහ ප්‍රමාණයක් වුව හොත් ඒ කාල සීමාව තුළ සහ ඒ ප්‍රමාණය දක්වා ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

සභාවේ නිලධර යන් වෙත සාමාන්‍ය අධිකාර පැවරීම සඳහා සභාවට ඇති බලය.

224. මේ ආඥාපනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින්, රීතියකින් හෝ නියෝගයකින් හෝ කිරීමට, දීමට සහ ලබා ගැනීමට නගර සභාවක් වෙත බලය පැවරී ඇති සියලු කුවිතාන්සි සහ අනුමත කිරීම්, සභාපතිවරයාගේ සාමාන්‍ය පාලනයට යටත්ව, කිරීමට, දීමට සහ ලබාගැනීමට, නගර සභාව විසින් යෝජනා සම්මතයක් මගින් සභාවේ යම් නිලධරයකුට, සාමාන්‍ය අධිකාරයක් කලින් කල අවශ්‍ය විය හැකි පරිදි දෙනු ලැබිය හැකි ය. තවද, ඒ නිලධරයා විසින් කරන ලද හෝ දෙන ලද හෝ ලබාගන්නා ලද සියලු ක්‍රියා, කුවිතාන්සි සහ අනුමත කිරීම්, ඒ යෝජනා සම්මතය බලාත්මකව පවත්නා තාක් ඒ ක්‍රියා, කුවිතාන්සි සහ අනුමත කිරීම් සභාව විසින් කරන ලද හෝ දෙන ලද විටක මෙන් අනුගාමී සහ වලංගු විය යුතු ය.

සභාවේ නිලධර යන්ට අවහිර කිරීම පිළිබඳ දඬුවම.

225. මේ ආඥාපනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක විධිවිධාන අනුව යම් විධිවිධානයක් යටතේ හෝ එ ප්‍රකාර හෝ නගර සභාවක යම් නිලධරයකු වෙත පැවරී ඇති හෝ පිරිනමනු ලැබ ඇති යම් කාර්යයක් කිරීමේ දී හෝ එසේ පැවරී ඇති හෝ පිරිනමනු ලැබ ඇති යම් අධිකාරයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට හිතාමතාම අවහිර කරන තැනැත්තකු වුව ද වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි යම් කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට ද යටත් විය යුතු ය.

[1984 අංක 46 § 32.]

සභාවේ නිලධර යන් විසින් බලය නොනිසි ලෙස පාවිච්චි කිරීම පිළිබඳ දණ්ඩනය.

226. මේ ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ රීතියක අධිකාරය යටතේ යම් ක්‍රියාවක් කිරීමේ ව්‍යාජයෙන් යම් තැනැත්තකුට අනවශ්‍ය ලෙස සැහැසි වන හෝ යම් පීඩාවක් හෝ කරදරයක් සිදු වීමට සලස්වන, නගර සභාවක යම් නිලධරයකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව ඊට වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

[1984 අංක 48 § 33.]

සභාවේ නිලධරයන් සහ සේවකයන් ගිවිසුම් ගැන සම්බන්ධතා නොදැක්විය යුතු බව.

227. (1) යම් නගර සභාවක කිසි ම සභිකයකු විසින්, නිලධරයකු විසින් හෝ සේවකයකු විසින් සභාව සමග එළඹි යම් ගිවිසුමක හෝ සභාව සඳහා ඉටු කරන ලද යම් වැඩක් පිළිබඳව සැලකිල්ලක් හෝ යම් මුදල් සම්බන්ධතාවක් හෝ නියම වශයෙන් හෝ අනියම් වශයෙන් නොදැක්විය යුතු ය.

(2) නගර සභාවක යම් සභිකයකු විසින් හෝ නිලධරයකු විසින් හෝ සේවකයකු විසින් සභාව සමග එළඹි යම් ගිවිසුමක හෝ සභාව සඳහා ඉටු කරන ලද වැඩක් පිළිබඳව සැලකිල්ලක් හෝ මුදල් සම්බන්ධතාවයක් දැක්වුවහොත්, ඔහු රුපියල් පන්දහසකට





නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු අතර, අවශ්‍යානුකූල පරිදි, සභාවේ සභිකයකු වශයෙන් අසුන් ගැනීමට හෝ සභාව යටතේ නිලයක් දැරීමට හෝ සේවයෙහි යෙදී සිටීමට හෝ නුසුදුස්සකු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් නීතිගත කරන ලද සමාගමක කොටස්කරුවකු වන කිසි ම තැනැත්තකු, ඒ සමාගම සහ සභාව අතර යම් ගිවිසුමක් තිබීම හෝ සභාව සඳහා එම සමාගම විසින් යම් වැඩක් කරනු ලැබීමේ හේතුව නිසා ම පමණක්, ඒ දඬුවමට යටත් නොවිය යුතු ය.

228. ප්‍රාදේශීය අරමුදලින් ගෙවනු ලබන, නගර සභාවේ සෑම නිලධරයකු ම හෝ සේවකයකු ම සහ නගර සභාවක් විසින් හෝ එහි අධිකාරය යටතේ නගර සභාවේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් යම් බද්දක් හෝ යම් ගෙවීමක් එකතු කිරීම භාර දෙනු ලැබ සිටින සෑම කොන්ත්‍රාත්කරුවකු හෝ අනුයෝජිතයකු සහ ඒ බද්ද හෝ ගෙවීම එකතු කිරීම සඳහා ඒ කොන්ත්‍රාත්කරු විසින් හෝ අනුයෝජිතයා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සෑම සේවකයකු හෝ වෙනත් සෑම තැනැත්තකු ම දණ්ඩ නීති සංග්‍රහයෙහි රජයේ සේවකයා යන පදයෙන් භාවිත අර්ථය ඇතුළත රාජ්‍ය සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

නගර සභාවක නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් විය යුතු බව.

## X වන කොටස

## *ඉවත් කිරීම, පවත්නා නීති අදාළ කිරීම, අන්තර්කාලීන විධිවිධාන සහ විවිධ විධිවිධාන

ඉවත් කිරීම.

230. හයවන උපලේඛනයෙහි එකින් එක සඳහන් කර ඇති ප්‍රඥප්ති, එම සභාව සංස්ථාපනය කරන ලද දිනය වශයෙන් මේ ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ නියමය කිසි ප්‍රකාශයට පත් කරන ලද දිනයේ සිට මේ ආඥාපනත යටතේ නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ යම් නගරයක කාර්යයන් සඳහා මිස ඉන් ඔබ්බට නොවනු සේ ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් නගර සභාවක් සංස්ථාපනය කරන ලද යම් නගරයක් ඇතුළත පිහිටි ප්‍රධාන මංමාවත් හෝ එහි යම් කොටස් සම්බන්ධයෙන්, මේ ආඥාපනතේ අනන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා නොමැති වූ ද අමාත්‍යවරයා සතු වූ ද අයිතිවාසිකම්වලට, බලතලවලට සහ කාර්යයන්ට, මේ වගන්තියේ අන්තර්ගත කිසිවකින් බල පෑමක් සිදුවේ යැයි සලකනු නොලැබිය යුතු අතර, කිසි ම අන්දමකින් ඒ අයිතිවාසිකම්වලට, බලතලවලට සහ කාර්යයන්ට හීන වීමක් වේනැයි සලකනු නොලැබිය යුතු ය.

* 229 වන වගන්තිය 1984 අංක 48 දරන පනතේ 35 වන වගන්තිය මගින් ඉවත් කරන ලදී.

*පවත්නා නීතිවල අර්ථ නිරූපනය කිරීම සහ ඒ නීති අදාළ කිරීම.*

**231.** ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ සංස්ථාපිත පළාත් ආණ්ඩු සභාවකට හෝ ඒ පළාත් ආණ්ඩු සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයකට මේ ආඥාපනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම දිනයෙහි අදාළ වන නීතියේ සෑම විධිවිධානයක් ම, ඒ විධිවිධාන මේ ආඥාපනත යටතේ සංස්ථාපිත නගර සභාවකට හෝ එකී යම් නගර සභාවක් සංස්ථාපනය කරන ලද නගරයකට අදාළ කරවීමේ කාර්යයන් සඳහා, පළාත් ආණ්ඩු සභාවක් පිළිබඳව හෝ පළාත් ආණ්ඩු සභාවක පරිපාලන සීමාව ඇතුළත ප්‍රදේශ පිළිබඳව ඒ විධිවිධානයේ ඇතුලත් සෑම සඳහන් කිරීමක් ම, නගර සභාවක් පිළිබඳව හෝ මේ ආඥාපනත යටතේ නගර සභාවක් සංස්ථාපනය කරන ලද නගරය පිළිබඳව කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

*ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනත යටතේ හෝ වතු පාරවල් පිළිබඳ ආඥාපනත යටතේ හෝ තවත් පාරවල් ඉදි නොකළ යුතු බව.*

**232.** මේ ආඥාපනත යටතේ නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ යම් නගරයක් ඇතුළත, 1896 ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනතේ හෝ වතු පාරවල් පිළිබඳ ආඥාපනතේ විධිවිධාන යටතේ කිසි ම පාරක්, මේ ආඥාපනත ආරම්භ කිරීමෙන් පසුව තවත් ඉදි කරනු නොලැබිය යුතු අතර, ඒ නගරය ඇතුලත වූ යම් පාරකට හෝ පාලමකට 1896 ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනත සහ වතු පාරවල් පිළිබඳ ආඥාපනත ව්‍යාප්ත කරවීම සඳහා පිළිවෙළින් ඒ ආඥාපනත් වල 42 වන වගන්තිය යටතේ හෝ 37 වන වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කරනු නොලැබිය යුතු ය.

*ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනත සහ වතු පාරවල් පිළිබඳ ආඥාපනත උපයෝග කරගැනීම.*

**233.** යම් නගර සභාවක් සංස්ථාපනය කරන ලද යම් නගරයක් ඇතුළත පිහිටි යම් ශාඛා පාරක් හෝ වතු පාරක් ඒ සභාව වෙත පවරනු ලබන තුරු 1896 ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනතේ විධිවිධාන, පහත සඳහන් මඳ වෙනස් කිරීම් සහිතව ඒ ශාඛා පාරට හෝ වතු පාරට නොකඩව අදාළ විය යුතු ය.

(අ) පළාත්බද මාර්ග භාරක සභාව පිළිබඳව කර ඇති සියලු සඳහන් කිරීම්, නගර සභාව පිළිබඳව කර ඇති සඳහන් කිරීම් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය;

(ආ) පළාතක් පිළිබඳව කර ඇති සියලු සඳහන් කිරීම්, නගරය පිළිබඳව කර ඇති සඳහන් කිරීම් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය;

(ඇ) එකී ආඥාපනත් දෙකෙන් කවර හෝ එකක් යටතේ අර්ථ කථනය කරනු ලැබ ඇති යම් දිස්ත්‍රික්කයක්, නගර සභා සංස්ථාපනය කරනු ලැබ ඇති නගර දෙකකට හෝ ඊට වැඩි ගණනකට ඇතුලත් වන යම් අවස්ථාවක දී, ඒ දිස්ත්‍රික්කය විෂයයෙහි පරිපාලනය අයත්ව තිබෙන්නේ ඒ සභා අතුරින් කවර සභාවකටදැයි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර ඒ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පළාත්බද මාර්ග භාරක සභාව ගැන සහ පළාත ගැන කරනු ලැබ ඇති සියලු සඳහන් කිරීම්, ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.





*අලුත් බදු පැනවූ විට වතු පිළිබඳ සහ ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනත් යටතේ ගෙවනු ලබන දායක මුදල් නතර විය යුතු බව.*

**234.** 1896 ශාඛා පාරවල් පිළිබඳ ආඥාපනත යටතේ හෝ වතු පාරවල් පිළිබඳ ආඥාපනත යටතේ අර්ථ කථනය කරනු ලැබ ඇති යම් දිස්ත්‍රික්කයක් තුළ පිහිටි වතුවලට බල පවත්නා වූ ද මේ ආඥාපනත යටතේ නගර සභාවක් විසින් පනවනු ලැබුවා වූ ද යම් වරිපනම් බද්දක් හෝ බද්දක්, ඒ වතු සම්බන්ධයෙන් ගෙවිය යුතු වන දිනයේ සිට හෝ දිනයෙන් පසු, ඒ ආඥාපනත් දෙකෙන් කවර හෝ එකක් යටතේ ඒ වතු අනාගත යම් වින්නක් සම්බන්ධයෙන් (එවකට ගෙවිය යුතුව ඇති දායක මුදල් නොවන) කිසි ම දායක මුදලක් ගෙවනු නොලැබිය යුතු නමුත්, මංමාවත් ආඥාපනත යටතේ ප්‍රධාන මංමාවත් ලෙස ප්‍රකාශ කරනු නොලැබුවා වූ, ඒ දිස්ත්‍රික්කයේ සියලු ශාඛා පාරවල් හෝ වතු පාරවල්, නගර සභාව වෙත සතු කළ යුතු අතර, නගරසභාව විසින් ඒ පාරවල් නඩත්තු කරනු ලැබිය යුතුවාක් මෙන් ම අලුත් වැඩියා ද කරනු ලැබිය යුතු ය.

*ගම්සභා ආඥාපනත බලපවත්නා ප්‍රදේශ තුළ අලුත් බදු පැනවීමේ ප්‍රතිඵල.*

**235.** නගරයක නගර සභාව විසින් මේ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් අලුත් වරිපනම් බද්දක් හෝ බද්දක් ගම් සභා ආඥාපනත බල පවත්නා ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයක් වන හෝ එහි කොටසක් වන නගරයක යම් කොටසක වැසියන් විසින් ගෙවිය යුතු වන දිනයේ දී හෝ ඒ දිනයෙන් පසුව, නගරයේ ඒ කොටස ඇතුළත් වන ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපිත ගම් සභාව විසින්, නගරයේ ඒ කොටසේ පාරවල් ඉදි කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යයන් සඳහා බද්දක් අය නොකළ යුතුවාක් මෙන්ම, ඒ ගම් සභාව විසින් සුදුස්සක් කළ හැකිව තිබෙන අරමුදල්වලින් යම් කොටසක් යොදවනු ලැබීම නොකළ යුතු ය.

*නගර සභා පළාත් පාලන ආයතනවල අනුප්‍රාප්තිකයන් විය යුතු බව.*

**236.** (1) ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද යම් පළාත් පාලන ආයතනයක පාලනය යටතේ පැවති යම් සම්පූර්ණ පරිපාලන ප්‍රදේශයක් හෝ ඉන් යම් කොටසක් මේ ආඥාපනත යටතේ නගර සභාවක් සංස්ථාපනය කරන ලද නගරයකට අඩංගු වන යම් අවස්ථාවක දී, නගර සභාව සංස්ථාපනය කරන ලද දින සිට ඒ පරිපාලන ප්‍රදේශය හෝ කොටස සම්බන්ධ සියලු කාර්යයන් සඳහා ඒ නගර සභාව ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නගරයක් සඳහා නගර සභාවක් සංස්ථාපනය කරන ලද දිනයේ සිට බල පැවැත් වෙන පරිදි,—

(අ) ඒ උපවගන්තියෙහි සඳහන් පළාත් පාලන ආයතනයට අයත් වූ ද ඒ නගරය ඇතුළත පිහිටා තිබිය හැකි වූ ද ඒ පළාත් පාලන ආයතනයේ අරමුදල් නොවන සියලු දේපළ;

(ආ) ඒ පළාත් පාලන ආයතනයේ අරමුදල් සියල්ල හෝ, ඒ ආයතනයේ පරිපාලන ප්‍රදේශයේ යම් කොටසක් පමණක් නගරයට අඩංගු වන යම් අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ඉහත කී අරමුදලේ යම් කොටසක් ; සහ

(ඇ) එම ආයතනයේ සියලු අයිතිවාසිකම්, බලතල, කාර්ය, ණය, වගකීම් සහ බැදීම්, ඒවා නගරය ඇතුළත යම් ප්‍රදේශයකට අදාළ වන ප්‍රමාණයට,

එම සභාවට පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ ආඥාපනතින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලැබ ඇති ප්‍රමාණයකට හැර, යම් පළාත් පාලන ආයතන පංතියක් ගැන හෝ එක්තරා විශේෂිත පළාත් පාලන ආයතනයක් ගැන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක, රීතියක, නියෝගයක හෝ අතුරු ව්‍යවස්ථාවක හෝ ඒ අනුව ලියා අත්සන් කරන ලද හෝ නිකුත් කරන ලද යම් ලේඛනයක හෝ සාධන පත්‍රයක කර ඇති සියලු සඳහන් කිරීම්, ඒවා මේ ආඥාපනත යටතේ, සංස්ථාපනය කරනු ලැබූ නගර සභා ගැන කරන ලද සඳහන් කිරීම් ලෙස හෝ, එක්තරා විශේෂිත පළාත් පාලන ආයතනයක් ගැන කර ඇති සඳහන් කිරීමක් සම්බන්ධයෙන් වන විට ඒ පළාත් පාලන ආයතනය අනුප්‍රාප්තිකයා වන නගර සභාව ගැන කරන ලද සඳහන් කිරීමක් ලෙස, එකී යම් සභා හෝ සභාවක් සංස්ථාපනය කරන ලද දිනයේ සිට, ප්‍රශ්නයට භාජනයව ඇති කාරණයේ කාර්යයන් සඳහා තේරුම් ගත යුතු ය.

(4) මේ වගන්තියේ හෝ ඉන් පසුව එන වගන්තිවල කාර්යයන් සඳහා, "පළාත් පාලන ආයතනය" යන යෙදුමෙන් යම් මහ නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

පවත්නා ඇප සහ ණය නිදහස් කිරීම ව්‍යාවර්තනය කිරීම.

237. (1) මේ ආඥාපනතින් යම් නගර සභාවක් වෙත පවරන ලද යම් වරිපනම් බද්දක්, බද්දක් හෝ දේපළක් ඇපයට තබා පළාත් පාලන ආයතනයක් විසින් ලබා ගෙන ඇති ණය කිසිවකට මේ වගන්තියේ සඳහන් කිසිවකින් හානිකර අන්දමේ බල පෑමක් නොවිය යුතු ය. තවද, එසේ ආරක්ෂිත සියලු ණය ද මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ යම් පළාත් පාලන ආයතනයකින් නගර සභාවකට පවරන ලද යම් දේපළකට සම්බන්ධ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී එම පළාත් පාලන ආයතනයක් විසින් දරන ලද සියලු අනාරක්ෂිත ණය ද වගකීම් ද බැදීම් ද ඒ නගර සභාව විසින් නිදහස් කිරීම ද ගෙවීම ද ඉටු කිරීම ද කරනු ලැබිය යුතු ය.

(2) යම් පළාත් පාලන ආයතනයක බලතල, කාර්ය සහ බැදීම් මේ ආඥාපනතින් යම් නගර සභාවක් වෙත පැවරිය යුතු විටක, ඒ පළාත් පාලන ආයතනය විසින් දරන ලද සියලු පවත්නා ණය සහ බැදීම්, එකී පැවරීමේ දිනයට පෙර හැකි තාක් දුරට ගෙවා නිම කිරීම එහි ස්වකීය බලතල, කාර්ය සහ බැදීම් මේ ආඥාපනතින් යම් නගර සභාවක් වෙත පැවරිය යුතු වන සෑම පළාත් පාලන ආයතනයක ම කාර්යය විය යුතු ය.





ප්‍රකාශන, නියම, රීති සහ නිවේදන නොකඩව බල පැවැත්වීම.

238. ස්වකීය බලතල සහ කාර්ය මේ ආඥාපනත යටතේ යම් නගර සභාවක් වෙත පවරනු ලැබුයේ යම් පළාත් පාලන ආයතනයක ද ඒ පළාත් පාලන ආයතනයේ හෝ ඊට බලපාන සහ පැවරීම කෙරෙන අවස්ථාවේ බලාත්මක තිබූ ප්‍රකාශන, නියම, නිවේදන, රීති, නියෝග සහ අතුරු ව්‍යවස්ථා සියල්ල, එසේ පවරන ලද බලතලවලට සහ කාර්යයන්ට ඒවා අදාල වනතාක් දුරට හෝ ඒවායේ බලතලවලට සහ කාර්යයන්ට අනුව වන තාක් දුරට හෝ නගර සභාව සංස්ථාපනය කරන ලද නගරය තුළ වූ යම් ප්‍රදේශයක් ඇතුළත ඇති යම් කාරණයකට හෝ දෙයකට ඒවා අදාළ වන තාක් දුරට සහ ඒවා මේ ආඥාපනතේ විධිවිධාන සමග ඝට්ටනය නොවන තාක් දුරට, ඒවා මේ ආඥාපනත යටතේ නගර සභාවේ බලතල සම්බන්ධයෙන් හෝ ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සාදන ලද ඒවා මෙන් ද, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා විසින් හෝ නගර සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීමට හෝ වෙනස් කරනු ලැබීමට යටත්ව සහ පැවරීම කරන අවස්ථාවේ දී හෝ ඒ සම්බන්ධයෙන් මේ ආඥාපනත අනුව කරනු ලැබිය හැකි යම් ව්‍යතිරේඛයන්ට හෝ සුළු වෙනස් කිරීම්වලට යටත්ව ද, නොකඩව බලාත්මක තිබිය යුතු ය.

පවතිමින් තිබූ නඩු සහ ගිවිසුම් ආදිය සඳහා ව්‍යාවර්තනය.

239. (1) මේ ආඥාපනතින් යම් නගර සභාවක් වෙත පවරන ලද යම් බලතල, කාර්ය, බැදීම් හෝ දේපළ සම්බන්ධයෙන යම් පළාත් පාලන ආයතනයක ප්‍රතිලාභය සඳහා හෝ ඊට විරුද්ධව ඒ නගර සභාව සංස්ථාපනය කරන ලද දිනයේ දී අවසන් නොවී ඇති හෝ පවත්නා යම් නඩුවකට හෝ නීති කෘත්‍යයකට හෝ යම් නඩුවක හෝ නීති කෘත්‍යයක නිමිත්තකට, නගර සභාව සංස්ථාපනය කිරීමේ හේතුව නිසා යම් අන්දමකින් හානිකර බලපෑමක් නොවිය යුතු අතර, ඒ සභාව සංස්ථාපනය කරනු නොලැබිණි නම් ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ නඩුව හෝ නීති කෘත්‍යය හෝ නඩුවේ හෝ නීති කෘත්‍යයේ නිමිත්ත නොකඩව ගෙන ගියාක් මෙන්, පවත්වාගෙන යනු ලැබුවාක් මෙන් සහ බලාත්මක කරනු ලැබුවාක් මෙන්, ඒ පළාත් පාලන ආයතනයේ අනුප්‍රාප්තිකයා වශයෙන් එම සභාව විසින් හෝ ඊට විරුද්ධව එය නොකඩවා ගෙන යෑම, පවත්වා ගෙන යෑම සහ බලාත්මක කිරීම කරනු ලැබිය හැකි ය.

(2) යම් පළාත් පාලන ආයතනයක් විසින් එළඹෙනු ලැබුවා වූ ද නිකුත් කරනු ලැබුවා වූ ද, එසේ නැතහොත් කරනු ලැබුවා වූ ද ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රදේශය සඳහා නගර සභාවක් සංස්ථාපනය කරන ලද අවස්ථාවේ දී පැවැතියා වූ ද, මේ ආඥාපනතින් ඒ නගර සභාව වෙත පවරන ලද යම් බලතලවලට, කාර්යයන්ට, බැදීම්වලට, වගකීම්වලට හෝ දේපළවලට බලපාන්නා වූ ද, සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, දැන්වීම් හෝ වෙනත් සාධන පත්‍ර, එකී සභාව එකී ගිවිසුම්වල, ඔප්පුවල, බැඳුම්කරවල, එකඟවීම්වල, දැන්වීම්වල හෝ වෙනත් සාධන පත්‍රවල පාර්ශ්වකරුවකු වූ විටක මෙන් හෝ එකී සභාව විසින් එකී ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් දැන්වීම් හෝ වෙනත් සාධන පත්‍ර නිකුත්

කරන ලද හෝ ඊට එළැඹි විටක මෙන්, එම සභාවට විරුද්ධව හෝ පක්ෂව පූර්ණ ලෙස බලාත්මක සහ බල සහිත විය යුතු අතර ඒවා සම්පූර්ණයෙන් බල සහිතව බලාත්මක කරනු ලැබීමට සහ ඒ අනුව ක්‍රියා කරනු ලැබීමට ද හැකි ය.

නිලධරයන් සහ සේවකයෝ.

**240.** (1) මේ ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද යම් නගර සභාවක් අනුප්‍රාප්තිකයා වන්නේ යම් පළාත් පාලන ආයතනයක් සඳහා ද ඒ සෑම පළාත් පාලන ආයතනයක නිලධරයන් සහ සේවකයන්, ඒ සභාව සංස්ථාපනය කරනු ලැබූ විට, ඒ සභාවේ නිලධරයන් සහ සේවකයන් විය යුතු අතර, එම පළාත් පාලන ආයතනය යටතේ තම ධුර දැරූ ආකාරයෙන් ම සහ ඒ ධුර දැරුයේ යම් නියමයන් සහ කොන්දේසි යටතේ ද හැකි තාක් දුරට ඒ නියමයන් සහ කොන්දේසි උඩ, ඔවුන් විසින් තම ධුර දැරිය යුතු ය. තව ද ඒ කාර්යයන් ම හෝ ඊට අනුරූප කාර්යයන් ඉටු කරද්දී, හැකි තාක් දුරට ඔවුන් විසින් එම පළාත් පාලන ආයතනයෙන් ඔවුන්ට ලබා ගැනීමට අයිතිවාසිකම් තුබුණු යම් වැටුපකට, පාරිශ්‍රමිකයකට හෝ දීමනාවකට නොඅඩු වැටුපක්, පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ලැබිය යුතු අතර, ලබා ගැනීමට අයිතිවාසිකම් තුබූ යම් විශ්‍රාම වැටුපක් සහ පාරිතෝෂික මුදලක් තුබුනහොත්, ඊට නොඅඩු විශ්‍රාම වැටුපක් සහ පාරිතෝෂික මුදලක් ලැබීමට ඔවුන්ට හිමිකම් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නිලධරයන් විසින් හෝ සේවකයන් විසින් ඉටු කළ යුතු කටයුතු, නගර සභාව විසින් සුදුසු යැයි සිතිය හැකි අන්දමින් බෙදාදීම නගර සභාව විසින් කළ හැකි අතර, ඒ සෑම නිලධරයකු හෝ සේවකයකු විසින් ඒ කටයුතුවලට සම්බන්ධ කාර්යයන්, සභාව විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි ඉටු කරනු ලැබිය යුතු ය.

වැටුප් ආදිය සැකසීම.

**241.** 230 වන වගන්තියෙහි සඳහන් වගකීම්වල සහ බැදීම්වල යම් පැවරීමක් කරන ලද විට ඇති විය හැකි අලුත් තත්ත්වයන්ට මුහුණ පෑමේ අපේක්ෂාවෙන්, 240 වන වගන්තියෙහි සඳහන් යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ වැටුප්, පාරිශ්‍රමික, දීමනා, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ කාර්ය සැකසීමේ කාර්යය සඳහා, අවස්ථාවේ යෙදී ඇති සියලු කරුණු අනුව සුදුසු යැයි සහ සාධාරණ යැයි නගර සභාව විසින් සිතනු ලැබිය හැකි විධිවිධාන, යෝජනා සම්මතයක් මගින් සැලැස්වීම සභාව විසින් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, එකී යම් යෝජනා සම්මතයකින් අතාප්තියට පත් යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ඒ ගැන කොමසාරිස්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලද විටක, නගර සභාව විසින් මේ වගන්තිය යටතේ සලස්වනු ලැබිය හැකි අන්දමේ යම් විධිවිධාන යක් කොමසාරිස්වරයා විසින් නියමයක් මගින් සලස්වනු ලැබිය හැකි ය.





මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් ආදිය දීම සඳහා අතීතයටත් බලපාන සේ අතුරු ව්‍යවස්ථා අදාළ කරගැනීමට බලය ලත් නගර සභාවකට ඇති බලය.

**242.** මේ ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ ලෙස 246 වන වගන්තිය යටතේ සලකනු ලබන්නා වූ ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබුවා වූ ද, යම් නගර සභාවක් විසින් යෝජනා සම්මතයක් මගින්,—

(අ) මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ වැන්දඹුවන්ට, දරුවන්ට, ළඟම ඥාතීන්ට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික දීමනා සැපයීම සඳහා එම සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, යම් නිලධරයකු හෝ සේවකයකු සභාවේ සේවයෙහි නිරතව සිටින අතර තුර 1933 ජනවාරි මස 1 වන දිනට පෙර නොවන දිනයක දී මිය ගියේ යැයි සභාව සෑහීමකට පත් වන අවස්ථාවක දී, ඒ නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් අතීතයටත් බල පාන ලෙස අදාළ කරගත යුතු යැයි ; සහ

(ආ) මියගිය යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ වැන්දඹුවකට හෝ දරුවන්ට ඒ යෝජනා සම්මතය අනුව ප්‍රදානය කරන ලද යම් විශ්‍රාම වැටුපක්, ඒ නිලධරයා හෝ සේවකයා මිය ගිය දින සිට ගෙවිය යුතු යැයි

ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

ධුර නැති කිරීම.

**243.** 239 වන වගන්තියෙහි සඳහන් වගකීම්වල හෝ බැදීම්වල යම් පැවරීමක් කරන ලද විටක, නගර සභාවක් විසින් අනවශ්‍ය යැයි සිතනු ලබන යම් ධුරයක්, ඒ නගර සභාව සංස්ථාපනය කරනු ලැබීමට පෙර ඒ ධුරය දරන්නා සේවයෙහි නියුක්තව සිටියේ යම් පළාත් පාලන ආයතනයක ද ඒ පළාත් පාලන ආයතනය විසින් එම ධුරය නැති කරනු ලැබිණි නම් ඔහු විසින් ලැබීමට අයිතිවාසිකම් ඇති වන්දියක් ධුරය නැති කරන අවස්ථාවේ දී ඔහු වෙත ගෙවීමට යටත් ව, ඒ නගර සභාව විසින් නැති කරනු ලැබිය හැකි ය.

වරිපනම් බදු සහ තක්සේරු කිරීම.

**244.** (1) යම් නගර සභාවක් අනුප්‍රාප්තිකයා වන්නේ යම් පළාත් පාලන ආයතනයක් සඳහා ද ඒ පළාත් පාලන ආයතනය විසින් පනවනු ලැබුවා වූ ද සභාව සංස්ථාපනය කරන ලද දිනයේ දී අය වීමට තිබිය හැකි වූ ද සියලු වරිපනම් බදු සහ බදු, සභාව විසින් පනවන ලද වරිපනම් බදු සහ බදු අය කරගන්නා ආකාරයෙන් ම බලාත්මක කිරීම සහ අය කර ගැනීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා පළාත් පාලන ආයතනය විසින් කරන ලද හෝ යොදා ගන්නා ලද සියලු තක්සේරු කිරීම්, මේ ආඥාපනතින් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් නගර සභාව විසින් ප්‍රතිශෝධනය කරනු ලබන තුරු, නොකඩව බලාත්මක විය යුතු ය.

පැවරීම් කරන විට දේපළ සහ ණය සාධාරණ ලෙස සැකසීම.

**245.** (1) යම් නගර සභාවක් හෝ නගර සභා අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් වන්නේ යම් පළාත් පාලන ආයතනයක් හෝ පළාත් පාලන ආයතනය සඳහා ද ඒ පළාත් පාලන ආයතනයේ හෝ පළාත් පාලන ආයතනවල පරිපාලන සීමා තුළ වූ ප්‍රදේශය, මේ

ආඥාපනත යටතේ ඒ නගර සභාව හෝ සභා සංස්ථාපනය කිරීමේ කාර්යය සඳහා උපකොටස්වලට බෙදන ලද අවස්ථාවක දී හෝ යම් නගර සභාවකට හෝ නගර සභාවලට පවරන ලද එබඳු පළාත් පාලන ආයතන දෙකක හෝ ඊට වැඩි ගණනක පරිපාලන සීමාවල ඒ ඒ මායිම්වල යම් වෙනසක් අන්‍යාකාරයකින් කරන ලද අවස්ථාවක දී, එකී යම් පළාත් පාලන ආයතනයකින් හෝ පළාත් පාලන ආයතනවලින් එකී යම් නගර සභාවක් වෙත පවරන ලද ඒ ඒ දේපළවලට, අයිතිවාසිකම්වලට, ණයවලට, වගකීම්වලට සහ බැඳීම්වලට අදාළ සියලු කාරණා, ඉන් බලපෑමක් වූ නගර සභා අතර වූ එකඟවීමක් මගින් හෝ එබඳු එකඟ වීමක් ප්‍රායෝගික නොවේනැයි ඔප්පු වුවහොත් අමාත්‍යවරයාගේ නියමයක් මගින් සාධාරණ ලෙස සකසනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නගර සභා දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර වූ සෑම එකඟ වීමක් සහ අමාත්‍යවරයා විසින් කරන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් කරන ලද සෑම නියමයක් ම එසේ පළ කරනු ලැබූ විට එය මේ ආඥාපනතේ අන්තර්ගත කරනු ලැබූ විටක මෙන් බල සහිත විය යුතු ය.

**වියදම් සළස්වා නොමැති ප්‍රශ්න සැකසීම.**

*247. ලංකාව මුළුල්ලේ ම හෝ යම් නිශ්චිත ස්ථානයක හෝ ප්‍රදේශයක සාමාන්‍ය වශයෙන් හෝ යම් විශේෂ කාරණයක් හෝ කාරණා සම්බන්ධයෙන් මේ ආඥාපනත ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය ප්‍රාථමික වැඩ වර්ගවල පිළිබඳව, බලාපොරොත්තු නො වූ අවස්ථා හෝ විශේෂ අවස්ථා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස හෝ තීරණය කිරීම සඳහා හෝ සැකසීම සඳහා මේ ආඥාපනතින් කිසි ම විධිවිධානයක් හෝ කිසි ම ඵලදායී විධිවිධානයක් සලස්වනු නොලැබ ඇති යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම පිණිස හෝ සැකසීම පිණිස හෝ අමාත්‍යවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන සියලු විධාන, ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, නිකුත් කරනු ලැබිය හැකි ය.

**ආඥාපනතේ නිශ්චිත විධිවිධාන නිශ්චිත සීමා ඇතුළත අදාළවීම බැහැර කිරීමට ඇති බලය.**

248. මේ ආඥාපනත යටතේ නගර සභාවක් සංස්ථාපනය කරනු ලැබූ යම් නගරයක පරිපාලන සීමා ඇතුළත හෝ ඒ පරිපාලන සීමා තුළ වූ යම් නිශ්චිත ප්‍රදේශයක් ඇතුළත හෝ මේ ආඥාපනතේ යම් නිශ්චිත විධිවිධානයක්, සම්පූර්ණ වශයෙන් ම හෝ කොටසක් වශයෙන් හෝ අදාළ නොවිය යුතු යැයි, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

**අර්ථ නිරූපනය.**

249. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ආඥාපනතේ—

"පරිපාලන ප්‍රදේශය" යන්නෙන්, පළාත් පාලන (පරිපාලන ප්‍රදේශ) ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් මායිම් නියම කරනු ලැබූ පරිපාලන ප්‍රදේශයක් අදහස් වේ;

* 246 වන වගන්තිය අන්තර්ගත ලදී.



"වාර්ෂික වටිනාකම" යන්නෙන්, යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් සඳහා, පොදු වර්පනම් බදු හා බදු ගෙවීමට කුලී නිවැසියා විසින් භාර ගනු ලැබී නම් හා එහි ඇතුළිය ඉල්ලා සිටීමට නිසි තත්ත්වයක ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපත තබා ගැනීමට අවශ්‍ය අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා මනා ලෙස තබා ගැනීමේ වියදම් තිබිවක් වේනොත්, ඒ වියදම් ගෙවීමට ගෙහිමියා විසින් භාර ගනු ලැබී නම්, එක් වර්ෂයක් තවත් වර්ෂයක් සමග ගනු ලැබූ විට කුලී නිවැසියා විසින් ගෙවිය යුතු යැයි සාධාරණව අපේක්ෂා කළ හැකි වාර්ෂික කුලිය අදහස් වේ;

එසේ වුව ද, වාර්ෂික වටිනාකම ගණනය කිරීමේ දී හා තක්සේරු කිරීමේ දී, නැනැතියාව නොමැති වූ යම් කාල පරිච්ඡේදයක් සඳහා කිසි ම ඉඩ හැරීමක් හෝ අඩු කිරීමක් නොකළ යුතු ය;

"නියමිත දිනය" යන්නෙන් 1940 ජනවාරි මස 1 වන දිනය අදහස් වේ;

"සහකාර කොමසාරිස්වරයා" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, ඒ නගරය පිහිටි පරිපාලන ප්‍රදේශය සඳහා වූ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා අදහස් වේ;

"ගොඩනැගිල්ල" යන්නට මනුෂ්‍ය වාසය සඳහා භාවිත කරනු ලබන්නා වූ හෝ නොඑසේ වූ යම් ගෙයක්, ගරාජයක්, මඩුවක්, පැලක් හෝ වහලක් සහිත කොටු කළ ප්‍රදේශයක් සහ යම් බිත්තියක් ද ඇතුළත් වන අතර, ඇළක් හෝ ගංගාවක් හෝ වන්නා වූ මංමාවතකට අදාළ යම් පද සම්බන්ධයක දී, යම් ගොඩබසින පාලමක්, ගොඩබසින වේදිකාවක් හෝ පාලමක් සහ ඊට ඇඳුණු හෝ සම්බන්ධ කළ යම් නිර්මාණයක් ද ඇතුළත් වේ;

"ඇළ" යන්නෙන්, යම් ප්‍රසිද්ධ ඇළක් අදහස් වන අතර, ඒ ඇළේ පැති, ඇදගෙන යෑම පිණිස වූ මාර්ග, කාණු, කාණු සහ අගල් ද සමග එහි ඉවුරෙන් ඉවුරට ඇති සම්පූර්ණ ජල මාර්ගය සහ, ඒ ඇළ ආරක්ෂා කිරීම සඳහා හෝ එහි යහපත සඳහා වෙන් කොට ඇති, ඒ ඇළට යාබද සියලු ඉඩම් ද ඇතුළත් වේ;

"සභාපතිවරයා" සහ "උප සභාපතිවරයා" යන යෙදුම්වලින් තත් කාර්යයට අදාළව තත් කාලයෙහි බල පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව නගර සභාවකට තෝරා පත් කර ගන්නා ලද සභාපතිවරයෙක් හෝ උප සභාපතිවරයෙක් පිළිවෙලින් අදහස් වේ. [1977 අංක 24 5 136.]

"කොමසාරිස්වරයා" යන්නෙන්, පළාත් පාලන කොමසාරිස්වරයා හෝ යම් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්වරයෙක් අදහස් වේ;

"දිස්ත්‍රික්කය" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ;

"ඡන්ද විමසීම් නිලධරයා" යන්නෙන්, තත් කාර්යය සඳහා තත් කාලයේ අදාළ වන ලඞ්කා නීතියේ විධිවිධාන යටතේ පත් කරන ලද, දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා අදහස් වන අතර, එසේ පත් කරන ලද යම් සහකාර ඡන්ද විමසීම් නිලධරයෙක් ඊට ඇතුළත් වේ;

"පළමුවන මහා ඡන්ද විමසීම" යන්නෙන්, මේ ආඥාපනත යටතේ නගරයක් සඳහා සංස්ථාපනය කළ යුතු නගර සභාවේ ප්‍රථම සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා පවත්වනු ලබන මහා ඡන්ද විමසීම අදහස් වේ;

"දිසාපතිවරයා" යන්නෙන්, යම් නගරයක පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා අදහස් වේ;

"ගෘහ මූලිකයා" යන්නෙන්, නැනැත්තකු පදිංචිව සිටින ගෙයක අයිතිකරු හෝ කොටසක අයිතිකරු හෝ බදු ගැනුම්කරු හෝ ප්‍රධාන පදිංචිකරු අදහස් වේ;

"වැසියා" යන්නෙන්, ශ්‍රී ලංකාවෙහි සිටිමින් තුන් මසක් හෝ ඊට වැඩි කාලයක් පදිංචිව සිටි නැනැත්තෙක් අදහස් වේ;

"ප්‍රාදේශීය අරමුදල" යන්නෙන්, යම් නගරයක් සම්බන්ධයෙන් වූ විට, එම නගරයේ නගර සභාව විසින් 158 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදල අදහස් වේ;

"කරදරය" යන්නට, දෘෂ්ටි, ආඝ්‍රාණ හෝ ශ්‍රවණ ඉන්ද්‍රියට පීඩාවක්, ප්‍රකෝපනයක්, අප්‍රසන්නතාවක්, හිංසාවක්, අන්තරායක් හෝ අලාභයක් ඇති කරවන හෝ ඇති කරවීමට ඉඩ ඇති එසේ නැතහොත් සෞඛ්‍යයට හෝ දේපළට අන්තරාදායක හෝ හානිකර හෝ එසේ අන්තරාදායක හෝ හානිකර වීමට ඉඩ ඇති යම් ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ දෙයක් ඇතුළත් වේ;

"අයිතිකරු" යන්නට, එම වචනය යොදනු ලබන්නේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ කුලිය තත් කාලයේ තමා වෙනුවෙන් ම හෝ වෙනත් යම් නැනැත්තකුගේ අනුයෝජිතයා හෝ භාරකරු වශයෙන් ලබාගන්නා නොහොත් ඒ ස්ථානය කුලී නිවැසියකුට කුලියට දෙනු ලැබ නම් ඒ කුලිය ලබාගන්නා නැනැත්තා ඇතුළත් වේ;

"ස්ථානය" යන්නට, සියලු ගේ දොර, ගොඩනැගිලි, ඉඩම් සහ පරවශතා ඇතුළත් වන අතර, ඒ පරවශතා අයිතිව තිබෙන්නේ යම් දේපලකට ද නැතහොත් ඒවා භුක්ති විඳිනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි කොටසක් ලෙස ඒ පරවශතා සලකනු ලැබිය යුතු ය;

"ප්‍රධාන මංමාවත" යන්නෙන්, ප්‍රධාන මංමාවත්වලට අදාළ යම් ප්‍රඥප්තියක් යටතේ වූ යම් ප්‍රකාශනයක් මගින්, නියමයක් මගින් හෝ නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ තදනන්තර ප්‍රකාශනයක් මගින්, නියමයක් මගින් හෝ නිවේදනයක් මගින් අවලංගු කරනු නොලැබූ යම් මංමාවතක් අදහස් වේ;

"නිසි නිලධරයා" යන්නෙන් නගර සභාවක විධානය අනුව, යම් මංමාවතක හෝ මංමාවතක් සම්බන්ධයෙන් කරන ලද හෝ කිරීමට ඇති යම් වැඩක් භාර නිලධරයා අදහස් වේ;

"පොදු වීථිය" යන්නෙන්, මහජනයාට මාර්ග අයිතියක් ඇත්තා වූද සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් යම් පොදු අධිකාරියක් විසින් අලුත්වැඩියා කරනු ලබන්නා වූ හෝ නඩත්තු කරනු ලබන්නා වූ හෝ අලුත්වැඩියා කරනු ලැබ ඇත්තා වූ හෝ නඩත්තු කරනු ලැබ ඇත්තා වූ ද, එසේ නැතහොත් යම් ප්‍රඥප්තියක් යටතේ හෝ නීතිය ක්‍රියාත්මක වීමේ දී ඒ අධිකාරියට පවරා දෙනු ඇත්තා වූ හෝ ඒ අධිකාරිය වෙත සතු කර දී ඇත්තා වූද යම් වීථියක් අදහස් වේ;

"ඉවත් කළ ප්‍රඥප්තිය" යන්නෙන්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතින් ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් අදහස් වේ;

"ගඟ" යන්නට, යාත්‍රා කළ හැකි සියලු පොදු ඔයවල්, වැව්, මෝය වල්, බොක්ක සහ මුහුදට ගලා යන දිය පාරවල් සහ ඊට අයත් ඇදගෙන යාම සඳහා වූ සියලු මාර්ග සහ වේලි ද ඇතුළත් වේ;

"පාර" යන්නට, පහත සඳහන් දේ ද ඇතුළත් වේ :—

(අ) සියලු පොදු රිය මාර්ග, කරත්ත පාරවල්, පාමගවල් සහ පාරකට අයත් හෝ ඊට අනුබද්ධ සියලු පාලම්, කාණු සහ වේලි, දියමංකඩවල් සහ අගල්;

(ආ) යම් පාරකට යාව පිහිටි, ඒ පාරේ ආරක්ෂාව හෝ යහපත සඳහා වෙන් කරනු ලැබ ඇති සියලු ඉඩම්;

(ඇ) යම් පාරක් ඉදිකිරීම සඳහා ලකුණු කොට වෙන් කරනු ලැබ ඇති සියලු ඉඩම්;

(ඈ) පොදු පිය මාර්ගවල හෝ කරත්ත පාරවල්වල මධ්‍යයේ සිට අඩි තිස්තුනක් වූ දුර ප්‍රමාණයක් ඇතුළතින් පොදු පාරවල්වල මධ්‍යයේ සිට අඩි දහයක් වූ දුර ප්‍රමාණයක් ඇතුළතින් පිහිටියා වූ ද, පෞද්ගලික දේපළක් නොවන්නා වූ ද, සියලු මුඩු බිම් ඒ මුඩු බිම් පෞද්ගලික දේපළ බව ඔප්පු කිරීමේ භාරය, ඒ මුඩු බිම් වල අයිතිය ඇතැයි කියා සිටින තැනැත්තා වෙත රඳා පවතී; තවද

(ඉ) සියලුම පොදු චතුරශ්‍ර, තණ පිට්ටනි, වෙළඳ ස්ථාන සහ පොදු ගොඩනැගිලි නොවන වෙනත් පොදු ස්ථාන;

"රීතිය" යන්නෙන්, නගර සභාවලට මග පෙන්වීම සඳහා 193 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද රීතියක් අදහස් වේ;

"ලේකම්" යන්නෙන්, නගර සභාවක තත් කාලයේ ලේකම් වීමට හෝ ලේකම් වශයෙන් ක්‍රියා කිරීමට ඒ නගර සභාව විසින් පත් කරන ලද නිලධරයා අදහස් වේ;

"වීථිය" යන්නට, ගෙවල් දෙකකට හෝ ඊට වැඩි ගණනකට හෝ ගෙපළවල්වලට අවතීර්ණ වීමේ මාර්ගයක් ලෙස භාවිත කරනු ලබන හෝ භාවිත කරනු ලැබීමට අදහස් කරනු ලබන, යම් පාරක්, අඩිපාරක් හෝ මගක්, මහජන යාව එහි මාර්ග අයිතිය තුබුණ ද නොතිබුන ද, ඇතුළත් වන අතර එහි අද්දර ඇති සියලු දිය පාරවල්, කාණු අගල්, පදික වේදිකා සහ වෙනත් කළ ඉඩම් ද ඊට ඇතුළත් වේ;

"මංමාවත" යන්නෙන්, යම් පාරක්, ඇළක් හෝ ගංගාවක් අදහස් වන අතර අඳ පටු මගක් ද ඊට ඇතුළත් වේ;

"නගරය" යන්නෙන්, මේ ආඥාපනතේ කාර්යයන් සඳහා නගර යක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද නාගරික ප්‍රදේශයක් අදහස් වේ.

[1969 අංක 4 § 3.] (2) ගෙවල් කුලී පනත අදාළ වන යම් ස්ථානයකට වාර්ෂික වටිනාකම මේ ආඥාපනතේ කාර්යයන් සඳහා නිර්ණය කිරීමේ දී සහ ඒ ස්ථානයේ වාර්ෂික ගෙවල් කුලිය ඒ නිර්ණය කිරීමේ කාර්ය යන් සඳහා තක්සේරු කිරීමේ දී, නගර සභාවක් විසින් ඒ පනතේ විධිවිධාන සැලකිල්ලට නොගත යුතු ය.



පළමුවන උපලේඛනය

(138 වන සහ 139 වන වගන්ති.)

වෙළෙඳ පොළ ආකෘති

'අ' ආකෘතිය

1. මට අයිති, ——— පිහිටි පෞද්ගලික වෙළෙඳ පොළ සඳහා බල පත්‍රයක් ලබාගැනීමේ අභිලාෂය ඇතිව, ——— පදිංචි ——— වන මම, නගර සභා ආඥාපනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, ඒ වෙළෙඳ පොළ* ——— දිනවල ——— වන දින සිට ——— වන දින දක්වා වූ කාල සීමාව තුළ ——— යේ පවත්වාගෙන යෑමට බල පත්‍රයක් දෙන මෙන් එකී ආඥාපනතේ ——— වන වගන්තිය යටතේ මෙයින් ඉල්ලුම් කරමි.

2. ප්‍රාදේශීය අතුරු ව්‍යවස්ථාවලින් (හෝ අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයාගේ නියමයකින්) නියම කර ඇති පරිදි, ස්ථානයේ සැලැස්ම සහ පරිමාණයට අඳින ලද සැලැස්මවල් ——— ක් ද වැඩි විස්තර පත්‍රිකා ද මේ සමඟ ඉදිරිපත් කරමි.

3. එකී වෙළෙඳ පොළ සම්බන්ධයෙන් පසු පිටුවේ සඳහන් ප්‍රකාශ සත්‍ය බව ද නිවැරදි බව ද වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : 19———.

*වෙළෙඳ පොළ පවත්වනු ලබන දවස හෝ දවස් සඳහන් කරන්න. නැතහොත් ඒ වෙනුවට, වෙළෙඳ පොළ සෑම ද ම පවත්වනු ලබන්නේ නම්, "දිනපතා" යන වචනය ආදේශ කරන්න.

(ඉහත දැක්වෙන ආකෘතියේ පසු පිටුවෙහි)

නගර සභා ආඥාපනතේ 138 වන වගන්තිය යටතේ වූ ප්‍රකාශය

——— හි පෞද්ගලික වෙළෙඳ පොළ

1. පිහිටීම :—

පළාත :———.

දිස්ත්‍රික් කය :———.

කෝරළය :———.

ගම :———.

2. පාරවල්, දුම්රිය මාර්ග සහ ඇළවල් අනුව ඒ වෙළෙඳ පොළෙහි පිහිටීම : ———.

3. ආසන්නතම පොදු වෙළෙඳ පොළවල්වල සිට දුර ප්‍රමාණය ඒ පොදු වෙළෙඳ පොළවල්වල නම් සඳහන් කළ යුතු ය :———.

4. ආසන්නතම පෞද්ගලික වෙළෙඳ පොළවල්වල සිට දුර ප්‍රමාණය. ඒ පෞද් ගලික වෙළෙඳ පොළවල්වල නම් සඳහන් කළ යුතු ය :———.

5. වෙළෙඳ පොළේ අයිතිකරුගේ නම :———.

6. වෙළෙඳ පොළේ කළමනාකරුගේ හෝ බදු ගැනුම්කරුගේ නම :———.

7. වෙළෙඳ පොළ සඳහා වෙන් කර ඇති ඉඩමු ප්‍රමාණය හා එහි වටිනාකම : ———.

8. ගොඩනැගිලිවල ස්වභාවය, ඒ එක් එක් ගොඩනැගිල්ල කවර කාර්යයක් සඳහා භාවිත කරන්නේ ද යන බව සහ එහි වටිනාකම :———.

9. යම් කාණු, වැසිකිළි හෝ ජල සම්පාදනයක් තිබෙන්නේ ද යන බව :———.

10. වෙළෙඳ පොළ පිහිටවනු ලැබූ දිනය :———.

11. වෙළෙඳ පොළ පවත්වන්නේ කවර දවස්වල ද යන බව සහ එය පවත්වන වාර ගණන :———.

12. පසුගිය සඳහන් අයගේ සාමාන්‍ය ඇමිණීම :—

(අ) වෙළෙන්දෝ :———. (ආ) මිල දී ගන්නෝ :———.

13. පසු ගිය දොළොස් මාසය තුළ දළ ලැබීම :———.

14. පසු ගිය දොළොස් මාසය තුළ ශුද්ධ ලැබීම :———.

———,
ප්‍රකාශය කරන්නාගේ අත්සන.

'ආ' ආකෘතිය

පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රය

අංකය :———.

19 —— මස —— වන දින

රු. ——— ක ගාස්තුවගෙවන ලදී.

නගර සභා ආඥාපනතේ විධිවිධානවලට සහ එය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට සහ පසු පිටුවෙහි සඳහන් විශේෂ කොන්දේසිවලට ද යටත්ව, මෙහි පහත විස්තර කර ඇති ස්ථානයේ පිහිටි වෙළෙඳ පොළ පවත්වාගෙන යාමට ——— පදිංචි ——— ට එකී ආඥාපනතේ ——— වන වගන්තිය යටතේ මෙයින් අවසර දෙනු ලැබේ.

ස්ථානය :———.

දිනය :———.

———,
නගර සභාවේ සභාපති.

(මෙහත දැක්වෙන ආකෘතියේ පසු පිටුවෙහි)

ස්ථානය පිළිබඳ විස්තරය :———.

බලපත්‍රය ප්‍රදානය කරනු ලැබුයේ යම් විශේෂ කොන්දේසි ඇත් ද යන බව:
———

දෙවන උපලේඛනය

(140 වන වගන්තිය.) මේ ආඥාපනත යටතේ පිහිටුවනු ලබන හෝ බලය දෙනු ලබන සියලු වෙළෙඳ පොළවල්වල ප්‍රමිති

සාමාන්‍ය වෙළෙඳ පොළවල්වල (එනම්, දෙවර්ගයක හෝ වර්ග වැඩි ගණනක බඩු විකිණීම සඳහා යොදාගෙන ඇති වෙළෙඳ පොළවල්වල) ප්‍රමිති

1. සෑම සාමාන්‍ය වෙළෙඳ පොළක් සඳහා අක්කර කාලකට නොඅඩු ප්‍රදේශයක් තිබිය යුතුය.

2. සෑම සාමාන්‍ය වෙළෙඳ පොළක් ම අඩි 4 කට නොඅඩු වූ ද අඩි 6 කට නොවැඩි වූ ද තාප්පයකින් හෝ වැටකින් කොටු කළ යුතු අතර, පළලින් අඩි 12 කට නොඅඩු දොරටුවක් ද ඊට සැපයිය යුතු ය.

3. වෙළෙඳ පොළ භූමිය ඇතුළත පිහිටා ඇත්තා වූ ද වාහන සඳහා පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබ ඇත්තා වූ ද සෑම පාරක් ම පළලින් අඩි 15 කට නොඅඩු විය යුතු අතර, තලන ලද බොරලු කැට හෝ කළු ගල් වලින් සැදුණු මතුපිටක් ද ඊට තිබිය යුතු ය.





සාමාන්‍ය වෙළෙඳ පොළවල් වූ හෝ විශේෂ වෙළෙඳ පොළවල් වූ සියලු වෙළෙඳ පොළවල්වල (එනම්, යම් විශේෂ වර්ගයක බඩු විකිණීම සඳහා වෙන් කරනු ලැබ ඇති වෙළෙඳ පොළවල්වල) ප්‍රමිතිය

4. කිසි ම අලුත් වෙළෙඳ පොළ ගොඩනැගිල්ලක් හෝ මායිම් තාප්පයක් හෝ එහි කොටසක්, යම් පාරක මධ්‍යයේ සිට අඩි 25 ක් ඇතුළත හෝ නගර සභාව විසින් නිරූපණය කරනු ලැබ ඇති යම් වීථි රේඛාවක් ඇතුළත ඉදි කරනු නොලැබිය යුතු ය.

5. සෑම වෙළෙඳ පොළ භූමියක ම පළලින් අඩි 7 කට නොඅඩු හිස් බිමක් තිබිය යුතු අතර, වීථියකට යාව ඇති යම් පැත්තක හැර, අනෙක් සියලු පැතිවල ගොඩනැගිලි නොතිබිය යුතු ය.

6. යම් වෙළෙඳ පොළ භූමියක් ඇතුළත වූ යම් වෙළෙඳ පොළ ගොඩනැගිලි දෙකක පියසි අතර අඩි 15 ක අවම ඉඩක් තැබිය යුතු ය.

7. සෑම වෙළෙඳ පොළ ගොඩනැගිල්ලක් ම—

(අ) ගඩොල්, ගල් හෝ කලුක් ගල් බැම්මෙන් ඉදි කළ යුතු ය;

(ආ) එහි පියසි යටත් පිරිසෙයින් අඩි 7 ක් වත් උසින් ධිටින සේ විය යුතු ය.

(ඇ) උලුවලින් හෝ සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් ද්‍රව්‍යය කින් හෝ වසන ලද වහලකින් යුක්ත විය යුතුය.

8. සෑම වෙළෙඳ පොළ භූමියකට ගෙබිම කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් හෝ වෙනත් පසාරු කළ නොහැකි ද්‍රව්‍යයකින් සෑදිය යුතු ය.

9. බිත්තිවල සහ සන්ධි සමඟ බිත්ති එකතු වන ස්ථාන සහ බිත්ති සමඟ ගෙබිම එකතු වන ස්ථාන ශුද්ධ පවිත්‍ර කිරීම පහසු වන විශිෂ්ට වටකුරු කළ යුතු ය.

10. සෑම වෙළෙඳ පොළ ගොඩනැගිල්ලක් ම, ඒ වටා පිහිටි භූමියට වඩා එක් අඩියක් උස් කළ යුතු ය.

11. සියලු වෙළෙඳ පොළ ගොඩනැගිලි වටා සහ සභාපතිවරයා විසින් නිශ්චය වශයෙන් සඳහන් කරනු ලැබිය හැකි, වෙළෙඳ පොළ භූමියේ වෙන යම් කොටස් වල, කොන්ක්‍රීට් හෝ සිමෙන්තියෙන් බඳින ලද, නිසි ලෙස වතුර බැස යන කාණු සැපයිය යුතු ය.

12. වෙළෙඳ පොළ ගොඩනැගිල්ලෙහි සියලු කුළුණු, සිමෙන්තියෙන් බඳින ලද හෝ යකඩයෙන් සාදන ලද ඒවා හෝ ඔප්පටම් කරන ලද ලීයෙන් සාදන ලද ඒවා විය යුතු ය.

13. මස් විකිණීමට නියමිත සෑම වෙළෙඳ පොළක ම, තනිකර ම මස් පමණක් විකිණීම සඳහා වෙන් කරන ලද, විශේෂ මස් වෙළෙඳ පිළක් හෝ ස්ථානයක් හෝ ඊට වැඩි ගණනක් තිබිය යුතු ය. ඒ සෑම මස් වෙළෙඳ පිළක ම හෝ ස්ථාන යක ම, (ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති නියමයන්ට අනු කූල වන අතර ම) ඇතුළු බිත්තිවල මතුපිට, ගෙබිමේ සිට අඩි 4 කට නොඅඩු උසකට මප දැමූ ගඩොලින් හෝ සිමෙන්තියෙන් ආවරණය කළ යුතුවාක් මෙන්ම එහි—

(අ) දුවිලි නොරඳන සිලිමක් ;

(ආ) මස් එල්ලා තැබීම සඳහා බැල්ක සහ කොකු;

(ඇ) සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, දොරවල්වල, ජනෙල් වල සහ බිත්තිවල ඇති නිවාරණ වාතාශ්‍ර විධිවිධාන ;

(ඈ) දියර ද්‍රව්‍ය ඇතුළට පසාරු නොවන අන්දමට තුත්තනාගම්, කිරිගරුඩ හෝ සභාපතිවරයා විසින් අනුමත කරන ලද වෙනත් ද්‍රව්‍යයකින් මතු පිට ආවරණය කරන ලද මේස ;

(ඉ) කුණු රැඳී තිබීම වැළැක්වෙන අන්දමින් මතුපිට සිනිඳු කරනු ලැබ ඇති මස් කපන කොට,

සපයනු ලැබිය යුතු ය.

14. අළුත් මාළු විකිණීමට නියමිත සෑම වෙළෙඳ පොළක ම, ඒ කාර්යය සඳහා ම පමණක් වෙන් කරනු ලැබුවා වූ ද ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති නියමයන්ට අනුකූල වන අතර ම, සියලු පැතිවලින් විවෘතව තිබෙන්නා වූ ද විශේෂ ස්ථානයක් තිබිය යුතු ය. ඒ විශේෂ ස්ථානය වටා ආසන්නයෙන් ම ඇති කාණුවල ජලය ඉවත් කළ හැකි භාජනයකට ගලා යා යුතු අතර, ඒ විශේෂ ස්ථානයේ සේදීම් කටයුතු සඳහා යොදවන ජලය ද ඒ භාජනය වෙත ගලා යෑමට සැලැස්විය යුතු ය. ඒ විශේෂ ස්ථානයට, ජලය ඇතුළට පනාරු නොවන මතුපිට සහිතව ශක්තිමත් ලෙස තනන ලද ලී මේස හෝ සිමෙන්තිවලින් සාදන ලද මතුපිට සහිත සිමෙන්ති මේස සැපයිය යුතු ය.

15. පෞද්ගලික වෙළෙඳ පොළක ඇති සෑම ළිඳක් ම, සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මක්, වැඩ විස්තර පත්‍රිකාවක් අනුව සහ එසේ අනුමත කරන ලද ස්ථානයක ඉදි කළ යුතු අතර, කවර විටකවත්, එබඳු ළිඳක්, කසළ වළක හෝ ගව මඩුවක සිට අඩි 100 ක් ඇතුළත ඉදි නොකළ යුතු ය.

16. පෞද්ගලික වෙළෙඳ පොළක ඇති සෑම වැසිකිළියක් ම, වළ වැසිකිළියක් හෝ සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් අන්දමක වැසිකිළියක් විය යුතු අතර, සභාපතිවරයා විසින් අනුමත කරන ලද ස්ථානයක සහ ඔහු විසින් අනුමත කරනු ලබන සැලැස්මක් සහ වැඩ විස්තර පත්‍රිකාවක් අනුව ඉදි කරනු ලැබිය යුතු ය.

17. පෞද්ගලික වෙළෙඳ පොළ භූමිය ඇතුළත වූ හෝ ඒ භූමිය සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සෑම ගෝඝාතක ස්ථානයක ම, ඉවත් කළ හැකි භාජනයක් තුළට ලේ ගලා යන අන්දමට බෑවුමක් සහිතව සිමෙන්තිවලින් සාදන ලද හෝ කොන්ක්‍රීට් ගෙබිමක් තිබිය යුතු ය. මාංශාවශේෂ, ගෝඝාතක භූමියෙන් ඉවත් කරනු ලබන තුරු ඒවා රැස් කර තැබීම සඳහා ද භාජනයක් ඉදි කර තැබිය යුතු ය. ඝාතනය කරන ලද සතුන් එල්ලා තැබීම සඳහා ඒ ගොඩනැගිල්ලෙහි බාල්ක සහ කොකු සවි කළ යුතු අතර ඒ ගොඩනැගිල්ල ආවරණයකින් වට කිරීමෙන් හෝ වෙන ආරක්ෂාවක් යෙදීමෙන්, සත්ව ඝාතනය පිටතට නොපෙනෙන අන්දමට කටයුතු සැලැස්විය යුතු ය.

(163 වන වගන්තිය.)

## තුන්වන උපලේඛනය

### රථවාහන සහ සත්ව බද්ද

[1979 අංක 42 § 16.]

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර් රථයක්, රේද කුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා ... ... | 25 | 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා— | | |
| (අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 10 | 0 |
| (ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්ය සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... ... | 5 | 0 |
| සෑම කරත්තයක් ම සඳහා ... ... | 20 | 0 |
| සෑම අත් කරත්තයක් ම සඳහා ... ... | 10 | 0 |
| සෑම රික්ෂෝවක් ම සඳහා ... ... | 7 | 50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා ... | 15 | 0 |
| සෑම අලියකු ම සඳහා ... ... | 50 | 0 |





රෝදවල විෂ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන, විල් බැරෝක්ක, හුදෙක් පෞද්ගලික ස්ථානයක් තුළ පමණක් වෙළෙඳ කටයුතු සඳහා භාවිත කැරෙන අත් කරත්ත සහ වෙළඳ කටයුතු සඳහා භාවිත නොකැරෙන අත් කරත්ත මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට, යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව, විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද, යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙනයෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

## හතරවන උපලේඛනය

(158 වන වගන්තිය.)

නාගර සභා විසින් අය කරගත හැකි දඩ මුදල් සහ දණ්ඩන මුදල් සභාවේ පරිපාලන සීමා ඇතුළත—

(අ) මේ ආඥාපනත හෝ ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ;

(ආ) මේ ආඥාපනත හෝ ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ සභාවේ කාර්ය ඉටු කිරීමේ දී හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ;

(ඇ) කරදර පිළිබඳ ආඥාපනත යටතේ ;

(ඈ) නිවාස සහ නාගර සංවර්ධන ආඥාපනත යටතේ ;

(ඉ) නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත යටතේ අය කර ගනු ලබන සියලු දඩ මුදල් සහ දණ්ඩන මුදල්.

## පස්වන උපලේඛනය

නාගර සභා විසින් අය කරගත හැකි මුද්දර ගාස්තු සහ ගාස්තු

(158 වන වගන්තිය.)

1. (අ) **බෝට්ටු ආඥාපනතින් ;**

(ආ) **ගෝඝාතක ආඥාපනතින් ;**

(ඇ) **වාහන ආඥාපනතින් ;**

(ඈ) තත් කාර්යය සඳහා යම් විශේෂ විධිවිධානයක් සලස්වනු ලැබ ඇත්තේ යම් ප්‍රඥප්තියක ද, ඒ ප්‍රඥප්තියෙන්,

නාගර සභාවලට පවරා ඇති සියලු මුද්දර ගාස්තු සහ ගාස්තු.

2. යම් නාගර සභාවක පරිපාලන සීමා ඇතුළත—

(අ) නැව්තොටට සංසිධායක ආඥාපනත යටතේ ;

(ආ) ඛනිජ තෙල් ආඥාපනත යටතේ ;

(ඇ) විෂ, අබින් හා අන්තරායදායක ඖෂධ ආඥාපනත යටතේ ;

(ඈ) පුපුරන ද්‍රව්‍ය ආඥාපනත යටතේ ;

(ඉ) තුවක්කු ආඥාපනත යටතේ

යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් භුක්ති විඳීමට පවරන බල පත්‍ර සම්බන්ධයෙන් ගාස්තු හෝ මුද්දර ගාස්තු වශයෙන් ගෙවනු ලබන සියලු මුදල්.

3. නාගරයක වැසියන් විසින්—

(අ) නීතිඥවරුන් වශයෙන්, අධිකරණ සංවිධාන පනතේ 40(2) වන වගන්තිය යටතේ වූ ඇතුළත් කරගැනීමේ සහතික සඳහා ;

(ආ) නොතාරිස්වරුන් වශයෙන්, නොතාරිස් ආඥාපනතේ 3 වන, 27 වන සහ 28 වන වගන්ති යටතේ නිකුත් කරනු ලබන, බල පත්‍ර සහතික සහ ප්‍රකාශන සඳහා ;

(ඇ) ආධුනිකත්ව ගිවිසුම් සම්බන්ධයෙන් හෝ නොතාරිස්වරයකු වශයෙන් සුදුසුකම් ලැබීම පිණිස යම් තැනැත්තකු පළමු වරට බැඳෙන යම් ගිවිසුමක් සඳහා ;

[1979 අංක 43 § 17.]

(ආ) බදු උකස්ගත්තන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර මත බදු උකස් ගත්තන් විසින්

ගෙවනු ලබන සියලු මුද්දර ගාස්තු.

[1979 අංක 42 § 17.]

4. නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමකට බල පාන පැවරුම්කර, උකස්කර, නැගිකර සහ බදුකර සම්බන්ධයෙන් මුද්දර ආඥාපනත යටතේ ගෙවනු ලබන සියලු මුද්දර ගාස්තු.

---

## හයවන උපලේඛනය

(230 වන වගන්තිය.)

### ඉවත් කිරීම

1. මංමාවත් ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

2. 1892 කුඩා නගරවල සෞඛ්‍යාරක්ෂක ආඥාපනත* සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

3. 1898 ප්‍රාදේශීය මණ්ඩල ආඥාපනත* සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

4. බෝවෙන රෝග ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

5. 1891 අංක 19 දරන උතුරු පළාතේ වෙළඳ පොළවල් ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

6. මහ නගර සභා ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

7. ගම් සභා ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

8. සුළු නගර සභා ආඥාපනත සහ ඒ ආඥාපනත සංශෝධනය කරමින් සම්මත කරන ලද සියලු ප්‍රඥප්ති.

---

*1949 අංක 54 දරන පනත මගින් ඉවත් කරන ලදී.